

# පාලි ගද්‍ය පද්‍ය රචනාං



# පාලිගද්‍යපද්‍යරචනා

පාලි වාක්‍යරචනාව හා ගාථාබැඳීම
ඉගනීම සඳහා


කර්තෘ :

දර්ශනවිශාරද (Ph.D) මහාචාර්‍ය අග්ගමහාපණ්ඩිත

**පොල්වත්තේ බුද්ධදත්ත**

කල්‍යාණිවංශනිකායේ මහානායකස්ථවිර



ප්‍රකාශකයෝ :

අම්බලම්ගොඩ ආනන්ද සාප්පුවේ අයිතිකාර

ඒ. පී. කේ. ද වාස්

මුද්‍රණය :

**අනුල මුද්‍රණාලය**

98, ඩින්ස්පාර-මරදාන

මිල රු. 2. 50

1962

# හඳුන්වාදීම.

ස්වභාෂාව නොවූ බසක් ඉගෙන ඒ භාෂාවෙන් වාක්‍යරචනා කිරීම කාට වුවත් අපහසු වැඩකි. එහෙත් ඉංග්‍රීසි වාක්‍යරචනාව මුලසිටම පුහුණු කරවීම සඳහා ඒ පාඨශාලාවල උපක්‍රම යොදා තිබේ. ඒ සඳහා අපමණ පොත් ද ඒ බසින් සම්පාදිතව තිබෙත්. පාලි භාෂාවේ වාක්‍යරචනාව ඉගැන්වීම ඉතා මෑතකදී පටන්ගන්නා ලද්දකි. මාගේ "**පාලිභාෂාවතරණය**" වාක්‍යරචනාව මුල්කොට සම්පාදිතවූවකි. එහෙත් එය භාෂාවත් ව්‍යාකරණත් ක්‍රමානුකූලව ඉගැන්වීම සඳහා අදහස්කරන ලද්දක් බැවින් වාක්‍යරචනාවට ඕනෑ සියලු දේ එහි දක්වීමට අවකාශ නැත. ප්‍රාචීනභාෂෝපකාර සමිති ආදියේ විභාගවලට පෙනී සිටින ශිෂ්‍යයන් වාක්‍යරචනාවලින් බොහෝසේ අසමර්ථවනබව නොයෙක් විට අසන්ට ලැබේ. එයට උපකාර වන අන් පොතක් නොතිබුණු බැවින් මා විසින් මින් පෙර "**පාලිවාක්‍යවිවේචනය**" නම් පොතක් සම්පාදිත විය. ඒ පොතේ පිටපත් අවසන්වූ විට එය නැවත සකස් කිරීමේදී භාෂාපරිවර්තනය සඳහාත් කොටසක් එක්කළයුතු බව පෙනීගිය නිසා ඒ පොතේ පිළිවෙළ වෙනස්කොට "**පාලිවාක්‍යරචනාව හා පරිවර්තනපරිචය**" නමැති පොත සකස් කරන ලදී. 1947 දී පළකරවූ ඒ පොතේ පිටපත් තවම විකිණී අවසන් නොවූහ.

මෙකී එක් පොතකවත් ගද්‍යරචනාව ගැන මිස පද්‍යරචනාව ගැන කිසිවක් ඇතුළත් නොකරන ලද බැවින් ආධුනිකයන්ට පද්‍යරචනාව ගැනත් මූලික අවබෝධයක් ඇතිකරවීම සුදුසු යයි වැටහුණ බැවින් තෙවෙනි වර ඒ පොත "පාලිගද්‍යපද්‍යරචනා" නාමය යොදා ගාථාබන්ධනය සම්බන්ධ කරුණු ස්වල්පයක් ද ඇතුළත් කොට මෙසේ සකස්කෙළෙමි. මුල් පොතේ තිබුණු කිසිවක් අත් නොහරිනලදී.

පාලිය සිංහලට පෙරළාගැනීම පහසු නමුත් සිංහලය පාලියට පෙරළීම එතරම් පහසු නොවේ. එබැවින් පරිවර්තනපරිචයේ මුල් කොටසෙහි සාමාන්‍ය කථාව්‍යවහාරයෙහි පවත්නා කරුණු මුල්කොට යෙදූ කෙටි සිංහල වාක්‍යයන් පාලියට නගන සැටි දක්වා ඊට අනතුරුව කෙටිකථා නගන සැටි දක්වනලදී. ඊටත් පසුව තරමක් දීඝීවූ ප්‍රවෘත්ති සිංහලෙන් දක්වා ඒවා පාලියට නගා

පෙන්වන ලදහ. එසේ යෙදූ කුඩා කථා දශයකි. අන්‍යවූ ප්‍රවෘත්ති ඇතුළත් දීර්ඝ වාක්‍ය කොටස් 13 කි. එයින් නොනැවතී පාලියෙන් පෞද්ගලික ලිපි ගළපන සැටි ද මෙහි 70 වෙනි පිටේ සිට දක්වන ලදී.

සිංහලභාෂාරීතිය ඇතැම් තැනකදී පාලිභාෂාරීතිය හා නොසැසඳෙන බැවින් පාලිභාෂාරීතිය දක්වන කොටසක් මෙහි 79 පිටේ සිට ඇතුළත්කොට තිබේ. දීර්ඝ වාක්‍යයන් කෙටිකොට, වචන අඩුකොට අර්ථයට හානියක් නොවෙන සේ යොදන සැටි දැක්වීම මේ පොතට අලුතෙන් එක්කරනලදී.

ක්‍රියාමාලාවක් යොදා එක් එක් ක්‍රියාවේ වර්තමාන පදය ද පූර්වක්‍රියාව ද අතීතකිතකපදය ද එක් එක් පෙළෙහි දක්වනලදී. සිංහලයෙහි යුගල වශයෙන් යෙදෙන "ගස්-කොළන්, තොවිල්-පවිල්" ආදිය මෙන් පාලියෙහිත් යුගල වශයෙන් යෙදෙන ශබ්ද ඇති බැවින් ඒවා හැකිතරමක් එක්කොට මෙහි පිටුවල දක්වන ලදී. එයට අනතුරුව අන්‍යොන්‍යවිරුද්ධාර්ථ ඇති ශබ්දයන්ගේ වචනමාලාවකි.

සොයාගතහැකිවූ නිපාත සියල්ලම අර්ථ සහිතකොට අකාරාදි පිළිවෙළින් මෙහි යොදා ඇත.

මෙසේ ආධුනිකයන්ට වාක්‍යරචනාවට හා භාෂාපරිවර්තනයට දියහැකි හැම රුකුලක්ම මේ පොතෙන් දෙනලදැයි සැලකියහැක.

මීට,

අම්බලම්ගොඩ අග්ගාරාමාධිපති

**පොල්වත්තේ බුද්ධදත්ත**

කල්‍යාණිවංසනිකායේ මහානායකස්ථවිර.

25. 1. 1962.

# පටුන

පිට


1. වාක්‍යය නම් කුමක්ද? ... 1
2. අමිශ්‍ර වාක්‍ය (සකර්මක) ... 2
3. විශේෂණ පද ... 3
4. ලිංග පරිවර්තනය, ස්ත්‍රීප්‍රත්‍යයෝ ... 7
5. ක්‍රියා විශේෂණ ... 11
6. සංඛ්‍යා විශේෂණ ... 13
7. සර්වනාම විශේෂණ ... 16
8. සමාස විශේෂණ ... 17
9. භින්නාධිකරණ විශේෂණ ... 19


## පරිවර්තනපරිචය

### සිංහල පාලියට නැගීම.


1. සාමාන්‍ය කථොපකථන i ... 20
2. ,, ii ... 22
3 අණකිරීම් හා අවවාද ... 23
4. පාඨශාලීය ශිෂ්‍යයකු හා කථාවක් ... 24
5. ගොවියන් දෙදෙනකුන් අතර කථාවක් ... 27
6. වෙළඳුන් ,, ,, ,, ... 29
7. තිරිසනුන් සම්බන්ධ වාක්‍ය ... 30
8. වෘක්ෂයන් හා පුෂ්ප-ඵලාදිය සම්බන්ධ වාක්‍ය ... 32
9. වාසය කරන ගෙයක් සම්බන්ධ දේ ... 34
10. නගරයක් සම්බන්ධ වාක්‍ය ... 36
11. රෝග හා බෙහෙත් පිළියම් ... 38
12. බෞද්ධ විහාරස්ථානයෝ ... 40
13. බුරුමරටෙන් ආවකු හා කථාවක් ... 42


### කුඩා කථා හා පොත්වලින් ගත් කොටස්.


1. සිංහසම පොරවාගත් කොටළුවා ... 44
2. අකාලයෙහි නික්ම යාමේ විපාක ... 45
3. කවුඩු - බකමූහුණු වෛරය ... 46
4. සමගියේ බලය ... 47

5. ප්‍රමාදයේ විපාක ... 48
6. ගොළුවකු මෙන් ඇඟවූ යාචකයා ... 49
7. විවාදයට පත් දියකාවෝ දෙදෙන ... 49
8. හාවකුවිසින් සිංහයෙක් මරණලදී ... 50
9. කට නිසා විනාශයට පත් ඉබ්බා ... 51
10. අන්ධයකුගේ දක්‍ෂභාවය ... 53
11. කාලිදාස පණ්ඩිතවූයේ කෙසේද? ... 54
12. උසස් කුලැත්තෝ කාරුණිකයෝද? ... 54
13. ජීමූතවාහන කුමරා ... 55
14. විතසතාදතත වෙළඳා හා ඔහුගේ පුත්‍රයා ... 56
15. සිල්වතාගේ තේජස ... 57
16. පමණ දැනීම යහපති ... 58
17. බැමිණිතියානාය කල ... 59
18. ශාසන පරම්පරාව රැකගත් සැටි ... 61
19. නාලන්‍දාහි විශ්වවිද්‍යාලය ... 63
20. උදන්තපුරී මහාවිද්‍යාලය ... 64
21. වික්‍රමශිලාහි විශ්වවිද්‍යාලය ... 65
22. තක්සලා විශ්වවිද්‍යාලය ... 66
23. ටිබැට්රට තාෂිලුම්පෝ විශ්වවිද්‍යාලය ... 68

**24. ලේඛන සම්පාදනය.**

(1) පොත් වෙලෙන්දෙකුට ... 70
(2) උපාධ්‍යාය සථවිරතුමාට ... 70
(3) උපාධ්‍යාය සථවිරයන් විසින් ශිෂ්‍යයාට ... 71
(4) විල්හෙල්ම් ගෛගර් පඬිතුමාට ලිපියක් ... 72
(5) ඒ පඬිතුමා එවූ පාලි ලිපියක් ... 73
(9) නැවත ඒ පඬිතුමාට යැවූ ලිපියක් ... 73

26. කත්‍රී කර්මාදිය තැබිය යුතු තැන් ... 74
26. වාක්‍යයක් ලක්‍ෂ කිරීම ... 76
27. භාෂාරීති ... 79
28. ක්‍රියාමාලාව ... 88
29. නිපාතමාලාව ... 99

30. යුගල වශයෙන් යෙදෙන ශබ්ද ... 102
31. අන්‍යොන්‍ය විරුද්ධාර්ථ ඇති විශෙෂණ ... 104
32. අන්‍යොන්‍ය විරුද්ධාර්ථ ඇති නාම ... 107
33. පද්‍යරචනා ... 110
34. අර්ථ විවරණ ... 121
සිංහල පාලි වචන මාලාව 125

# පාලිගද්‍යපද්‍යරචනා

## ගද්‍යරචනා

**නමො තස්ස වාක්‍යපථාතිගස්ස.**

## වාක්‍යය නම් කුමක්ද?

**1.** සම්පූර්ණ අදහසක් ප්‍රකාශකරන වචනසමූහය **වාක්‍ය** නමි. වාක්‍යයකගේ නිෂ්පාදනයට කරන්නෙක් ද ක්‍රියාවක් ද ඇතිවිය යුතුයි. **කරන්නකු** (කර්තෘපදයක්) හා **කිරීමක්** (ක්‍රියාපදයක්) **නැතිව වාක්‍යයක් සම්පාදනය කළහැකි නොවේ.**

**පුරිසො නිසීදති** (=පුරුෂයා හිඳී) යන්න වාක්‍යයකි. **පුරිසො** නාමපදයකි; මේ වාක්‍යයෙහි (හිඳීම්) ක්‍රියාව කරන්නා පුරුෂ තෙමේයි. **නිසීදති** ක්‍රියාපදයකි; පුරුෂයාගේ කිරීම **එයින්** කියවේ.

**1.** **පුරිසො** ඒකවචනයකි, **නිසීදති** යන්නත් ඒකවචනයකි. මෙසේ **කර්තෘ ඒකවචනය වූ විට** (හෙවත් කරන්නා එක් අයකු වූ විට) **ඔහුගේ ක්‍රියාවත් ඒකවචනයෙන් සිටිය යුතුයි.**

භාෂාවක් නිවරදසේ ව්‍යවහාර **කළයුතු** ආකාරය ව්‍යාකරණයෙන් උගන්වනු ලැබේ "**පුරිසො නිසීදන්ති** (=පුරුෂයා හිඳිත්.) යි කිවහොත් එය ව්‍යාකරණයට විරුඬයි; කර්තෘ ඒකවචනයෙන් ද ක්‍රියාව බහුවචනයෙන් ද යොදා තිබෙන හෙයිනි.

**2.** **ක්‍රියාව බහුවචනය වූවිට කර්තෘ ද බහුවචනයෙන් සිටිය යුතුයි.** එබැවින් මේ වාක්‍යයේ කර්තෘපදයද බහුවචනයක් කොට **පුරිසා නිසීදන්ති** යි යෙදියයුතු වේ.

"**පුරිසා නිසීදති**"යි කර්තෘ බහුවචනයෙන් හා ක්‍රියාව ඒකවචනයෙන් යෙදීමත් යුතුනොවේ.

### අභ්‍යාසය 1.

ඒකවචනවලින් වාක්‍යදශයක් ද බහුවචනවලින් වාක්‍ය දශයක් ද සෑදියයුතු.

පහත පෙනෙන වාක්‍යයන් නිදෙස්කළයුතු:-

1. ගොණො ධාවන්ති 2. සීහා තිට්ඨන්ති 3. මිගා සයන්ති. 4. සුනඛො සයන්ති. 5. පුරිසා භුඤ්ජන්ති. 6. කාකො රවන්ති. 7. ත්වං නිසීදථ. 8. අහං පචාම. 9. තුම්හෙ ගච්ඡාහි. 10 මයං භුඤ්ජාමි. 11. අහං කරොම 12. ත්වං සයථ.

---

## අමිශ්‍රවාක්‍ය (සකර්මක.)

කර්තෘ හා ක්‍රියාව වාක්‍යයක ප්‍රධානාවයවයි. **පුරිසො සයති** (=පුරුෂයා නිදයි) යන තැන ක්‍රියාපදය අකර්මක (කර්මයක් නොගන්නා) බැවින් ඒ වාක්‍යය කර්තෘ-ක්‍රියාදෙකින් සම්පූර්ණවේ. තමුත් **ගොණො ඛාදති** (=ගොනා කයි) යන තැන "ඛාදති" යන ක්‍රියාව කර්මයක් අපෙක්ෂාකෙරේ. මේ වාක්‍යය ඇසූවකුට ගොනා කන්නේ කුමක් ද? තණකොළද? පිදුරුද? අන් දෙයක්ද? යන සැකය උපදී, එබැවින් කනදෙය ද ඇතුළත් කොට **ගොණො තිණං ඛාදති** (=ගොනා තණ කයි) කීවිට වාක්‍යය සම්පූර්ණවේ. මෙසේ-

**4. අකර්මකක්‍රියාවකින් යුත් වාක්‍යය කර්මය නැතිව සම්පූර්ණවෙතත් සකර්මකක්‍රියාවකින් යුත් වාක්‍යය කර්මයක් නැති කල්හි සම්පූර්ණ නොවේ.**

සකර්මක වාක්‍ය:-

---

1. පුරිසො **රුක්ඛං** ඡින්දති.
2. මනුස්සා භත්තං භුඤ්ජන්ති.
3. අස්සා **ගාමං** ධාවිංසු.
4. දාසො **ගොණෙ** බන්ධි.
5. වනිතායො **පදුමානි** ආහරිංසු
6. රක්ඛසී **මනුස්සෙ** ඛාදි.
7. වඩ්ඪකිනො දාරුභණ්ඩානි කරොන්ති.
8. සීහා **හත්ථිනො** මාරෙන්ති.

9. කස්සකා ඛෙත්තානි කසිංසු.
10. තුම්හෙ පක්ඛිනො පලාපෙථ.
11. අහං සීලං රක්ඛිස්සාමි.
12. ත්වං මහාචෙතියං වන්දසි.
13. මයං අනුරාධපුරං ගමිස්සාම.
14. තුම්හෙ පුඤ්ඤානි කරොථ.
15. භික්ඛවො ධම්මං දෙසෙසුං.

**5. කර්තෘ හා ක්‍රියාව ඒකවචනයෙන් සිටි නිසා කර්මයත් ඒකවචනයම විය යුතු නොවේ.** එක් මිනිසකු විසින් එක් ගසක් හෝ බොහෝ ගස් හෝ කැපියහැක; එබැවින් කර්තෘ ඒකවචනය වූ විට කර්මය ඒකවචනයෙන් හෝ බහුවචනයෙන් සිටීමට බාධාවක් නැත එමෙන්ම **කර්තෘ හා ක්‍රියාව බහුවචනයෙන් සිටි තැන්හි කර්මය ඒකවචනයෙන් යොදන්නට බාධාවක් නැත්තේය.** මිනිසුන් බොහෝ දෙනෙකුන් විසින් එක් ගසක් කැපීම හෝ එක් කුඹුරක් සීසෑම කළහැකිවේ. මෙසේ කර්මය කර්තෘ ක්‍රියාවන්ගේ ඒකබහුත්වය අනුගමනය නොකෙරේයයි දතයුතු.

**අභ්‍යාසය 2.**

මේ වාක්‍යයන්හි අඩුතැන් කර්මපදවලින් පිරවියයුතු:-

1. ත්වං............ගච්ඡසි. 2. භික්ඛවො............රක්ඛන්ති. 3. හත්ථිනො ..............බාදන්ති. 4. සීහො ...............මාරෙති. 5. මයං............කසාම. 6. තුම්හෙ ..........වන්දථ 7. පුරිසො ............බන්ධති 8. දසා............භුඤ්ජන්ති. 9. ගොණො.......... ධාවි. 10. මනුස්සා............ආහරන්ති. 11. කස්සකො............... ජිනි. 12. ගොණා............බාදිංසු.

---

## විශෙෂණපද.

**6. කර්තෘපදයකට කර්මපදයකට සම්බන්ධකොට විශෙෂණ පද යෙදිය හැක.** "පුරිසො ආගච්ඡති" (=පුරුෂයා ඒ) යන වාක්‍යයෙහි පුරුෂයා ධනවතෙක් නම්:

**ධනවා පුරිසො ආගච්ඡති.**

(=ධනවත් පුරුෂයා ඒ) යයි කියහැක.

ඔහුට ඇති ගුණයන් අනුව නානාවිධ විශේෂණපද යෙදිය හැක:

| | | | |
|---|---|---|---|
| 1. සීලවා | පුරිසො | ආගච්ඡති | (සිල්වත් පුරුෂයා ඒ.) |
| 2 පඤ්ඤවා | ,, | ,, | (නුවණැති ,, ,,) |
| 3. රස්සො | ,, | ,, | (මිටි ,, ,,) |
| 4· ලකුණ්ඨකො | ,, | ,, | (කුරු ,, ,,) |
| 5. උච්චො | ,, | ,, | (උස් ,, ,,) |
| 6. සෙතො | ,, | ,, | (සුදු ,, ,,) |
| 7. කාළො | ,, | ,, | (කළු ,, ,,) |
| 8. කක්ඛළො | ,, | ,, | (රළු; තපුරු ,, ,,) |
| 9. දුප්පඤ්ඤො | ,, | ,, | (අඥාන ,, ,,) |
| 10. පාපකාරී | ,, | ,, | (පව්කාර ,, ,,) |
| 11. රොදමානො | ,, | ,, | (අඬන ,, ,,) |
| 12. හසමානො | ,, | ,, | (සිනාසෙන ,, ,,) |
| 13. බලවා | ,, | ,, | (බලවත් ,, ,,) |

ආදිවශයෙන් නොයෙක් පද පුරිස-ශබ්දයට හෝ අන්‍ය ශබ්දයකට විශේෂණකොට යෙදිය හැක; නමුත්

**7. ඒ විශේෂණපද වෙසෙසනු ලබන පදයට අයත් ලිඞ්ගයෙන් ද විභක්තියෙන් ද සංඛ්‍යාවෙන් ද යුක්තවිය යුතුයි.**
(සංඛ්‍යා නම් ඒක-බහුවචනයි.)

උඩ දක්වූ වාක්‍යයන්හි වෙසෙසනුලැබූ පදය **පුරිසො** යන්නයි. එයට විශේෂණවූ පදසියල්ල **පුරිසො** යන්න මෙන් පුල්ලිඞ්ගයත් ප්‍රථමාවිභක්තියත් ඒකවචනයත් ගෙන සිටී.

**7· (1) කර්මය හා යෙදෙන විශේෂණපද කර්මවිභක්තියෙන්ම යුක්තවෙති.** උදාහරණ:-

1. රක්ඛසී **බහූ** මනුස්සෙ ඛාදි.
2. වඩ්ඪකී **නානාවිධානි** දාරුභණ්ඩානි කරොති.
3. මනුස්සා **මහන්තං** රුක්ඛං ඡින්දිංසු.
4. කස්සකා **ඛුද්දකං** ඛෙත්තං කසන්ති.
5. වනිතා **රත්තානි** පදුමානි ආහරි.
6. ත්වං **මඤ්ජුභාණකෙ** පක්ඛී පලාපෙසි.
7 අහං **දීඝං** රජ්ජුං ආනෙස්සාමි.
8. මයං **සීලවන්තෙ** භික්ඛූ වන්දිස්සාම
9. කඤ්ඤා **සෙතානි** වත්ථානි පරිදහති.
10. චොරො **තිඛිණං** සත්ථං හරි.

## අභ්‍යාසය 3.

මේ වාක්‍යයන්හි කර්තෘ-කර්ම පදවලට ගැළපෙන විශෙෂණපද එක්කළයුතු:-

1. .........භික්ඛූ ධම්මං දෙසෙන්ති. 2. ත්වං ...........පුඤ්ඤානි කරොසි. 3. මයං ...........ගොණං ආහරිම්හ. 4. .........සීහො ........... හත්ථිං මාරෙසි. 5. වඩ්ඪකී .......... ගෙහානි කරොති. 6. ........... වනිතා ........... පදුමං පූජෙසි 7. .. ...... ගොණො ........ තිණං ඛාදි. 8. අහං ........ වත්ථං පරිදහාමි. 9. කස්සකො ........... පක්ඛී පලාපෙති. 10. ...... ...දාසො ............. අස්සෙ බන්ධි.

නිදෙස්කළයුතු:

1. අහං රත්තානි පදුමං ආහරිං. 2. වනිතා සෙතං වත්ථානි පරිදහිස්සන්ති 3. මනුස්සා මහන්තා රුක්ඛා ඡින්දන්ති. 4. ත්වං දීඝා රජ්ජුං ආනෙහි. 5. මයං සීලවන්තං භික්ඛූ පස්සාම.

පාලියට නැගියයුතු:-

1. මිනිහා මහත්වූ කෙතක් සීසෑවේය. 2. වඩුවෝ කුඩා ගස් කැපූහ 3. මම තියුණු පොරවක් ගෙනෙන්නෙමි. 4. ස්ත්‍රිය ධාන්‍ය කන පක්ෂීන් පලවාහරී. 5. කන්‍යාවෝ දික් ලණු ගෙනෙත්. 6. සොරු දරුණු රකුසියට පහර දුන්හ. 7. වඩුවා රතු වස්ත්‍රයක් හඳී. 8. වඩුවන්ගේ නොයෙක් ලීබඩු මිනිස්සු මිලදී ගනිත්. 9 වෙළෙන්දෝ සුදු රෙදි විකුණත්. 10. ඇත්තු ගුණවත් ස්ත්‍රියක් මැරූහ.

**7.** (2) **තෘතීයාදී අන්‍යවිභක්තීන් හා ද විශෙෂණ පද යෙදියහැක.**

උදාහරණ:-

1. **ධාවන්තං** පුරිසං පස්සි (=දුවන පුරුෂයකු දුටි.
2. **ධාවතා** පුරිසෙන කතං (=දුවන පුරුෂයා විසින් කරන ලදී.)
3. **ධාවන්තානං** පුරිසානං අදාසි (=දුවන පුරුෂයන්ට දුන්නේය.)
4. **ධාවන්තෙහි** පුරිසෙහි අපෙහි (=දුවන පුරුෂයන්ගෙන් ඉවත්වෙව.)

5. **සෙතානං** පුරිසානං අස්සා ධාවන්ති (=සුදුමිනිසුන්ගේ අශ්වයෝ දුවත්.)

6. **නීචෙසු** පුරිසෙසු සගුණො නත්ථි (=නීචමිනිසුන් කෙරෙහි යහපත් ගුණය නැත.)

**7. (3) විශෙෂ්‍ය (වෙසෙසියයුතු) පදය ස්ත්‍රීලිඞ්ගික වේ නම් විශෙෂණපද ද ස්ත්‍රීලිඞ්ගික වෙති.**

1. **සීලවතී** කඤ්ඤා ධම්මං සුණාති (=සිල්වත් කන්‍යා තොමෝ ධර්මය අසයි.)
2. **කාළා** වනිතායො ගාමං අගමංසු (=කළු ස්ත්‍රීහු ගමට ගියහ )
3. තෙ **මහන්තිං** නාවං අභිරුහිංසු (=ඔවුහු මහත් නැවකට නැංගාහ )
4. ඉත්ථියො දීඝා දෙණියො ආරුහිත්වා නදිං තරිංසු (=ස්ත්‍රීහු දික් ඔරුවලට නැගී ගඟ එතර කළහ.)
5. **කොමලාහි** තරුණීහි ගායිතං (=කොමල තරුණියන් විසින් ගායනා කරනලදී.)
6. **දුප්පඤ්ඤාය** නාරියා ධනං අදංසු (=අඥාන ස්ත්‍රියට ධනය දුන්හ.)

**7. (4) නපුංසක ලිඞ්ගික විශෙෂ්‍ය පදයන් හා නපුංසක ලිඞ්ගික විශෙෂණපදම යෙදෙති:-**

1. සරෙ **රත්තං** පදුමං පුප්ඵති (=විලෙහි රත් පියුම පිපේ.)
2. **බහූනි** කුලානි ඉධ වසන්ති (=බොහෝ පවුල් මෙහි වෙසෙති.)
3. තෙ **සෙතානි** උප්පලානි ආහරිංසු (=ඔවුහු සුදු උපුල් ගෙනආහ )
4. සො **මහන්තෙන** පදුමෙන චෙතියං පූජෙසි (=හෙතෙම මහත් පියුමකින් චෛත්‍යය පිදී.)
5. මනුස්සා **උළාරානි** පුඤ්ඤානි **කරොන්ති** (මිනිස්සු උදාරවූ පින් කරති.)
6. කොසලරාජා **ද්වීසු** රට්ඨෙසු රජ්ජං **කාරෙසි** (=කොසොල් රජ (කාශි-කෝශල) දෙරටෙහි රාජ්‍යය කරවිය.)

### අභ්‍යාසය 4.

පහත දැක්වෙන වාක්‍යයන් පාලියට නැගියයුතු:-

1. සුදු ගොන්නු දුවත්. 2. රතු උපුල් ගෙනෙව්. 3. උස් ගසක් කපමු. 4 හෙළපියුම්වලින් චෛත්‍යය පුදව්. 5. සිල්වත් ස්ත්‍රීහු දන් දුන්හ. 6 ඔවුහු කුඩානැවකින් ගඟේ ගියහ. 7. මහත්වූ ගමෙහි බොහෝ ගෙවල් වෙති. 8. තපුරු මිනිසෙක් රතුදෙනට පහරදුන්නේය. 9. කළු ගොණාට තණකොළ දෙව. 10. ධනවත් තරුණියෝ සුදු රෙදි මිලදී ගනිත්.

පහත පෙනෙන වාක්‍යයන් නිදෙස්කළයුතු:-

1. **සෙතො** පුරිසො තිට්ඨති. 2. තෙ **ධාවන්තො** අස්සං බන්ධන්ති. 3. **කාළා** වනිතා පස්සථ. 4 **රත්තානි** පදුමානි ආහරථ. 5. **සෙතෙන පදුමං** පූජෙමි. 6. **මහන්තී** ගොණො ධාවති. 7. **නහායන්තී** වනිතාය හත්ථා හසන්ති. 8. **දුප්පඤ්ඤස්ස** වනිතාය භාතරො කසන්ති. 9. **ධනවන්තො** වනිතා ආගච්ඡන්ති. 10. **සීලවන්තියො** පුරිසා නිසීදන්ති.

---

## ලිඞ්ගපරිවර්තනය

**8. ඇතැම් පුල්ලිඞ්ගික ශබ්දයන් ආ-ඊ-ආදි ස්ත්‍රීප්‍රත්‍යයන් යෙදීමෙන් ස්ත්‍රීලිඞ්ගිකත්වයට පැමිණවියහැක.**

**ආ-ප්‍රත්‍යය** (අකාරාන්තයන් කෙරෙන් පමණයි):-

| **පුම්ලිඟු:** | **ඉත්ථිලිඟු:** |
|---|---|
| ඛත්තිය | ඛත්තියා (=රාජවංශික ස්ත්‍රී) |
| දහර | දහරා (=ළඳුරි) |
| අන්ධ | අන්ධා (=අන්ධ ස්ත්‍රී) |
| බාල | බාලා (=අඥාන ස්ත්‍රී) |
| අස්සද්ධ | අස්සද්ධා (=ශ්‍රද්ධානැත්තී) |
| දුස්සීල | දුස්සීලා (=සිල්නැත්තී) |
| මහාපඤ්ඤ | මහාපඤ්ඤා (=මහනුවණැත්තී) |
| පාපධම්ම | පාපධම්මා (=ලාමක ස්වභාව ඇත්තී) |
| කාළ | කාළා (=කළු ස්ත්‍රී) |
| රස්ස | රස්සා (=මිටි ස්ත්‍රී) |

කකාරයෙන් අවසන්වෙන පුල්ලිඞ්ගික ශබ්දයන් කෙරෙන් ආ-ප්‍රත්‍යය වූ පසු කකාරයට මුලින් ඉකාරාදේශ ද වේ. (මේ ශබ්දයෝ බොහෝ සේම ණ්වු- ප්‍රත්‍යයෙන් සිද්ධවූවෝයි.)

| | |
|---|---|
| සාවක | සාවිකා (=ශ්‍රාවිකාතොමෝ) |
| උපාසක | උපාසිකා (=උවැසිය) |
| මාණවක | මාණවිකා (=තරුණිය) |
| නායක | නායිකා (=නෙත්‍රී, නායක ස්ත්‍රී) |
| කුමාරක | කුමාරිකා (=කුමරිය) |
| ගායක | ගායිකා (=ගීකියන්නී) |
| පරිබ්බාජක | පරිබ්බාජිකා (=පරිව්‍රාජිකාව) |

**ඊ-ප්‍රත්‍යය** (අකාරාන්තයෙන් හා වන්තු-මන්තු ප්‍රත්‍යයාන්තයන් කෙරෙන්)

| | |
|---|---|
| කුමාර | කුමාරී |
| තරුණ | තරුණී |
| සමණ | සමණී |
| බ්‍රාහ්මණ | බ්‍රාහ්මණී |
| සාමණේර | සාමණේරී |
| සකුණ | සකුණී |
| සුනඛ | සුනඛී |
| බිළාල | බිළාලී |
| සීහ | සීහී |
| මිග | මිගී |
| කාක | කාකී |
| වානර | වානරී |
| ගෝතම | ගෝතමී (=ගෞතමගෝත්‍ර ඇත්තී) |
| කුක්කුට | කුක්කුටී |

---

ඇතැම්විට ඊ ප්‍රත්‍යය පරකල්හි න්තු ප්‍රත්‍යයට ත-කාරාදේශ වේ.

| | පුම්ලිඞ්ග: | ඉත්ථි ලිඞ්ග: |
|---|---|---|
| (ප්‍රථමා) | ගුණවා | ගුණවතී; ගුණවන්තී |
| ,, | සීලවා | සීලවතී; සීලවන්තී |
| ,, | පඤ්ඤවා | පඤ්ඤවතී; පඤ්ඤවන්තී |
| ,, | ධනවා | ධනවතී; ධනවන්තී |
| ,, | සතිමා | සතිමතී; සතිමන්තී |
| ,, | බුද්ධිමා | බුද්ධිමතී; බුද්ධිමන්තී |

ඉනිප්‍රත්‍යය (අ-ඉ-ඊ-උකාරාන්තයන් කෙරෙන්)

| | |
|---|---|
| රාජ | රාජිනී |
| යක්ඛ | යක්ඛිනී |
| දීපි | දීපිනී |
| සාමී | සාමිනී |
| මේධාවී | මේධාවිනී |
| භික්ඛු | භික්ඛුනී |
| තපස්සී | තපස්සිනී |
| බ්‍රහ්මචාරී | බ්‍රහ්මචාරිනී |
| මාලී | මාලිනී |
| පක්ඛී | පක්ඛිනී |
| මනාපී | මනාපිනී |
| සුඛී | සුඛිනී |
| පාපකාරී | පාපකාරිනී |

ආනී-ප්‍රත්‍යය (අකාරාන්ත-ඉකාරාන්තයන් කෙරෙන්)

| | |
|---|---|
| මාතුල | මාතුලානී |
| ගහපති | ගහපතානී |
| ඛත්තිය | ඛත්තියානී |
| ආචරිය | ආචරියානී |
| කපිල | කපිලානී |

9 ඇතැම් පුල්ලිඞ්ගික ශබ්දයන්ට ස්වරූපයෙන් වෙනස් වූ ස්ත්‍රීලිඞ්ගික ශබ්ද ඇත්තාහ.

| | |
|---|---|
| පුරිසො | ඉත්ථි |
| පිතා | මාතා |
| භාතා | භගිනී |
| සසුරො (=මාමා) | සස්සු (=නැන්දා) |

(මෙහි කසාදයෙන් වූ නෑකමයි)

| | |
|---|---|
| අස්සො | වළවා, (අස්සා කියාත් වේ) |
| ගොණො | ගාවී |
| පුත්තො | ධීතා; සුණ්හා (කියාත් වේ) |
| ජාමාතා = බෑණා | සුණිසා = ලේලී |
| දෙවො | අච්ඡරා = දෙවඟන |
| යුවා = තරුණයා | යුවතී = තරුණී |
| භත්තා = ස්වාමිපුරුෂයා. | භරියා = භාර්‍යාව |
| සාලො = මස්සිනා | නනන්දා = නෑනා |

## අභ්‍යාසය 5.

**මාතුලො ගහපතිං ගොණං වික්කිණි** යන වාක්‍යයේ පුල්ලිඞ්ගිකශබ්දයන් සත්‍රීලිඞ්ගයට නැගූවිට:–

**මාතුලානී ගහපතානිං ගාවිං වික්කිණි** යි සිටී.

**සස්සු ගුණවතිං සුණිසං අක්කොසි** යන වාක්‍යයේ සත්‍රීලිඞ්ගික ශබ්දයන් පුල්ලිඞ්ගයට නැගූවිට:–

**සසුරො ගුණවන්තං ජාමාතරං අක්කොසි** යි සිටී.

මේ **අනුව** පහත පෙනෙන වාක්‍යයන් පුල්ලිඞ්ගයටත් සත්‍රීලිඞ්ගයටත් පෙරළියයුතු:–

1. රාජා කුමාරෙහි සද්ධිං ගන්ත්වා උය්‍යානෙ මිගෙ පස්සි. 2. සසුරො ජාමාතරා සද්ධිං ගොණෙ වික්කිණිතුං නගරං අගමාසි. (නගරශබ්දය 'නගරී' යයි සත්‍රීලිඞ්ගයට නැගිය හැක.) 3. භික්ඛූ ච සාමණෙරා ච උපාසකා ච බ්‍රාහ්මණා ච රාජානො ච ධම්මසවණාය සන්නිපතිංසු. 4. භගිනියො ගහපතානීනං සන්තිකං ගන්ත්වා තාසං ධීතරානං සකුණියො අදංසු. 5. මෙධාවිනී ඛත්තියානී බ්‍රහ්මචාරිනිං තපස්සිනිං උපට්ඨාසි. 6. තස්මිං අරඤ්ඤෙ බහූ සීහියො ව්‍යග්ඝියො දීපිනියො සිගාලියො මිගියො සකුණියො ච වසන්ති 7. සීලවා සාමණෙරො පබ්බජන්තො භික්ඛූ උපට්ඨහිත්වා ගුණවා භවති. 3. අන්ධො මාණවකො රඤ්ඤො සන්තිකං පත්වා එකං අස්සං යාචි. 9. තාසං ඉත්ථීනං ධීතරො සස්සූනං ගාවියො තිණං ඛාදපෙසුං. 10. සසුරො ජාමාතුනො පුත්තස්ස සුනඛං කුක්කුටං ච අදාසි.

**10.** සත්‍රියට පර්‍යායනාමයක්වූ **මාතුගාම ශබ්දය නියත පුල්ලිඞ්ගිකයි;** නමුත් එය හා යෙදෙන විශෙෂණපද ඇතැම්විට සත්‍රීලිඞ්ගයෙන් යෙදී තිබේ:–

### අංගුත්තරපඤ්චකනිපාතයෙහි:

1. "කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චා මාතුගාමො **දුබ්බණ්ණා** ච හොති **දුරූපා සුපාපිකා** දස්සනාය, දළිද්දා ච හොති **අප්පස්සකා අප්පභොගා**? (සුමනා සුත්ත.)

**පඤ්චකනිපාතයෙහිම:**

2. "සල්ලපෙ අසිහත්ථෙන, පිසාචෙනපි සල්ලපෙ,
තත්වෙව **එකො එකාය මාතුගාමෙන** සල්ලපෙ."

ප්‍රථමනිදර්ශිතයෙහි 'එකවෙචා' යන සර්වනාමවිශෙෂණය පුල්ලිඞ්ගයෙන් ද ඉතිරි විශෙෂණ සය ස්ත්‍රීලිඞ්ගයෙන් ද යෙදී තිබේ.

ඇතැම්තැනක මෙසේ වුවත් මාතුගාම ශබ්දයට පුල්ලිඞ්ගික විශෙෂණත් යෙදියහැකිබව අඞ්ගුත්තරපාළියෙන්ම ප්‍රකටවේ:

**එහි දුකනිපාතයෙහි:**

3. "ද්විත්‍නං භික්ඛවෙ ධම්මානං **අතිත්තො අප්පටිවාණො** මාතුගාමො කාලංකරොති"

**චතුක්කනිපාතයෙහි:**

4. "**කොධනො** ආගතාද මාතුගාමො, **ඉස්සුකී** ආගතාද මාතුගාමො, **මච්ඡරී** ආගතාද මාතුගාමො, **දුප්පඤ්ඤො** ආගතාද මාතුගාමො; අයං ඛො ආගතාද හෙතු යෙන මාතුගාමො නෙව සභාය නිසීදති, න කම්මන්තං පයොජෙති."

---

## ක්‍රියාවිශෙෂණ

**11. පාලිභාෂාවෙහි ක්‍රියාවිශෙෂණපද බොහෝසේ ම නපුංසක - කර්මවිභක්ති - ඒකවචනයෙන් සිටිත්. ඇතැම්විට තෘතීයාඒකවචනයෙන් ද සිටිත්.**

1. "**මුහුත්තමපි** චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා"
(ධම්මපද)

(=ඉදින් ප්‍රාඥතෙමේ **මොහොතක්** වත් පණ්ඩිතයකු සේවනය කෙරේනම් දිව ව්‍යඤ්ජනරසය (වහා) දැනගන්නාසේ **වහා** ධර්මය අවබොධකෙරේ.) මෙහි **මුහුත්තං, ඛිප්පං** දෙක ක්‍රියාවිශෙෂණයි. නවත් උදාහරණ:-

2. "තෙසං හි භගවා කප්පාසිකවනසණ්ඩෙ **පඨමං** ධම්මං දෙසෙසි" ධ. අ.

3. "**සුසුඛං** වත ජීවාම වෙරිනෙසු අවෙරිනො"
(ධම්මපද)

4. "මා **බාළ්හං** පරිදෙවෙසි **ඛිප්පං** බන්ධාහි භණ්ඩිකං"
(කුණ්ඩලකෙසීවත්ථු)

5. "**සධම්මං** ගිහිභාවෙ ආදීනවං කථෙත්වා ඉදානි **අභිණ්හං** ගුණං කථෙති." ධ. අ.

6. A "එස මයා දින්නං **ඛිප්පං** ගණ්හාති" B "ථෙරො තස්ස ගෙහෙ **නිබද්ධං** භුඤ්ජති." ධ. අ.

7. "තං **සක්කච්චං** භොජෙත්වා තස්ස පත්තං **සාධුකං** ධොවිත්වා නානග්ගරසභොජනස්ස පූරෙත්වා ......................
'ඉම්මස්ස පිණ්ඩපාතං දදෙය්‍යාථා' ති ආහ."
ධ. අ. ජම්බුකාජීවක.

8. A "**සණිකං** උපායෙන පුච්ඡිස්සාමීති චින්තෙත්වා අම්මෙව ආහ." B සා මෙ **නිච්චං** ඔතාරමෙව ගවෙසති."
ධ. අ. උදෙනවත්ථු.

## තෘතීයාවට උදාහරණ:

1. "මච්ඡරියසෙට්ඨිං **මුහුත්තකෙන** දමෙත්වා ............සත්ථු සම්මුඛං කත්වා සොතාපත්තිඵලෙ පතිට්ඨාපෙසි" ධ. අ.

2. "භූමියං නිපජ්ජිත්වා සම්පරිවත්තමානා **කිච්ඡෙන** දාරකං විජායිත්වා ..........." (පටාචාරාවත්ථු.)

3. "ඉදානි පන මෙ චිත්තං නිබ්බුතං භවිස්සති, **සුඛෙන** ච සයිතුං ලභිස්සාමි." (උදෙනවත්ථු.)

## අභ්‍යාසය 6.

මෙ වාක්‍යයන්හි ඒ ඒ තැනට ගැළපෙන ක්‍රියාවිශෙෂණ යෙදියයුතු: 1. අස්සා.......... ධාවන්ති 2. දාරකො ...... ...... කීළිත්වා ගෙහං අගමාසි. 3. පඤ්ඤවන්තා....... ධම්මං විජානන්ති. 4. ධනවන්තා මඤ්චෙසු ..........සයන්ති. 5. සම්ම, මා........... අඤ්ඤස්ස අගුණං කථෙහි. 6. භගවා...........භික්ඛූනං අප්පමාදෙන ඔවදි. 7. යාවාහං ආගච්ඡාමි .... ........ ඉධෙව තිට්ඨාහි. 8. මනුස්සා ......... ගන්ත්වා ආසනානි පඤ්ඤපෙසුං, පච්ඡා භික්ඛූ අගමංසු. 9. තෙ භික්ඛූ නිසීදාපෙත්වා..... ......භොජෙසුං. 10. භොජනාවසානෙ.........පත්තෙ ධොවිංසු.

## සංඛ්‍යාවිශේෂණ

12. **නාමපද වූ සත්ත්ව-ද්‍රව්‍යාදීන්ගේ විශේෂණයෝත් නාමපදම වෙති.** නාමපදයෝ වනාහි නාමනාම-සමාසනාම-තද්ධිතනාම - කිතකනාම - සංඛ්‍යානාම - සර්වනාමාදි ප්‍රභේදයෙන් යුක්තවෙති. ඔවුනතුරෙන් සංඛ්‍යානාමයන් අන්පදයන්ට විශේෂණවන ආකාරය මෙහි දක්වනු ලැබේ.

1 **එකා** ඉත්ථී **ද්වෙ** පුත්තෙ විජායි.

2 **චත්තාරො** පුරිසා අට්ඨ ගොණෙ හරිංසු.

3 **පඤ්ච** වාණිජා **දසහි** සකටෙහි භණ්ඩානි ආහරිංසු.

4 **තිස්සන්නං** වනිතානං **ඡ** පුත්තා **ඡ** ධීතරො ච සන්ති.

5 **දසහි** ගාමෙහි **සතං** මනුස්සා ආගමිංසු.

6 අට්ඨසු ගෙහෙසු **පඤ්චතිංසති** ජනා වසන්ති.

7 **ද්වාදස** උපාසකා **ඡන්නං** භික්ඛූනං **ඡ** චීවරානි අදංසු.

8 **පඤ්චන්නං** දාසානං **පඤ්චදස** පුත්තා **වීසති** මහිසෙ නෙත්වා ඛෙත්තං කසිංසු.

9 **එකො** ධනවා අත්තනො **චතුන්නං** පුත්තානං එකෙ-**කස්ස සහස්සං** රූපියානි **සතං** ගාවො ච අදාසි.

10 ලඞ්කාදීපපාලකා **එකස්මිං** වස්සෙ රූපියානං **ද්වාදස කොටියො අසීති සතසහස්සානි** ච නානාබලීහි ලභන්ති.

(මොවුන්ගේ අර්ථ විවරණයෙන් දතයුතු.)

---

සංඛ්‍යාවන්ගේ ලිඞ්ගභෙදයත් වරනැගෙන ආකාරයත් **පාලිභාෂාවතරණ** ප්‍රථමභාගයෙහි දක්වන ලදී. මෙහිදී නැවත එය බලා හොඳින් ධාරණයකොට ගතයුතුයි. ද්වි ශබ්දයේ පටන් **අට්ඨාරස** ශබ්දය දක්වා සංඛ්‍යාවෝ බහුවචනයෙන් පමණක් යුක්තවෙති, ඔවුන්ගේ ඒකවචන නැත්තාහ.

13. **එකූනවීසති (19) පටන් අට්ඨනවුති (98) දක්වා සංඛ්‍යාවෝද කෝටිය පටන් කෝටිප්පකෝටිය දක්වා ශබ්දයෝද ස්ත්‍රීලිඞ්ග එකවචනයෙන් යුක්තවෙති.** නමුත් 'විස්සේ කොටස් හතරක්' ''සියේ කොටස් අටක්'' යනාදි වශයෙන් වෙන් වෙන් කොටස්ගණන් ප්‍රකාශකරන කල්හි බහුවචනයෙන්ද සිටිත්.

**14. ඒකූනසත (99) ශබ්දයේ පටන් 'සතසහස්ස' හෝ ලක්ඛ — ශබ්දය දක්වා ශබ්දයෝ නපුංසකඒකවචනයෙන් යුක්තවෙති.** කොටස් වශයෙන් කියනුලබන කල්හි ඔවුහුද බහුවචනයෙන් සිටිත්.

උඩ දැක්වූ වාක්‍යයන් අතුරෙන් 5 වැන්නෙහි "සතං මනුස්සා" යන තැන **මනුස්සා** පුල්ලිඟු බහුවචනයි, **සතං** නපුංසක **ඒ**කවචනයි විශේෂණපදය විශේෂ්‍යපදයාගේ ලිඞ්ග - සංඛ්‍යාවන් ගතයුතු වුවත් සතශබ්දය නියත නපුංසකලිඟු ඇතිහෙයින් මනුස්ස-ශබ්දයාගේ ලිඞ්ගය නොගනී.

**15. නියතලිඞ්ග ඇති** හෙවත් අසුවල් ශබ්දය අසුවල් ලිඞ්ගයෙහි පමණක් වේයයි නියමිතවූ **ශබ්දයන් අන්‍යලිඞ්ගික ශබ්දයන් හා විශේෂණවනවිට ස්වකීය නියතලිඞ්ගය අත්නොහරිති.**

8 වෙනි වාක්‍යයෙහි "වීසති මහිසෙ" යන තැන **වීසති** ස්ත්‍රීලිඞ්ග කර්මවිභක්ති ඒකවචනයි, **මහිසෙ** පුල්ලිඞ්ගකර්මබහුවචනයි. මේ දෙක ලිඞ්ගයෙන් ද වචනයෙන් ද වෙනස්ව විභක්තියෙන් පමණක් සමානව විශේෂණ විශේෂ්‍යව සිටී.

10 වෙනි වාක්‍යයෙහි "ද්වාදස කොටියො, අසීති සතසහස්සානි" යන පද අන්පදයන්ගේ විශේෂණ නොවෙති. නමුත් කොටස් වශයෙන් සංඛ්‍යාවන් දක්වන ආකාරයට නිදර්ශන වශයෙන් මෙහි ඇතුළත් කරනලදී. "රුපියල් (පිළිබඳ) කෝටි දෙළසක් ද ලක්ෂ අසූවක් ද"යි අර්ථ දතයුතුයි.

### පොත්වලින් උපුටාගත් නිදර්ශන:

1. "**ඡන්නාසීති සතසහස්සානි** ඡළභිඤ්ඤා මහිද්ධිකා
දීපඞ්කරං ලොකවිදුං පරිවාරෙන්ති සබ්බදා"
(බුද්ධවංසපාළි)

(=ෂඩභිඥා ඇති මහත්සෘද්ධි ඇති සාරලක්ෂයක් රහත්හු හැම කල්හි දීපඞ්කර සම්බුදුන් වහන්සේ පිරිවරත්.)

2. "**සතසහස්සවස්සානි** ආයු තස්ස මහෙසිනො" (=ඒ සම්බුදුන් වහන්සේගේ ආයුෂය අවුරුදු ලක්ෂයකි.) බුද්ධවංසපාළි. "සතසහස්සවස්සානි" යන්න "ආයු" යන ඒකවචනයට විශේෂණයි.

3. "පුන නාරදකූටම්හි පවිවෙකගතෙ ජිනෙ
**ඛීණාසවා** වීතමලා සමිංසු **සතකොටියො**"
(බුද්ධවංසපාළි)

(=නැවත සම්ඳෙයන් වහන්සේ නාරදකුටියෙහි විවෙකීව වසන කල්හි පහවූ කෙලෙස් ඇති සියක් කෝටියක් රහත්හු රැස්වූහ.) මෙහි "සතකොටියො" යන ස්ත්‍රීලිඞ්ගබහුවචනය "ඛීණාසවා" යන පුල්ලිඞ්ගික ශබ්දයට විශෙෂණයි.

4. "**තිංසාය** වස්සසහස්සෙහි ලොහකුම්භිමුඛං පත්වා එකෙකං ගාථං වත්තුකාමා හුත්වා" (=තිස්දහසක් හවුරුද්දෙන් ලෝ සැළියේ මුවවිට (ගැටිය) ට පැමිණ එක් එක් ගාථාව කියනු කැමැත්තෝවැ (ධම්මපදඨකථා — 219) මෙහි **තිංසාය** යන ඒක වචනය "වස්සසහස්සෙහි" යන බහුවචනයට විශෙෂණවේ.

5. "ඉමස්මිං ජම්බුදීපෙ **එකසතං** රාජානො **එකසතං** අග්ගමහෙසියො" (=මේ දඹදිව එක්සියයක් රජවරු ද එක්සියයක් මෙහෙසියෝ ද වෙති.) ධ. අ. (221) "මෙහි **එකසතං** යන නපුංසක ඒකවචනය පුල්ලිඞ්ග - ස්ත්‍රීලිඞ්ගයන්හි බහුවචනයන්ට විශෙෂණව සිටී.

6. "කස්සපො භගවා........**වීසතියා** ඛීණාසවසහස්සෙහි සද්ධිං චාරිකං චරමානො බාරාණසිං අගමාසි" (=කාශ්‍යප සම්ඳෙයන් වහන්සේ................විසිදහසක් රහතන් වහන්සේ සමග චාරිකාවෙහි හැසිරෙමින් බරණැසට වැඩිසේක.)

ධම්මපදඨකථා (219.)

## අභ්‍යාසය 7.

මේ වාක්‍යයන් පාලියට නැගියයුතු.

---

1. ගම් විස්සකින් පන්සියයක් මිනිස්සු ආහ. 2. අපි ගොණුන් විසිදෙනෙකුන්ට තණකොළ දුනිමු. 3. ඔවුහු තිස් නමක් භික්ෂූන්ට සිවුරු විසිපහක් දුන්හ 4. ගොවියෝ හතළිස් දෙනෙක් ගොණුන් අසූවක් මිලදී ගත්හ 5. ස්ත්‍රීන් සතරදෙනාගේ පුත්‍රයෝ සතරදෙන රුපියල් හාරදහසකින් ගෙවල් සතරක් සෑදවූහ 6. දාසයෝ අටදෙන පොරෝ අටකින් ගස්හැටක් කැපූහ. 7. ගෙවල් සියයක දහසක් මිනිස්සු වෙසෙත්. 8. දීපඞ්කර සම්ඳෙයන් වහන්සේ සාරලක්ෂයක් රහතන් වහන්සේ සමග අමර නගරයට පිවිසිසේක.

ඉලක්කම් වලින් දක්වා තිබෙන ගණන්වලට
පාලිවචන යෙදියයුතු:

1. 4 ඉත්ථියො 4 පුත්තානං 4 අම්බෙ අදංසු. 2. 10 වාණිජා 500 සකටෙහි භණ්ඩානි හරිංසු. 3 ධනවා අත්තනො 2 භාතරානං 200 රූපියානි අදාසි. 4. 20 මනුස්සා 500 භික්ඛූනං දානමදංසු. 5. එකො ධනවා 5000 රූපියෙහි චෙතියං කාරාපෙසි. 5. රාජා 20 වාණිජානං 10000 රූපියානි දත්වා 50 අස්සෙ ගණ්හි. 7. අනාථපිණ්ඩිකො 540000000 විස්සජ්ජෙත්වා ජෙතවනමහාවිහාරං කාරෙසි. 8. සො නිබද්ධං 500 භික්ඛූ භොජෙසි.

---

## 16 සර්වනාමවිශෙෂණ.

1. **තාසං** ඉත්ථීනං **කතමා** පසන්නවතී?

2. **තයො** පුරිසා **එකං** වනං අගමංසු, තෙසු එකො **ඉතරෙසං** ද්වින්නං ද්වෙ ව්‍යග්ඝෙ දස්සෙසි.

3. **සබ්බාසං** වනිතානං **සබ්බෙ** භත්තාරො **අඤ්ඤං** ගාමං අගමංසු.

4. **තස්ස** පුරිසස්ස **තෙ** පුත්තා **තස්මිං** ඨානෙ ඨත්වා **තං** ගොණං **කෙන** දණ්ඩෙන පහරිංසු.

5. **ඉමිස්සා** ඉත්ථියා **අයං** ධීතා **ඉමාය** සූචියා **ඉදං** වත්ථං සිබ්බි.

6. **ඉමෙසං උභින්නං** පුරිසානං **සබ්බං** ධනං **කෙහි** චොරෙහි ථෙනිතං.

7. "තිස්ස, මහල්ලකභික්ඛූනං **සබ්බමෙතං** වත්තං කාතුං වට්ටති. ............**එතෙ** භික්ඛූ ඛමාපෙහීති" චූළතිස්ස. ධ. අ.

8. "සො නිමුජ්ජිත්වා **අඤ්ඤෙන** ඨානෙන පලායි." "**අඤ්ඤං** තෙ කුමාරිකං ආනෙස්සාමි." "**තස්මිං** සමයෙ සත්ථා පරිසමජ්ඣෙ ධම්මං දෙසෙති." ධ. අ.

9. "**තස්මිං** ඛො පන නිවෙසනෙ **සබ්බෙව** දාසකම්මකරා විසාඛාය සන්තකාව." "**එතෙන** හි අග්ගිනා සදිසො අග්ගි නාම නත්ථීති එවං **ඉමස්මිං** කාරණෙ සා නිද්දොසාව අහොසි" ධ. අ. විසාඛාවත්ථු

10. "තුම්හෙ **කෙනාකාරෙන** ගතාති?" "**උභොහි** හත්ථෙහි ජණ්ණුකානි ඔලම්බිත්වා නිත්ථුනන්තො........අම්හි හු ඛො කිඤ්චි ගෙහෙති ආහ." ධ. අ. 205.

### අභ්‍යාසය 8.

පාලියට නැගියයුතු:-

1. ඒ පුරුෂයන් අතුරෙන් කවරෙක් බලවත් වේද? 2. අසවලා මේ ගමේ සියලු ගෙවල් දන්නේයයි කවරකුට කියහැකිද? 3. සොහොයුරන් දෙදෙනාගේ සියලු දරුවෝ එක්තරා වනයකට ගොස් බොහෝ මුවන් මැරූහ. 4. මේ ගෘහපතියාගේ දියණියන් විසින් අර ශාලාවේදී මේ රෙදි වියන ලදහ. 5. මව්පියන් දෙදෙනාගේ (උභශබ්දය යොදනු.) සියලු ධනය ඔවුන්ගේ දරුවන් සතරදෙනාට දෙනලදී. 6. අර ස්ත්‍රීන් දෙදෙනාගේ ස්වාමිවරු දෙදෙන අන් ගමකට ගොස් මේ ගොනුන් විසිදෙන ගෙනාහ. 7. මේ නුවර සියලු ගෘහපතීන්ගේ දාසයෝ අර විල්වලින් රතුනෙළුම් ගෙනවුත් අන් චෛත්‍යයකට පිදූහ. 8. කුමක්හෙයින් තොපගේ සහෝදරයෝ අන්‍යයන්ගේ ගොනුන්ට පහරදෙත්ද?

---

## 17. සමාසවිශෙෂණං.

1. "සො.........**ධමනිසන්ථතගත්තො** **ආලසියාභිභූතො** **කච්ඡුපරිකිණ්ණො** අහොසි" ධ. අ. 147.

2. "**අසීතිසකටමත්තානි** ඛදිරදාරූනි ආහරාපෙත්වා පූරෙ-ත්වා." ධ. අ.

3. **සබ්බසෙතස්ස** හත්ථිපොතකස්ස දායකො **එකචාරිකො** හත්ථි සාරිපුත්තත්ථෙරො අහොසීති" ධ. අ. රාධත්ථෙර

4. "**කතභත්තකිච්චෙන** ථෙරෙන සද්ධිං මධුරපටිසන්ථාරං කත්වා එවමාහ." ධ. අ. අග්ගසාවක.

5 "**පියංවදෙ** කරවීකසකුණෙ **මධුරරසං** සහකාරඵලං මුඛතුණ්ඩකෙන පහරිත්වා පග්ඝරිතරසං සායිත්වා....... **සකල වනගහණනිස්සිතං** සත්තකායං මත්තං... .......... කරොන්තො .........විරවති" (මහාබොධිවංස)

6. "**පාතුභූතසත්තරතනො** රාජා කාලිඞ්ගො චක්කවත්තී එකදිවසං **සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො** **මාලාවිලෙපනධරො** ............**සබ්බසෙතං** **කෙලාසකූටපටිභාගං** ගජරතනමාරුය්හ .............මාතාපිතූනං අස්සමපදං පායාසි."

(මහාබොධිවංස.)

7. "සාවත්ථියං අනාථපිණ්ඩික - විසාඛාදි - පඤ්චකොටිමත්තා අරියසාවකා සත්තකොටිමත්තා කල්‍යාණපුථුජ්ජනා ච ගන්ධමාලාදයො ආදාය සන්නිපතිංසු." (මහාබොධිවංස.)

8. "සත්තරතනමයං වෙදිකං කාරාපෙත්වා සුවණ්ණමිස්සකං වාලුකං ඔකිරිත්වා පාකාරෙන පරික්ඛිපිත්වා සත්තරතනමයං ද්වාරකොට්ඨකං කාරාපෙසි" (මහාබොධිවංස.)

9 "තිංසයොජනිකං මග්ගං ගන්ත්වා උත්තුඞ්ගතරඞ්ගභඞ්ගාභිරාමං ගඞ්ගං නදිං උත්තරිත්වා ඛරරාජගහං රාජගහං නාම අතිමනොහරං නගරං පවිසිත්වා තත්ථ ඉස්සරියමදමත්තං ජනං පරිභාසෙන්තො විය සන්තින්ද්‍රියො සන්තමානසො ......... පිණ්ඩාය චරිත්වා... ...විරොචමානො නිසීදි" (මහාබොධිවංස)

10. "දසසතනයනො විජයුත්තරං නාම වීසංරතනසතිකං සාමං භුවනවිවරව්‍යාපිනාදං සඞ්ඛං ධමයන්තො අට්ඨාසි" (මහා-බොධිවංස.)

---

### 18. එක් විශෙෂ්‍යපදයකට විශෙෂණ බොහෝ ගණනක් එකවිට යෙදියහැක.

1. සීලවා ධනවා පුරිසො ගච්ඡති.
2. වනචරකා මහන්තානි සෙතානි පදුමානි ආහරන්ති.
3. කාලා දුස්සණ්ඨා ඉත්ථි සෙතං සුඛුමං වත්ථං පරිදහති
4. ධනවන්තො බලවන්තො කාලා පුරිසා ගාමං ගච්ඡන්ති.
5. සෙතා සීලවතී පඤ්ඤාවතී වනිතා මහන්තං නීලං වත්ථං කිණි.
6. ආගච්ඡන්තානං සාහසකාරීනං දසන්නං තෙසං පුරිසානං කක්ඛළා දුම්මුඛා පුත්තා මහන්තෙන සෙතවණ්ණෙන අස්සගොණෙ මාරෙසුං.
7. ලක්ඛණවන්තො බලවා දාසො ධාවන්තං රත්තං කූටගොණං දීඝාය දළ්හාය රජ්ජුයා බන්ධිත්වා එකස්මිං මහන්තෙ දළ්හෙ ථම්භෙ උපනිබන්ධි
8. මහාපුරිසො - සෙතකාකොසාඛ - චම්පකාදිනානාතරුසණ්ඩමණ්ඩිතං මිගතුරගනාගවිහඞ්ගසාදිචතුප්පදගණානුචරිතං දෙවදානවාදිනානාභූතසන්නිසෙවිතං අනෙකවිධරතනාකරං සුරකින්නරනාගරඞ්ගමණ්ඩලං හිමවන්තං අපෙක්ඛාගසි.

9. **මොහන්ධකාරවිධංසකො ධම්මදීපඞ්කරො ලොක සිවඞ්කරො දීපඞ්කරො** නාම **අනුත්තරො** සම්මාසම්බුද්ධො **වර රුචිරදස්සනෙ ජනනෙත්තමනොහරෙ සුදස්සනමහාවිහාරෙ** විහරති.

10. "සො...................... දීපඞ්කරලොකනාථං **සුනිවත්ථං සුපාරුතං සන්තින්ද්‍රියං සන්තමානසං ලක්ඛණානුබ්‍යඤ්ජනස්ස** භා**සමන්නනං** ඡබ්බණ්ණබුද්ධරංසියො **විස්සජ්ජෙන්තං අරියගණ පරිවුතං අලංකතමග්ගපටිපන්නං** දෙවමනුස්සෙහි **පූජියමානං** දිස්වා................ අවකුජ්ජො හුත්වා .................... **කලලපිට්ඨෙ** නිපජ්ජි." (මහාබොධිවංස)

11. **මහන්තානි මහන්තානි** පබ්බතකූටානි **ධූපායන්තානි පජ්ජලන්තානි** ආකාසෙනාගන්ත්වා බොධිසත්තං පත්වා දිබ්බමාලාගුළභාවං ආපජ්ජිංසු.

---

## භින්නාධිකරණ විශෙෂණ

**19.** මින් පෙර විශෙෂණ ගැන දක්වූ සියල්ල සමානාධිකරණ විශෙෂණ ගැනයි **යම් තැනක විශෙෂණය විශෙෂ්‍යයාගේ ලිඞ්ගවිභක්තිසඞ්ඛ්‍යාවන් ගනී නම් එය සමානාධිකරණ විශෙෂණයයි. යම් තැනක ඒ දෙදෙනාගේ සමානලිඞ්ගවිභක්ති සඞ්ඛ්‍යාවලින් සිටීමක් නැත්නම් එය භින්නාධිකරණයයි.**

**බ්‍රාහ්මණස්ස** පුත්තො (=බමුණාගේ පුත්‍රයා)
**තස්සා** මාතාපිතරො (=ඇගේ මවුපියෝ)
**රඤ්ඤො** ඡත්තං (=රජුගේ ඡත්‍රය)
**භික්ඛුනො** චීවරං (=භික්ෂුවගේ සිවුර)
**සෙට්ඨිනො** පාසාදො (=සිටුහුගේ ප්‍රාසාදය)

ආදි සම්බන්ධවිභක්තියෙන් යුත් පද බොහෝසේම භින්නාධි **කරණවිශෙෂණ** වෙති.

**භින්නාධිකරණ විශෙෂණ තෘතීයාවෙන් ද සිටිති.**

"එකූනතිංසො **වයසා** සුභද්ද
යං පබ්බජිං කිං කුසලානුඑසී."

(=සුභද්‍රය, මම **වයසින්** එකුන්තිස් හවුරුදු ඇත්තේ කුශලය කුමක්දැයි සොයමින් පැවිදිවීමි) මහාපරිනිබ්බාණසුත්ත. මෙහි "වයසා" යන්න කරණාර්ථයෙහි හෝ අන්‍යාර්ථයෙක්හි නොවේ, 'එකූනතිංසො' යන්නට විශෙෂණවශයෙන්ම සිටිනෙයි.

2. "විපස්සී මාරිස, භගවා අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො **ජාතියා** අහොසි.................... කොණ්ඩඤ්ඤො **ගොත්තෙන**" (=භවත්නි, විදර්ශී අර්හත් සම්‍යක්සම්බුඩතෙමේ **ජාතියෙන්** ක්ෂත්‍රිය විය, ගොත්‍රයෙන් කෞණ්ඩින්‍ය විය.) මහාපදානසුත්ත.

3. "තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො
සාරිපුත්තොති **නාමෙන** හෙස්සති අග්ගසාවකො"

(=ඒ සර්වඥයන්වහන්සේගේ ධර්මයන්හි දායාදයෙක්වූ ඖරසවූ ධර්මනිර්මිතවූ නමින් සැරියුත් නම්වූ අග්‍රශ්‍රාවකයෙක් වන්නේය.) අපදානපාළි 19.

4. "**වාමෙන** සූකරො හොති – **දක්ඛිණෙන** අජාමිගො,
**සරේන** නෙලකො හොති – **විසාණෙන** ජරග්ගවො."
(සම්මොහවිනොදනී.)

---

# පරිවර්තනපරිචය.

## සිංහල පාළියට නැගීම.

### 1. සාමාන්‍ය කථොපකථන. I.

1. තෝ (උඹ) පාළිභාෂාව දන්නෙහි ද?

ත්වං පාළිභාසං ජානාසි?

උඹ (=ඔබ) යන්න මධ්‍යම පුරුෂයෙහි යෙදෙන්නේ නොවේ. මධ්‍යම පුරුෂයෙහි යෙදෙන "තෝ, තෙපි" යන වචන පහත් අයට පමණක් ආමන්ත්‍රණය සඳහා මෙකල යොදන බැවින් ශිෂ්ටකථාවේදී එවැනි පදයක් යෙදීමත් යුතු නොවේ. පාළියෙහි "ත්වං, තුම්හෙ" යන පදයන් කාටත් යෙදිය හැකි බව සැලකියයුතු.

2. මම ටිකක් දනිමි.

අහං ථොකං ජානාමි.

3. ඔබට පාළියෙන් කථාකරන්ට හැකිද?

සක්කොසි ත්වං පාළිභාසාය සල්ලපිතුං?

4. ඔව්, මට ටිකක් කථා කළ හැක.

ආම, අහං ථොකං සල්ලපිතුං සක්කොමි

5. ඔබේ නම කුමක්ද? කවර නමැත්තෙක් වෙහිද?

තුය්හං නාමං කිං? කින්නාමො'සි?

6. මාගේ නම විජයබාහුය.

අහං විජයබාහු-නාමොම්හි.

7 තෝ කොහි වෙසෙහි ද?

ත්වං කත්ථ වසසි?

8. මම කොළඹනගරයෙහි වසමි.

අහං කොළම්බනගරෙ වසාමි.

9. ඔබේ වයස කොපමණද?

කිත්තකං තුය්හං ආයුප්පමාණං?

10. මම විසිඅවුරුදු වයස් ඇත්තෙමි.

අහං වීසතිවස්සොම්හි (ආයුනා.)

11. මගේ වයස අවුරුදු පසළොසකි.

මය්හං ආයුප්පමාණං පණ්ණරස වස්සානි.

12. තාගේ මවුපියවරු කොහි වෙසෙත්ද?

තුය්හං මාතාපිතරො කුහිං වසන්ති?

13. ඔවුහු දුන් දකුණු පලාතේ වසත්.

තෙ'දානි දක්ඛිණදෙසෙ වසන්ති

14. ඔබට සහෝදර-සහෝදරියෝත් සිටිත්ද?

තුය්හං භාතුභගිනියො'පි සන්ති නු?

15. එසේය, මට සොහොයුරෝ සිවුදෙනෙක් ද සොහොයුරියෝ දෙදෙනෙක් ද වෙති.

ආම, මය්හං චත්තාරො භාතරො ද්වෙ භගිනියො ච සන්ති.

16. ඔබගේ සොහොයුරෝ කුමක් කරත්ද?

තව භාතරො කිං කරොන්ති?

17. ඔවුනතුරෙන් වැඩිමහල්ලා වෙළෙන්දෙකි, දෙවෙනියා ලියන්නෙකි, ඉතිරි දෙදෙන තවම ඉගෙනගනිත්.

තෙසු වුඩ්ඪතමො වාණිජො, දුතියො ලෙඛකො, ඉතරෙ ද්වෙ තාව උග්ගණ්හන්ති.

18. තෝ මෙහි කවද ආයෙහිද?

කදා ත්වං ඉධා' ගතො'සි?

19. ඊයේ සවස මම මෙහි ආවෙමි.

හීයො සායණ්හෙ' හං ඉධා' ගච්ඡිං.

---

## 2. සාමාන්‍ය කථොපකථන ii.

20. ඔබ කවරෙක් ද? 20. කො'සි ත්වං?

21. මම මිහිරෙක් මි. 21. අහමෙකො පථිකො

22. කොයි සිට එහිද? 22. කුතො ආගච්ඡසි?

23. මම ඉන්දියාවෙන් ආවෙමි.

අහං ඉන්දුදෙසතො ආගතො'මහි.

24. කුමක් කරන්ට ආයෙහි ද?

කිං කාතු මාගතො'සි?

25. බඩු වගයක් විකුණන්ට ආවෙමි.

එකච්චානි භණ්ඩානි වික්කිණිතු මාගමිං.

26. තොපගේ පියා කුමක් කරන්නේද?

තුය්හං පිතා කිං කම්මං කරොති?

27 මගේ පියා මහානාම නම් වෙළෙන්දෙකි.

මය්හං පිතා මහානාමො නාම වාණිජො.

28. මෙහි තාගේ මිත්‍රයෙක් හෝ අඳුනන්නෙක් සිටී ද?

කො ඉධ තව මිත්තො වා සන්දිට්ඨො වා?

29. මාගේ මිත්‍ර වෙළෙන්දෙක් කුමාරවීථියෙහි වසයි.

මය්හං මිත්තො එකො වාණිජො කුමාරවීථියං වසති.

30. තෝ මෙතැනින් කොහාට යන්නෙහි ද?
ඉතො ත්වං කතරං ඨානං ගච්ඡසි?

31. මම මෙයින් අන්‍ය නුවරකට යන්නෙමි.
ඉතො'හං අඤ්ඤං නගරං ගමිස්සාමි.

32. (තෝ) මේ පෙදෙසට ප්‍රියකෙරෙහි ද?
පියායසි ත්වම්මං පදෙසං?

33. ඉතා උෂ්ණ නොවන්නේ නම් මම මේ පෙදෙසට ප්‍රිය කරමි.
පියායෙය්‍යම්මං සචායං නාච්චුණ්හො භවෙය්‍ය.

34. (තෝ) කවදා සියරටට යන්නෙහි ද?
කදා ත්වං සකරට්ඨං පටිගමිස්සසි?

35. සෑහෙන තරම් මුදලක් ලැබුණුවිට මම යන්නෙමි.
යදා පහොනකං මූලං ලභිස්සාමි, තදා ගමිස්සාමි.

36. ඔබ ළඟ දැන් කොපමණ මුදලක් තිබේ ද?
කිත්තකං මූලං'දානි තව සන්තිකෙ අත්ථි?

37. රුපියල් 14 ක්ද සත 50 ක්ද ළඟ ඇත්තාහ.
චුද්දස රූපියානි පණ්ණාස සතභාගා ච මම' න්තිකෙ සන්ති.

---

### 3. අණකිරීම් හා අවවාද.

38. සාණ්ටාව (හෝ සීනුව) ශබ්දකරව.
ඝණ්ඨං වාදෙහි.

39. මාගේ ඔරලෝසිය මෙහි ගෙනෙව.
මම හොරාලොචනං ඉධා'හර.

40. අර මිනිසා මෙහි කැඳවව.
තං පුරිසං ඉධ පක්කොසාහි.

41. උඹේ පා සෝදා ගනිත්. 41. තුයහං පාදෙ ධොවාහි.

42. මාගේ පටරෙද්ද අකුලව.
මම කොසෙය්‍යවත්ථං සංහරාහි.

43. මේ සිඟන්නාට සහල්ටිකක් දෙව.

ඉමස්ස යාචකස්ස ථොකං තණ්ඩුලං දෙහි.

44. පෑනක් ගෙනෙන්ට ඒ ළමයා පිටත්කරව.

ලෙඛණිං ආනෙතුං තං දාරකං පෙසෙහි.

45. හැමකල්හි මවුපියන්ට කීකරු වව්.

සදා මාතාපිතුන්නං වචනකරා හොථ.

46. වැඩියන් (වැඩිමහල්ලන්) ට කවටකම් නොකරව්.

මා වුඩ්ඪානං පරිහාසං කරොථ.

47. කිසිවිටෙකත් බොරු නොකියව්.

මා කදාචිපි මුසා භණථ.

48. සියලු ආගමිකගුරුවරුන්ට ගෞරව කරව්.

සබ්බසාමයිකා-සමණානං ගාරවං කරොථ.

49. පාපමිත්‍රයන් හා අසත්පුරුෂයන් සේවනය නොකරව්.

පාපමිත්තෙ අසප්පුරිසෙ ච මා සෙවථ.

50. තිරිසනුන්ට හිංසා නොකරව්.

තිරච්ඡානගතෙ මා හිංසථ

51. අනුන්ගේ දොස් (=සිදුරු) නො සොයව්.

මා පරෙසං ඡිද්දානි ගවෙසථ

52. තමන්ගේ ම දොස් සොයා ඒවා දුරුකරව්.

අත්තනොව වජ්ජානි උපපරික්ඛිත්වා තානි පජහථ.

53. අනුන් සතු ඉදිකටුවක් පමණ දෙයකුත් සොරා නොගනිව්.

පරසන්තකං සූචිමත්තම්පි මා ථෙනෙථ.

---

## 4. පාඨශාලීය ශිෂ්‍යයකු හා කථාවක්.

(මධ්‍යමපුරුෂ ඒකවචනය දැක්විය යුතු නිසා මෙහි "තෝ" යන්න යොදනු ලැබී. සිංහල කථාව්‍යවහාරයේදී එය යෙදීම මෙකල ට යොග්‍යනොවේ )

54. තෝ කුමක්හෙයින් ඊයේ නාවෙහි ද?

කස්මා ත්වං හීයො නාගතො’ සි?

55. ඊයේ මම පියා සමග මලගෙයකට ගියෙමි.

හීයො'හං පිතරා සඞ්ං මතකඝරං අගමාසිං

56 උඹේ පොත් හා ලිපිද්‍රව්‍ය කොහි ද?

කුහිං තව පොත්ථකා ලෙඛණභණ්ඩානි ච?

57. ඒවා මම ශාලාව තුළ මේසයමත තබා ආවෙමි.

තානි'හං සාලබ්භන්තරෙ ලෙඛණඵලකෙ ඨපෙත්වා ආගතොම්හි.

58. තෝ කුමක්හෙයින් අද ප්‍රමාදවී ආයෙහිද?

කස්මා ත්වමජ්ජ චිරායිත්වා ආගතො'සි?

59. අතරමග පාලම කැඩීතිබෙන බැවින් මෙතර වන්ට නොහැකිව ප්‍රමාදවීමි.

අන්තරාමග්ගෙ සෙතුනො භින්නත්තා තරිතුමසක්කො නෙතා චිරායිං.

60. ඒ ළමයා ඔබට කුමක් කීයේද?

කිං සො දාරකො තුය්හං වදි?

61. මුදල් නැති බැවින් ඕනෑ පොත් ගතනොහැකි වීමියි කීය.

මූලාභාවතො ඉච්ඡිතෙ පොත්ථකෙ කිණිතුං න සක්කිංති සො කථෙසි.

62. හෙතෙම ඔබ! කැඳවූයේ කුමක් පිණිසද?

කිමත්ථාය සො තං පක්කොසි?

63. මගෙන් පොතක් ලබාගනු කැමතිව හෙතෙම මා කැඳවීය.

මම සන්තිකා එකං පොත්ථකං ලබ්ධුමිච්ඡන්තො සො මං පක්කොසි.

64. ඔබවිසින් පොත් කීයක් මිලට ගන්නාලද්දහුද?

කති පොත්ථකා කීතා තයා?

65. පොත් සතරක් මාවිසින් ගන්නාලදහ.

චත්තාරො පොත්ථකා මයා කීතා

66. ඒවාට කොපමණ මුදලක් දෙනලද්දේ ද?

කිත්තකං මූලං තදත්ථාය තයා දින්නං?

67. රුපියල් 8 කුත් සත 75 ක් දුනිමි.

අට්ඨ රූපියානි පඤ්චසත්තති-සතභාගෙ ච අදාසිං

68. මේ වරද ඔහුවිසින් ඔබ ඉදිරියෙහි කරනලද්දේද?

තවාභිමුඛෙ තෙනි'දං දුක්කම්මං කතන්නු?

69 නැත; අන්‍යශිෂ්‍යයන් දෙදෙනෙකුන් ඉදිරියේදී කරනලදී.

න; අඤ්ඤෙසං ද්වින්නං සිස්සානං අභිමුඛෙ තෙනෙ'දං කතං.

70. එසේ නම් තෝ මෙය කෙසේ දන්නෙහිද?

යජ්ජෙවං කථං ත්වමිදං ජානාසි?

71. හෙතෙම එසේ කෙළේයයි අන්‍යයෝ මට කීහ.

සො තථා කරීති අඤ්ඤෙ මං වදිංසු.

72. තෝ මේ පොතේ කොළ ඉරුවෙහිද?

ත්වං ඉමස්ස පොත්ථකස්ස පත්තානි දාලෙසි නු?

73. නෑ; මම කොපිපොතෙහි අකුරු ලියමින් උන්නෙමි.

න, අහං ලිපිපරිචයෙ .අක්ඛරානි ලිඛන්තො නිසීදිං

74. තෙපි යකඩ පෑන්තලවලින් ලියව්ද?

අයලෙඛණීමුඛෙහි නු තුම්හෙ ලිඛථ?

75. අපි පිහාටු පෑන්වලින් ලියමු.

මයං පත්තනාළලෙඛණීහි ලිඛාම.

76. තොපගේ ගුරුවරයා ඊයේ කුමක් ඉගැන්නුවේද?

තුම්හාකමාචරියො හීයො කිං උග්ගණ්හාපෙසි?

77. හෙතෙම අපට ඉන්දියාභූමිවිස්තරය ඉගැන්විය.

සො' මහාකං භාරතභූමිවිත්ථාරං උග්ගණ්හාපෙසි.

78. මාගේ ගල්ලෑල්ල බිඳුණ බැවින් හෙට අනෙකක් මිලයට ගත්තෙමි.

මම සිලාපත්ථරස්ස භින්නත්තා සුවෙ'හං අඤ්ඤං කිණිස්සාමි.

79. ඒ පොත ඔහු විසින් ඔබට දෙනලද්දේද?

තෙන සො පොත්ථකො තුය්හං දින්නො නු?

80. එය ඔහුට අසිනි නැති බැවින් දිය නොහැකියයි කීයේය.
තස්ස අත්‍ථායත්තත්තා තං දතුං න සක්කොති සො වදි.

81. පාඨශාලාවෙන් නෙරපනලද ඒ ශිෂ්‍යයා තමාගේ ගමට හැරීගියේය.

පාඨසාලාය නික්කඩ්ඩිතො සො සිස්සො අත්තනො ගාමං පච්චාගමි.

82. අනාගතාභිවෘද්ධිය කැමැත්තෝ කුඩාකලම ශිල්පොද්ග්‍රහණය කරත්වා.

අනාගතාභිවුඩ්ඩි මිච්ඡන්තා දහරකාලෙ යෙව සිප්පුග්ගහණං කරොන්තු.

---

### 5. ගොවියන් දෙදෙනෙකුන් අතර කථාවක්

83. ශුභ උදයක් වේවා! 83. සුප්පභාතං!

84. ඔබගේ මෙහි ඒම යහපති.

සුන්දරං තයා කතං ඉධාගමනත්ථ.

85. මම ඔබ හමුවෙන්ට කැමතිව ඔබගේ ඒම බලාපොරොත්තු වෙමින් සිටියෙමි.

අහං තයා සමාගන්තුමිච්ඡන්තො තව ඉධාගමනං පච්චාසිංසන්තො වසිං.

86. ඔබ බොහෝ කලකින් මෙහි නොපැමිණියේ කුමක් හෙයින්ද?

කස්මා භවං චිරාය ඉධ නාගතොසි?

87 රෝගයකින් පෙළුණු මම මසක් පමණ කල් කිසි තැනක යන්ට නොහැක්කෝ වීමි.

ගෙලඤ්ඤෙනා'භිභූතො පනාහං මාසමත්තං කත්ථචිපි ගන්තුං නාසක්ඛිං.

88. ඔබගේ ගොයිතැන සමෘද්ධවීද? නොවීද?

භවතො සස්සං සමිද්ධං වා? නො වා?

89. අධිකජලයෙන් මාගේ ගොයම් විනාශවිය; සවල්පයක් ම ඉතිරි විය.

අධිකජලෙන මයහං සස්සං විනට්ඨං; ථොකමෙව අවසිට්ඨමහොසි.

90. ඔබගේ ගොයිතැනේ තොරතුරු කෙසේද?

කා භවතො සස්ස පවත්ති?

91. පළමුකොට ගවයෝ වැට බිඳගෙන පැල ගොයම් කෑහ, ඉතිරි කොටස නියගෙන් වේලී ගියේය.

පඨමං ගාවො වතිං භින්දිත්වා තරුණකිට්ඨං ඛාදිංසු, අවසිට්ඨං නිදාඝෙන මිලායි.

92. එසේ නම් ඔබගේ පවුල පෝෂණය කරන්නේ කෙලෙසද?

යජ්ජෙවං කථං භවතො කුටුම්බං පොසෙස්සසි?

93. මම පලාකොළ ද වම්බටු පුසුල් ආදිය ද විකුණා ජීවිකාව කරන්නෙමි.

අහං සාකපණ්ණානි භණ්ඩාකී-කුම්භණ්ඩාදීනි ච වික්කිණිත්වා ජීවිකං කප්පෙස්සාමි.

94. ඔබගේ වත්තේ බොහෝ දෙඩම්ගස් තිබෙත් ද?

සන්ති තවුය්‍යානෙ බහූ ජම්බීරරුක්ඛා?

95. ගස් විස්සක් මාගේ උයනෙහි රෝපණය කරන ලදහ.

වීසති රුක්ඛා මමුය්‍යානෙ රොපිතා හොන්ති

96. එක් වාරයකදී ඒවායින් කොපමණ ගෙඩි නෙලන්නෙහිද?

එකස්මිං ඵලවාරෙ තෙහි කිත්තකානි ඵලානි ඔචිනාසි?

97. එක්ඵලවාරයකදී දෙඩම් දෙදහසක් පමණ ලබමි.

එකස්මිං ඵලවාරෙ ද්විසහස්සමත්තානි ඵලානි ලභාමි.

98. කුඹුර කවදා සීසාන්නු කැමැත්තෙහිද?

කදා තව ඛෙත්තං කසිතු මිච්ඡසි?

99. ගොණුන් හා නගුල් ලැබුණුවිට සීසාන්නෙමි.

ගොණෙසු ච නඞ්ගලෙසු ච ලද්ධෙසු කසිස්සාමි.

100. ගොයම් කැපීමේදී කොපමණ මිනිස්සු ඕනෑවෙත්ද?

ලායනෙ කිත්තකා ලායකා ඉච්ඡිතබ්බා?

101. කපන්නෝ දශදෙනෙක් දෑකැති දහයකින් එක්දිනකදී මාගේ ගොයම් කපන්නට සමර්ථවෙත්.

දස ලායකා දසහි දාත්තෙහි එකස්මිං දිනෙ මම සස්සං ලායිතුං සක්කොන්ති.

102. ඒවා කමතෙහි ගොඩගසා ගොනුන් කීදෙනෙකුන් ලවා මඩවන්නෙහි (පාගවන්නෙහි) ද?

කානි ඛලෙ රාසිකත්වා කතිහි ගොණෙහි මද්දාපෙස්සසි?

103. ගොනුන් අටදෙනෙකුන් ලවා පාගවා පිදුරු ඉවත්කොට බොල් පොලා වියලා ධාන්‍ය ගෙනයන්නෙමි.

අට්ඨහි ගොණෙහි මද්දාපෙත්වා පලාලං උද්ධරිත්වා භුසං පප්ඵොටෙත්වා සුක්ඛාපෙත්වා ධඤ්ඤං හරිස්සාමි.

---

## 6. වෙළඳුන් දෙදෙනෙකුන් අතර කථාවක්.

104. භවතාට ශුභාගමනයක් වේවා! මේ අස්නෙහි හුනමැනවි.

ස්වාගතං භවතො! නිසීදතු' මස්මිමාසනෙ.

105. ඔබගේ සැපදුක් කෙසේද?

කා තව සුඛදුක්ඛප්පවත්ති (=සරීරප්පවත්ති) ?

106. මම ද මාගේ අඹුදරුවෝ ද සුවසේ වසමු.

අහඤ්චෙව මම පුත්තදාරා ච සුඛිතා වසාම.

107. මේ මාසේ වෙළඳාමෙන් කොපමණ ලාභයක් ලද්දේද?

ඉමස්මිං මාසෙ වණිජ්ජාය කිත්තකො ලාභො ලද්ධො?

108. බඩු ගත්මිලටත් අඩුවෙන් විකුණන්ට සිදුවූ බැවින් මට පාඩුවක් මිස ලාභයක් නොවීය.

භණ්ඩානං කීත මූලතොපි ඌනතමූලෙන වික්කිණිතත්තා මය්හං හානි යෙ ව අහොසි; න වඩ්ඪි.

109. පර්සියාවෙන් ඔබවිසින් කවර බඩු ගෙනෙන ලද්දාහුද?

පාරසිකදෙසතො තයා කානි භණ්ඩානි ආනීතානි?

110. මම තවලමක් සමග එහි ගොස් අගනා පලස් ඔටුවන් පිට පටවා ගෙනාවෙමි.

අහමෙකෙන සත්ථෙන තත්ථ ගන්ත්වා අග්ඝානි කොජවානි ඔට්ඨෙසු ආරොපෙත්වා ආනෙසිං.

111. එයින් එක් පලසක් කොපමණ මිලකට විකුණන්නෙහිද?

තතො එකං කොජවං කිත්තකෙන මූලෙන වික්කිණිස්සසි?

112. ගත් මිලෙන් දෙගුණයකට විකුණන්නෙමි.
කීතමූලතො දිගුණෙන මූලෙන වික්කිණිස්සාමි.

113. ඊයේ එක් වෙළඳනැවක් වරායට පැමිණියේයයි ඇසීමි.
හීයො එකා වාණිජනාවා තිත්ථමාගතාති සුණිං.

114. මම නැව්තොටට ගොස් එයින් බඩු ගැනීමට අත්තිකාරම් දුනිමි.
අහං නාවාතිත්ථං ගන්ත්වා තතො භණ්ඩගහණත්ථාය සච්චකාරමදාසිං.

115. හෙට මම කරත්ත දසයකින් ඒ බඩු මගේ වෙළඳසැලට ගෙන්වන්නෙමි.
සුවෙ'හං දසහි සකටෙහි තානි භණ්ඩානි අත්තනො ආපණං ආහරාපෙස්සාමි.

116. මෙහිදී එක් රුපියලකට අඹ ගෙඩි සියයක් ගතහැක.
ඉධ එකෙන රූපියෙන අම්බානං සතං කෙතුං සක්කා.

## 7. තිරිසනුන් සම්බන්ධ වාක්‍ය

117. බල්ලෝ රාත්‍රිකාලයේදී ස්වකීය ස්වාමීන්ගේ ගෙවල් රකිත්.
රත්තියං සුනඛා අත්තනො සාමිකානං ගෙහානි රක්ඛන්ති.

118. මිනිස්සු වනයෙන් ඇතුන් බැඳ ගෙනවුත් හික්මවා තමන්ගේ වැඩ කරවා ගනිත්.
මනුස්සා අරඤ්ඤතො හත්ථී බන්ධිත්වානෙත්වා තෙ දමෙත්වා අත්තානං කිච්චානි කාරාපෙන්ති.

119. රථයන්හි යොදනලද අශ්වයෝ රථාචාර්යයන් විසින් හසුරුවනු ලැබෙත්.
රථෙසු යොජිතා අස්සා සාරථීහි සාරියන්ති.

120. ඔටුවෝ බොහෝ බඩු ගෙන ජලය නැති කාන්තාරයන්හි යන්ට සමර්ථ වෙති.
ඔට්ඨා බහුං භණ්ඩං වහන්තා නිරුදකකන්තාරෙසු ගන්තුං සමත්ථා හොන්ති.

121. කොටළුවෝ ශරීරයෙන් උන් හා සමානවූ අන්‍ය සිවුපාවන්ට වඩා බර උසුලන්ට හැකිවෙති.
ගද්‍රභා දේහප්පමාණේන තේසං සමානෙහි අඤ්ඤෙහි චතුප්පදෙහි අධිකතරං භාරං වහිතුං සක්කොන්ති.

122. විදුරා ගසට නැග පක්ෂීන්ගේ කූඩු කඩා දැම්මේය.
සාඛාමිගො රුක්ඛමාරුහිත්වා පක්ඛීනං කුලාවකෙ විනාසෙසි.

123. වැද්දෝ මුවන් මරා මස් විකිණීම පිණිස නුවරට ගෙනෙත්.
ව්‍යාධා මිගෙ වධිත්වා මංසං වික්කිණිතුං නගරමාහරන්ති.

124. තණ කමින් සිටි සාවා මිනිසකු දැක භයවී පලාගියේය.
තිණං ඛාදන්තො සසො එකං මනුස්සං දිස්වා භායිත්වා පලායි.

125. දෙන්තොමෝ කිරි දෙවීන්ට ඉඩ නොදී තමාගේ වස්සාට සෙව්වේය.
ගාවී ඛීරං දෙහිතුමදත්වා සකං වච්ඡං පායෙසි.

126. මීමැස්සන් විසින් මල්රේණු ගෙනවුත් අමාරුවෙන් සැදූ පැණි මිනිස්සු බලාත්කාරයෙන් ගනිත්.
මධුකරෙහි පුප්ඵරෙණවො ආහරිත්වා කිච්ඡෙන සම්පාදිතං මධුං මනුස්සා බලක්කාරෙන ගණ්හන්ති.

127. ගිරවා හොටයෙන් අඹගෙඩිය විද රසය උරා බිව්වේය.
සුවො මුඛතුණ්ඩෙන අම්බං විජ්ඣිත්වා තස්ස රසං පිවි.

128. වේයෝ මැටි ටික ටික ගෙනවුත් ක්‍රමයෙන් මහත්වූ තුඹසක් හොඩනගත්.
උපචිකා ථොකථොකං මත්තිකමානෙත්වා අනුක්කමෙන මහන්තං වම්මිකං උට්ඨාපෙන්ති.

129. මදුරුවෝ මිනිසුන් ඩැහැ ලේ බොමින් ඔවුන් පෙළත්.
මකසා මනුස්සෙ ඩසිත්වා ලොහිතං පිවන්තා තෙ පීළෙන්ති.

130. මකුළුවා කුඩාසතුන් ඇල්ලීමපිණිස තමා සෑදූ දැල පතුරුවයි.
උණ්ණනාභි ඛුද්දජන්තවො ගහෙතුං සයංකතං ජාලං පත්ථරති.

131. කුහුඹි පොළෙව සාරා තමන්ගේ වාසස්ථාන සාදාගනිත්.
කිපිල්ලිකා භූමිං ඛණිත්වා අත්තනො නිවාසට්ඨානානි පටියාදෙන්ති.

132. පලඟැටියෝ ගින්න දැක එහි වර්ණයෙන් මුළාවූවාහු එයට වැටී මැරෙත්.

සලභා අග්ගිං දිස්වා තස්ස වණ්ණෙන මොහිතා තත්‍ථ පතිත්වා මරන්ති

133. උකුස්සෝ කුඩා පක්ෂීන් අල්වා මරා කති.

සෙනා ඛුද්දකපක්ඛිනො මාරෙත්වා ඛාදන්ති.

134. මීගොන්නු මඩවතුරෙහි ගැලෙන්ට කැමැතිවෙත්.

මහිසා සපඞ්කෙ ජලෙ නිමුජ්ජිතු මිච්ඡන්ති.

135. ඒ විලෙහි හංසයෝ පසළොස්දෙනෙක් ද කොකුන් බොහෝ ගණනක් ද ඇත්තාහ.

තස්මිං සරෙ පණ්ණරස හංසා බහවො බකා ච සන්ති.

136. සර්පයෝ මීයන් (අල්වා) ගිලිත්; මුගටින් විසින් සර්පයෝ මරනු ලැබෙත්.

සප්පා මූසිකෙ ගිලන්ති; නකුලෙහි පන සප්පා මාරීයන්ති.

137. සර්පයන්ගේ විෂ දළමුල ඇත්තේය; ගෝනුස්සාගේ විෂ තගුටෙහි වේ.

සප්පානං විසං දාඨාමූලෙ, විච්ඡිකානං විසං නඞ්ගුට්ඨෙ හොති.

138. කස්තූරි හිමවතෙහි වසන මුවවර්ගයකගෙන් ලබාගනිත්.

කත්‍ථූරිකං හිමවති වසන්තියා එකාය මිගජාතියා ලභන්ති.

8. වෘක්ෂයන් හා පුෂ්ප - ඵලාදිය සම්බන්ධයි.

139. ලක්දිව නොයෙක් ලක්ෂගණන් පොල්ගස් ඇත්තාහ.

ලඞ්කායං අනෙකසතසහස්සසඞ්ඛා නාළිකෙරරුක්ඛා සන්ති.

140. ඇතැම් කෙනෙක් ඒවායේ අතු වියා ඒවායින් ගෙවල් සෙවිලි කරත්.

එකච්චෙ තෙසං පත්තානි වායෙත්වා තෙහි ගෙහානි ඡාදෙන්ති.

141. ඒවායේ මල්වලින් රසය ගෙන මද්‍යවර්ගයන් ද පැණි ද හකුරු ද සාදත්.

තෙසං පුප්ඵෙහි රසං ගහෙත්වා මජ්ජානි, ඵාණිතං, සක්ඛරා ච සම්පාදෙන්ති.

142. ගෙඩිවලින් මිහිරි ජලයක් ද කිරි ද තෙල් ද ලබාගනිත්.
ඵලෙහි මධුරං පානීයං, ඛීරං, තෙලඤ්ච ලභන්ති.

143. ළමයි පොලුවලින් ගසා අමු අඹ කඩා කෑහ.
දාරකා දණ්ඩකෙහි පහරිත්වා (දණ්ඩකානි ඛිපිත්වා) ආමානි අම්බානි පාතෙත්වා ඛාදිංසු.

144 කොස් දෙල් කෙසෙල් යන මේවා උෂ්ණ රටවල වැවෙත්.
පනසා ලබුජා කදලියො ච උණ්හදෙසෙසු සම්භවන්ති.

145. මුද්දිරප්පලම් හා ඇපල් සමශීතෝෂ්ණ දෙශයන්හි හටගනිත්.
මුද්දිකා මහාබදරා ච සමසීතුණ්හෙසු දෙසෙසු ජායන්ති.

146. සාදික්කා වසාවාසි දෙවගය එකම ගෙඩියකින් ලැබේ.
ජතිඵල-ජාතිකොසා එකස්මිං යෙව ඵලෙ සම්භවන්ති.

147. එන්සාල් නම් කුළුරසැති එක් කුඩා ඇට වර්ගයකි.
ඵලානි එකා කටුකරසා ඛුද්දකබීජජාති.

148. ලක්දිව ඩෙබර දඹදිව ඩෙබරවලට වඩා කුඩාය.
ලඞ්කාය බදරානි ජම්බුදීපිකබදරෙහි ඛුද්දකතරානි (හොන්ති.)

149. රටඉඳි අරාබියආදි පරදේශවලින් මෙරටට ගෙනෙනුලැබේ.
මහාඛජ්ජූරිඵලානි අරාබිආදි – පරදෙසෙහි ඉමං රට්ඨං ආහරීයන්ති.

~~150. සපුමල් මනාසුවඳ ඇත්තාහුය; වදමල් සුවඳ නැත්තාහුය.~~
චම්පකපුප්ඵානි මනුඤ්ඤගන්ධානි හොන්ති; ජයසුමන පුප්ඵානි නිග්ගන්ධානි.

151. නාගසේ ලීය ඉතා තදය, මල් ඉතාසුවඳැත්තාහ.
නාගරුක්ඛස්ස දාරු අතිථද්ධං, පුප්ඵානි අතිමනුඤ්ඤගන්ධානි.

152. ලුණුවරණගසේ කොළ වැටුණු විට වියළි ගසක් මෙන් පෙනේ.
වරණරුක්ඛො පත්තානං පතිතකාලෙ සුක්ඛරුක්ඛො විය පඤ්ඤායති.

153. බෙලි-දිවුල්ගෙඩිවල මදය තදකටුවකින් ආවරණව තිබේ.
බෙලුව-කපිත්ථඵලානං මිඤ්ජං ථද්ධෙන කටාහෙන ආවරිතං හොති.

154. දඹදිව්වැස්සන් විසින් මුඛවාස පිණිස නිතර විකනු ලබන බුලත් හා පුවක් යුරෝපීය රටවල දක්නානොලැබේ.
ජම්බුදීපිකෙහි මුඛවාසත්ථාය අභිණ්හං සෙවියමානානි (=චබ්බමානානි) තම්බුලානි පූගානි ච යුරොපීය රට්ඨෙසු අඤ්ඤාතානි (= න දිස්සන්ති.)

---

## 9. වාසයකරන ගෙයක් සම්බන්ධ දේ.

155. මගේ කාමරයේ දොර හා ජනෙල් විවෘතකරව.
මම ගබ්භෙ ද්වාර-වාතපානානි විවරාහි.

156. දූතොමෝ දොර වසා යතුර ගෙන නෑම පිණිස ළිඳට ගියාය.
ධීතා ද්වාරං පිදහිත්වා කුඤ්චිකමාදාය නහානත්ථාය කූපමගමාසි.

157. හැමදාම උදෑසන දැසිහු මිදුල හැමද කසල ඉවත දමත්.
සබ්බදාව පාතො දාසියො ගෙහඞ්ගණං සම්මජ්ජිත්වා කචවරං අපනෙන්ති.

158. ගෙයි ස්වාමිදූ කුස්සියේ එළිපත්ත උඩ සිටගෙන අරක්කැමියාට කථාකළාය.
සරණී රසවතියා උම්මාරෙ ඨත්වා සූදං ආමන්තෙසි.

159. සේවකයා මේසයෙහි රෙද්දක් එළා එය මත පිඟන් ද හැඳි ද තැබීය.
සෙවකො භොජනඵලකමත්ථරිත්වා තස්සුපරි කංසෙ ච කටච්ඡු ච ඨපෙසි

160. උදෑසන කෑමට කැඳ ද දවල් කෑමට එළුමස් ද පිළියෙළ කරවයි ගෘහපතියා අණ කෙළේය.
පාතරාසත්ථාය යාගුං දිවාභත්තත්ථාය එළකමංසං ච පටියාදෙහීති ගහපති ආණාපෙසි.

161. ගෙයි හිමියෝ තමන්ගේ නෑයන් සමග ආහාර අනුභව කිරීම පිණිස මේසය වටේ පුටුවල හිඳගත්හ.
සරසාමිකා අත්තනො ඤාතීහි සද්ධිං භුඤ්ජනත්ථාය භොජනඵලකස්ස සමන්තා පීඨේසු නිසීදිංසු.

162. කුඩා ළමයි "අපි කිරිබොන්ට කැමැත්තෙමු"යි කෑගැසූහ.

බාලදාරකා "මයං ඛීරං පිවිතුමිච්ඡාමා" ති උග්ඝොසෙසුං.

163. පිටිසර වැසියෝ වංගෙඩිවල වී දමා මෝල්වලින් කොටා කුළුවලින් පොළා පොතු ඉවත් කරත්.

ජනපදවාසිනො වීහිං උදුක්ඛලෙ පක්ඛිපිත්වා මුසලෙහි කොට්ටෙත්වා සුප්පෙහි පප්ඵොටෙත්වා තචං අපනෙන්ති.

164. සහල් සැළිවල බහා දියවත්කොට ළිප මත තබා ගිනි දැල්වීමෙන් බත් පිසගනු ලැබේ.

තණ්ඩුලෙ චාටීසු ආකිරිත්වා උදකං සිඤ්චිත්වා උද්ධනං ආරොපෙත්වා අග්ගිජාලනෙන භත්තං පචීයති.

165. පොල්මද හිරමණයෙන් සියුම්කොට ගා දිය සමග මිරිකා කිරි ගනු ලැබේ.

නාළිකෙරමිඤ්ජං සණ්හකරණියා සණ්හං කත්වා උදකෙන මද්දිත්වා ඛීරමාකඩ්ඪීයති.

166. ගෙයි ලීබඩු පිටතට ගෙන ශුද්ධකටයුතුයයි ස්වාමියා මෙහෙකරුවන්ට නියම කෙළේය.

ගෙහෙ දාරුභණ්ඩානි බහි නීහරිත්වා සොධෙතබ්බානීති සාමිකො සෙවකෙ ආණාපෙසි.

167. අඳෙහි ඇතිරිල්ලක් එළා කොට්ට තබා පිළියෙළ කිරීම එක් අයකුට භාරවිය.

මඤ්චෙ අත්ථරණමත්ථරිත්වා බිම්බොහනානි ඨපෙත්වා පටියාදනං එකස්ස භාරමහොසි.

---

168. හෙතෙම අලුත් ගෙයක් සෑදවීම සඳහා ගඩොල් ද ලී ද උළු ද මිලයට ගත්තේ ය.

සො නවං ගෙහං කාරෙතුකාමො (තදත්ථාය) ගිඤ්ජකා, දාරුසාරානි, ඡදනිට්ඨකා ච කිණි.

169. උළුවඩුවෝ බිත්ති බඳිමින් ලී වඩුවෝ ලීවැඩ කරමින් වහාම ගෙය සාදා නිමකළහ.

ඉට්ඨකවඩ්ඪකිනො භිත්තියො චිනන්තා දාරුවඩ්ඪකිනො දාරුකම්මං කරොන්තා සීඝමෙව ගෙහං නිට්ඨපෙසුං.

## 10. නගරයක් සම්බන්ධ වාක්‍ය.

170. පෙරකල නගරයෝ ප්‍රාකාර-දියඅගල්-දොරටු- අටලුවලින් යුක්තවූහ.

පුරා නගරානි පාකාර-ද්වාරට්ටාලකෙහි යුත්තානි අහෙසුං.

171. නගරවල කුඩා-මහත් බොහෝ වීථිහු ද උයන් පොකුණු ද නානාවිධ ගෙවල් ද ඇත්තාහ.

නගරෙසු ඛුද්දකමහන්තා වීථියො, උය්‍යාන - පොක්ඛරණියො, නානාවිධානි ඝරානි ච සන්ති.

172. එහි තරඟ අසුන්දිවීම පවත්නාකල්හි බොහෝ ධනවත්තු ද නිර්ධනයෝ ද තරඟපිටියෙහි රැස්වෙත්

තත්‍ථ අභිභූතාය අස්සධාවනෙ වත්තමානෙ බහූ ධන-වන්තා නිද්ධනා ච අස්සමණ්ඩලෙ සන්නිපතන්ති.

173. සුරාසොඬහු සවස්කාලවල පානාගාරයන්හි (තැබෑරුම්වල) රැස්ව මත්පැන් බොති.

සුරාසොණ්ඩා සායණ්හෙසු පානමන්දිරෙසු සන්නිපතිත්වා මජ්ජං පිවන්ති.

174. නගරපාලකයෝ දුරතැන්වලින් ජලය ගෙනවුත් ජලාශයන් පුරවා නළ (පයිප්ප) මාර්ගයෙන් නාගරිකයන්ට ජලය බෙදා දෙති.

නගරපාලකා දූරට්ඨානෙහි උදකමානෙත්වා ජලාලයෙ පූරෙත්වා නළමග්ගෙන නාගරිකානං උදකං භාජෙන්ති.

175. අපරාධ කරන්නෝ රාජපුරුෂයන් විසින් උස්පවුරුවලින් වටකරනලද සිරගෙවල දමනු ලැබෙත්.

අපරාධිනො රාජපුරිසෙහි උච්චපාකාරපරික්ඛිත්තෙසු කාරාගාරෙසු පක්ඛිපීයන්ති.

176. ධනවතුන්ගේ පුත්‍රයෝ තමන්ගේ මිතුරන් සමග මෝටර් රථවල නැගී නාට්‍ය බැලීම පිණිස නාට්‍යශාලාවලට එළඹෙත්.

ධනීනං පුත්තා සකසකමිත්තෙහි සයංවට්ටකරථෙ ආරුහිත්වා නච්චදස්සනාය නච්චසාලායො උපසඞ්කමන්ති.

177. රජුගේ හා ඇමතිවරුන්ගේ ප්‍රාසාදයෝ නුවර මැද පෙදෙසෙහි පිහිටියාහ.

රඤ්ඤො රාජාමච්චානං ච පාසාදා නගරස්ස මජ්ඣභාගෙ පතිට්ඨිතා.

178. වර්ණයොජකයෝ මුද්‍රණාලයවලට පැමිණ අකුරු අමුණා පොත් ආදිය මුද්‍රණය කරත්.

වණ්ණයොජකා මුද්දඞ්කනාලයෙ පත්වා අක්ඛරානි යොජෙත්වා පොත්ථකාදයො මුද්දාපෙන්ති.

179. නුවර තුළ මිනිසුන් මළ කල ඔවුන්ගේ නෑයෝ ඒ මළ සිරුරු සොහොනට ගෙනගොස් වළ ලත්, නැතහොත් දවත්

අන්තොනගරෙ මනුස්සෙසු මතෙසු තෙසං ඤාතකා තානි කලෙබරානි සුසානං නෙත්වා ආවාටෙසු නිඛණන්ති, අථ වා ඣාපෙන්ති.

180. නගරශෝධකයෝ වීථිවල කුණු ඉවත් කිරීම ද වැසිකිළි ශුද්ධකිරීම ද කරත්.

නගරසොධකා (=පුප්ඵඡඩ්ඩකා) රච්ඡාසු කචවරාපනයනං වච්චකුටිසොධනං ච කරොන්ති.

181. නුවර වීථින් රාත්‍රියෙහි විදුලියෙන් එළි කරනලද බැවින් සොරුන් විසින් බඩු සොරකම්කිරීම අපහසුය.

නගරවීථිනං විජ්ජුප්පභාය ආලොකිතත්තා චොරෙහි භණ්ඩථෙනනං දුක්කරං.

182. අවුරුදුපතා පොසොන් පසළොස්වක්දා විසිදහසකට අධික ගණනක් මිනිස්සු දුම්රියවලින් හා මෝටර් වාහනවලින් අනුරාධපුරයට රැස්වෙති.

අනුසංවච්ඡරං ජෙට්ඨපුණ්ණමියං වීසතිසහස්සාධිකා මනුස්සා ධූමරථෙහි සයංවට්ටකෙහි ච අනුරාධපුරං සමොසරන්ති.

183. අපගේ රජතුමා සියපිරිවර සමග සඳුදා හතරට පමණ නුවර ප්‍රදක්ෂිණා කරන්නේයයි අසන්ට ලැබේ.

අම්හාකං භූපො සකපරිවාරෙන සහ චන්දවාරෙ චතුඝටිකායං නගරං පදක්ඛිණං කරිස්සතීති සූයතෙ.

184. එක් සිරකරුවෙක් බන්ධනාගාරපාලකයාට පොල්ලකින් ගසා මැරුවේයයි පත්‍රයක පළවිය.

එකො වජ්ඣප්පත්තො කාරාපාලකං මුග්ගරෙන පහරිත්වා මාරෙසීති එකස්මිං පවත්තිපණ්ණෙ පඤ්ඤායිත්ථ.

185. නගරාධිපතිතෙමේ කෞතුකාගාරය සඳහා විශාල පහයක් ගොඩනංවා එහි නානා කෞතුකභාණ්ඩයන් තැන්පත් කරවිය.

නගරගුත්තිකො කොතූහලසාලත්ථාය මහන්තං මන්දිරං මාපෙත්වා තත්ථ නානාකුතූහලභණ්ඩානි ඨපාපෙසි.

---

## 11. රෝග හා බෙහෙත් පිළියම්.

186. වෙද්දු නොයෙක් ආකාරවලින් රෝගීන්ට පිළියම් කරත්.

වෙජ්ජා නානාකාරෙහි රොගිනො තිකිච්ඡන්ති.

187. ඇතැම් රෝගීහු අමිහිරි රසැති කෂාය බොන්ට නොකැමැති වෙත්.

එකච්චෙ රොගිනො අමධුරරසානි කසායානි පිවිතුං න ඉච්ඡන්ති.

188. එවැන්නන් උදෙසා මිහිරි බෙහෙත් ඔවුන්විසින් සාදනුලැබේ.

තාදිසානමත්ථාය මධුරභෙසජ්ජානි තෙහි සම්පාදීයන්තෙ.

189. ජලසන්නිය (=කොලෙරාව), වසූරිය, මහාමාරිය යන මොහු භයානක වසංගත රෝගයෝයි.

විසූචිකා මසූරිකා අහිවාතකරොගො ච සංකන්තිකා භයානකරොගා.

190. මේ රෝග වැළඳුනවුන්ගෙන් වැඩිදෙනෙක් මැරෙති, සවල්ප දෙනෙක් පමණක් ජීවිතය ලබත්.

ඉමෙහි රොගෙහි ඵුට්ඨා බහවො මරන්ති, අප්පකා යෙව ජීවිතං ලභන්ති.

191. එක් කලහයකදී තුවාල ලැබූ මිනිසෙක් ඔහුගේ නෑයන් විසින් ආරොග්‍යශාලාවට ගෙනයන ලදී.

එකස්මිං කලහෙ ලද්ධප්පහාරො මනුස්සො තස්ස ඤාතීහි සොත්ථිසාලං නීතො හොති.

192. සල්ලවෛද්‍යයා සල්‍යකර්මයක් කොට ඒ රෝගියාට පිළියම් කෙළේය.

සල්ලකත්තො සත්ථකම්මං කත්වා තං රොගිං තිකිච්ඡි

193. සාත්තුකාරියෝ රෑ දවල් ඔහුගේ ඇඳ ළඟ සිටිමින් ඔහු ආරක්‍ෂාකළහ.

සප්පායකාරිකා (=උපට්ඨායිකා) රත්තින්දිවං තස්ස මඤ්චං-සන්තෙ ඨත්වා තං රක්ඛිංසු.

194. කෂායක් උණුකිරීමට කටරොලු වදකසා වැල්මී යන මේවා ගෙනෙවයි වෛද්‍යයා කීය.

කසායං පචිතුං ගිරිකණ්ණිං ගොලොමිං යට්ඨිමධුකං ච ආනෙහීති වෙජ්ජො වදි.

195. ඇස්වල අඳුන් ගෑම පෙරසිට දඹදිව මිනිසුන් විසින් කරනුලැබේ.

අක්ඛීසු අඤ්ජනාලෙපනං චිරකාලතො පට්ඨාය ජම්බුදීපිකෙහි කරීයතෙ.

196. රෝගාරම්භයේ දී ආහාර නොගෙන සිටීමෙන් බොහෝ රෝගයෝ දුරුවෙති.

රොගාරම්භෙ අනසනෙන බහූ රොගා විගච්ඡන්ති.

197 පක්‍ෂඝාතරෝගය පිළියම් නොකටහැක්කක් හෝ ඉතා අපහසුවෙන් සුවකළහැක්කක් ලෙස සලකනු ලැබේ.

පක්ඛඝාතරොගො අතෙකිච්ඡො දුතත්කිච්ඡො වාති සල්ලක්ඛීයතෙ.

198. කිලිටි ශරීර හා වස්ත්‍ර ඇති බැවින්ද අපිරිසිදු තැන්වල වසන බැවින් ද බොහෝදෙන රෝග පීඩිත වෙත්.

කිලිට්ඨ - ගත්ත - වත්ථතාය අපරිසුද්ධට්ඨානවාසෙන ච බහවො රොගපීළිතා භවන්ති.

199. කලින් කල වමන - විරේචනවලින් ශරීරය ඇතුළ ශුද්ධකළ යුතුය.

කාලෙන කාලං උද්ධවිරෙචන - අධොවිරෙචනෙහි සරීරබ්භන්තරං සොධෙතබ්බං.

200. අතිසාරරෝගයෙන් පෙළුණු හෙතෙමේ තවම ගිලන් බැවින් නොමිදුණේය.

අතිසාරරොගෙන පීළිතො සො න තාව ගෙලඤ්ඤා වුට්ඨිතො.

201. ගිලනුන්ට උපස්ථානකිරීම අපගේ භාග්‍යවතුන්වහන්සේ විසින් අතිශයෙන් වර්ණිතය.

ගිලානොපට්ඨානම්පන අම්හාකං භගවතා අතීව පසත්ථං හොති.

202. පෙර සිටි ඇතැම් රජවරු තිරිසනුන් සඳහා ද ආරෝග්‍ය ශාලාවන් පිහිටුවූහ.

එකච්චෙ පොරාණරාජානො තිරච්ඡානගතානම්පි අත්ථාය සොත්ථිසාලායො පතිට්ඨාපෙසුං.

---

## 12. බෞද්ධ විහාරස්ථානයෝ.

203. පෙර දඹදිව නොයෙක් දහස්ගණන් භික්ෂූන්ගෙන් ගැවසුණු සියගණන් විහාරයෝ වූහ.

පුරා ජම්බුදීපෙ අනෙකභික්ඛුසහස්සාකිණ්ණා අනෙකසතවිහාරා අහෙසුං.

204. මෙකල්හි මධ්‍යදේශයෙහි සියලු පුරාණ සංඝාරාමයෝ විනෂ්ටයහ; භික්ෂූන්ගේ දර්ශනය ද දුර්ලභය.

ඉදානි පන මජ්ඣිමදෙසෙ සබ්බෙ පොරාණකසඞ්ඝාරාමා නට්ඨා; භික්ඛූනං දස්සනම්පි දුල්ලභං ජාතං.

205. මධ්‍යදේශයට නැගෙනහිරින් බුරුම - සියම් රටවල ද දකුණෙන් ලක්දිව ද ඊසාණදෙසැ චීන - ජපන් රටවලද මෙකල්හි නොයෙක් දහස්ගණන් සංඝාරාමයන් හා දස දහස් ගණන් භික්ෂූහු ඇත්තාහ.

මජ්ඣිමදෙසස්ස පුරත්ථිමතො මරම්ම - ස්‍යාමරට්ඨෙසු, දක්ඛිණතො ලඞ්කාදීපෙ පුරත්ථිමුත්තරතො චීන - ජපන් රට්ඨෙසු ච ඉදානි අනෙකසහස්සා සඞ්ඝාරාමා අනෙකසතසහස්සා භික්ඛවො ච සන්ති.

206. පෙර සංඝාරාමයන්හි චෛත්‍ය - පිළිමගෙවල් නොවූහ; දැනුත් සියම් - බුරුමරටවල ඒවා සංඝාරාමවලින් වෙන් කොට පිහිටුවත්.

පුරා සඞ්ඝාරාමෙසු චෙතියපටිමාඝරා නාහෙසුං; ඉදානිපි ස්‍යාම - මරම්මරට්ඨෙසු සඞ්ඝාරාමෙහි විසුං යෙව තානි පතිට්ඨාපෙන්ති.

207. ලක්දිව හා අන්‍යදෙශයන්හි බොහෝ විහාරවල පුස්කොළවල ලියූ දහම්පොත් සුරක්‍ෂිත වෙත්.

ලඞ්කායං අඤ්ඤේසු ච දෙසෙසු බහුසු විහාරෙසු තාලපණ්ණලිඛිතා ධම්මගන්ථා සුරක්ඛිතා හොන්ති.

208. ඒ පොත් මනාව රක්නාලදහු නම් අවුරුදු දහසක් පමණ කල් ද නොනැසී පවත්නාහ.

සචෙ තෙ පොත්ථකා සුට්ඨු රක්ඛිතා භවෙය්‍යුං, වස්ස සහස්සාධිකකාලම්පි අවිනට්ඨා පවත්තෙය්‍යුං.

209. දැන් වනාහි මුද්‍රිත පොත් සුලභ බැවින් පුස්කොළවල ලියන්නෝ අල්ප වෙති.

ඉදානි පන මුද්දිතපොත්ථකානං සුලභතාය තාලපණ්ණෙසු ලිඛන්තා අප්පකා හොන්ති.

210. භික්‍ෂු - සාමණේරවරු උදෑසනම නැගිට සෑමලු ආදිය ඇමද පරමල් ඉවත්කොට මලසුන් සෝද දිනපතා වත්පිළිවෙත් කරත්.

භික්ඛුසාමණෙරා පාතොව උට්ඨහිත්වා චෙතියඞ්ගණාදීනි සම්මජ්ජිත්වා මිලාතපුප්ඵානි අපනෙත්වා පුප්ඵාසනානි ධොවිත්වා පතිදිනං වත්තපටිවත්තං කරොන්ති.

211. ඔවුහු පඬු තම්බා පඬුඔරුවල වත්කොට එහි සිවුරු බහා පඬු පොවත්.

තෙ රජනං පචිත්වා රජනදොණීසු ආසිඤ්චිත්වා තාසු චීවරානි පක්ඛිපිත්වා රජන්ති.

212. ඒ සිවුරු පොරවා පාත්‍ර ගෙන ගම්වල හැසිර පිඬු ලබාගෙන ආසනශාලාවලදී වළඳත්.

තානි චීවරානි පාරුපිත්වා පත්තෙ ගහෙත්වා ගාමෙසු චරිත්වා පිණ්ඩං ලද්ධා ආසනසාලාසු භුඤ්ජන්ති.

213. මිනිසුන් ධර්මශාලාවෙහි රැස්වූ විට ධර්මකථිකභික්‍ෂුනමක් ධර්මාසනයට නැගී විජිනිපතක් ගෙන ධර්මය දේශනාකරයි.

ධම්මසභාය මනුස්සෙසු සන්නිපතිතෙසු එකො ධම්මකථිකො භික්ඛු ධම්මාසනමභිරුහිත්වා වීජනිං ගහෙත්වා ධම්මං දෙසෙති.

214. මිනිස්සු පෝයදිනවලදී අටසිල් සමාදන්ව බණ අසා මල් - පහන් - සුවඳදුම් ආදියෙන් බුදුන් පුදත්.

උපොසථදිවසෙසු මනුස්සා අට්ඨඞ්ගසීලං සමාදියිත්වා ධම්මං සුත්වා පුප්ඵ-දීපධූපාදීහි බුද්ධං පූජෙන්ති.

215. වතාවත් කිරීමත් ආහාරකෘත්‍යයත් නිමවූ පසු ඇතැම් පැවිද්දෝ පොත් කටපාඩම්කරත්, ඇතැම්කෙනෙක් ගුරුන් ගෙන් ග්‍රන්ථයන්ගේ අර්ථ අස්වාගනිත්.

නිට්ඨිතෙ වෙය්‍යාවච්චකරණෙ භත්තකිච්චෙ ච එකච්චෙ පබ්බජිතා ගන්ථෙ වාචුග්ගතෙ කරොන්ති, එකච්චෙ ගුරූනං සන්තිකා ගන්ථෙ උග්ගණ්හන්ති.

216. විවේකකාමී ඇතැම් පැවිද්දෝ වනසෙනසුන්වලට පැමිණ භාවනානුයොගීහු වෙති.

පටිසල්ලානාභිරතා එකච්චෙ පබ්බජිතා අරඤ්ඤ සෙනාසනානි ගන්ත්වා භාවනානුයොගිනො හොන්ති.

217. සූර්‍ය්‍යයා අස්තඞ්ගත වූ පසු භික්ෂු-ශ්‍රාමණේරවරු බුදුන් වැඳ මහතෙරවරුන්ට ගෞරව දක්වා ප්‍රථමයාමකාලයේ දී පිරිත් ආදිය හදුරත්.

සූරියෙ අත්ථඞ්ගතෙ භික්ඛුසාමණෙරා බුද්ධවන්දනං ථෙරූපට්ඨානං ච කත්වා පඨමයාමෙ වත්තමානෙ පරිත්තාදීනි සජ්ඣායන්ති.

## 13. බුරුමරටෙන් ආවකු හා කථාවක්.

218. තෝ කවර රටක වැසියෙක් ද?

ත්වං කතරරට්ඨවාසිකො' සි?

219. මම බුරුමරට වැසියෙක්මි

අහං මරම්මරට්ඨවාසිකො' ම්හි.

220. තෝ සියරටින් කවදා නික්මුනෙහි ද?

කදා ත්වං සකරට්ඨතො නික්ඛන්තො?

221. පසුගිය මස එකොළොස්වෙනිදා මම එරටින් නික්මුනෙමි.

ගතමාසස්ස එකාදසමෙ තතො' හං නික්ඛන්තො' ම්හි.

222. නැවෙහි කීදිනක් ගතකෙළෙහිද?

නාවායං කතිදිවසෙ වීතිනාමෙසි?

223. සිවුදිනකින් මුහුද තරණකෙළෙමි.

චතූහි දිවසෙහි සමුද්දමතරිං.

224. ඔබ හා ආ අන්‍යයෝත් ඇත්තාහුද?
සන්ති තයා සහාගතා අඤ්ඤෙපි?

225. අන්‍ය පුරුෂයෝ දෙදෙනෙක් ද භික්ෂුනමක් ද මා සමග ආහ.
අඤ්ඤෙ ද්වෙ පුරිසා එකො ච භික්ඛු මයා සහා'ගතා

226. තෙපි කුමක් පිණිස මේ දිවයිනට පැමිණියාහු ද?
කිමත්ථාය තුම්හෙ ඉමං දීපමාගතා'ත්ථ?

227. දළදාව හා පෞරාණික චෛත්‍යයන් වැඳීම පිණිසය.
දාඨාධාතුං පොරාණක - චෙතියානි ච වන්දනත්ථාය.

228. මේ දිනවල කොතැනක නැවතී සිටිව්ද?
ඉදානි කත්ථ වාසූපගත'ත්ථ?

229. සෙංකඩගලනුවර රජවීථියේ නවවෙනි ගෙයි වසමු.
සෙඞ්ඛණ්ඩසෙලනගරෙ රාජවීථියා නවමකෙ ගෙහෙ වසාම.

230. තෙපි චෛත්‍යවන්දනාව පිණිස කවදා යන්නාහු ද?
කදා තුම්හෙ චෙතියවන්දනාය ගමිස්සථ?

231. මෙයින් දෙතුන් දිනක් අවෑමෙන් අපි අනුරාධපුරයට යන්නෙමු.
ඉතො ද්වීහ-තීහච්චයෙන මයං අනුරාධපුරං ගමිස්සාම.

232. තෙපි බුරුමරට කිනම් පෙදෙසක වාසයකරව් ද?
තුම්හෙ මරම්මරට්ඨස්ස කස්මිං පදෙසෙ වසථ?

233. අපි රාමඤ්ඤමණ්ඩලයෙහි මෝල්මීන් නුවර වසමු.
මයං රාමඤ්ඤමණ්ඩලෙ මොරනගරෙ වසාම.

234. එරටෙහිත් බොහෝ චෛත්‍යාදි වන්දනීයස්ථානයෝ ඇත්තාහු නොවෙත්ද?
නනු තස්මිංපි රට්ඨෙ චෙතියාදයො බහූනි වන්දනීයට්ඨානානි සන්ති?

235. ඔව්, රැන්ගුන් නුවර තිගුම්බමහාචෛත්‍යය ආදි නොයෙක් දහස්ගණන් පූජ්‍යස්ථානයෝ ඇත්තාහ.
ආම, රැන්ගුන්නගරෙ තිගුම්බමහාචෙතියපමුඛානි අනෙකසහස්ස-පූජනීයට්ඨානානි සන්ති.

236 තිගුම්බමහාසෑය කුමක් නිධන් කොට කවරකු විසින් කරවන ලද්දක්ද?

තිගුම්බමහාචෙතියං කිං නිදහිත්වා කෙන කාරාපිතං?

237. බුදුන්ගේ කේශධාතූන් පිහිටුවා තපුස්ස-හල්ලුක වෙළඳුන් දෙදෙනා විසින් පළමුකොට පිහිටුවනලැදැයි කියත්.

පඨමං තාව හගවතො කෙසධාතුයො පතිඨාපෙත්වා ද්වීහි තපුස්ස-හල්ලිකනාමෙහි වාණිජෙහි පතිඨාපිතන්ති වදන්ති.

238. එය වනාහි රියන් 250 ක් උසැත්තේය, අගසිට මැද දක්වා රන්තහඩුවලින් වසනලද්දේය, මැද සිට පාදය දක්වා රන්ආලේපකරන ලද්දේය, බොහෝ කුඩා චෛත්‍යවලින් හා පිළිමගෙවලින් පිරිවරන ලද්දේය.

තම්පන අඩ්ඪතෙය්‍යරතනසතුබ්බෙධං, අග්ගතො යාව මජ්ඣා සුවණ්ණපට්ටෙහි ඡාදිතං, මජ්ඣතො යාව පාදා සුවණ්ණාලිම්පිතං, බහූහි ඛුද්දකචෙතියෙහි පටිමාඝරෙහි ච පරිවාරිතං.

239. ප්‍රාකාර තුනකින් වට කරනලද ඒ මහසෑය රාත්‍රියෙහි ද විදුලි එළියෙන් ආලෝක කරන ලද්දේ මිහිකාන්තාවගේ හිසැ මිණිචොටුන්නක් සේ රැ දුවල්හි බබලයි.

තීහි පාකාරෙහි පරික්ඛිත්තං තම්පන මහාචෙතියං රත්තියම්පි විජ්ජුප්පදීපෙහි ආලොකිතං මහිකන්තාය සිරසි පිළන්ධිතං රතනකිරීටං විය රත්තින්දිවං විරොචති.

---

# කුඩා කථා හා පොත්වලින් උපුටාගත් කොටස්.

---

## 1. සිංහසම පොරවාගත් කොටළුවා.

අතීතයේදී එක් වෙළෙඳෙක් කොටළුවකු පිට පැටවූ බරින් වෙළඳම් කරමින් හැසිරේ. හෙතෙමේ ගිය ගිය තැන කොටළුවාගේ පිටින් බඩු මිටිය බහා කොටළුවා සිංහසමක් පොරවා හැල්කෙත්-යවකෙත්වලැ හරී. ඉක්බිති එක්දිනක් ඒ වෙළඳ එක් ගම්දොරක් අසළ වාසයගෙන උදෑසන්බත පිසවන්නේ කොටළුවා සිංහසම් පොරවා යවකෙතකට යැවීය.

කෙත රකින්නෝ 'සිංහයෙක' යන සංඥවෙන් ළඟට පැමිණෙන්ට නොහැක්කාහු ගෙට ගොස් දැන්වූහ. සියලු ගම්වැස්සෝ ආයුධ ගෙන සක්පිඹිමින් බෙරවයමින් කෙත සමීපයට ගොස් මහත් නාද කළහ. කොටළුවා මරණ භයින් බියපත්වූයේ කොටළුහඬින් හැඬී ගම්වැස්සෝ උහු කොටළුබැව් දැන ඇට පොඩිකරමින් තළා සිංහසම ගෙන ගියාහ.

---

### 1. සීහචම්මාවුතො ගද්‍රභො.

"අතීතෙ එකො වාණිජො ගද්‍රභභාරකෙන වොහාරං කරොන්තො විචරති සො ගතගතට්ඨානෙ ගද්‍රභස්ස පිට්ඨිතො භණ්ඩිකං ඔතාරෙත්වා ගද්‍රභං සීහචම්මෙන පාරුපිත්වා සාලි-යවඛෙත්තෙසු විස්සජ්ජෙති. අථෙකදිවසං සො වාණිජො එකස්මිං ගාමවාරෙ නිවාසං ගහෙත්වා පාතරාසං පචාපෙන්තො ගද්‍රභං සීහචම්මං පාරුපිත්වා යවඛෙත්තං විස්සජ්ජෙසි.

ඛෙත්තරක්ඛකා 'සීහො'ති සඤ්ඤාය උපගන්තුං අසක්කොන්තා ගෙහං ගන්ත්වා ආරොචෙසුං. සකලගාමවාසිනො ආවුධානි ගහෙත්වා සඞ්ඛෙ ධමෙන්තා භෙරියො වාදෙන්තා ඛෙත්තසමීපං ගන්ත්වා උන්නාදිංසු. ගද්‍රභො මරණභයභීතො ගද්‍රභරවං රවි. ගාමවාසිනො තස්ස ගද්‍රභභාවං ඤත්වා අට්ඨීනි භඤ්ජන්තා පොථෙත්වා සීහචම්මං ආදාය අගමංසු."

---

### 2. අකාලයෙහි නික්මයෑමේ විපාක.

එක්කලෙක බරණැස්රජ ප්‍රත්‍යන්තය සංසිඳවීම සඳහා නොකල්හි නික්ම උයනෙහි කඳවුර බැන්දේය. එකල්හි එක් බකමූහුනෙක් උණපඳුරකට ඇතුල්ව සැඟවුණේය. කවුඩෝ ඌ දැක අවුත් "නික්මෙන්නාවූ ඌ අල්වාගන්නෙමු"යි පිරිවැරූහ. ඌ (මහමූණා) ඉරබසිනතෙක් නොසිට කලින්ම නික්ම පලායන්ට ආරම්භකෙළේය. ඉක්බිති කවුඩෝ ඌ වටකොට ගෙන හොටවලින් කොටමින් බිම හෙළූහ. රජතෙමේ ඇමතියකු අමතා 'මේ කවුඩෝ කුමක් හෙයින් මහමූණා තසන්දැ'යි ඇසීය. "මහරජ, නොකල්හි තමන්ගේ වාසස්ථානයෙන් නික්මෙන්නෝ මෙසේ දුකට පැමිණෙත්"යයි ඇමතියා කීය.

---

### 2. අකාලෙ නික්ඛමණස්ස ඵලං.

එකදා බාරාණසීරාජා පච්චන්තං වූපසමනත්ථාය අකාලෙ නික්ඛමිත්වා උය්‍යානෙ ඛන්ධාවාරං නිවාසෙසි. තදා එකො උළූකො වෙළුගුම්බං පවිසිත්වා නිලීයි. කාකා තං දිස්වා ආගන්ත්වා

"නික්ඛමන්තං තං ගණ්හිස්සාමා"ති පරිවාරෙසුං. සො යාව සුරියත්ථඞ්ගමනා අඨත්වා කාලස්සෙව නික්ඛමිත්වා පලායිතුං ආරභි. අථ නං කාකා පරිවාරෙත්වා තුණ්ඩෙහි කොට්ටෙන්තා පාතෙසුං. රාජා එකං අමච්චං ආමන්තෙත්වා "කස්මා ඉමෙ කාකා උළූකං පරිපාතෙන්තී"ති පුච්ඡි අමච්චො "මහාරාජ, අකාලෙ අත්තනො වසනට්ඨානා නික්ඛමන්තා එවං දුක්ඛං පපොන්තී"ති ආහ.

### 3. කවුඩු - බකමුහුණු වෛරය.

පෙර ප්‍රථමකල්පික (මනුෂ්‍ය)යෝ රැස්ව එක්තරා විශිෂ්ට රූපවත් සෞභාග්‍යයෙන් අගතැන්පත් ආඥාසම්පන්න පුරුෂයකු (තෝරා) ගෙන රජ කළහ. සිවුපාවෝ ද රැස්ව එක් සිංහයකු රජ කළහ. මහමුහුදු මත්ස්‍යයෝ ආනන්ද නම් මසකු රජ කළහ. ඉක්බිති පක්ෂිසමූහයෝ හිමවත්පෙදෙසෙහි රැස්ව "මිනිසුන් අතරෙහි රජෙක් විද්‍යමානවේ, සිවුපාවන් අතරෙහිත් මසුන් අතරෙහිත් එසේමය අපටත් රජකු ලබන්ට වටී, රජතනතුරෙහි තැබියයුතු එකකු දනිව්"යයි. ඔවුහු එවැනි පක්ෂියකු බලන්නාහු එක් බකමූණකුට කැමතිවී "මේ තෙම අපට රුචිවේ"යයි කීහ.

ඉක්බිති එක් පක්ෂියෙක් සියල්ලුදෙනගේ අදහස (=කැමැත්ත) ගැන්ම සඳහා තුන්වරක ඇස්විය; ඔහුගේ තෙවෙනි ඇස්වීමේදී එක් කවුඩෙක් නැගිට "ටිකක් නවතුව, මේ රාජාභිෂේක කාලයෙහි මොහුගේ මූණ මෙබඳුය, කිපුණහුගේ මුහුන කෙබඳු වන්නේද? කිපුණු මොහු විසින් බලනු ලබන අපි රත්කබලෙහි දැමූ තල මෙන් එතැන එතැනම පුපුරන්නෙමු මොහු රජකිරීම මට රුචි-නොවේ"යයි කීය.

### 3. කාකොළූකානං වෙරසම්භවො.

"අතීතෙ පඨමකප්පිකා සන්නිපතිත්වා එකං අභිරූපං සොභග්ගප්පත්තං ආණාසම්පන්නං පුරිසං ගහෙත්වා රාජානං කරිංසු. චතුප්පදාපි සන්නිපතිත්වා එකං සීහං රාජානං කරිංසු. මහාසමුද්දෙ මච්ඡා ආනන්දං නාම මච්ඡං රාජානං කරිංසු. තතො සකුණගණා හිමවන්තප්පදෙසෙ සන්නිපතිත්වා "මනුස්සෙසු රාජා පඤ්ඤායති, තථා චතුප්පදෙසු චෙව මච්ඡෙසු ච අම්හාකම්පි රාජානං ලද්ධුං වට්ටති. එකං රාජට්ඨානෙ ඨපෙතබ්බයුත්තකං ජානාථා"ති, තෙ තාදිසං සකුණං ඔලොකයමානා එකං උළූකං රොචෙත්වා "අයං නො රුච්චතී"ති ආහංසු.

අථෙකො සකුණො සබ්බෙසං අජ්ඣාසයගහණත්ථං තික්ඛත්තුං සාවෙසි. තස්ස තතියසාවණාය එකො කාකො උට්ඨාය "තිට්ඨ

තාව, එතස්ස ඉමස්මිං රාජාභිසෙකකාලෙ ඊදිසං මුඛං, කුඩස්ස කීදිසං භවිස්සති? ඉමිනා හි කුඩෙන ඔලොකිතා මයං තත්තකපාලෙ පක්ඛිත්තතිලා විය තත්ථ තත්ථෙව භිජ්ජිස්සාම. ඉමං රාජානං කාතුං මය්හං න රුච්චතී''ති ආහ.

### 4. සමගියේ බලය.

සම්බුදුන්වහන්සේ නෑයන් අමතා, මහරජවරුනි, තෙපි නෑයෝය, නෑයන් නම් සමගිවූවත් සතුටුවූවත් වියයුතුය. නෑයන්ගේ සමගිය ඇති කල සතුරෝ අවකාශ නොලබති; **මිනිසුන්ගේ තබා** සිතිවිලිනැති වෘක්ෂයන්ගේත් සමගියක් ලබන්ට වටී: අතීතයෙහි වනාහි හිමවත්පෙදෙසැ සල්වනයකට මහා වාතයක් වැදුණේය ඒ සල්වනය ගස්-පැල-පඳුරු-වලින් එකිනෙක සම්බන්ධව සිටිබැවින් එක්ගසකුදු හෙළන්ට නොහැකි වූයේ (ගස්වල) මුදුනෙන් මුදුනෙන් ගියේය. හිස් බිම් පෙදෙසක පිහිටි කුඩාඅතු මහඅතුවලින් යුත් එක්මහරුකක් අන් ගස් හා සම්බන්ධ නැති බැවින් මුලිනුදුරා බිම හෙළීය. මේ කරුණෙන් **තොපත් සමගිව සතුටුවෙමින් විසිය යුතුය.**

**සංලක්ෂ්‍යය:**

''මිනිසුන්ගේ තබා'' යන්න ''මනුස්සෙ ඨපෙත්වා'' කියා හෝ ''මනුස්සානං ඨපෙත්වා''යි යෙදීම පාලියට නොගැළපේ; ''තිට්ඨන්තු තාව මනුස්සභූතා''යි නැගිය යුතු.

### 4. සමග්ගියා බලං.

''සත්ථා ඤාතකෙ ආමන්තෙත්වා ''මහාරාජා, තුම්හෙ ඤාතකා; ඤාතකෙහි නාම සමග්ගෙහි සම්මොදමානෙහි භවිතුං වට්ටති. ඤාතකානං හි සාමග්ගියා සති පච්චාමිත්තා ඔතාරං න ලභන්ති. තිට්ඨන්තු තාව මනුස්සභූතා, අචෙතනානම්පි රුක්ඛානං සාමග්ගිං ලද්ධුං වට්ටති: අතීතස්මිං හි හිමවන්තපදෙසෙ මහාවාතො සාලවනං පහරි. තස්ස පන සාලවනස්ස අඤ්ඤමඤ්ඤං රුක්ඛ-ගච්ඡ-ගුම්බ ලතාහි සම්බන්ධත්තා එකරුක්ඛම්පි පාතෙතුං අසක්කොන්තො මත්ථකමත්ථකෙනෙව අගමාසි. එකං පන අඞ්ගණෙ ඨිතං සාඛාවිටපසම්පන්නං මහාරුක්ඛං අඤ්ඤෙහි රුක්ඛෙහි අසම්බන්ධත්තා උම්මූලෙත්වා භූමියං පාතෙසි. ඉමිනා කාරණෙන තුම්හෙහිපි සමග්ගෙහි සම්මොදමානෙහි වසිතුං වට්ටතී''ති.

### 5. ප්‍රමාදයේ විපාක.

ජනපදයෙහි (පිටිසර) වසන එක්කුලපුත්‍රයෙක් සැවැත්නුවර එක් කුලදුවක් තමාගේ පුතුට පවරා (=ආවාහකොට දීමට පොරොන්දු ලබාගෙන) 'අසවල් නම් දවසෙහි ගෙනයන්නෙමි'යි.

දවසක් තබා එදවස පැමිණිවිට තමාගේ ගෙට එළඹෙන ආජීවක යකුගෙන් "සවාමීනි, අපි අද එක් මඞගලයක් කරන්නෙමු, නැකත හොබනේදැ"යි ඇසීය. හෙතෙම "මේතෙමේ පළමුවෙන් මා නොවිචාරා දැන් අසන්නේය"යි කිපී "අද නැකත නොහො-බනේය, අද මඟුල් නොකරව්, ඉදින් කරන්නහු නම් මහත් විනාශයක් වන්නේය"යි කීය. ඒ ගෙයි මිනිස්සු ඔහුගේ (කීම) අදහා එදවස නොගියාහ.

නුවර වැස්සෝ මඟුල සම්බන්ධ සියලු වැඩ කොට ඔවුන් නොඑනබව දැක කළ මඟුලෙන් ම දුවණියන් අනෙකෙකුට දුන්හ. අනිකෝ (පිටිසරයෝ) පසුදා අවුත් "අපට දැරිය දෙව්"යැයි කීහ. ඉක්බිති සැවැත්වැසියෝ "දනව්වැසි ගෙහිමියෝ වූ තොපි පවිටු මිනිස්සුය, දවස නියමකොට (නැවත) නොසලකා හැර නාහු; ආ මගින්ම හැරී පලයව්, අප විසින් දැරිය අනෙකෙකුට දෙනලද්දීය"යි ඔවුන්ට පරිභවකළහ. ඔවුහු ඔවුන් හා කලහකොට ආමගින්ම ගියහ.

### 5. පමාදස්ස දොසො.

"සාවත්ථියං කිරෙකං කුලධීතරං ජනපදෙ එකො කුලපුත්තො අත්තනො පුත්තස්ස වාරෙත්වා "අසුකදිවසෙ නාම ගණ්හිස්සාමී"ති දිවසං ඨපෙත්වා තස්මිං දිවසෙ සම්පත්තෙ අත්තනො කුලූපකං ආජීවකං පුච්ඡි: "භන්තෙ, අජ්ජ මයං එකං මඞ්ගලං කරිස්සාම, සොභනං නු ඛො නක්ඛත්ත"න්ති? සො "අයං මං පඨමං අපුච්ඡිත්වා ඉදානි පටිපුච්ඡතී"ති කුජ්ඣිත්වා "අජ්ජ අසොභනං නක්ඛත්තං, මා අජ්ජ මඞ්ගලං කරිත්ථ; සචෙ කරිස්සථ, මහාවිනාසො භවිස්සතී"ති ආහ. තස්මිං කුලෙ මනුස්සා තස්ස සද්දහිත්වා තං දිවසං න ගච්ඡිංසු.

නගරවාසිනො සබ්බං මඞ්ගලකිරියං කත්වා තෙසං අනාගමනං දිස්වා යථාකතෙනෙව මඞ්ගලෙන ධීතරං අඤ්ඤස්ස අදංසු. ඉතරෙ පුනදිවසෙ ආගන්ත්වා "දෙථ නො දාරිකං"ති ආහංසු. අථ නෙ සාවත්ථිවාසිනො "ජනපදවාසිනො නාම තුම්හෙ ගහපතිකා පාපමනුස්සා, දිවසං ඨපෙත්වා අවඤ්ඤාය නාගතා; ආගතමග්ගෙ-නෙව පටිගච්ඡථ; අම්හෙහි අඤ්ඤස්සං දාරිකා දින්නා"ති පරිභාසිංසු. තෙ තෙහි සද්ධිං කලහං කත්වා යථාගතමග්ගෙනෙව ගතා."

### 6. ගොළුවකු මෙන් ඇඟවූ යාචකයා.

පෙරකල එක් යාචකයෙක් මා ගොළුවකු කොට දක්වන්නෙම් නම් මට බොහෝ මුදල් ලැබියහැකිය''යි සිතා ''ගොළුවා'' යන වචනය ලෑල්ලක ලියවා එය කරේ එල්ලාගෙන මාර්ගයක් අසළ සිටියේය.

ඔහුගේ සතුරෙක් වූ අන්‍ය යාචකයෙක් ''මොහුගේ කපටිකම හෙළි කරන්නෙමි''යි සිතා ඔහුට නුදුරු තැන හුන්නේය. එක්තරා කාරුණික පුරුෂයකු ඒ මූගප්‍රතිරූපකයා (=බොරු ගොළුවා) ට තඹසල්ලියක් දීම පිණිස සමීපයට ආ කල්හි ඒ හතුරා 'මහත්මයාණෙනි, මොහුට කිසි මුදලක් නුදුන මැනවි, මේ තෙම කපටියෙකි, ගොළුවෙක් නොවේ''යයි කෑගැසීය. ඉක්බිති කෝපාවිෂ්ටවූ ඒ කපටියා ''බොරුකාරය, මම හැමකල්හි ගොළුවෙක් වීමි; දැනුත් ගොළුවෙමි''යි කීය. එකල්හි ඒ අනුකම්පක පුරුෂයා ''කථාකරන්ට හැකි ඇතැම් ගොළුවෝ සිටිත්ය''යි කියමින් එතැනින් ඉවත ගියේය.

### 6. මූගපතිරූපකො යාචකො.

අතීතෙ එකො යාචකො ''සචා'හං අත්තානං මූගං විය දස්සෙය්‍යං, බහුං මූලං ලභෙය්‍ය''න්ති. චින්තෙත්වා ''මූගො''ති වචනං එකස්මිං ඵලකෙ ලිඛාපෙත්වා තං ගීවායං ලග්ගෙත්වා මග්ගපස්සෙ අට්ඨාසි.

තස්ස පච්චාමිත්තො අඤ්ඤො යාචකො ''ඉමස්ස සාඨෙය්‍යං පාකටං කරිස්සාමී''ති චින්තෙත්වා තස්සා'විදූරෙ නිසීදි. යදෙ'කො අනුකම්පකො පුරිසො තස්ස මූගපතිරූපකස්ස කාකණිකං දාතුං සන්තිකමුපාගමි, තදා සො වෙරී ''මහාසය, මා එතස්ස කිඤ්චි මූලං දෙහි; සඨො එසො, නෙ'සො මූගො''ති උග්ඝොසෙසි. අථ සො සඨො කොපාවිට්ඨො ''මුසාවාදී, සබ්බදා'ව'හං මූගො අහොසිං; ඉදානිපි මූගො භවාමී''ති ආහ. තදා සො කාරුණිකො: ''අපෙව' ක චෙව මූගා යෙ සල්ලපිතුම්පි සක්කොන්තී''ති වදන්තො තතො අපගච්ඡි.

### 7. විවාදයට පත් දියකාවෝ දෙදෙන

අතීතයෙහි මිත්‍රවූ දියකාවෝ දෙදෙනෙක් වූහ, එයින් එකෙක් ගඟේ ඉවුර අසළ හැසිරෙයි, අනිකා ගැඹුරු දියෙහි හැසිරෙයි. එක් දිනක ඔවුහු මසකු ලැබ එකෙක් ''මත්ස්‍යයාගේ හිස කොටස කන්ට කැමැත්තෙමි''යි කීය; අනිකාත් ඒ කොටසම ලබනු කැමති විය. තමන්ගේ විවාදය තීරණය කරගත නොහැකි ඔවුහු එක් සිවලකු වසන තැනට ගොස් ''අපේ මේ නඩුව විසඳුව මැනවැ''යි කීහ.

හිවලා තමා දුන් විනිශ්චයෙහි සිටිනබවට පළමුකොට ඔවුන්ගේ ප්‍රතිඥාව ගෙන මසුගේ හිසද නගුටද කඩා වෙන්කොට: "ඉවුරෙ අසළ හැසිරෙන්නා නගුට ලබයි; ගැඹුරෙහි හැසිරෙන්නාට හිස ලැබේ; මේ මැද කොටස අධිකරණනායකයාට (අයිති) වන්නේය"යි කියා එකකුට හිස ද අනිකාට නගුට ද දී තෙමේ මැදකොටස කන්ට පටන්ගත්තේය.

බෙදයට පත් දියකාවෝ එතැන් පටන් මසුන් ලැබ විවාද නැතිව සමසේ බෙදාගෙන කෑහ.

## 7. විවාදාපන්නා වෙ උද්දා.

අතීතෙ වෙ උද්දා සහායකා අහෙසුං; තෙසු එකො අනුතීරචාරී, එකො ගම්භීරචාරී. තෙ එකදා එකං මච්ඡං ලභිත්වා එකො: "අහං මච්ඡස්ස උපරිමභාගං ඛාදිතුම්ච්ඡාමී"ති ආහ; අපරොපි තමෙව භාගං ඉච්ඡි. තෙ අත්තනො විවාදං තීරෙතුං අසක්කොන්තා එකස්ස සිගාලස්ස වසනට්ඨානං ගන්ත්වා "ඉමං නො අට්ටං විනිච්ඡිනථා"ති ආහංසු.

සිගාලො අත්තනා දින්නවිනිච්ඡයෙ තිට්ඨන්තියා පඨමං තෙසං පටිඤ්ඤං ගහෙත්වා මච්ඡස්ස සීසං ච නඞ්ගුට්ඨඛණ්ඩ ඡින්දිත්වා විසුං කත්වා;

"අනුතීරචාරී නඞ්ගුට්ඨං
සීසං ගම්භීරචාරිනො;
අථා'යං මජ්ඣිමො ඛණ්ඩො
ධම්මට්ඨස්ස භවිස්සතී"ති

වත්වා එකස්ස සීසං ඉතරස්ස නඞ්ගුට්ඨඛණ්ඩ දත්වා මජ්ඣිමං ඛණ්ඩං සයං ඛාදිතුමාරභි.

විසංවාදප්පත්තා උද්දා තතො පට්ඨාය මච්ඡෙ ලභිත්වා විවාදරහිතා සමං භාජෙත්වා ඛාදිංසු.

## 8. සාවකු විසින් සිංහයෙක් මරනලදී.

මධුරපර්වතයෙහි දුර්දාන්ත නම් සිංහයෙක් විසී. ඔහු දිනපතා බොහෝ සතුන් මරාදමන බැවින් ඒ වනවැසි සිවුපාවෝ රැස්ව "අපෙන් එක එකා දවස්පතා සිංහයා වෙත යවමු"යි තීරණය කොට ගෙන එපවත් සිංහයාට දැන්වූහ සිංහයා ද යහපතැයි පිළිගත්තේය. එක් දිනක් වෘද්ධ සාවකුට සිංහයා වෙත යාමට වාරය පැමිණියේය. ඌ මරණයෙන් මිදීමට උපායක් සිතමින් සෙමින් සෙමින් ගස්සේ වේලාව ඉක්මවා සිංහයා වෙත පැමිණියේය.

බඩසයින් පෙළුණු බැවින් කෝපාවිෂ්ටවූ සිංහයා "තෝ කුමක් හෙයින් කල්ගතකොට එහිදැ"යි විචාළේය. "ස්වාමීනි, මාගේ දෝෂයක් නොවේ, අතරමගදී අන්‍යසිංහයකු විසින් බලාත්කාරයෙන් නවත්වන ලද්දෙමි. මා ඔබවහන්සේ වෙතට අවුත් නැවත ඔහු වෙත හැරී එනබවට පොරොන්දු වෙනතුරු මට එන්ට අවකාශ නුදුන්නේය"යි හාවා කීය. එයින් මහත් කෝපයට පත් සිංහයා "වහාම මට ඒ උඩඟු සිංහයා දක්වව"යි කියමින් සාවා සමග යන්ට පිටත්විය. හාවා එක් ගැඹුරු ළිඳක් සමීපයට ගොස් "ස්වාමීනි, බලනු මැනව, ඒ දුෂ්ටයා මේ ළිඳ ඇතුළේ වසන්නේය"යි කියමින් දියතුළ පෙනෙන ඔහුගේම ප්‍රතිබිම්බය පෙන්විය. ඉක්බිති දර්පිතවූ ඒ සිංහයා මහත් සේ නාදකොට ළිඳතුළට පැන එහිම මළේය.

## 8. සසකෙනෙ'කො සීහො මාරිතො.

මන්දරපබ්බතෙ දුද්දන්තො නාම සීහො වසි. තෙන පතිදිනං බහුන්නං පාණානං ව්‍යාපාදිතත්තා තංවනවාසිනො චතුප්පදා සමාගන්ත්වා "අම්හෙසු එකෙකං පච්චාහං සීහස්ස සන්තිකං පෙසෙමා"ති නිච්ඡයං කත්වා තං පවත්තිං සීහස්ස ආරොචෙසුං. සොපි සාධූති සම්පටිච්ඡි. එකදා එකස්ස වුඩ්ඪසසකස්ස වාරො සම්පාපුණි. සො කථං මරණම්හා මුච්චිස්සාමී"ති උපායං චින්තෙන්තො තත්‍ථ තත්‍ථ විලම්බන්තො කාලක්ඛෙපං කත්වා තමුපාගමි.

ඛුදාභිභූතත්තා කොපාවිට්ඨො සීහො "කස්මා ත්වං චිරායිත්වා ආගච්ඡසී"ති පුච්ඡි "සාමි, න මය්හං දොසො; අන්තරාමග්ගෙ අඤ්ඤෙන සීහෙනා'හං නිවත්තාපිතොම්හි. යාවා'හං භවන්තස්ස සන්තිකමාගන්ත්වා පච්චාගමනාය පටිඤ්ඤං නාදාසිං, තාව මෙ ආගන්තුං නාදාසී"ති සසකො ආහ, තෙනා'තීව කොපාවිට්ඨො සීහො "සීඝං මෙ තං සප්පගබ්භං සීහං දස්සෙහී"ති වදන්තො තෙන සද්ධිං ගන්තුං නික්ඛමි. අථ සසො තමෙකස්ස ගම්භීර කූපස්ස උපන්තිකං නෙත්වා "පස්ස, සාමි, සො දුට්ඨො ඉමස්මිං කූපබ්භන්තරෙ වසතී"ති වදන්තො කූපම්බුනි දිස්සමානං තස්සෙව පටිබිම්බං දස්සෙසි. දප්පිතො සීහො මහානාදං නදිත්වා කූපං පක්ඛන්දිත්වා තත්‍ථෙව මරි.

## 9. කට නිසා විනාශයට පත් ඉබ්බා.

තමාගේ මිත්‍රවූ හංසයන් දෙදෙනෙකුන් සමග හිමාලයට යනු කැමතිවූ එක් ඉබ්බෙක් "ඉදින් ඔබ දෙදෙන කොටවලින් දණ්ඩක දෙ කොණ ඩැහැගන්නාහු නම් මා ඒ දණ්ඩේ මැද ඩැහැගත්විට

ඔබගේ පියාපත් බලයෙන් මටත් අහසින් ගමන්කළහැකැ''යි කීය. ඒ උපක්‍රමය එසේ වේවා, තා ගෙන අහසින් යන අප දක්නා මිනිස්සු 'අද්භූත දර්ශනයෙකැ'යි උද්ඝෝෂණය කරන්නාහ. තෝ එය අසා ඔවුන්ට උත්තර දෙන්නෙහි නම් එකාන්තයෙන් තාගේ ජීවිතය විනාශවෙන්නේය''යි හංසයෝ කීහ. ''මම ඔයතරම් මෝඩයෙක්ද? මම කිසිවක් කථානොකරන්නෙමි''යි ඉබ්බා කීය.

ඉක්බිති යථෝක්තාකාරයෙන් උහු ගෙනයනු ලබන කල්හි මිනිස්සු එය දැක 'අහෝ! ආශ්චර්යයකි! පක්ෂීහු දෙදෙනෙක් ඉබ්බකු ගෙනයත්ය''යි කෑගසන්ට පටන්ගත්හ. එයින් ඇතැම් කෙනෙක් ''ඉදින් මේ ඉබ්බා වැටෙන්නේ නම් මෙහිදීම උඟ පිස කන්නෙමු''යි කීහ. තවත් කෙනෙක් ''අපි උඟ ගෙවලට ගෙන ගොස් පිසන්නෙමු''යි කීහ. මේ කර්කශවචන අසා අතිශයෙන් කෝපයට පත් ඉබ්බා තමාගේ අධිෂ්ඨානය සිහිනැතිකොට ''තෙපි අලු කන්නෙව්''යයි කියන්ට කැමතිව කට හැරී කෙණෙහි බිම වැටී කඩ කඩව ගියේය.

### 3. මුඛං නිස්සාය විනාසප්පත්තො කුම්මො.

අත්තනො සහායෙහි වීහි හංසෙහි සද්ධිං හිමාලයං ගන්තුකාමො එකො කුම්මො ''සචෙ තුම්හෙ මුඛතුණ්ඩකෙහි එකං දණ්ඩං ද්වීසු කොණෙසු ගණ්හෙය්‍යාථ, මයා තස්ස මජ්ඣං මම මුඛෙන ගහිත කාලෙ තුම්හාකං පක්ඛබලෙන අහම්පි නභසා ගන්තුං සක්ඛිස්සාමී''ති ආහ. ''උපක්කමො පන තථා හොතු; තං ගහෙත්වා ආකාසෙන ගච්ඡන්තෙ අම්හෙ පස්සන්තා මනුස්සා ''අහො, අබ්භුතං දස්සනං''ති උග්ඝොසිස්සන්ති; සචෙ ත්වං තං සුත්වා තෙසං පටිවචනං දදෙය්‍යාසි, කාමං තව ජීවිතං විනස්සිස්සතී''ති හංසා අවොචුං. ''කිමහං තථාවිධො ජළො? නාහං කිඤ්චි කථෙස්සාමී''ති කුම්මො වදි.

තතො යථාවුත්තාකාරෙන තස්මිං නීයමානෙ මනුස්සා තං දිස්වා ''හා! හා! අච්ඡරියං! වෙ පක්ඛිනො එකං කුම්මං හරන්තී''ති උග්ඝොසෙසුං. තෙසු එකච්චෙ ''සචා'යං කුම්මො පතිස්සති එත්ථෙව නං පචිත්වා ඛාදිස්සාමා''ති ආහංසු. එකච්චෙ ''මයං තං ගෙහං නෙත්වා පචිස්සාමා''ති වදිංසු. ඉමානි කක්කලවචනානි සුත්වා අතීව රුට්ඨො සො කුම්මො අත්තනො අධිට්ඨානං විස්සරිත්වා ''තුම්හෙ භස්මං ඛාදිස්සථා''ති වත්තුං මුඛෙ විවටමත්තෙ භූමියං පතිත්වා ඛණ්ඩාඛණ්ඩිකො ජාතො.

## 10. අන්ධයකුගේ දක්ෂභාවය

මැටිකළයක් හා පොරෝනා කම්බිලියක් හැර තමා සතු අන්කිසි ධනයක් නැති එක්තරා අන්ධයෙක් දිනක් දේවස්ථානයකට ගොස් දේවායාචනයෙන් යුක්ත උපවාසයෙන් (=ආහාර නොගැනීමෙන්) තමාගේ දුඃඛිතජීවිතය කෙළවර කරන්ට ඉටාගත්තේය.

ඔහුගේ ප්‍රතිපත්තියෙන් සතුටුවූ දෙවිතෙමේ ඔහු ඉදිරියෙහි දෘශ්‍යමානවී "තට වරයක් දෙන්නෙමි"යි කීය. ස්ථානෝචිත ඥානයෙන් යුත් ඒ අන්ධයා "පින්වතා කවරෙක්ද"යි විචාළේය. "මම මහාදේවයා වෙමි"යි කීකල්හි "ඇසින් දක්නට නොහැකි මම එය කෙසේ අදහා ගනිම්ද"යි අන්ධයා කීය. දෙවිතෙමේ එකෙණෙහි ඔහුගේ ඇස් පෙනීම ඇතිකෙළේය. එකල්හි අන්ධයා දණින් වැටී "මම මාගේ මුණුපුරකු රාජ්‍යශ්‍රිය අනුභව කරනු දක්නට ලබන්නෙම්වා"යි කීය. මෙසේ හෙතෙම එක් වරයෙන්ම අක්ෂිදෘෂ්ටියත් දීර්ඝජීවිතයත් සම්පතුත් ලබාගත්තේය.

## 10. උපායදක්ඛො අන්ධො.

එකං ඝටිං කම්බලඤ්ච විනා අඤ්ඤස්ස කස්සචි ධනස්ස අස්සාමිකො එකො අන්ධො එකදා එකං දෙවායතනං ගන්ත්වා අනසනෙන අත්තනො දුක්ඛිතජීවිතස්ස අන්තං කාතුමධිට්ඨාසි.

තස්ස තාය පටිපත්තියා පසන්නා දෙවතා තම්පුරතො පාතුභවිත්වා "වරං තෙ දම්මී"ති ආහ. ඨානොචිතපඤ්ඤො සො අන්ධො "කො'සි ත්වං"ති පුච්ඡි; "අහං මහාදෙවො"ති වුත්තෙන "අක්ඛීහි අපස්සන්තො අහං කථං තං සද්දහාමී"ති අවච. තස්මිං ඛණෙ දෙවතා තස්ස දස්සනං පාකතිකං අකාසි. තතො අන්ධො ජණ්ණුකෙහි නිපතිත්වා "මම නත්තාරං රජ්ජසිරිමනුභොන්තං පස්සිතුං ලභෙය්‍යාමහං"ති යාචි. එවං සො එකෙනෙව වරෙන අක්ඛිදිට්ඨිං දීඝජීවිතං සම්පත්තිඤ්ච පටිලභි.

## 11. කාලිදාස පණ්ඩිතවූයේ කෙසේද?

කාලිදේවියගේ ප්‍රසාදලාභයෙන් කාලිදාස කවිත්වයට පැමිණියේයයි ඇතැම්කෙනෙක් කියත්. ඒ සම්බන්ධ ප්‍රවෘත්තිය මෙසේයි:- පෙර එක් රජෙකුගේ අතිශයෙන් පණ්ඩිත වූ දූකුමරියක් විය. ඇයට යෝග්‍ය ස්වාමිපුරුෂයකු සොයාගත නොහැකිව ඛෙදයට පත් රජතෙමේ දිනක් මෙසේ ප්‍රකාශයක් කෙළේය: "සෙට උදෑසන යමෙක් මාගේ ඇසට පළමුකොට හමුවන්නේ නම් ඔහට මාගේ දුවණියන් දෙන්නෙමි"යි.

තමාගේ පුතුට රජකුමරිය නුදුන් බැවින් කෝපයට පත්ව සිටි එක් ඇමතියෙක් ගසකට නැගී අත්තක හිඳගෙන ඒ අත්තේ මුල කපන අතිමුස්වූ එක් බමුණු ගොපල්ලකු දැක ඔහු ගෙනවුත් රාජද්වාරය සමීපයෙහි තැවැත්විය. රජතෙමේ ද ඔහු දැක තමාගේ ප්‍රතිඥාවට අනුරූප ලෙස ඒ ගොපල්ලාට දුව දුන්නේය. රාත්‍රියෙහි විලාසමන්දිරගතවූ රජදූතොමෝ ඔහු අතිශයෙන් අඥානබව දැනගති. ඉක්බිති ඇය විසින් කර්කශ වචනවලින් ආක්‍රෝශ කරන ලද හෙතෙමේ එක් වනයකට පිවිස කාලිදේවියගේ සිත් ගෙන අතිවිශිෂ්ට කවිත්වය ලැබුවේය.

## 11. කථං කාලිදාසො පණ්ඩිතො ජාතො?

කාලිදාසො කාලිදෙවියා පසාදලාභෙන කවිත්තං පත්තොති එකච්චෙ වදන්ති. අත්‍රා'යං කිංවදන්තී:- පුරා එකස්ස රඤ්ඤො අතිපඤ්ඤවතී ධීතා අහොසි තස්සා'නුරූපං පතිං පරියෙසිතු මසක්කුණෙය්‍යන්තො ඛින්නො රාජා එකදා "යො සුවෙ පාතො පඨම තරං මම චක්ඛුස්සාපාථ මාගච්ඡති, තස්සා'හං ධීතරං දදිස්සාමී"ති නිවෙදෙසි.

අත්තනො පුත්තස්ස තං රාජධීතරං වාරෙත්වා අලද්ධතාය කුද්ධො එකො අමච්චො එකං රුක්ඛසාඛමාරුහිත්වා තස්සා යෙව සාඛාය මූලං ඡින්දන්තං එකං ගොපාල-බ්‍රාහ්මණදාරකං දිස්වා තමානෙත්වා (පටිඤ්ඤාත-දිවසස්ස පාතො) රාජද්වාරසමීපෙ ඨපෙසි. රාජා තං දිස්වා අත්තනො පටිඤ්ඤාභඞ්ගමකරොන්තො තස්ස ගොපා-ලස්ස'ත්තනො ධීතරමදාසි. අථ රත්තියං විලාසමන්දිරගතා රාජ ධීතා තස්ස අච්චන්තබාලතං (=ජළතං) අඤ්ඤාසි. තතො තාය කක්ඛළාහි වාචාහි අක්කොසිතො සො එකං අරඤ්ඤං පවිසිත්වා කාලිදෙවිමාරාධෙත්වා අභිවිසිඨ-කවිත්තමලභීති.

---

## 12. උසස් කුලැත්තෝ කාරුණිකයෝද?

බරණැසින් ප්‍රයාගයට යන එක් පුරුෂයෙක් සොරුන් අතට අසුවිය; ඔවුහු ඒ මිනිසාගේ වස්ත්‍රාදිය පැහැරගෙන ඔහුට ද ආයුධ වලින් පහර දී මළඑකක්හු මෙන් කොට පලාගියහ. ඉක්බිති එක් බමුණෙක් ඒ මගින් යන්නේ තුවාලලත් ඒ පුරුෂයා දැක ඔහුගෙන් ඉවත්ව මාගීයේ අනික් පැත්තෙන් ගියේය; තවත් බමුණෙක් එතැනින් යන්නේ එසේම ඉවත්ව ගියේය.

ඉත්පසු ඒ මග යන එක් ගිහිකුලිකයෙක් ඒ දුකට පත් මිනිසා දැක ඔහු කෙරෙහි කරුණා උපදවා සමීපයට එළඹ ඔහුගේ තුවාළ බැඳ මුද්‍රිකසාරය හා තෙල් ඒ තුවාළවල වත් කොට තමා නැගී ගිය සිවුපාවා පිට ඔහු නංවාගෙන එක් දූතශාලාවක් කරා පැමිණ එහි නැවතී ඔහුට සාත්තු කෙළේය. කීප දිනකින් තමාගේ ගමන ආරම්භකරන්ට කැමතිවූ හෙතෙමේ කහවණු දෙකක් ශාලාපාලකයාට දී "මේ මිනිසාට මනාසේ සාත්තු කළමැනවි, යම්කිසි වියදමක් යන්නේ නම් මා හැරී එන ගමනේදී ඒ සියල්ල ගෙවන්නෙමි" යි කියා ගියේය.

## 12. උච්චාකුලිකා අනුකම්පකා හොන්ති නු?

බාරාණසිතො පයාගං ගච්ඡන්තො එකො පුරිසො චොරහත්ථප්පත්තො අහොසි. චොරා තස්ස වත්ථාදීනි අච්ඡින්දිත්වා තම්පි ආවුධෙහි පහරිත්වා මතසදිසං (අතිදුබ්බලං) කත්වා පලායිංසු. අථෙ'කො බ්‍රාහ්මණො තෙන මග්ගෙන ගච්ඡන්තො තං ඛතසරීරං පුරිසං දිස්වා තතො අතික්කම්ම මග්ගස්ස ඉතරපස්සෙන අගමාසි. අඤ්ඤොපි බ්‍රාහ්මණො තෙන ගච්ඡන්තො තථෙව අපක්කමිත්වා අගමාසි.

අනන්තරං එකො හීනජච්චො තස්මිං මග්ගෙ ගච්ඡන්තො තං දිස්වා තස්මිං කාරුඤ්ඤං උප්පාදෙත්වා තමුපසඞ්කම්ම තස්ස වණානි බන්ධිත්වා තෙසු මුද්දිකාසවං තෙලඤ්ච ආසිඤ්චිත්වා අත්තනො වාහකෙ පසුම්හි තමාරොපෙත්වා එකං දූතසාලම්පත්වා තත්ථ තං පටිජග්ගි. කතිපාහච්චයෙන අත්තනො ගමනමාරභිතුකාමො සො ද්වෙ කහාපණෙ නීහරිත්වා සාලාපාලකස්ස දත්වා එවමවදි: "සක්කච්චං ඉමං පුරිසං පටිජග්ගාහි, සචෙ (තස්ස'ත්ථාය) කොචි ධනබ්බයො හොති තං සබ්බම්හං පච්චාගමනකාලෙ දස්සාමී"ති.

## . ජීමූතවාහන කුමරා.

හිමාලයේ එක් පර්වතකූටයක් මත්තෙහි කඤ්චනපුර නම් නගරයක් විය. පූර්වයේදී ඒ නගරවරයෙහි "ජීමූතකේතු" නම් රජතුමෙක් විය. එතුමාගේ ඇතුළුනුවර වූ රාජෝද්‍යානයෙහි ආයාචකයන්ගේ මනොරථපූරණය කරන්නාවූ පරම්පරාගත කල්ප වෘක්ෂයක් විය. ඒ රජතෙමේ ඒ කල්පතරුවට උපස්ථානකොට වෘක්ෂයාගේ ආනුභාවයෙන් අත්‍යන්තයෙන් පරිත්‍යාගශීලී වූ සකල සත්වානුකම්පී වූ උත්තමගුණයුත් **ජීමූතවාහන** නම් පුත්‍රයකු ලැබීය.

එකුමරු වැඩිවිය පත් කල්හි රජතෙම ඔහු යුවරාජත්වයෙහි පිහිටුවිය. ඉක්බිති එක් දිනක් ඒ කුමරතෙමේ හුදකලාව වසන පිය රජු වෙත පැමිණ: මහරජ, මේ ශරීරය ආදි සියලු සංස්කාර ධර්මයන් චඤ්චල රළපෙළකට සමානබව ඔබ දනිත්. ධනයාගේත් විදුලියගේත් ස්ථිරභාවයක් කොතැනක කවරකු විසින් දක්නා ලද්දේද? මෙ සසරෙහි එකම පරෝපකාරය ස්ථිර ද පුණ්‍යය හා කීර්තිය උපදවන්නේ ද වේ. මෙසේ සියලු දෙය අනිත්‍ය කල්හි කුමක් සඳහා මේ කප්රුක මෙසේ රකිනුලැබේදැ"යි ඇසීය.

## 13. රාජසුතො ජීමූතවාහනො.

හිමවතො එකස්ස කූටස්ස මත්ථකෙ කඤ්චනපුරං නාම නගරමහොසි. තස්මිං පුරුත්තමෙ පුරා ජීමූතකෙතු නාම රාජා'හවි. තස්ස අන්තෙපුරුය්‍යානෙ (=පමිදවනෙ) ආයාචකානං මනොරථපූරකො පරම්පරාගතො එකො කප්පරුක්ඛො අහොසි සො රාජා තං කප්පතරුමුපට්ඨහන්තො තස්සා'නුභාවෙන අච්චන්තං දාන සංවිභාගරතං සකලපජානුකම්පිං උත්තමගුණයුත්තං **ජීමූතවාහනං** නාම කුමාරමලභි.

වයප්පත්තෙ තස්මිං කුමාරෙ රාජා තං ඔපරජ්ජෙ අභිසිඤ්චි. අථෙ'කදා සො කුමාරො පටිසල්ලීනං පිතුරාජානමුපසඞ්කම්ම එව'මවොච: "මහාරාජ, ඉමං සරීරමාදිං කත්වා සබ්බෙසං සංඛතධම්මානං චලමානතරඞ්ගසමානත්තං ත්වං ජානාසි. ධනස්ස විජ්ජු-යා ච ථිරභාවො කදා කෙන දිට්ඨො? ඉමස්මිං සංසාරෙ එකොව පරොපකාරො ථිරො පුඤ්ඤ-යසාවහො ච හොති. එවං සබ්බධම්මෙසු අනිච්චෙසු කිමත්ථායා'යං කප්පරුක්ඛො එවං රක්ඛීයතී"ති.

## 14. විතස්තාදත්තවෙළඳා හා ඔහුගේ පුත්‍රයා.

විතස්තානදීතීරයෙහි "තක්සලා" නම් නගරයක් විය. නදීජලයෙහි ප්‍රතිබිම්බිතවූ ඒ නගරයාගේ ප්‍රාසාදපඞ්ක්තිය වනාහි නගරශ්‍රීය බැලීම සඳහා නාගලොවින් මතුවූ නාගපුරියක් සේ දෘශ්‍යමානවිය. ඒ නගරයෙහි බුද්ධභක්තිපරායණවූ "විතස්තාදත්ත" නැමැති ධනවත් වෙළඳෙක් විසීය ඔහට "රත්නදත්ත" නමැති පුත්‍රයෙක් සිටියේය. ඒ පුත්‍රයා නිතොරම සිය පියාට පව්කාර-යෙකැයි ආක්‍රෝශ කෙළේය. "කවරහෙයකින් තෝ මට මෙසේ ආක්‍රෝශකෙරෙහි දැ"යි පියා විසින් විචාරණලද හෙතෙමේ "වෛදික ධර්මයට විරුද්ධව ධර්මවිරෝධ ක්‍රියාවන්හි යෙදෙන හෙයිනුත් බමුණන් හැරදමා නිරන්තරයෙන් බෞද්ධභික්ෂූන් සේවනය කරන හෙයිනුත්ය"යි කීය.

"ද්වේෂාදි කෙලෙසුන්ගෙන් වෙන්වීමත් සත්‍යවාදී බවත් සකල සත්ත්වානුකම්පාවත් බ්‍රාහ්මණධර්මයෙහි ඇතුළත්යයි සිතමි"යි පියා කීය. පියාවිසින් මෙසේ කියනලද හෙතෙමේ ඒ කීම පිළිනොගෙන වඩවඩාත් පියාට ආක්‍රෝශ කරන්ට පටන්ගති. එයින් ඛේදයට පත් පියතෙමේ "කාලිඞ්ගදත්ත" නම් රජු වෙත පැමිණ මේ සියලු පුවත් දැන්විය. ඉක්බිති රජතෙම ඒ වෙළඳපුතු සවභවනයට ගෙන්වා තමා කෝපාවිෂ්ටවූ සේ දක්වා "මේ අතිදුෂ්ටවූ පාපිෂ්ට වාණිජපුත්‍රයා මරාදමව්"යයි කීයේය.

## 14. වාණිජො විතත්ථාදත්තො තස්ස පුත්තො ච.

විතත්ථානදියා තීරෙ තක්කසිලා නාම නගරී අහොසි. නදී ජලෙ පටිබිම්බිතා පන'ස්ස පාසාදපන්ති තන්නාගරසිරිමොලො-කෙතුකාමතාය අධොභුවනා'ගතා නාගපුරීව පඤ්ඤායිත්ථ. තස්මිං නගරෙ බුද්ධභත්තිපරායණො විතත්ථාදත්තො නාම ධනවා වාණිජො වසි. තස්ස රතනදත්තො නාම පුත්තො. සො නිබද්ධං අත්තනො පිතරං "පාපො"ති අක්කොසි. "කස්මා ත්වං මං එවමක්කොසසී?"ති පිතරා පුට්ඨො සො එවමාහ: "ත්වං වෙදවිමුඛො හුත්වා තංධම්ම විරුද්ධකිච්චප්පසුතො බ්‍රාහ්මණෙ වජ්ජෙත්වා නිබද්ධං සක්‍යපුත්තියෙ භික්ඛූ උපට්ඨහසී"ති.

තං සුත්වා වාණිජො: 'දොසාදිකිලෙසෙහි විගමනං, සච්චවාදිතා, සබ්බභූතානුකම්පිකතා ච බ්‍රාහ්මණධම්මන්තොගධා'ති මඤ්ඤෙ"ති අවච පිතරා එවං වුත්තො සො තස්ස වචනමනාදියිත්වා අතිරෙකතරං පිතරමක්කොසි කුමාරකො. තෙන ඛින්නචිත්තො පිතා කාලිඞ්ගදත්තං රාජානමුපසඞ්කමිත්වා සබ්බම්මිං පවත්තිමාරොචෙසි. තතො රාජා තං වාණිජපුත්තං අත්තනො භවනමානයාපෙත්වා මුසාරචිතකොපො (=කොපාවිට්ඨමිව අත්තානං දස්සෙත්වා) "ඉමං අච්චන්ත කක්ඛළං පාපිට්ඨං වාණිජපුත්තං ඝාතෙථා"ති ආහ.

## 15. සිල්වතාගේ භේෂජ

කූටකණ්ණ රජතුමා "ගිරිගම් කොණ" වැසි චූලසුධම්ම තෙරුන්ට මමත්වය කරයි, හෙතෙම උපුල්වැව වසන්නේ තෙරුන් කැඳවීය. තෙරුන්වහන්සේ අවුත් මණ්ඩලාරාමවිහාරයෙහි වසත්. රජ තෙරුන්ගේ මවගෙන් "ස්ථවිරතුමා කුමක් ප්‍රියකෙරේද"යි ඇසීය. "මහරජ, අල"යයි (ඈ කීය). රජ අල (තම්බා) ගෙන්වා ගෙන විහාරයට ගොස් තෙරුන්වහන්සේට දෙන්නේ මුහුණ බලන්ට අසමර්ථවිය.

හෙතෙම නික්ම පිරිවෙණෙන් පිටදී "තෙරුන්වහන්සේ කෙබඳුද්ද"යි බිසවගෙන් ඇසීය. "ඔබතුමා පුරුෂයෙක් වී උඩ බලන්ට අසමර්ථවූයේය, ස්ත්‍රියක්වූ මම කෙසේ සමර්ථවන්නෙම්ද"යි බිසව කීය. රජතුමා "මගේ රටෙහි බදුගෙවන ගෘහපතියකුගේ පුත්‍රයකු මූණ ඔසවා බලන්ට අසමර්ථවෙමි, බුද්ධශාසනය වනාහි ඒකාන්තයෙන් උත්තමය"යි (කියා) අත්තල ගැසීය.

## 15. සීලවන්තො මහානුභාවතා.

**කූටකණ්ණරාජා** කිර **ගිරිගාමකණ්ණවාසිං** **චූළසුධම්මත්ථෙරං** මමායති. සො **උප්පලවාපියං** වසමානො ථෙරං පක්කොසාපෙසි. ථෙරො ආගන්ත්වා **මාලාරාමවිහාරෙ** වසති. රාජා ථෙරස්ස මාතරං පුච්ඡි. "කිං ථෙරො පියායතී?"ති. 'කන්දං මහාරාජා" ති. රාජා කන්දං ගාහාපෙත්වා විහාරං ගන්ත්වා ථෙරස්ස දදමානො මුඛං උල්ලොකෙතුං නාසක්ඛි.

සො නික්ඛමිත්වා බහිපරිවෙණෙ දෙවිං පුච්ඡි. "කීදිසො ථෙරො?"ති. "ත්වං පුරිසො හුත්වා උල්ලොකෙතුං න සක්කොසි; අහං කථං සක්ඛිස්සාමි, නාහං ජානාමි කීදිසො"ති. රාජා "මම රට්ඨෙ බලිකාරගහපතිපුත්තං උල්ලොකෙතුං න විසහාමි; මහන්තං වත භො බුද්ධසාසන"න්ති අප්ඵොටෙසි" (ඤාණවිභඞ්ග අටුවාවෙනි.)

## 16. පමණ දැනීම යහපති.

තිස්ස (සද්ධාතිස්ස?) මහරජතුමා දවස්පතා සෑගිරියෙහි භික්ෂු සංඝයාට දන් දෙන්නේ "මහරජ, කුමකුහෙයින් එක්තැනක්ම සේවනය කෙරෙහිද, අන් තැනෙක්හිත් දන් දෙන්ට නොවටීද"යි රටවැසියන් විසින් කියනලද්දේ දෙවෙනි දවස්හි අනුරාධපුරයෙහි මහදන් දෙවීය. එක් භික්ෂුනමක්වත් පිළිගැන්මෙහි පමණ නොදත්තේය. එක් එක් නම පිළිගත් ඛාද්‍ය-භෝජ්‍යයන් දෙතුන් දෙනෙක් ඉස්සූහ.

රජතුමා දෙවෙනිද සෑගිරියෙහි භික්ෂුසංඝයාට ආරාධනය කරවා ඇතුළ්රජගෙට පැමිණි කල්හි "පාත්‍ර දුනමැනවැ"යි කීය. "මහරජ, ඕනෑනැත; තමාගේ ප්‍රමාණයෙන් භික්ෂාව ගන්නාහ"යි (කියා) එක් භික්ෂුනමක්වත් පාත්‍රය නොදුන්නේය. සියළුදෙනාවහන්සේ ප්‍රමාණයෙන් යුත් භෝජනයම ගත්හ. ඉක්බිති රජතුමා "බලව්, තොපගේ භික්ෂූන් අතරෙහි එක් නමක්වත් පමණ නොදනී, ඊයේ කිසිවක් ඉතිරි නොවිය; අද ගත් දේ ස්වල්පය, ඉතිරි දේ බොහෝය"යි (කියා) ඔවුන්ගේ පමණ දැන්මෙහි තුටුසිතැත්තේ අවශෙෂයන්ගේ පමණ නොදැන්මෙහි නොසතුටු සිතැත්තේ විය.

## 16. සාධු මත්තඤ්ඤුතා.

"**තිස්සමහාරාජාපි** දෙවසිකං **චෙතියපබ්බතෙ** භික්ඛුසංඝස්ස දානං දදමානො "මහාරාජ, කිං එකමෙව ඨානං භජසි? කිං අඤ්ඤත්ථ දාතුං න වට්ටතී"ති? ජානපදෙහි වුත්තො දුතියදිවසෙ **අනුරාධපුරෙ** මහාදානං දාපෙසි. එකභික්ඛුපි පටිග්ගහණෙ මත්තං න අඤ්ඤාසි. එකමෙකෙන පටිග්ගහිතං ඛාදනීය-භොජනීයං ද්වෙ තයො ජනා උක්ඛිපිංසු.

රාජා දුතියදිවසෙ චෙතියපබ්බතෙ භික්ඛුසංඝං නිමන්තා-පෙත්වා රාජන්තෙපුරං ආගතකාලෙ "පත්තං දෙථා"ති ආහ. "අලං මහාරාජ, අත්තනො පමාණෙන භික්ඛං ගණ්හිස්සන්තී"ති එක භික්ඛුපි පත්තං න අදාසි. සබ්බෙ පමාණයුත්තකමෙව පටිග්ග-හෙසුං. අථ රාජා "පස්සථ, තුම්හාකං භික්ඛූසු එකොපි මත්තං න ජානාති; හියො කිඤ්චි අවසෙසං නාහොසි; අජ්ජ ගහිතං මන්දං අවසෙසමෙව බහූ"ති තෙසං මත්තඤ්ඤුතාය අත්තමනො ඉතරෙ-සඤ්ච අමත්තඤ්ඤුතාය අනත්තමනො අහොසි"

## 17. බැමිණිතියාසාය කල.

වත්තබ්බකනිග්‍රෝධතෙරුන් සාමණේරකලැ බමුණුතිස් බිය පහළවිය. සාමණේරතුමා ද ඔහුගේ උපාධ්‍යායස්ථවිරතුමා ද මූදින් එතර නොගියාහ "කොළ කන මිනිසුන් ආශ්‍රයකොට වසන්නෙමු"යි පිටිසරට අභිමුඛවූහ. සාමණේරතෙමේ සතියක් පමණ නිරාහාර වැ එක් ගම්පෙදෙසක තල්ගසක ඉදුණු තල්ගෙඩි දැක "ස්වාමීනි, ටිකක් නැවතුනමැනව, තල්ගෙඩි හෙළමි"යි උපාධ්‍යායයන්ට කිය "සාමණේරය, තෝ දුබ්ලවෙහි, නොනගුව"යි. "ස්වාමීනි, නගින්නෙම්ය"යි (කියා) කුඩා පිහියක් ගෙන තල්ගසට නැග තල්වල්ල කපන්ට පටන්ගත්තේය. පිහියා තලය ගැලවී බිම වැටුණේය. 'මෙතෙමේ වෙහෙසෙමින් ම ගසට නැගුණේය, දැන් කුමක් නම් කරන්නේදැ"යි ස්ථවිරතුමා සිතී. සාමණේරතුමා තල්කොළ ඉර ඉරා පිහියාමිටේ බැඳ ගැටගසා බිමට බා "ස්වාමීනි, පිහියාතලය මෙහි ඔබනසේක්නම් යෙහෙකැ"යි කීය. ස්ථවිරතුමා "සාමණේරයා උපාය දන්නෙකැ"යි (සිතමින්) පිහියා තලය ඇතුල්කොට දුණි. හෙතෙම පිහිය ඔසවා තල්ගෙඩි හෙළීය. යම්තාක්කල් තල්ගෙඩි විද්‍යමාන වූවහු ද ඒතාක් එහි වැස ගෙඩි අවසන්වූ පසු පිළිවෙළින් (ගොස්) කොළ කන මිනිසුන් වසන තැනක හැරදමූ එක් විහාරයකට ඇතුල්වූහ.

පියමහරජ (=වළගම්බා රජ) තුමා රාජ්‍යයට පැමිණියේය; මුහුදට එතරින් ආ භික්ෂූහු "වත්තබ්බක නිග්‍රොධස්ථවිරතුමා කොහේද? වත්තබ්බක නිග්‍රොධස්ථවිරතුමා කොහේදැ"යි අසා උන්වහන්සේ සමීපයට ගියහ. මහාභික්ෂුසමූහයක් තෙරුන් පිරිවැරීය. හෙතෙම මහබික්සඟ විසින් පිරිවරනලද්දේ ක්‍රමයෙන් මහාවිහාරයට පැමිණ මහාබෝධිය ද මහසෑය ද ථූපාරාම චෛත්‍ය යද වැඳ නුවරට ඇතුල්විය. දකුණු දෙරටුව දක්වා යන කල්හිම නවතැනකදී තුන්සිවුරු උපන්නේය. ඇතුළු නුවරට පිවිසිතැන් පටන් මහත් සත්කාර උපන්නේය. මෙසේ විපත්තිකාලයේදී තල්ගෙඩි අල-මුල්-කොළත් දුලීභවිය, සම්පත්කාලයේදී මෙවැනි මහාලාභය උපන්නේය.

## 17. බ්‍රාහ්මණතිස්සභයෙ වත්තමානෙ.

"වත්තබ්බකනිග්‍රොධත්ථෙරස්සාපි සාමණෙරකාලෙ බ්‍රාහ්මණතිස්සභයං උදපාදි. සාමණෙරො ච උපජ්ඣායො චස්ස පරසමුද්දං නාගමංසු, "පණ්ණඛාදකමනුස්සෙ උපනිස්සාය වසිස්සාමා"ති පච්චන්තාභිමුඛා අහෙසුං. සාමණෙරො සත්තාහමත්තං අනාහාරො හුත්වා එකස්මිං ගාමට්ඨානෙ තාලරුක්ඛෙ පක්කං දිස්වා උපජ්ඣායං ආහ. "භන්තෙ ථොකං ආගමෙථ, තාලපක්කං පාතෙස්සාමී"ති. "දුබ්බලොසි ත්වං සාමණෙර, මා අභිරුහී"ති. "අභිරුහිස්සාමි භන්තෙ"ති ඛුද්දකවාසිං ගහෙත්වා තාලං ආරුය්හ තාලපිණ්ඩිං ඡින්දිතුං ආරභි. වාසිඵලං නික්ඛමිත්වා භූමියං පති. ථෙරො චින්තෙසි. "අයං කිලමන්තොව රුක්ඛං ආරුළ්හො, කිං නු ඛො ඉදානි කරිස්සතී"ති. සාමණෙරො තාලපණ්ණං ඵාලෙත්වා ඵාලෙත්වා වාසිදණ්ඩකෙ බන්ධිත්වා ඝට්ටෙන්තො ඝට්ටෙන්තො භූමියං පාතෙත්වා "භන්තෙ, සාධු වතස්ස සචෙ වාසිඵලං එත්ථ පවෙසෙය්‍යාථා"ති ආහ. ථෙරො "උපායසම්පන්නො සාමණෙරො"ති වාසිඵලං පවෙසෙත්වා අදාසි. සො වාසිං උක්ඛිපිත්වා තාලඵලානි පාතෙසි ............................ යාව තාලඵලානි අහෙසුං තාව තත්ථෙව වසිත්වා ඵලෙසු ඛීණෙසු අනුපුබ්බෙන පණ්ණඛාදකමනුස්සානං වසනට්ඨානෙ එකං ඡඩ්ඩිතවිහාරං පවිසිංසු"

"**පිතුමහාරාජා** රජ්ජං පටිපජ්ජි පරසමුද්දා ආගතාගතා භික්ඛූ "**කහං වත්තබ්බකනිග්‍රොධත්ථෙරො? කහං වත්තබ්බකනිග්‍රොධත්ථෙරො**"ති? පුච්ඡිත්වා තස්ස සන්තිකං අගමංසු. මහාභික්ඛුසංඝො ථෙරං පරිවාරෙසි. සො මහාභික්ඛුසංඝපරිවුතො අනුපුබ්බෙන **මහාවිහාරං** පත්වා **මහාබොධිං මහාචෙතියං ථූපාරාමං**

ච වන්දිත්වා නගරං පාවිසි යාව දක්ඛිණද්වාරා ගච්ඡන්තස්සෙව නවසු ඨානෙසු තිචීවරං උප්පජ්ජි, අන්තොනගරං පවිට්ඨකාලතො පට්ඨාය මහාසක්කාරො උප්පජ්ජි, ඉති කාලවිපත්තියං තාලඵල-කන්ද-මූල-පණ්ණම්පි දුල්ලභං ජාතං; කාලසම්පත්තියං එවරූපො මහාලාභො උප්පන්නොති.”

## 18. ශාසනපරම්පරාව රැකගත්සැටි.

බ්‍රාහමණතිස්සසොරා රට වැනසීය. සංඝතෙමේ සියලු දෙසින් නාගදීපයට ගොස් දඹකොළපටුනෙහි තෙමහල් මහපහුරක් බැන්දවිය; (පහුරේ) එක් තට්ටුවක් ජලයෙහි ගැලුනේය, එකක භික්ෂුසමූහයා උන්නේය, එකක පාත්‍ර සිවුරු තැබූහ. සංයුත්ත-භාණක චූලසිවසථ්විරය - ඉසිදත්තසථ්විරය - මහාසෝණසථ්විරය යි තෙරතුන්නමක් ඒ පිරිස්වලට අධිපතිවූහ. ඒ තුන්නම අතුරෙන් තෙරදෙනමක් මහාසෝණතෙරුන්ට “ඇවැත, මහා-සෝණ, පහුරට නැගෙව”යි කීහ. ස්වාමීනි, ඔබවහන්සේලා (කුමක් කරන්ට ද)? “ඇවත, ජලයේදී මියයාමත් ගොඩදී මියයාමත් මෙපමණෙක්මය (=එකසැටිමය), අපි නොයන්නෙමු; තා නිසා වනාහි අනාගතයෙහි ශාසනයාගේ පරම්පරාව පවතින්නේය, ඇවත තෝ යව”යි. “ස්වාමීනි, ඔබවහන්සේලා නොයන කල්හි මමත් නොයන්නෙමි”යි. තුන්වර දක්වා කියාත් තෙරුන් නංවන්නට නොහැක්කාහු නැවතුණාහ.

ඒ කාලයෙහි මහාවිහාරය හිස් විය, මහසැමළුවෙහි එරඬු ගස් පැලවූහ: චෛත්‍යය පැළැටියෙන් ගැවසුණේ සෙවෙලෙන් වැසුණේ විය. සථ්විරතුමා ජීවමාන බුදුන්ට ගෞරව දක්වන්නාසේ මහසෑය වැඳ බටහිරදෙස ශාලාවට පිවිස බලමින් “මෙවැනි අග්‍රලාභයටත් අග්‍රකීර්තියටත් පැමිණි බුදුරදුන්ගේ ශරීරධාතු නිදන් කළතැන අසරණවීය”යි සිතමින් හුන්නේය.

ඉසිදත්තසථ්විරතුමා ද පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන්නේ අළුදනව්වට පැමිණියේය, එහි මිනිස්සු ඉතා නොඉදුණු මීගෙඩි පළා ඇට ගෙන පොතු දමා ගියහ. සථ්විරතුමා “ඇවත, මහා-සොණ, භික්ෂාහාරයක් පෙනේ” යයි කියා පාසිවුරු ගෙන්වාගෙන සිවුරු පොරවා පාත්‍රය පිටතට ගෙන සිටියේය. කුඩා දරුවෝ වැඩසිටි තෙරුන් දැක “මෙයින් කිසි ප්‍රයෝජනයක් ඇතැ” යි (සිතා) වැලි පිසදමා මීගෙඩි පොතු පාත්‍රයෙහි දමා දුන්හ. තෙරවරු අනුභව කළහ. සත්දිනක් පමණ එයම ආහාරය විය.

බමුණුතිස් සොරු මළකල පිතෘමහාරාජතෙමේ ඡත්‍ර නැංවිය. "බිය සංසිඳුණේය, රට සමෘද්ධය"යි අසා භික්ෂුගණයා පරතෙරින් නැව් නැගී මාතොටපටුනෙහි බැස "මහාසොණස්ථවිර කොහි වෙසේද"යි අසා තෙරුන් සමීපයට ගියේය. තෙරුන්වහන්සේ පන්සියයක් භික්ෂූන් පිරිවරකොට ඇත්තාහු කාලකගම මණ්ඩලාරාම (වට්ටාරම) විහාරයට පැමිණියහ.

### 18. සාසනස්ස රක්ඛිතාකාරො.

"**බ්‍රාහ්මණතිස්සචොරොපි** ජනපදං විද්ධංසෙසි....................
........සඞ්ඝො සබ්බදිසාහි **නාගදීපං** ගන්ත්වා **ජම්බුකොලපට්ටනෙ** තිභූමක - මහාඋළුම්පං බන්ධාපෙසි. එකා භූමිකා උදකෙ ඔසීදි; එකිස්සා භික්ඛුසඞ්ඝො නිසින්නො, එකිස්සා පත්තචීවරානි ඨපයිංසු, සංයුත්තභාණක - **චූළසිවත්ථෙරො, ඉසිදත්තත්ථෙරො, මහාසොණත්ථෙරොති** තයො ථෙරා තාසං පරිසානං පාමොක්ඛා. තෙසු ද්වෙ ථෙරා **මහාසොණත්ථෙරං** ආහංසු: "ආවුසො මහාසොණ, අභිරුහ උළුම්පං"න්ති. "තුම්හෙ පන භන්තෙ"ති? "ආවුසො, උදකෙ මරණම්පි ථලෙ මරණම්පි එකකමෙව, න මයං ගමිස්සාම; තං නිස්සාය පන අනාගතෙ සාසනස්ස පවෙණි ඨස්සති, ගච්ඡ ත්වං ආවුසො"ති. "නාහං භන්තෙ තුම්හෙසු අගච්ඡන්තෙසු ගමිස්සාමී"ති යාව තතියං කථෙත්වාපි ථෙරං ආරොපෙතුං අසක්කොන්තා නිවත්තිංසු."

"තස්මිං සමයෙ මහාවිහාරො සුඤ්ඤො, චෙතියඞ්ගණෙ එරණ්ඩා ජාතා; චෙතියං ගච්ඡෙහි පරිවාරිතං, සෙවාලෙන පරියොනද්ධං. ථෙරො ධරමානකබුද්ධස්ස නිපච්චාකාරං දස්සෙන්තො විය මහාචෙතියං වන්දිත්වා පච්ඡිමදිසාය සාලං පවිසිත්වා ඔලොකෙන්තො "එවරූපස්ස නාම ලාභග්ග - යසග්ගප්පත්තස්ස සරීරධාතු-නිවාසට්ඨානං අනාථං ජාත"න්ති චින්තයමානො නිසීදි."

---

"**ඉසිදත්තත්ථෙරොපි** අනුපුබ්බෙන චාරිකං චරන්තො **අළජනපදං** සම්පාපුණි. තත්ථ මනුස්සා නාතිපක්කානි මධුකඵලානි භින්දිත්වා අට්ඨිං ආදාය නවං ඡඩ්ඩෙත්වා අගමංසු. ථෙරො "ආවුසො **මහාසොණ,** භික්ඛාහාරො පඤ්ඤායතී"ති වත්වා පත්තචීවරං ආහරාපෙත්වා චීවරං පාරුපිත්වා පත්තං නීහරිත්වා අට්ඨාසි. තරුණදාරකා ථෙරං ඨිතං දිස්වා "ඉමිනා කොචි අත්ථො භවිස්සතී"ති වාලුකං පුඤ්ඡිත්වා මධුකඵලත්තචං පත්තෙ පක්ඛිපිත්වා අදංසු. ථෙරා පරිභුඤ්ජිංසු. සත්තාහමත්තං සො යෙව ආහාරො අහොසි.

“**බ්‍රාහ්මණතිස්ස**චොරෙ මතෙ **පිතුමහාරාජා** ජනතං උස්සාපෙසි “භයං වූපසන්තං, ජනපදෙ සම්පන්නො”ති සුත්වා පරසමුද්දතො භික්ඛුසඞ්ඝො නාවාය **මහාතිත්ථපට්ටනෙ** ඔරුය්හ “**මහාසොණත්ථෙරො කහං** වසතී”ති පුච්ඡිත්වා ථෙරස්ස සන්තිකං අගමාසි. ථෙරො පඤ්චසතභික්ඛුපරිවාරො **කාලකගාමෙ මණ්ඩලාරාමවිහාරං** සම්පාපුණි.”

## 19. නාලන්දාශ්‍රී විශ්වවිද්‍යාලය.

පෙර දඹදිව සෞගත මහාවිද්‍යාලයන් අතුරෙන් අතිශයෙන් ප්‍රකටභාවයට පැමිණියේ **නාලන්දාවිශ්වවිද්‍යාලයයි.** ඒ විද්‍යාලය මුළු මගධරටෙහි “ධර්මගඤ්ජා” **නාමයෙන්** ප්‍රකටවිය. භාරතීයපුස්තකාලයන් අතුරෙන් ඉතාමහත් එකවූ ඒ විශ්වවිද්‍යාලය බද පුස්තකාලය “රත්නොදධි” නමැති නවභූමික මහාප්‍රාසාදයක පිහිටුවා තිබුණේය ක්‍රිස්තොත්පත්තියෙන් පෙර ප්‍රථම ශතවර්ෂයේ පටන් හෙවත් ඒ මහාවිද්‍යාලයෙහි ආචාර්‍ය්‍යවරයෙක් ව විසූ නාගාර්ජුන මහාස්ථවිරතුමාගේ කාලයේ සිට - ක්‍රිස්තොත්පත්තියෙන් අටවෙනි ශතසංවත්සරය දක්වා මේ විශ්වවිද්‍යාලය අභිවෘද්ධියෙන් අනූනව පැවැත්තේය.

අෂ්ටමශතවත්සරය පවත්නාකල මේ නිඛිලවිද්‍යාලයට නුදුරු තැන උදන්තපුරියෙහි පාලරජවරුන්ගේ අනුග්‍රහයෙන් කරවූ මහාවිද්‍යාලය ශ්‍රෙෂ්ඨතර භාවයට පත්විය. සප්තමශතවත්සරයාගේ මුලදීම “හියුඑන් සියං” නමැති මහාපඨිටක චීන තෙරුන්වහන්සේ නාලන්දාමහාවිද්‍යායතනයට පැමිණ එහි පණ්ඩිතාචාර්‍ය්‍යයන්ගෙන් සංස්කෘතයට නැගුණු බුද්ධධර්මය ඉගෙන ඒ විද්‍යායතනය සම්බන්ධ ප්‍රවෘත්තීන් ද ඇතුළත් කොට විශාල වූ භ්‍රමණවෘත්තාන්තයක් ස්වභාෂාවෙන් ලිව්වේය.

---

## 19. නාලන්දාය නිඛිලවිජ්ජාලයො.

පුරාණජම්බුදීපෙ සොගතමහාවිජ්ජායතනෙසු අතිපාකටභාවප්පත්තමපන නාලන්දානිඛිලවිජ්ජායතනමහොසි. සො පන විජ්ජාලයො සකලමගධරට්ඨෙ “ධම්මගඤ්ජා” නාමෙන විදිතො'හවි. භාරතීය - පොත්ථකාලයානං මහන්නතමො තස්ස විජ්ජායතනස්ස පොත්ථකාලයො “රතනොදධි” නාමම්හි නවභූමක-පාසාදෙ පතිට්ඨාපිතො අහොසි. කිස්තුප්පත්තිතො පඨමසතවච්ඡරතො පට්ඨාය, අථවා තස්මිං විජ්ජාලයෙ ආචරියභාවෙන වුත්ථස්ස නාගජ්ජුනමහාථෙරස්ස කාලතො පට්ඨාය, යාව කිස්තුප්පත්තිතො අට්ඨමසතවච්ඡරං අයං නිඛිලසත්ථාලයො අභිවුඩ්ඪියා අනූනො පවත්තිත්ථ.

අට්ඨමසතවච්ඡරෙ වත්තමානෙ ඉමස්ස විජ්ජායතනස්ස නාති-දූරට්ඨානෙ උද්දන්තපුරියං පාලරාජූනං අනුග්ගහෙන කාරාපිතො පන මහාවිජ්ජාලයො සෙට්ඨතරභාවං සම්පාපුණි. සත්තම-සත වච්ඡරස්ස ආදිම්හි යෙව "හියුඑන් සියං" නාමො මහාපරියටකො චීනදෙසීයත්ථෙරො එතං නාලන්දාමහාවිජ්ජායතනං පත්වා තත්ථ පණ්ඩිතාචරියානං සන්තිකා සක්කතභාසාරුළ්හං බුද්ධධම්මමුග්ගහෙත්වා තස්ස විජ්ජායතනස්ස පවත්තියො ච අනෙකා කත්වා මහන්තං පරියටනවුත්තන්තං නිජභාසාය ලිඛිත්වා ඨපෙසි.

## 20. උද්දන්තපුරි මහාවිද්‍යාලය.

පාලවංශික රජවරුන් මගධාධිපතිත්වයට පැමිණෙන්ට බොහෝ කලකට පෙර උදන්තපුරියෙහි මහාසඞ්ඝාරාමයක් තිබුණේය. පාලරජුන්ගේ කාලයේදී මගධයෙහි අග්‍රරාජධානිය බවට පත්වූ නගරයක් මේ විහාරය අසල ගොඩනැංවූ බැවින් ද මේ විහාරය මගධයෙහි අත්‍යුත්කෘෂ්ටභාවයට පත්වූ හෙයින් ද ඒ මුළු රටම "විහාර" (හෙවත් "බිහාර්") නාමයෙන් ප්‍රකටවිය. බ්‍රාහමණයන් විසින් නින්දාවශයෙන් "මඝ" යයි පෙරළනලද පුරාණ "මගධ" නාමය ක්‍රමයෙන් අභාවයට ගියේය.

මහීපාලරජුගේ පුත්‍රවූ මහාපාලරජුගේ කාලයේදී මේ උදන්තපුරිමහාවිහාරයෙහි හීනයානික - මූලස්ථවිරවාදී දහසක් පමණ භික්ෂූහු ද පන්දහසක් පමණ මහායානික භික්ෂූහු ද විසූහ. පාල රජවරු වනාහි උදන්තපුරිමහාවිහාරයෙහි වෛදික-සෞගත-ධර්ම ග්‍රන්ථයන්ගෙන් පිරුණු මහාපුස්තකාලයකින් යුත් ශ්‍රමණවිශ්ව-විද්‍යාලයක් පිහිටවූහ. ඒ පුස්තකාලය වනාහි මහමත්වරුන් විහාරයන් වනසමින් භික්ෂූන් නසනකල්හි 1202 වෙනි වර්ෂයේදී විනාශකරන ලද්දේය.

ඒ කාලයේදීම චීනයෙහි විසූ ටාටරියාධිරාජයන්ගේ අනුග්‍රහය ~~නිසා ටිබැට්රට ආදිම සංඝරාජයාණන්ගේ නිවාසස්ථානය බවට~~ පැමිණි "සාක්‍ය මහාවිහාරය" උදන්තපුරියෙහි මහාසංඝාරාමය අනුව කරවනලද්දේය. ඒ සාක්‍යමහාවිහාරියයෝ උදන්තපුරී සංඝාරාමයෙහි පැවති ශික්ෂාපදයන් විනයනයන් අනුගමනය කළහ.

## 20. උද්දන්තපුරිමහාවිජ්ජාලයො.

පාලරාජූනං මගධාධිපච්චලාභතො අතිපුරා යෙව උද්දන්තපුරියං මහාසඞ්ඝාරාමො අහොසි. පාලවසුධාධිපානං සමයෙ මාගධ-රාජධානිභාවප්පත්තස්ස එකස්ස නගරස්ස එතස්ස මහාවිහාරස්සාසන්නෙ

මාපිතත්තා ච ඉමස්ස විහාරස්ස මගධදෙසෙ අච්චුන්නතභාවප්පත්තිතො ච සබ්බොපි මගධදෙසො "විහාර" (=බිහාර්) නාමෙන පාකටො'හවි. පොරාණං මගධනාමං, බ්‍රාහ්මණෙහි නින්දාවසෙන "මඝ" ඉති වොහාරං පාපිතං, අනුක්කමෙන විස්සරිතමහොසි.

මහීපාලරඤ්ඤො පුත්තස්ස මහාපාලරාජිනො කාලෙ අස්මිං උදන්තපුරීමහාවිහාරෙ සහස්සමත්තා හීනයානික – මූලථෙර වාදිනො භික්ඛූ ච පඤ්චසහස්සමත්තා මහායානිකභික්ඛූ ච වසිංසු. පාලරාජානො පන තස්මිං මහාසඞ්ඝාරාමෙ වෙදික – සොගතධම්ම ගන්ථපරිපුණ්ණෙනෙ'කෙන පොත්ථකාලයෙන සහිතං සාමණ්ණකං තිබිලවිජ්ජාලයං පතිට්ඨාපෙසු. සො පනෙ'සො පොත්ථකාලයො මාහම්මදිකානං විහාරවිධංසනෙ භික්ඛුඝාතනෙ ච වත්තමානෙ 1202 මෙ වස්සෙ විධංසිතො අහොසි

තස්මිං යෙව සමයෙ චීනදෙසෙ චුත්ථානං ටාටරියාධිරාජූනං අනුග්ගහං ලභිත්වා තිබ්බතදෙසෙ, ආදිමසඞ්ඝරඤ්ඤො නිවාසට්ඨානත්තං පත්තො, "සක්‍යමහාවිහාරො" උදන්තපුරියං මහා සඞ්ඝාරාම මනුගන්ත්වා කාරිතො අහොසි. තෙ පන සක්‍යමහාවිහාරීයා උදන්තපුරීමහාවිහාරෙ පවත්තං සික්ඛාපනං විනයනඤ්ච අනුගච්ඡිංසු.

## 21. වික්‍රමශිලාශ්‍රී විශ්වවිද්‍යාලය.

අටවෙනි ක්‍රිස්තුශතාබ්දයේ මධ්‍යභාගයේදී ධර්මපාලමහරජු විසින් පිහිටුවනලද වික්‍රමශිලාරාජමහාවිහාරය ගංගානදියගේ වම් ඉවුර අසල පර්වතයක් මස්තකයෙහි බැබළුණේය. ප්‍රධාන විහාර මන්දිරය අවට තුදුරුතැන්හි සඞ්ඝාවාස 107 ක් ගොඩනගනලදහ; ඒ සියල්ල වටකොට මහාප්‍රාකාරයක් විය. දොරටුසතර අසළ පැමිණෙන ශිෂ්‍යයන්ට නොමිලයේ ඉගැන්වීම කරන විද්‍යාලය සතරක් විය; "චාරපණ්ඩිත" නමැත්තෝ ඒ විද්‍යාලයන් පාලනය කළහ.

මධ්‍යස්ථානය වූ මහාවිද්‍යාලයෙහි දේවධර්මය ඉගැන්වූ පණ්ඩිතාචාර්‍ය්‍ය දෙදෙන මේ විශ්වවිද්‍යාලයේ පළමු දෙවෙනි කුළුණු මෙන් සලකන ලදහ මහාප්‍රාකාරයෙන් ඇත්ළත චාරයන් සමීපයෙහි පිහිටි යථොක්ත ද්වාරවිද්‍යාලයන්හි උද්ග්‍රහණයකරන ශිෂ්‍යයන්ට වාසය පිණිස නිදහස් වාසාගාර සතරක් ද පිහිටුවනලදී. එරට රජකුමරුන් හා සිටුවරුන් විසින් ඊට යන වියදම උසුළනලදී.

රජදරුවන්ගේ අනුග්‍රහය සැමවිටම ලැබූ මේ විශ්වවිද්‍යාලය සංඝස්ථවිර ප්‍රමුඛ සදෙනෙකුගේ සභාවක් විසින් පාලනයකරනලද්දේ ශතවර්ෂ සතරක් මුළුල්ලේ සමෘද්ධාකාරයෙන් පැවැත්තේය.

## 21. වික්කමසිලාය සබ්බසත්ථාලයො.

භික්ඛුපපත්තිතො අට්ඨමසතවච්ඡරස්ස මජ්ඣභාගෙ ධම්මපාලෙන මහාරඤ්ඤා වික්කමසිලායං කාරාපිතො රාජමහාවිහාරො ගඞ්ගාය නදියා උත්තරතීරෙ එකස්ස නගස්ස මුද්ධනි විරොචිත්ථ. තස්ස මජ්ඣෙ පතිට්ඨිතස්ස මහාපාසාදස්ස සමන්තා අවිදූරට්ඨානෙසු සත්තාධිකා සතමත්තා සංඝාවාසා අහෙසුං; සබ්බෙපි තෙ එකෙන මහාපාකාරෙන පරික්ඛිත්තා. විහාරස්ස චතූසු ද්වාරෙසු චතූහි ද්වාරපණ්ඩිතෙහි පරිපාලිතා චත්තාරො විජ්ජාලයා අහවුං අගතානං සිස්සානං නිමමූලෙන විජ්ජාදානාය.

පමුඛභූතෙ මහාවිජ්ජාමන්දිරෙ දෙවධම්මසික්ඛාපකා පන ද්වෙ පණ්ඩිතා තස්ස සබ්බස්සාපි නිඛිලවිජ්ජාලයස්ස ධාරකා පඨම-දුතියත්ථම්භා විය සල්ලක්ඛිතා'හෙසුං. පාකාරස්ස අන්තො ද්වාර සමීපෙ පතිට්ඨිතෙසු යථාවුත්තෙසු චතූසු ද්වාරවිජ්ජාලයෙසු උග්ගණ්හන්තානං සිස්සානං වාසාය චත්තාරො වාසාගාරා, යත්ථ වසන්තානං සිස්සානං ඝාසච්ඡාදනපරිබ්බයො තද්දෙසවාසීහි රාජකුමාරෙහි මහද්ධනීහි ච දීයිත්ථ. සබ්බදා රාජානුග්ගහෙන පරිපොසිතො පනායං නිඛිලවිජ්ජාලයො සංඝත්ථෙරපමුඛාය ඡන්නං ජනානං සභාය පරිපාලිතො චතුසතවස්සානි සමිද්ධාකාරෙන පවත්තිත්ථ.

## 22. තක්සලා විශ්වවිද්‍යාලය.

දඹදිව අතිපුරාණ විශ්වවිද්‍යාලය තක්සලාහි පිහිටා තිබුණේය. එය බ්‍රාහ්මණයන් බලපැවැත්වූ විද්‍යාස්ථානයකි. බටහිරින් පර්සියාව දක්වා ද උතුරෙන් යවනලෝකය (ග්‍රීසිය) දක්වා ද නැගෙනහිරින් මගධය හා ප්‍රාචීනදේශය දක්වා ද ඒ විශ්වවිද්‍යාලයේ ප්‍රභාවය පැතිර ගියේය. මගධාධිපතිවූ බිම්බිසාරරජුගේත් භගවත් ශාක්‍යමුනීන්ද්‍රයන්වහන්සේගේත් රෝගාපහාරකවූ ජීවක නම් රාජවෛද්‍යයා මේ විශ්වවිද්‍යාලයෙහි උගත්තෙකි. ඔහුගේ සංක්ෂිප්ත චරිතය මෙසේයි:-

දක්ෂිණමගධයෙහි වූ රජගහනුවර උපන් හෙතෙමේ වැඩිවිය පැමිණියේ වෛද්‍යකම හා කලාශිල්පයන් ඉගෙනීම පිණිස තක්සලාහි විශ්වවිද්‍යාලයට ගියේය, "ආත්‍රෙය" නම් මහාවෛද්‍යාචාර්යයන්

අභිමුඛයට පැමිණි හෙතෙම "ගුරුපූජාවශයෙන් කොපමණ මිලක් දියහැකිද"යි විචාරනලද්දේ "ස්වාමීනි, ශාස්ත්‍රගවේෂණය සඳහා මම මගධයේ සිට මෙතෙක් දුර ආමි; සියගෙයින් පිටවෙන මම තමාගේ අදහස මවුපියන්ට හෝ මිත්‍රයන්ට නොකීවෙමි. එබැවින් මම ධනයෙන් යම්කිසි පරිත්‍යාගයක් කරන්ට අසමර්ථවෙමි. නමුත් ඉගනීම අවසන්වූ පසු මාගේ ශරීරය ඔබ අයත්වූවක් කරන්නෙමි (හෙවත් මම ඔබගේ සේවකයෙක් වන්නෙමි) යි කීය.

මේ කීමෙන් සතුටුවූ ආත්‍රෙයතෙමේ ඔහු තමාගේ ශිෂ්‍යගණයට ඇතුළත්කෙළේය. ජීවකයා ඒ ආචාර්‍යවරයාවෙතින් සත්වර්ෂයක් මුළුල්ලේ වෛද්‍යශාස්ත්‍රයත් වෙදකමත් ඉගෙනගත්තේය. අවසාන පරීක්ෂණයේදී "තක්සලාව හාත්පස දෙයොදුනක් තැන හටගෙන තිබෙන සියලු ගස්-වැල්-තෘණ-මූලාදීන්ගේ ඖෂධප්‍රයෝජනය විස්තරකරව"යි කියනලද ජීවකතෙමේ එහි අ විද වෘක්ෂලතාදි සකලභූතගාමසමූහය පරීක්ෂණයකොට "ඖෂධප්‍රයෝජනරහිත එකම වර්ගයක්වත් නැතැ"යි ආචාර්‍යතුමාට දැන්විය.

## 22. තක්කසිලාය නිඛිලවිජ්ජාලයො.

ජම්බුදීපෙ අතිපොරාණො නිඛිලවිජ්ජාලයො පන (ගන්ධාර දෙසෙ) තක්කසිලායං පතිට්ඨිතො අහොසි. තත්ථ බ්‍රාහ්මණා යෙව ආචරියා අහෙසුං (=බ්‍රාහ්මණත්තිකා යෙව තත්ථ පමුඛා භවිංසු.) පච්ඡිමතො යාව පාරසිකදෙසං, උත්තරතො යාව යොනකලොකං, පාචීනතො යාව මගධං පාචීනකදෙසඤ්ච තස්ස මහාවිජ්ජාලයස්ස පභාවො පත්ථරි. මගධාධිපස්ස බිම්බිසාරස්ස භගවතො ච සක්‍යමුනිනො ආතඞ්කාපහාරකො ජීවකො නාම රාජකීයවෙජ්ජො ඉමස්මිං නිඛිලවිජ්ජාලයෙ සිප්පං සික්ඛි. තස්ස සංඛිත්තචරිත මෙවං දට්ඨබ්බං:-

---

දක්ඛිණමගධෙ රාජගහනගරෙ ජාතො පනෙ'සො වයප්පත්තො භිසක්කකම්මං කලාසිප්පානි ච සික්ඛිතත්ථාය තක්කසිලාය නිඛිලවිජ්ජායතනමගමාසි. තත්ථ අත්තෙයස්ස නාම මහාවෙජ්ජාචරියස්සාභිමුඛං පත්තො සො තෙනාචරියෙන "කිත්තකං ආචරියධනං දස්සසී"ති පුට්ඨො "සාමි, සුතගවෙසකො'හං මගධතො එත්තකං දූරමාගච්ඡිං, සකගෙහතො නික්ඛමන්තො පනාහමත්තනො අජ්ඣාසයං මාතාපිතූනං මිත්තානඤ්ච න කථෙසිං. තස්මාහං ධනෙන යං කිඤ්චි ගුරුපූජං කාතුමසමත්ථො'ම්හි; තථාපි උග්ගහණෙ නිට්ඨිතෙ මම දෙහං තවායත්තං (අථවා තව පරිච්චත්තං) කරිස්සාමී"ති අවදි.

ඉමෙහි වචනෙහි තුට්ඨො අත්තෙයො තමත්තනො සිස්සගණෙ අන්තොගතමකාසි ජීවකො සත්තවස්සානි තම්හා ආචරියවරා වෙජ්ජසත්ථං තිකිච්ඡකකම්මඤ්ච උග්ගණ්හි. නිඨානොපපරික්ඛාය කාලෙ "තක්කසිලාය සමන්තා වියොජනට්ඨානෙ ජාතානං ගච්ඡ-ලතා-තිණ-මූලාදීනං සබ්බෙසං භූතගාමානං ඔසධප්පයොජනං විත්ථාරෙහී'ති" වුත්තො සො තත්ථ ආහිණ්ඩන්තො රුක්ඛලතාදි-සකලභූතගාමජාතං උපපරික්ඛිත්වා "ඔසධපයොජනරහිතා එකාපි භූතගාමජාති නත්ථී"ති ආචරියස්ස ආරොචෙසි.

## 23. ටිබැට්රට තාෂිලුම්පො විශ්වවිද්‍යාලය.

(ඉගැන්වීමේ පිළිවෙළ)

අවුරුදුසයේ පටන් දොළස දක්වා වයසැති කුලපුත්‍රයෝ ඔවුන්ගේ මවුපියන් විසින් හෝ ආරක්ෂකයන් විසින් විද්‍යාලයට පමුණුවනුලැබ ආචාර්ය ස්ථවිරනමකට බාරදෙනුලැබෙත්. ඒ බාලයෝ පළමුකොට ස්ථවිරයන් සමීපයෙහි ධර්මග්‍රන්ථයන් කියවීමට උගනිත්. ශිෂ්‍යයෝ ස්වකීයාචාර්යවරයාට වත්පිළිවෙත් කරමින් ඔහු සමීපයෙහි අනුභවකරමින්, නිදමින්, ආචාර්යභික්ෂුව සමගම වාසය කරත්. එක් එක් මාසයාගේ අවසානයේදී ස්වකීය පුත්‍ර-යන්ගේ සැපදුක් විමසීම සඳහා ද කෑම ඇඳීම ගැන ගෙවියයුතු මුදල් ගෙවීම සඳහා ද මවුපියවරු ආචාර්යවරයන් කරා පැමිණෙති.

තුන්අවුරුද්දක් ඇතුළත ඒ බාලයෝ බෞද්ධ ධර්මග්‍රන්ථවලින් උපුටා ලියූ ධර්මපාඨ ඇතුළත් පත්ඉරු 125 ක් පමණ කටපාඩම් කරගනිත්. පැවිදිවීමට සෑහෙන තරම් කරුණු ඉගෙනගත් පසු ආචාර්ය ස්ථවිරතෙමේ ඔවුන්ගේ නම් ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයන්ගේ නාමාවලියෙහි ඇතුළත්කිරීම පිණිස නායකස්ථවිරතුමාගේ සමීපයට යවයි. එක් එක් වර්ෂය තුළ යම් කෙනෙකුන්ගේ නම් ඒ පැවිද්ද අපේක්ෂාකරන්නන්ගේ ලේඛනයෙහි ඇතුළත් වූහුනම් ඒ සියලුදෙන ස්වකීයාචාර්යවරයන් සමග වර්ෂයක් පාසා පෙබර-වාරි මාසයෙදී පවත්වනුලබන මහාසම්මේලනය පිළිබඳ සිවුවෙනි දිනයේදී සභාශාලාව ඉදිරියෙහි වූ මිදුලෙහි රැස්වී සිටිය යුතුය. සංඝරාජයන්වහන්සේගේ නියෝජිත තැන ද දෙවෙනි මහඇමති සාද එහි පැමිණ ස්වකීය - ස්වකීය ශිෂ්‍යයන් ඇතුළු කිරීම සඳහා එක් එක් ආචාර්යවරයාගේ නම කියා කැඳවත්.

මෙසේ පැවිදිකිරීමට නියමවූ ඒ ශිෂ්‍යයන්ට පැවිද්ද ලැබෙන තුරු දිනපතා ශිෂ්‍යයකුට ලැබෙන වියදම දෙනුලැබේ. පැවිද්ද ලබනතුරු ඔවුනට විහාරයේ දෛනික පූජාවන් පවත්වනකල

භික්ෂූන් සමග ඒවාට සහභාගී වෙන්ට හෝ මහාසභාශාලාවෙහි භික්ෂූන් සමග වාඩිවෙන්ට හෝ නොලැබේ. යම් කලක සංඝස්ථවිරතුමා ඔවුන් පැවිදිකරනුකැමති නම් එකල්හි ඔවුන් කැඳවා මුදුනේ කෙස්රොදක් පමණක් ඉතිරිකොට හිස් බූගා තුන්සිවුරු අන්දවා සංඝරාජයන් ඉදිරියට පමුණුවයි. සංඝරාජතෙමේ කතුරක් අතින් ගෙන එක් එක් ශිෂ්‍යයාට මවුපියන් දුන් නමින් ආමන්ත්‍රණය කොට කැඳවා ඔහුගේ කුඩිම්බිය කතුරෙන් සිඳ දමා එතැන් පටන් ව්‍යවහාර කිරීම පිණිස අන්‍යනාමදානය කරයි.

## 23. තිබ්බතෙ තාසිලුම්පො නිඛිලවිජ්ජාලයො.

(සික්ඛාපනාකාරො.)

හෙට්ඨිමකොටියා ඡවස්සිකා උපරිමතො චාදසවස්සිකා කුලපුත්තා තෙසං මාතාපිතූහි වා ආරක්ඛකෙහි වා තං විජ්ජාලයං පාපිතා එකස්ස ආචරියත්ථෙරස්ස අප්පීයන්ති තෙ පන බාලා තස්ස ථෙරස්ස සන්තිකෙ පඨමං ධම්මගන්ථෙ වාචෙතුං උග්ගණ්හන්ති නිජචරියස්ස වත්තපටිවත්තං කරොන්තා තෙ සිස්සා තස්සෙව සමීපෙ භුඤ්ජන්තා සයන්තා තෙනෙව සද්ධිං වාසං කප්පෙන්ති. එකෙකස්ස මාසස්ස'න්තෙ තෙසං මාතාපිතරො සකපුත්තානං සුඛදුක්ඛවීමංසනාය ඝාසච්ඡාදනපරිබ්බයදානාය ච ආචරියානං සන්තිකමාගච්ඡන්ති.

තිවස්සබ්භන්තරෙ තෙ බාලා සොගතධම්මගන්ථෙහි උද්ධට-ධම්මපාඨන්තොගධානි පඤ්චවීසාධික-සතමත්තානි පණ්ණානි වාචුග්ගතං කරොන්ති. තෙහි පබ්බජ්ජාය පහොණකෙසු කාරණෙසු සික්ඛිතෙසු ආචරියත්ථෙරො තෙසං නාමානි පබ්බජ්ජාපෙක්ඛකානං නාමාවලියං අන්තොගධකරණාය සඞ්ඝනෙතුනො සන්තිකං පෙසෙති. එකෙකවස්සබ්භන්තරෙ යෙසං පබ්බජ්ජාපෙක්ඛානං ~~නාමානි ලෙඛනගතානි හොන්ති, තෙහි සබ්බෙහි නිජචරියෙහි සහ~~ අනුසංවච්ඡරං මාසමාසම්හි පවත්තාපියමානස්ස මහාසම්මෙලනස්ස චතුත්ථෙ දිවසෙ සභාසාලාඞ්ගණෙ සන්නිපතිතබ්බං හොති. අථ සංඝරඤ්ඤො දූතො චෙව දුතියමහාමච්චො ච තත්ථාගන්ත්වා සක-සකසිස්සානමන්තොකරණාය එකෙකං ආචරියං නාමෙන පක්කොසන්ති.

එවං පබ්බජ්ජාය නියමිතානං පන තෙසං සිස්සානං යාව පබ්බජ්ජාලාභං පතිදිනං එකෙනෙකෙන සිස්සෙන ලද්ධබ්බපරිබ්බයො දීයතෙ යාව තෙ සාමණෙරපබ්බජ්ජං න ලභන්ති, තාව විහාරෙ දෙවසිකපූජාසු වත්තමානාසු භික්ඛූහි සද්ධිං සහභාගිනො භවිතුං වා මහාසන්නිපාතසාලායං තෙහි සද්ධිං නිසීදිතුං වා

තලහනාති. යස්මිං සමයෙ සංඝත්ථෙරා තෙ පබ්බාජෙතුමිච්ඡන්ති, අථ තෙ පක්කොසිත්වා මුණ්ඩනි සිඛං ඨපෙත්වා කෙසෙ වොරොපෙත්වා තිචීවරෙහි අච්ඡාදෙත්වා සංඝරඤ්ඤො අභිමුඛං පාපෙන්ති. සංඝරාජා එකං පිප්ඵලං ගහෙත්වා එකෙකං සිස්සං තස්ස මාතාපිතූහි 'දින්නනාමෙනා' ලපිත්වා පක්කොසිත්වා මුණ්ඩති චූළං කත්තරිකාය ඡින්දිත්වා තතො පභාය වොහරණත්ථාය අඤ්ඤං නාමං දෙති.

---

## ලෙඛනසම්පාදනය.

---

1. පොත් වෙළඳකුගෙන් පොතක් තිබේදැයි අසා යැවීමට:-

අභිනවගාමෙ
වාලුකාරාමතො
15. 10. 30.

කොළම්බනගරෙ ජේ. ඩී. ප්‍රනාන්දු
මහාසයානං පෙසිතං

භවන්තා,

සචෙ තුම්හෙහි කතිපයවස්සානමුපරි මුද්දාපිතා "සුත්තනිපාත පාළි" යාවජ්ජතනා වික්කිණීයතෙ තතො මය්හමෙකං පොත්ථකං ඉධ සාසනපණ්ණාගාරතො මූලං දත්වා ගහණත්ථාය පෙසෙථ.

සචෙ තා ඛයං ගතා තං මය්හං නිවෙදෙථ. අධුනා මුද්දාපිතානං "පෙතවත්ථු – විමානවත්ථු – ථෙරගාථා – ථෙරීගාථානං" වික්කායික මූලං කිත්තකන්ති ඤාතුමිච්ඡාමි.

භවන්තානං විස්සාසිකො
සීලවංසො සමණුද්දෙසො.

---

2. පිරිවෙණක වසන පැවිදි ශිෂ්‍යයකු විසින් ස්වකීය උපාධ්‍යාය ස්ථවිරතුමන්ට:—

පෙසියතිදං කොළම්බනගරෙ මිණ්ඩලාරාමෙ
වසන්තෙන පියනන්දෙන භික්ඛුනා ගාරව
බහුමානපුබ්බඞ්ගමං පාදෙ වන්දිත්වා.

භන්තෙ,

තුම්හෙහි කතිපයදිවසානමුපරි මම පෙසිතං සාසනපණ්ණං මලභිං. තත්ථනෙනාගධං ඉතරං සාසනපණ්ණං පරිවෙණාචරිය වරස්සාදසිං

ඉදානි’මස්මිං පරිවෙණෙ අසීතිමත්තා සිස්සා උග්ගණ්හන්ති. අභිනවා සාලාපි නිට්ඨානං ගතා; ආගම්මාසෙ තස්සා පවෙසන මහුස්සවො ගම්භීරකාරෙන පවත්තීයිස්සතෙ. භද්දන්තාපි තදත්ථාය ඉධ පාපුණිස්සන්තීති මඤ්ඤෙ.

ආගාමිවස්සෙ උග්ගණ්හනත්ථාය බහූ මයා පොත්ථකා කිණිතබ්බා; තෙසමත්ථාය මූලම්පි ලද්ධබ්බං; තමත්ථං මය්හං මාතා පිතුන්නං භාතිකානං ච ආරොචෙථ. මය්හං අරොගභාවඤ්ච තෙසං නිවෙදෙථ.

තුම්හාකඤ්චෙව ඉතරෙසං සබ්බෙසං ආරාමවාසීනං ච සුඛ දුක්ඛං අඤ්ඤඤ්ච පවත්තියො ච ඤාතුමිච්ඡාමි.

භද්දන්තස්ස සුවචසිස්සො

පියනන්දො භික්ඛු.

---

3. ඒ උපාධ්‍යායස්ථවිරතුමන් විසින් ස්වකීය ශිෂ්‍ය තැනට:—

ලිඛීයති දං මෙත්තාපුබ්බඞ්ගමං

පියනන්දස්ස භික්ඛුනො.

සොත්ථ්‍යත්ථු!

ලද්ධම්මයා භවතා පෙසිතං සාසනපණ්ණං. පරිවෙණාධිපතිනා මහාථෙරෙනපි මම සකාසෙ එකං පණ්ණං පහිතං.

පාපමිත්තෙහි සඞ්ගම්ම නගරෙ තත්ථ තත්ථ විචරණමකත්වා සාධුකං සුස්සූසන්තෙන ධම්මවිනයො උග්ගණ්හිතබ්බොති අම්හාකං සන්තොවාදො භවතා පටිපජ්ජිතබ්බො න තාව මයා සුතං භවතො තාදිසං අගොචරාචරණං, යදා පනාහං සුණාමි තාදිසං, තදාහං ඛිප්පමෙව තං සඞ්ඝාරාමං ආණාපෙමි උග්ගහං ඨපෙත්වා.

යෙ ත්වං පොත්ථකෙ කිණිතුමිච්ඡසි තෙ ඉධාගතකාලෙ ඉතොව ලභිස්සසි.

අහඤ්චෙව අඤ්ඤෙ චාරාමවාසිකා සුඛිනො; ත්වම්පි තථෙවාති සද්දහාමි. ඉදානිධ අභිණ්හං දෙවො වස්සති, අඤ්ඤං ආරොචෙතබ්බං නත්ථි.

භවතො උපජ්ඣායො

සීලරතනථෙරො.

---

4 මේ පොතේ කර්තෘ ස්විට්සර්ලන්තයේ නැවතී සිටියදී මහාවංශපරිවර්තක "විල්හැල්ම් ගයිගර්" නම් ජර්මන් පඬිතුමාට යැවූ ලිපියක්:—

"පෙසීයති ඉදං ලෙඛනං බුද්ධදත්තත්ථෙරෙන ඩබ්ලියූ. ගයිගර් පණ්ඩිතස්ස (1928) චිත්තමාසස්ස සුක්කපක්ඛෙ ද්වාදසමියං රවිවාරෙ "ලොකාර්නෝ" නගරතො.

ජයතු භවං මහාසයො!

අහම්පනෙ'කො සීහළභික්ඛු, ගතමාසෙ ඉධාගතො "ආර්. ලන්ගේ" නාමකස්ස ගහපතිනො අජ්ඣෙසනම්පටිච්ච; ඉදානි තස්ස සන්තිකෙ වසාමි එකෙන කප්පියකාරකෙන සද්ධිං.

එසො පන ගහපති මයා පාළිභාසං චෙව බුද්ධධම්මඤ්ච උග්ගණ්හිතුමිච්ඡති.

භවතො පන මහාසයස්ස නාමං මයා චිරකාලතො පට්ඨාය ඤාතං පාළිපොත්ථකසමිති (Pali Text Society) ද්වාරතො. භවතා අම්හාකං මහාවංසස්ස සොධනෙන පරිවත්තනෙන ච සීහළානං කතො උළාරො සංගහොපි මයා විදිතො.

මයාපි පාළිපොත්ථකසමිතියා අත්ථාය "සම්මොහවිනොදනී-විනයවිනිච්ඡයා"දීනං පොත්ථකානං පරිසොධිතත්තා මම නාමම්පි භවං ජානාතීති මඤ්ඤාමි.

ඉමිනා ලෙඛනෙන සහ මයා සම්පාදිතෙ ද්වෙ පොත්ථකෙ භවතො තුට්ඨිපාභතවසෙන පෙසෙමි. තෙ පන භවතො උපකාරාවහා න හොන්ති, තථාපි භවන්තෙන මිත්තභාවං පත්ථයන්තො ඉමෙ පෙසෙමි.

---

පටිසාසනං ඉංග්ලිෂ්භාසාය වා පාළිභාසාය වා පෙසෙතු.

භවතො විස්සාසිකො

බුද්ධදත්තො (ථෙරො)

ලෙඛනානි ඊදිසං පෙසෙතබ්බානි:—

A. P. Buddhadatta
"Buen Retiro"
Locarno.

5. මීට පිළිතුරු වශයෙන් සිංහල අකුරෙන්ම ලියා ඒ පඬිතුමා විසින් එවනලද ලිපිය:-

"ඉදං සාසනපත්තං විලියම්ගෙගර් නාම පණ්ඩිතෙන ආයස්මතො බුද්ධදත්ත-ථෙරස්ස සන්තිකං පෙසියති.

ආයස්මතො නාමං සම්මොහවිනොදනී—විනයවිනිච්ඡය—උත්තරවිනිච්ඡයාදීනං පොත්ථකානං පරිසොධිතත්තා චිරකාලතො පභුති පාකටං මෙ අහොසි. තස්මා ආයස්මතො හත්ථතො පාළිභාසාය විරචිතං ලෙඛනං ලභිත්වා අතීව සන්තුට්ඨො අහොසිං; තං ච තුට්ඨිං දස්සෙතුකාමො අහම්පි ඉදං පටිසාසනං පාළිභාසාය පෙසෙමි. පයොගස්ස පන අභාවෙන මයා කතෙ දොසෙ ඛමතු භවං. පච්ඡිමදෙසවාසිනො හි පණ්ඩිතා පාළිභාසං පොත්ථකෙහි කෙවලං උග්ගණ්හන්ති, න දෙවසිකකථාසල්ලාපෙන.

යං මෙ පොත්ථකද්වයං ආයස්මතා ලෙඛනෙන සද්ධිං පෙසිතං තම්පි අහං පාභතං ධාරෙමි පියඤ්ච මනාපඤ්ච. බහූනං පන සාවකානං පාළිභාසං උග්ගණ්හිතුමිච්ඡන්තානං තානි පොත්ථකානි නිස්සංසයං බහූපකාරාවහා භවිස්සන්ති.

1926 මෙ වස්සෙ මම චතුමාසං ලඞ්කාදීපෙ වුසිතභාවං ආයස්මා ජානාතීති මඤ්ඤාමි. න පන තස්මිං කාලෙ අහං ආයස්මන්තං අපස්සිං, න ච මයං සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරිම්හ; අනාගතෙ තං කාලෙ භවෙය්‍යාති පත්ථෙමි.

සොත්ථිමා ආරොගො ච හොතු ආයස්මා, සුඛඤ්ච ජීවතු.

ආයස්මතො විස්සාසිකො

විලියම් ගෙගර්.

Prof. Dr. Wilh. Geiger,
Munchen-Neubiberg,
Bavaria, Germany.

---

7. දෙවෙනිවර මා විසින් යවනලද ලිපිය:—

"මහාපඤ්ඤස්ස ඩබ්ලියු. ගෙගර් නාමස්ස සන්තිකං පෙසිතමිදං.

සොත්ථි භවතු!

පච්ඡිමදෙසීයෙන භවතා මෙධාවිනා සීහළක්ඛරෙහි පාළිභාසාය ලිඛිතං සාසනපණ්ණං දිස්වා අතිවිය විම්හිතමානසො වාචෙත්වා පීතියා චුම්බිතො අහොසිං.

සච්චමෙව යං භවතා තම්හි ලෙඛනෙ වුත්තං: පරිචයෙ අසති පාළියා වාක්‍යරචනා අතිදුක්කරාති. න පන තෙ සුලභා පච්ඡිමෙ යෙ සක්කොන්ති පාළිසාසනානි ලිඛිතුං අඤ්ඤත්‍ර භවතාති මඤ්ඤාමි.

1926 මෙ වස්සෙ භවතො මහාසයස්ස ලඞ්කාදීපං සම්පත්තභාවං තදා ජානිං, තථාපි කාරණෙන විනා භවන්තං පස්සිතුං න උස්සහිං. සචාහං තදා ජානිතුං අසක්ඛිස්සං භවන්තස්ස බලපිටිය ගාමෙ ගුණසෙඛරමන්තිනො වාසට්ඨානගමනං, අම්හාකං සම්මුඛීභාවො සුකරො අභවිස්ස. මය්හං ජාතභූමි චෙව චිරනිවාසට්ඨානඤ්ච තදනන්තරභූතො අම්බලංගොඩනිගමො හොති. ගුණසෙඛරො පන මන්ති මය්හං විස්සාසිකමිත්තෙසු එකො.

ඉදම්පන මය්හං පඨමාගමනං පච්ඡිමදෙසම්පති සචා’හං පටිබලො භවෙය්‍යං ආගමෙ ගිම්හෙ භවන්තානං රට්ඨම්පි පස්සිතුං භවතාපි මහාපඤ්ඤෙන සම්මුඛීභවිතුං පත්ථෙමි.

සුඛී භවතු අරොගො නිද්දුක්ඛො සද්ධිං පුත්තදාරෙහි

භවතො විස්සාසිකො

බුද්ධදත්තො.

Buen Retiro
Via Circonvallazione,
Locarno

---

## කර්තෘකර්මාදිය තැබියයුතුතැන්.

A. අසුවල් පදය අසුවල් තැනම තැබියයුතුයයි නියමයක් ව්‍යාකරණයෙහි නැතත් **කර්තෘ පදය වාක්‍යයේ මුල ද ක්‍රියාව අගද කර්මය මැද ද ඔවුන්ගේ විශේෂණ පද ඇත්නම් ඒවාට මුලින් ද යෙදීම පාළියේ සාමාන්‍ය රීතියයි**

(කර්තෘගේ විශේෂණ කර්තෘපදයට මුලින්ද කර්මවිශේෂණ කර්මයට මුලින්ද ක්‍රියාවිශේෂණ ක්‍රියාවට මුලින්ද තැබියයුතු.) පූර්වක්‍රියාවන් අවසාන ක්‍රියාවට මුලින් යෙදිය යුතුයි.

යට දැක්වූ බොහෝ වාක්‍යයන්ගෙන් මේ සාමාන්‍ය රීතිය ප්‍රකටවන බැවින් මෙහි උදාහරණ දැක්වියයුතු නොවේ.

මේ සාමාන්‍ය රීතියට වෙනස්ව යෙදෙන තැන් ද දුර්ලභ නො වෙත්. **ගාථාබන්ධනයේදී බොහෝසේම මේ පිළිවෙළ නොසලකනු ලැබේ:-**

"අථ තං දහරා ච සාමණේරා ච අනුබන්ධිත්වා ආදාය සත්ථු සන්තිකං අගමංසු" යන දම්පියාඅටුවාපාළියෙහි කර්මය මුලින් යොදා තිබේ.

"පුඤ්ඤඤ්චෙ පුරිසො කයිරා, කයිරාථේතං පුනප්පුනං" යන ධම්මපදගාථාවෙහිත් එසේම යොදා තිබේ.

"උපෙමි බුද්ධං සරණං ධම්මඤ්චාපි අනුත්තරං
සංඝං ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං"

යන විමානවත්ථුගාථාහි ක්‍රියාව මුල ද කර්තෘපදය අග ද යොදා තිබේ.

**B. ප්‍රශ්න ඇසීමේදී කිංශබ්දාදියෙන් සෑදුණු පදත් අන්‍ය නිපාතපදාදියත් වාක්‍යයේ මුල යෙදෙනබව පෙනේ:-**

1. "කිං කථෙසි භාතික?" (ධ. අ. 3)
2. "**කහං** ගතො'සි ආවුසො?" (ධ. අ. 333 )
3. "**කුහිං** යාසි උපාසක?" (ධ. අ. 9.)
4. "**කස්මා** සො සප්පො එතං න ඩසි?" (ධ. අ. 333.)
5. "**කො** තත්ථ වසති?" (ධ. අ. 7.)
6. "**කෙනායං** ගණ්ඩි පහටා?" (ධ. අ. 328.)
7. "**කච්චි** පන මෙ මාතාපිතරො තුය්හං කුඩා?" (ධ. අ. 316)
8. "**කං'සි** ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො? **කො** වා තෙ සත්ථා? **කස්ස** වා ත්වං ධම්මං රොචෙසි?" (ධ. අ. 46)

මේ සාමාන්‍ය රීතිය ඉක්මවා යෙදුණ තැන් ද විද්‍යමානවෙති:-

---

"සචාහං ගෙහං ගමිස්සාමි, 'සාමිකො තෙ **කුහිං?** ' ති පුච්ඡිස්සන්ති." (ධ අ. 318.)

**C. ආලපනය වාක්‍යයේ මුල හෝ අග යෙදීම සාමාන්‍ය රීතියයි.**

1. "භන්තෙ, ඉමස්මිං සාසනෙ කති ධුරානි?" (ධ. අ. 4 )

2. "**ආවුසො,** ඉමං තෙමාසං කතිහි ඉරියාපථෙහි වීතිනාමෙස්සථ?" (ධ. අ. 4)

3. "**භොති,** සචෙ වෙජ්ජං ආනෙස්සාමි, භත්තවෙතනං දාතබ්බං භවිස්සති" (ධ. අ 13.)

B. අකුරට යටින් දක්වූ 1-2-3 වෙනි වාක්‍යයන්හි ආලපනය අග යෙදී තිබේ.

4. "අයං මෙ භන්තෙ සම්පත්ති තුම්හෙසු මතං පසාදෙත්වා ලද්ධා" (ධ. අ. 18) යනාදි වාක්‍යයන්හි මෙකී සාමාන්‍යරීතියට වෙනස්ලෙස ආලපනය යොදා තිබේ.

D. **ප්‍රතිවචන දීම සඳහා යොදන "ආම, එවං" ආදි වචන බොහෝසේ වාක්‍යයේ මුල යොදනු ලැබේ.**

1. "**ආම** සම්ම, ඉදානාහං විහාරං ගන්ත්වා ථෙරං............ දිස්වා ආගතොම්හි." (ධ. අ 10.)

2. "පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛන්ධං? **එවම්භන්තෙ**" (අග්ගික්ඛන්ධොපමසුත්ත.)

3. "කිම්පන භන්තෙ ඉදානි පි දින්නෙ ලභිස්සන්තීති? **ආම** මහාරාජාති" (ධ අ. 52.)

මෙ වාක්‍යයන්හි **"ආම-එවං" නිපාතයන් ආලපනයටත් මුලින් යෙදී තිබෙන** බව සැලකියයුතු.

E. **වචන පිළිගැන්මෙහි වූ "සාධු" ආදිය ද වාක්‍යයේ මුල යොදනු ලැබේ.**

1. "**සාධු**, සාමි, යථාජ්ඣාසයං කරොථ" (ධ. අ. 34.)

2. "**සාධු** භද්දෙ, එකං රූපාරම්මණං දිස්වා මය්හං කථෙය්‍යාසි" (ධ. අ. 35.

3. "**එවමාවුසො** ති බො ආයස්මා ආනන්දො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි."

(මහාපරිනිබ්බාණ සුත්ත.)

මෙ වාක්‍යත්‍රයෙහිම වචනප්‍රතිග්‍රහණයෙහි නිපාත ආලපනයටත් මුලින් යෙදීතිබේ.

---

## වාක්‍යයන් ලඝුකිරීම හා වෙනස්කිරීම

---

වචන බොහෝ ගණනකින් යුත් වාක්‍යයක් අඩු වචන ගණනකින් අදහස වෙනස් නොවන සේ ලිවිය හැකි නම් එසේ කළයුතුය. වාක්‍යලාඝවය වාක්‍යරචනාවේදී විශෙෂයෙන් සැලකිය යුත්තකි.

1. "එකදා භගවා සාවත්ථියං විහරි, තදා දෙවතා ආගන්ත්වා ධම්මං සුණිංසු."

යත වාක්‍යය

1. **"භගවති සාවත්ථියං විහරන්තෙ දෙවතා'ගන්ත්වා ධම්මං සුණිංසු"**යි අඩු වචන ගණනකින් ලිය හැක.

මෙසේ ලඝුකළ හැකි වාක්‍යයන්ට නිදර්ශන මෙසේයි:-

2. "යත්ථ මනුස්සා වසන්ති, තත්ථ සොණා ච ගොණා ච වසන්ති."

ලඝුකළ විට:- **මනුස්සානං වසනට්ඨානෙ සොණ-ගොණා ච වසන්ති.**

3. "යො තෙන සද්ධිං ඉධාගමි, සො අමෙහි සද්ධිං වාපිං ගමිස්සති."

ලඝුකළ විට:- **තෙන සද්ධිං ඉධාගතො අමෙහි වාපිං ගමිස්සති.**

4! "යදා කුක්කුටා රවිස්සන්ති, තදා සො ආගමිස්සති."

**කුක්කුටානං රවනකාලෙ සො ආගමිස්සති.**

5. "තෙ යථා කථෙන්ති, තථා න කරොන්ති."

**තෙ යථාකථිතං න කරොන්ති.**

6. "යදා වස්සති, තදා දෙවො නදියො වාපියො ච පූරෙති."

**දෙවො වස්සන්තො නදීවාපියො පූරෙති.**

7. "යදා ත්වං නහායිස්සසි තදා අහංපි නහායිස්සාමි."

---

**ත්වයි නහායන්තෙ (හෝ තව නහායනකාලෙ) අහම්පි නහායිස්සාමි.**

8. "යස්ස යස්ස හි රඤ්ඤා සද්ධිං ගන්තුකාමතා උප්පජ්ජති සො සො ආකාසගතොව හොති."

(දීඝ-අට්ඨවා 437.)

**රඤ්ඤා සද්ධිං ගන්තුකාමා සබ්බෙ ආකාසගතා හොන්ති.**

9. **"නනු ඉදානෙව දිවසකරො අත්ථඞ්ගතො? සො කථං ඉමං පුණ්ණචන්දං අනුබන්ධමානො උග්ගච්ඡිස්සති?"**

**(දීඝ-අට්ඨවා 436.)**

**ඉදානෙව අත්ථඞ්ගතො දිවසකරො කථං ඉමං පුණ්ණචන්දං අනුබන්ධමානො උග්ගච්ඡිස්සති?**

10. "යස්මිං පදෙසෙ චක්කරතනං පතිට්ඨාසි, තත්ථ රාජා වාසං උපගච්ඡි සද්ධිං පරිසාය." (දීඝ-අටුවා 438)

**චක්කරතනස්ස පතිට්ඨිතට්ඨානෙ සපරිසො රාජා වාසමුපගච්ඡි.**

11. "නත්ථි සො සත්තො නාම යො පච්චත්ථික-සඤ්ඤාය තං ආරබ්භ ආවුධං උක්ඛිපිතුං විසහෙය්‍ය." (දීඝ-අටුවා 438)

**තස්මිං රාජිනි පච්චත්ථිකසඤ්ඤාය ආවුධං උක්ඛිපිතුං සමත්ථො කොචි සත්තො නාම නත්ථි.**

12. "භගවාපි සෙතච්ඡත්තං පහාය හත්ථගතං....... රජ්ජං නිස්සජ්ජිත්වා පබ්බජිතො, තෙපි සෙතච්ඡත්තානි පහාය හත්ථ-ගතානි රජ්ජානි නිස්සජ්ජිත්වා පබ්බජිතා" (දීඝ-අටුවා 482.)

**භගවාපි තෙපි සෙතච්ඡත්තානි පහාය
හත්ථගතරජ්ජානි නිස්සජ්ජිත්වා පබ්බජිතා.**

13. "තුම්හෙ කපිලවත්ථුවාසිකෙ ගහෙත්වා ගච්ඡථ, යෙ සොණසිඟාලාදයො විය අත්තනො භගිනීහි සද්ධිං සංවසිංසු."

**සොණසිඟාලාදයො විය සකභගිනීහි සහ වුත්ථෙ කපිලවත්ථුවාසිකෙ ගහෙත්වා තුම්හෙ ගච්ඡථ.**

14. "රාජානං පස්සිතුං ආගච්ඡන්තා අඤ්ඤස්ස රජ්ජං අපීළෙත්වා අත්තනො අත්තනො රජ්ජපදෙසෙනෙව ආගමිස්සන්ති චෙව ගමිස්සන්ති චාති." (දීඝ-අටුවා 466.)

**රාජදස්සනං ආගච්ඡන්තා පරරජ්ජං අපීළෙත්වා සකසක රජ්ජපදෙසෙනෙව ගමනාගමනං කරිස්සන්තීති.**

15. "පත්තං ගහෙත්වා ආකාසෙ ඛිපි, පත්තො ආකාසෙ අට්ඨාසි." (දීඝ-අටුව' 370.)

**තාය ගහෙත්වා ආකාසං ඛිත්තො පත්තො තත්ථ අට්ඨාසි.**

16. "භගවා මහාභික්ඛුසඞ්ඝපරිවුතො රාජගහං අගමාසි, තත්ථ ගතකාලෙ මහාමොග්ගල්ලානත්ථෙරො පරිනිබ්බායි."

(දීඝ-අටුවා 384.)

**මහාභික්ඛුසඞ්ඝපරිවුතෙ භගවති රාජගහං ගතෙ මහාමොග්ගල්ලානත්ථෙරො පරිනිබ්බායි.**

17. "සයණ්හතා පනාහං එකං සුපිනමද්දක්ඛිං, ඊදිසං හි තං සුපිනං."

**සයණ්හතා පනාහං ඊදිසං සුපිනමද්දක්ඛිං.**

---

# භාෂාරීති.

ඒ ඒ භාෂාවන්හි අන්‍ය භාෂාවන් හා අසමානවූ ඇතැම් යෙදුම් විද්‍යමාන වෙති. ඒ විශෙෂ යෙදුම් 'භාෂාරීති' නාමයෙන් හඳුන්වනු ලැබේ.

සිංහල අනුව යොදනට යාමේන් පාළියෙහි වරදින තැන් හා පාළියෙහි විශෙෂව පවත්නා යෙදුම් ද හැකි තරමක් මෙහි දක්වනු ලැබේ.

ඇතැම් ශිෂ්‍යයෝ

1. (1) ගසට නගී = රුක්ඛස්ස ආරුහති.
(2) ගමට යයි = ගාමස්ස ගච්ඡති.
(3) ගෙට දුවයි = ගෙහස්ස ධාවති.
(4) ඔහුට ගසයි. = තස්ස පහරති

යි පරිවර්තනය කරත්.

මෙසේ කරත්තේ සිංහලෙහි කර්ම විභක්තියෙහිත් සම්ප්‍රදාන යෙහිත් ට-ප්‍රත්‍යය යෙදී තිබෙන බැවින් මේ තැන්හි ට-ප්‍රත්‍යය කවර අර්ථයකදැයි නොදැනය.

මේ තැන්හි ට-ප්‍රත්‍යය කර්මාර්ථයෙහි බැවින් ඒ වචන පාළියට නැගීමේදී කර්මවිභක්තියෙන් තැබිය යුතුයි. එබැවින් (1) රුක්ඛං ආරුහති, (2) ගාමං ගච්ඡති, (3) ගෙහං ධාවති, (4) තං පහරති යි මේ වාක්‍යයන් පාළියට නැගියයුතු.

(i) "යාචකයාට ආහාර දේ" යන්නෙහි දානාර්ථයක් ඇති බැවින් එබඳුතන්හි චතුර්ථිය යෙදිය යුතුයි. සම්ප්‍රදාන විභක්තිය කිනම් අර්ථයන්හි යෙදෙන්නේදැයි පා. න. තෙවෙනි පොතේ **විභක්ත්‍යර්ථ විභාගය** බැලීමෙන් දතහැක.

2. “මේ විල රාක්ෂසයකු විසින් අධිගෘහිත වූවක් වියයුතුය” යන තැන “විල” කුමන විභක්තියකින් යුක්තදැයි අප්‍රකටයි.

පාළියට නැගීමේදී :—

“රක්ඛසපරිග්ගහිතෙන ඉමිනා **සරෙන** භවිතබ්බං” තතියා-වෙන් යුක්තකොට නැගියයුතු.

3. (1.) “**ඔහු** එහි වසනබව සැමතැන ප්‍රකටවිය.”

(2.) “මට **කොටස්දෙකක්** දියයුතුබව හෝ නොදියයුතුබව අර රුක්දෙවියා දනී.”

(3.) “**ඒවා** කෑබව හෝ නොකෑබව දතමැනව.” යන වාක්‍යයන්හි “ඔහු – කොටස් දෙකක් – ඒවා” යන වචන කිනම් විභක්තියකින් යුක්ත කළයුතුදැයි ශිෂ්‍යයෝ සැකයට පත් වෙති. ඇතැම් විට වැඩිහිටියෝද මෙතැන්හි මූළා වෙති. මේ වාක්‍යයන්:–

(1.) “**තස්ස** තත්‍ථ වසනභාවො සබ්බත්‍ථ පාකටො අහොසි.”

(2.) “මය්හං **ද්වින්නං කොට්ඨාසානං** යුත්තභාවං වා අයුත්තභාවං වා එසා රුක්ඛදෙවතා ජානාති.”

(3.) “තෙසං ඛාදිතභාවං වා අඛාදිතභාවං වා ජානාථ.” යි ඡට්ඨියෙන් යුක්තකොට නැගිය යුතුයි.

**සංලක්ෂ්‍යය:**

**භාවාර්ථයක් යෙදෙනකල්හි ඊට සම්බන්ධවූ පදය සම්බන්ධ විභක්තියෙන් සිටී.**

4. ගොපල්ලා **දවසට දෙවරක්** පසේබුදුන්ට උපස්ථාන පිණිස ගියේය.” යන තැන “දවසට දෙවරක්” යන පද කිනම් විභක්තිවලින් යුක්තදැයි සැක උපදී.

මෙහි “දවසට” සම්බන්ධවිභක්තියි; “දෙවරක්” කර්ම විභක්තියි. එබැවින්:–

“ගොපාලකො දිවසස්ස ද්වෙ වාරෙ පච්චෙකබුද්ධස්ස උප-ට්ඨානං ගච්ඡි”යි නැගියයුතු.

5. (1) “මෙහි ඇතැමෙක් **තෙමේ** දන් දෙයි, අනුන් සමාදන් නොකරවයි.”

(2.) "කුද්‍දාලපණ්ඩිතයා **තෙමේ** පළමුව පැවිදිව් පසුව පිරිස පැවිදිකොට ආශ්‍රමප්‍රදේශය බෙදා දුන්නේය."

(3.) **තුමූ** නොගත්තාහු කෙසේනම් මටත් නොදෙවා යත්-තාහුද?"

යන වාක්‍යයන්හි "තෙමේ-තුමූ" යන පද ප්‍රථමාවෙන් යුක්තබව පැහැදිලිය. නමුත් පාළියෙහි මේ පදයන් පෙනෙන්නේ තතියාවෙන් යුක්තවයි. එය විශේෂ රීතියකි:-

(1.) "ඉධෙ'කච්චෙ **අත්තනා** දාතං දෙති, පරං න සමාදපෙති."
(ධම්මපදට්ඨකථා. 301.)

(2.) කුද්දාලපණ්ඩිතො පඨමං **අත්තනා** පබ්බජිත්වා පච්ඡා පරිසං පබ්බාජෙත්වා අස්සමපදං භාජෙත්වා අදාසි."
(කුද්දාලජාතක. 70.)

(3.) කථංහි නාම **අත්තනා** අගණ්හන්තා මය්හම්පි අදාපෙත්වා පක්කමිස්සන්ති?" (බ්‍රහ්මසංයුත්තට්ඨකථා. 1 - 169.)

**සංලක්ෂ්‍යය:**

මෙහි තෙවෙනි වාක්‍යයෙහි "අත්තනා" යන්න "අගණ්හන්තා" යන බහුවචනය හා සම්බන්ධවන නමුත් එය එකවචනයෙන් ම සිටීම සැලකියයුත්තකි.

6. (1.) "දෙරටුපාලයා (ඔහුට) උණපළුවලින් තළා **බෙල්ලෙන්** ගෙන බැහැරකෙළේය.

(2.) "මා හා සමානරූප ඇති අන්‍යවූ යමෙක් ඒනම් ඔහුගේ **පිටට** ගසා නෙරපව්.

(3.) "හෙතෙම ගොස් ගොනා **නාස්ලණුවෙන්** අල්ලා ගත්තේය."

(4.) "ගෘහපතියා බැස **හිසකෙස්වලින්** අල්වාගෙන නමා වැලමිටිපහරවලින් තළා **බෙල්ලෙන්** අල්වා (ඉවත) දමා ගියේය."

යන වාක්‍යයන්හි "බෙල්ලෙන් - පිටට - නාස්ලණුවෙන් - හිසකෙස්වලින්" යන වචන පාළියට නගන විට සත්තමියෙන් සිටිනබව පෙනේ:-

(1.) "ද්වාරපාලො.........වංසපෙසිකාහි තං පොථෙත්වා **ගීවාය** ගහෙත්වා නීහරි. (ඉල්ලීසජාතක.)

(2.) "**යො** අඤ්ඤො මයා සමානරූපො ආගච්ඡති, තං **පිට්ඨියං** **පහරිත්වා** නීහරෙය්‍යාථ." (එම ජාතක.)

(3.) "සො .........ගන්ත්වා ගොණෙ **නාසාරජ්ජුයං** ගණ්හි." (එම ජාතක.)

(4.) "ගහපතිකො ඔතරිත්වා **කෙසෙසු** ගහෙත්වා නාමෙත්වා **කප්පරප්පහාරෙහි** කොට්ටෙත්වා **ගලෙ** ගහෙත්වා......... ඛිපිත්වා පක්කාමි." (එම ජාතක.)

7. (1.) "මේ කීමේ අර්ථය ආයුෂ්මත් **ශාරිපුත්‍රස්ථවිරතුමාටම** වැටහේ නම් යෙහෙකි."

(2.) "චුන්දය, **තට** බෝධ්‍යඞ්ගයෝ වැටහෙත්වා."

(3.) "භාග්‍යවතුන් වහන්සේගේ ගිලන්බව නිසා **මට** ධර්මයෝද නොවැටහෙති."

යනාදි වැටහීම දක්වන වාක්‍යයන්හි "මට, තට" යනාදිය සිංහලෙහි සම්ප්‍රදානයෙන් යෙදේ. පාලියෙහි ඒවා ද්විතියාවෙන් යෙදෙත්:—

(1) "සාධු වතායස්මන්තං යෙව **සාරිපුත්තං** පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො" (ඛන්ධසංයුත්ත.)

(2) "පටිභන්තු තං චුන්ද බොජ්ඣඞ්ගා." (බොජ්ඣඞ්ගසංයුත්ත)

(3) "ධම්මා පි මං නප්පටිභන්ති භගවතො ගෙලඤ්ඤෙන." (මහාපරිනිබ්බාණ)

---

**සංලක්ෂ්‍යය:-**

මෙයට **පටිභායොග** යයි කියනු ලැබේ. පති-අධි-අනු ආදී උපසර්ගයෝගයක් නැතිවිට ඒ තැන්හි චතුර්ථීයම යෙදේ.

උදාහරණ:—

"අනඞ්ගණස්ස **පොසස්ස** නිච්චං සුචිගවෙසිනො
වාලග්ගමත්තං පාපස්ස අබ්භාමත්තංව **ඛායති**."

(ථෙරගාථා.)

8. මාරුකිරීමේදී මාරුවට දෙනදෙය දුතියාවෙන් ද මාරු කොට ගනුලබන දෙය තතියාවෙන් ද සිටිනබව පෙනේ.

(1) අසන්ථුතං මං චිරසන්ථුතෙන,
නිමිනාසි හොති අධුවං ධුවෙන;
මයාපි හොති නිමිනෙය්‍ය අඤ්ඤං;
ඉතො අහං දූරතරං ගමිස්සං." (චුල්ලධනුග්ගහජා.)

සොඳුර, තී බොහෝකලක් සේවනයකළ සපිරවූ සැමියා හා අසපිරවූ ආශ්‍රය නොකළාවූ මා මාරුකළෙහිය. මා හාත් අනිකකු මාරුකරනවා ඇත; එබැවින් මම මෙයින් ඉතා දුරට යන්නෙමි.

9. ද්විතීයාව යෙදිය යුතු තැන ප්‍රථමාවක්:—

(1.) "නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා" යන අඞ්ගුලිමාලසූත්‍රපාඨයෙහි "වොරොපෙතා" ප්‍රථමාවෙන් යුක්තයි. "දැන දැන ප්‍රාණියෙකු ජීවිතයෙන් තොරකළහු (=තොරකළබවක්) නොදනිමි"යි කියයුතු තැන යොදා තිබෙන්නේ "ප්‍රාණියකු ජීවිතයෙන් තොරකළේ නොදනිමි" යනුවෙනි.

(2.) "නාභිජානාමි සුපිනන්තෙනපි මෙථුනං ධම්මං පටිසෙවිතා"
(පාරාජිකපාළි.)

(3.) "සරසි ත්වං දබ්බං එවරූපං කත්තා." (එම.)
යන පාඨයෝද මීට නිදර්ශන වෙති.

10. (1.) "අඥානයා හා සහායබවක් (=මිත්‍රබවක්) නැත."
(2.) "මහානාමශාක්‍යයා හා වෛර බැන්දහ"
යන වාක්‍යයන් පාළියට පෙරළූවිට:—
(1) "නත්ථි බාලෙ සහායතා." (ධ. අ.)
(2) "මහානාමෙ සක්කා උපනය්හිංසු." යි සිටින්.

11. සිංහලෙහි "මෙන්-වැනි" යන උපමාද්‍යෝතක නිපාතයන් හා යෙදෙන පදය දුතියාවෙන් සිටින නමුත් පාළියෙහි එය ප්‍රථමාවෙන් සිටී:—

(1.) "නාහං චුන්ද අඤ්ඤං එකසංඝම්පි සමනුපස්සාමි එවං ලාභග්ගයසග්ගප්පත්තං යථරිවායං භික්ඛුසංඝො." (=චුන්දය මේ භික්ෂුසමූහය මෙන් ලාභයෙන් හා යසසින් අගතැන් පැමිණි අන්‍ය එක් සමූහයකුත් මම නොදකිමි)
(පාසාදිකසුත්ත. දීඝ.)

12. **"මනුෂ්‍යවූවන් ගැන කියනුම කිම?** චේතනාරහිත වෘක්ෂයන්ගේ ද සමගිය ලබන්ට වටී." යන වාක්‍යය පාළියට නැගෙන්නේ මෙසේයි:—

"**තිට්ඨන්තු තාව** මනුස්සභූතා, අචේතනානම්පි රුක්ඛානං සාමග්ගිං **ලද්ධුං** වට්ටති." (රුක්ඛධම්මජාතක )

මෙය පද තිබෙනසේ පෙරළුවහොත් "මනුෂ්‍යවූවෝ සිටිත්වා"යි හෝ "තවතිත්වා"යි කියයුතුය.

13. **"අච්චයො** මං භන්තෙ **අච්චගමා"** යන වාක්‍යයෙන් "ස්වාමීනි මා විසින් වරදක් කරනලද"යි කියවේ. පදයන් අනුව අර්ථ කිවහොත් "ස්වාමීනි, දෝෂය මා ඉක්මවා ගියේය"යි කියයුතුය. (මෙය **භද්දාලිසූත්‍රා**දියෙහි ආයේයි. M. i, 438; A. ii, 146.)

14. "එකමෙකං භික්ඛුං පච්චෙක-**දුස්සයුගෙන අච්ඡාදෙසි"** යන වාක්‍යය "අඩ්ඪනාගර" සූත්‍රාදි බොහෝතැන පෙනේ.

"එක් එක් භික්ෂුනම වෙන් වෙන් වස්ත්‍ර යුග්මවලින් ඇන්දවිය"යි අර්ථ කියයුතුය. එක් එක් නමට (සිවුරු සාදා ගැනීම පිණිස) වස්ත්‍ර දෙක බැගින් දුන්නේය යන අදහසයි.

"දුස්සයුග" යන්න දුතියාවෙන් සිටියයුතු නමුත් භාෂා රීතිය නිසා තතියාවෙන් යොදැතිබේ.

15. "නුගත් පෘථග්ජනයා හා උගත් ආර්යශ්‍රාවකයාගේ වෙනස කවරේද?" යන්න පාළියෙහි පෙනෙන්නේ:

"කිං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථු**ජ්ජනෙන"** කියායි. (වේදනාසංයුත්ත.)

ආර්යශ්‍රාවකයාගේත් පෘථග්ජනයාගේත් වෙනස කවරේදැයි ඇසීමයි.

16. "ඉමං කායං මඤ්චකං ආරොපෙත්වා බහිද්ධා නීහරථ, පුරායං **කායො එත්ථෙව විකිරති** සෙය්‍යථාපි භුසමුට්ඨි" යන **සළායතනසංයුත්ත**- උපසෙනසූත්‍රයෙහි ආ වාක්‍යය: **"මේ ශරීරය** බොල්මිටක් මෙන් **මෙහිම විසිරයන්නට පෙර** මේ සිරුර ඇඳක තබා පිටත ගෙනයව්"යයි පරිවර්තනය කළයුතු. සාමාන්‍ය රීති අනුව යොදනහොත් "ඉමස්ස කායස්ස එත්ථෙව විකිරණතො පුරෙ"යි වාක්‍යයෝජනාව කළයුතුය.

17. "අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සූපගතානං භික්ඛූනං ගාමො **චොරෙහි වුට්ඨාසි**" යන විනයමහාවග්ගෙහි ආ වාක්‍යය:

"**එක්තරා** ආවාසයක වස්එළැඹි භික්ෂූන්ගේ (ගොදුරු) ගම සොරුන් **කරණකොට නැංගේය**"යි සිංහලට නැගේ.

සොරුන් ගම පැහැරීම නිසා ගම්වැසි සමූහය ගම හැර ගියේය යන අදහස ගතයුතු.

18. "එවං හි සො භික්ඛවෙ මච්ඡො..........යථා කාමකරණීයො **බාලිසිකස්ස**" (සළායතනසංයුත්ත.)

"**මහණෙනි, මෙසේ ඒ මත්ස්‍යයා බිලිබාන්නා විසින් කැමති දෙයක් කළහැක්කෙක් වන්නේය.**"

(තෘතීයාර්ථයෙහි ෂෂ්ඨියයි.)

19. "තස්ස මෙ අට්ඨමී රත්ති, **යතො තණ්හා සමූහතා**"

(සාමාථෙරීගාථා.)

"යම් දිනක තෘෂ්ණාව නසනලද්දීද, (එතැන් පටන්) ඒ මට අටවෙනි රාත්‍රියයි." තෘෂ්ණාව නැසූ තැන් පටන් අටදිනක් ගතවීය යන අදහසයි.

20. "මා ඛො තුම්හෙ ආයස්මන්තො **එසො අජෙසි.**"

(චූලවග්ගපාළි.)

"මේ තෙමේ ආයුෂ්මත්වූ තොප නොදිනාවා, නොහොත් පරාජය නොකෙරේවා. (**ආයස්මන්තො** කර්මයයි ගතයුතු.)

21. "**අජ්ඣුමාරිකා** වායං කුලපුත්තො මරිස්සති"

(අඞ්ගුත්තරඅට්ඨකථා)

"මේ කුලපුත්‍රයා අනාථමරණයක්ම මැරෙන්නේය;" නිරාහාරයෙන් මරණයට පැමිණෙන්නේය යන අදහසයි.

22. "රතනත්තයගුණං අනුස්සරන්තස්සෙව **ගච්ඡන්තස්ස** චොරා මග්ගෙ **පරිසුම්භිංසු.**" (=රත්නත්‍රයගුණ සිහිකරමින් යනා **කල්හිම** සොරු මාර්ගයෙහි හාත්පසින් නැගී **සිටියහ.**) **ජනනමානවකවිමානවත්ථු.** සොරු මාර්ගය අවුරාගෙන සිටියාහ යන අදහසයි.

23. "සබ්බසන්ථරිං සන්ථතං, භන්තෙ, සන්ථාගාරං; ආසනානි පඤ්ඤත්තානි;..........යස්ස දානි භගවා කාලං මඤ්ඤති." (දී. සංගීතිසු) ශාලාව සැමතැන වැසුණු එකක් වනසේ නගරශාලාව අතුරනලදී; අසුන් පණවනලදහ. එහි යෑමට දැන් භාග්‍යවත්තෙමේ කල් දනීවා.

24. "නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති" (=එසේවූ කල්හි ඒ පුරුෂයාගේ කීම ආශ්චර්‍ය්‍ය නැත්තක් නොවන්නේද?) චූලසකුළුදායි. ම.

25. "සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසො අස්සකො අනාළ්හිකො; තස්ස අකාමකස්ස බිලං ඔලග්ගෙය්‍යුං." (=ඔහු නොකැමතිකල්හිම කොටස එල්ලවන්නාහුය.) එසුකාරිසුත්ත ම.

සමූහයක්වී ගමන්කළ මිනිසුන් අතරෙන් එක් මිනිසකු ඔහුට බෙදන මස්කොටස ගැනීමට නොකැමැතිවූ නමුත් අන්‍යයෝ නොකැමති ඔහුට මස්කොටසක් වෙන්කොට එල්ලා තැබූහ.

26. "අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අයං ජම්බුදීපො අවීචිං මඤ්ඤෙ ඵුටො භවිස්සති මනුස්සෙහි සෙය්‍යථාපි නළවනං වා සරවනං වා" (චක්කවත්තිසීහනාදසුත්ත)

"මහණෙනි, මිනිසුන් අසූදහස්හවුරුදු ආයුෂ ඇතිකල්හි මේ දඹදිව බටවනයක් හෝ බිහිබටවනයක් මෙන් අතර නැතිව මිනිසුන්ගෙන් පිරුණේ වන්නේයයි හඟිමි."

27. "සාලවතී ගණිකා න චිරස්සෙව පදක්ඛිණා අහොසි නච්චෙ ච ගීතෙ ච වාදිතෙ ච; අභිසටා අත්ථිකානං අත්ථිකානං මනුස්සානං; පටිසතෙන ච රත්තිං ගච්ඡති."

(විනයමහාවග්ග)

"සාලවතී ගණිකාතොමෝ නොබෝකලකින්ම නෘත්‍යයෙහිත් ගීතයෙහිත් වාද්‍යයෙහිත් දක්ෂවිය; කැමති කැමති මිනිසුන් විසින් එළඹෙනලද්දී විය; රැයකට සියය බැගින් ගෙන (පුරුෂයන් වෙත) යයි."

28. "සෙය්‍යථාපි භික්ඛවෙ චණ්ඩස්ස කුක්කුරස්ස නාසාය පිත්තං භින්දෙය්‍යුං, එවං හි සො භික්ඛවෙ කුක්කුරො භිය්‍යොසො මත්තාය චණ්ඩතරො අස්ස." (චුල්ලවග්ගපාළි)

මෙහි "නාසාය පිත්තං භින්දෙය්‍යුං" (=නාසයෙහි පිත බිඳින්නාහු නම්) යන්නෙන් නාසයට පිත ඇල්ලීම කියනු ලැබේ. "පිත ඇල්ලීම" නම් වලස්ආදි සතෙකුගේ පිත ගෙන බල්ලාගේ නාසයෙහි දැමීමයයි අටුවාවෙහි කියනලදී.

29. "රාජගහකො **නෙගමො** සාලවතිං කුමාරිං **ගණිකං වුට්ඨාපෙසි.**" (=රජගහවැසි **ගෘහපතිසමූහය** සාලවතී කුමරිය ගණිකාවක් කොට තැංවිය.) **මහාවග්ගපාළි.**

"ගණිකාස්ථානයෙහි තැබීය" යනු අදහසයි. **නෙගම** නම් "නගරසභා" වැනි සභාවකි.

30. **ජීන**= පිරිහුණේ. යමකින් පිරිහේනම් **මේ** ශබ්දය හා සම්බන්ධවන ඒ ද්‍රව්‍යය දුතියාවෙන් යොදා තිබෙන බව පෙනේ:-

"**ජීනො** රථස්සං මණිකුණ්ඩලෙ ච
පුත්තෙ ච දාරෙ ච තථෙව **ජීනො**"

(මණිකුණ්ඩලජාතක)

බහූ හි ඛත්තියා **ජීනා**
අත්ථං රට්ඨං පමාදිනො" (=ප්‍රමාදීවූ බොහෝ ක්ෂත්‍රියයෝ ධනයෙනුත් රාජ්‍යයෙනුත් පිරිහුණාහ.) **ගණ්ඩතින්දුක ජාතක.**

**ජීයති** = පිරිහේ.

මෙය ද ජීන-ශබ්දය මෙන් ජි (-හානියං) යන ධාතුවෙන් නිපන්නකි. මෙය හා සම්බන්ධවන පිරිහෙන දෙය දුතියාවෙන්ම සිටී.

---

"අක්ඛධුත්තො පඨමෙනෙව කලිග්ගහෙන පුත්තම්පි **ජීයෙථ,** දාරම්පි **ජීයෙථ,** සබ්බසාපතෙය්‍යම්පි **ජීයෙථ** උත්තරිම්පි අනුබන්ධං නිගච්ඡෙය්‍ය (=සූදුකාරයා ප්‍රථමපරාජය කරණකොටගෙනම පුත්‍රයාගෙන්ද පිරිහේ භාර්‍යාවගෙන්ද පිරිහේ සියලු සම්පතින්ද පිරිහේ, මත්තෙහිත් ඇපවලට බැඳෙන්නේය. ඒවා හැර දමන්නට සිදුවේ යන අදහසයි.)

**බාලපණ්ඩිතසුත්ත ම.**
M. iii 170.

# ක්‍රියාමාලාව

බොහෝසේ ව්‍යවහාරයට පත්වන ක්‍රියාවන්ගේ වර්තමාන-ප්‍රථමෛකවචනය ද පූර්වක්‍රියා ද කිතකපද ද මෙහි දක්වනු ලැබේ.

| **වර්තමාන-ක්‍රියා.** | **පූර්වක්‍රියා.** | **අතීත කිතකපද.** |
|---|---|---|
| අක්කමති | අක්කමිත්වා; අක්කමම, | අක්කන්ත. |
| අක්කොසති | අක්කොසිත්වා; -සිය. | අක්කුඨ. |
| අච්ඡති | අච්ඡිත්වා. | —— |
| අඤ්ජති | අඤ්ජිය; අඤ්ජිත්වා | අඤ්ජිත. |
| අතික්කමති | අතික්කමම; අතික්කමිත්වා | අතික්කන්ත. |
| අධිට්ඨාති | අධිට්ඨිය; අධිට්ඨහිත්වා. | අධිට්ඨිත. |
| අධිවත්තෙති | අධිවත්තිය; -ත්තිත්වා. | අධිවත්තිත. |
| අධිවාසෙති | අධිවාසෙත්වා. | අධිවාසිත. |
| අනුකරොති | අනුකරිත්වා; -කරිය. | අනුකත. |
| අනුගච්ඡති | අනුගන්ත්වා; -අනුගම්ම | අනුගත. |
| අනුධාවති | අනුධාවිත්වා | අනුධාවිත |
| අනුබන්ධති | අනුබන්ධිත්වා; -න්ධිය. | අනුබද්ධ. |
| අනුභවති | අනුභුත්වා; අනුභවිත්වා; අනුභවිය. | අනුභූත; අනුභවිත |
| අනුයුඤ්ජති | අනුයුඤ්ජිය, -ජිත්වා. | අනුයුත්ත |
| අනුස්සරති | අනුස්සරිය; -රිත්වා | අනුස්සරිත. |
| අපක්කමති | අපක්කමම; අපක්කමිත්වා | අපක්කන්ත. |
| අපගච්ඡති | අපගමම; අපගන්ත්වා | අපගත. |
| අපෙති | අපෙත්වා. | අපෙත. |
| අභික්කමති | අභික්කමිත්වා | අභික්කන්ත. |
| අභිත්ථවති | අභිත්ථවිත්වා, -විය. | අභිත්ථුත. |
| ~~අභිනන්දති~~ | ~~අභිනන්දිය; -දිත්වා.~~ | ~~අභිනන්දිත.~~ |
| අභිරමති | අභිරමිත්වා, -රමිය. | අභිරත. |
| අභිවාදෙති | අභිවාදිය; -වාදෙත්වා. | අභිවාදිත. |
| අසති (=අනුභවකරයි) | අසිත්වා. | අසිත. |
| අස්නාති ( ,, ) | අසිත්වා | අසිත. |
| ආකඩ්ඪති | ආකඩ්ඪිය; -ඪිත්වා. | ආකඩ්ඪිත. |
| ආකොටෙති | ආකොටිය; -ටෙත්වා | ආකොටිත. |
| ආගච්ඡති | ආගන්ත්වා; ආගම්ම | ආගත |
| ආගමෙති | ආගමෙත්වා | ආගමිත |
| ආචික්ඛති | ආචික්ඛිත්වා; -ඛිය. | ආචික්ඛිත. |

| වර්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීතකෘදන්ත පද. |
|---|---|---|
| ආණාපෙති | ආණාපිය; -පෙත්වා. | ආණාපිත. |
| ආදියති | ආදාය; ආදියිත්වා. | ආදින්න. |
| ආනෙති | ආනෙත්වා; ආනීය. | ආනීත. |
| ආරභති | ආරභිත්වා; ආරබ්භ; ආරද්ධා; ආරභිය. | ආරද්ධ. |
| ආරාධෙති | ආරාධිය; ආරාධෙත්වා | ආරාධිත. |
| ආරුහති | ආරුය්හ; ආරුහිත්වා | ආරූළ්හ. |
| ආරොචෙති | ආරොචිය; - චෙත්වා. | ආරොචිත. |
| ආරොපෙති | ආරොපිය; -පෙත්වා | ආරොපිත. |
| ආලිඞ්ගති | ආලිඞ්ගිය; -ඞ්ගිත්වා. | ආලිඞ්ගිත. |
| ආවුණාති | ආවුණිය; -ණිත්වා. | ආවුත. |
| ආසිඤ්චති | ආසිඤ්චිය; ආසිඤ්චිත්වා | ආසිත්ත. |
| ආසිංසති | ආසිංසිය; -සිත්වා | ආසිට්ඨ. |
| ආසෙවති | ආසෙවිය; -විත්වා | ආසෙවිත. |
| ආහරති | ආහරිය; ආහරිත්වා | ආහට. |
| ආහිණ්ඩති | ආහිණ්ඩිය; -ඩිත්වා | —— |
| ඉච්ඡති | ඉච්ඡිය; ඉච්ඡිත්වා | ඉච්ඡිත. |
| උක්කුජ්ජෙති | උක්කුජ්ජිය;-ජ්ජෙත්වා | උක්කුජ්ජිත. |
| උක්ඛිපති | උක්ඛිපිය; -පිත්වා | උක්ඛිත්ත. |
| උග්ගච්ඡති | උග්ගන්ත්වා; උග්ගච්ඡිත්වා; උග්ගම්ම. | උග්ගත. |
| උග්ගණ්හාති | උග්ගණ්හිය; උග්ගහෙත්වා; උග්ගණ්හිත්වා. | උග්ගහිත |
| උග්ගණ්හාපෙති | උග්ගණ්හාපෙත්වා | උග්ගණ්හාපිත. |
| උග්ඝොසෙති | උග්ඝොසිය,-සෙත්වා | උග්ඝොසිත. |
| උච්චාරෙති | උච්චාරිය; උච්චාරෙත්වා | උච්චාරිත. |
| උට්ඨහති, උට්ඨාති | උඨිය; උට්ඨහිත්වා; උඨාය. | උඨිත. |
| උට්ඨාපෙති | උට්ඨාපෙත්වා; උට්ඨාපිය | උට්ඨාපිත. |
| උඩ්ඩෙති | උඩ්ඩීයිත්වා; උඩ්ඩෙත්වා; උඩ්ඩිය. | උඩ්ඩිත. |
| උත්තරති | උත්තරිය; උත්තරිත්වා | උත්තිණ්ණ. |
| උපචිනාති | උපචිනිත්වා; -නිය. | උපචිත. |
| උපට්ඨහති | උපට්ඨහිත්වා; උපඨිය. | උපඨිත. |
| උපධාරෙති | උපධාරිය; -රෙත්වා | උපධාරිත. |
| උපලිම්පෙති | උපලිම්පිය; -පෙත්වා | උපලිත්ත; උපලිම්පිත. |

| වත්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීත කිතකපද. |
|---|---|---|
| උපෙක්ඛති | උපෙක්ඛිය; -ඛිත්වා | උපෙක්ඛිත. |
| උප්පජ්ජති | උප්පජ්ජිත්වා; -ජිය | උප්පන්න. |
| උබ්භිජ්ජති | උබ්භිජ්ජිය; -ජිත්වා | උබ්භින්න. |
| උම්මුජ්ජති | උම්මුජ්ජිය; -ජිත්වා | උම්මුජ්ජිත. |
| උය්‍යොජෙති | උය්‍යොජිය; -ජෙත්වා | උය්‍යොජිත. |
| උල්ලංඝෙති | උල්ලංඝිය; -ඝෙත්වා | උල්ලඞ්ඝිත. |
| උල්ලොකෙති | උල්ලොකිය; -කෙත්වා | උල්ලොකිත. |
| උස්සහති | උස්සහිත්වා | උස්සහිත. |
| ඔකිරති | ඔකිරිය; ඔකිරිත්වා | ඔකිණ්ණ. |
| ඔක්කමති | ඔක්කම්ම; ඔක්කමිත්වා | ඔක්කන්ත. |
| ඔචිනාති | ඔචිනිය; -නිත්වා | ඔචිත |
| ඔතරති | ඔතරිය; ඔතරිත්වා | ඔතිණ්ණ. |
| ඔතාරෙති | ඔතාරෙත්වා; ඔතාරිය | ඔතාරිත. |
| ඔනමති | ඔනමිත්වා; ඔනමිය | ඔනත |
| ඔභාසෙති | ඔභාසිය; -සෙත්වා | ඔභාසිත. |
| ඔමුඤ්චති | ඔමුඤ්චිය; -චිත්වා | ඔමුත්ත. |
| ඔරූහති | ඔරුය්හ; ඔරූහිත්වා | ඔරූළ්හ. |
| ඔලම්බති | ඔලම්බිත්වා; -බිය | ඔලම්බිත. |
| ඔලම්බෙති | ඔලම්බෙත්වා | ඔලම්බිත. |
| ඔලොකෙති | ඔලොකිය; -කෙත්වා | ඔලොකිත. |
| ඔසරති | ඔසරිත්වා | ඔසට. |
| කන්තති | කන්තිය; කන්තිත්වා | කන්තිත. |
| කප්පෙති | කප්පෙත්වා; කප්පිය | කප්පිත. |
| කම්පති | කම්පිත්වා | කම්පිත. |
| කම්පෙති | කම්පෙත්වා | කම්පිත. |
| කරොති | කත්වා; කරිත්වා<br>කාතූන; කරිය | කත. |
| කසති | කසිත්වා | කට්ඨ, කසිත. |
| කාරාපෙති | කාරාපිය; -පෙත්වා | කාරාපිත. |
| කාලංකරොති | කාලංකත්වා | කාලඞ්කත. |
| කිණාති | කිණිත්වා; කිණිය | කීත. |
| කීළති | කීළිත්වා | කීළිත. |
| කොට්ටෙති | කොට්ටෙත්වා;<br>කොට්ටිය | කොට්ටිත, |
| ඛණති | ඛණිත්වා; ඛණිය | ඛත. |
| ඛාදති | ඛාදිය; ඛාදිත්වා | ඛාදිත. |

| වර්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීත කිතකපද. |
|---|---|---|
| ඛිපති | ඛිපිය; ඛිපිත්වා | ඛිත්ත. |
| ගච්ඡති | ගන්ත්වා; ගමිත්වා | ගත. |
| ගජ්ජති | ගජ්ජිය; ගජ්ජිත්වා | ගජ්ජිත. |
| ගණ්හාති | ගණ්හිය; ගණ්හිත්වා<br>ගය්හ; ගහෙත්වා | ගහිත. |
| ගවේසති | ගවේසිය; ගවේසිත්වා | ගවේසිත. |
| ගායති | ගායිත්වා | ගායිත; ගීත. |
| ගිලති | ගිලිත්වා; ගිලිය | ගිලිත. |
| ගොපෙති | ගොපිය; තොපෙත්වා | ගොපිත. |
| ඝායති | ඝායිත්වා | ඝායිත. |
| චජති | චජිත්වා, චජිය | චත්ත. |
| චරති | චරිත්වා; චරිය | චරිත. |
| චලති | චලිත්වා; චලිය | චලිත. |
| චාරෙති | චාරෙත්වා, චාරිය | චාරිත. |
| චින්තෙති | චින්තිය; චින්තෙත්වා | චින්තිත. |
| චොරෙති | චොරෙත්වා | චොරිත. |
| ඡඩ්ඩෙති | ඡඩ්ඩිය; ඡඩ්ඩෙත්වා | ඡඩ්ඩිත. |
| ඡාදෙති | ඡාදෙත්වා; ඡාදිය | ඡාදිත; ඡන්න. |
| ජිජ්ජති | ජිජ්ජිත්වා; ජිජ්ජිය | ජින්න. |
| ඡින්දති | ඡෙත්වා; ඡින්දිය; ඡින්දිත්වා. | ඡින්න; ඡින්දිත. |
| ජහාති | ජහිත්වා; ජහිය | ජහිත. |
| ජානාති | ජානිත්වා; ජානිය | ඤාත. |
| ජායති | ජායිත්වා | ජාත. |
| ජාලෙති | ජාලෙත්වා | ජාලිත. |
| ජිනාති | ජෙත්වා; ජිනිත්වා; ජිනිය | ජිත |
| ජීයති | ජීයිත්වා | ජිණ්ණ |
| ජීරෙති | ජීරෙත්වා | ජීරාපිත |
| ජීවති | ජීවිත්වා | ——— |
| ජොතති | ජොතිත්වා | ——— |
| ජොතෙති | ජොතෙත්වා | ජොතිත. |
| ඣාපෙති | ඣාපෙත්වා; ඣාපිය. | ඣාපිත |
| ඨපෙති | ඨපෙත්වා; ඨපිය | ඨපිත. |
| ඩසති | ඩසිත්වා; ඩසිය | ඩසිත, දට්ඨ |
| තජ්ජෙති | තජ්ජිය; තජ්ජෙත්වා | තජ්ජිත. |
| තරති | තරිත්වා, තරිය | තරිත; තිණ්ණ. |
| තිකිච්ඡති | තිකිච්ඡිය; තිකිච්ඡිත්වා | තිකිච්ඡිත. |

| වර්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීත කිතකපද. |
|---|---|---|
| තිට්ඨති | ඨත්වා | ඨිත. |
| තුලෙති | තුලෙත්වා; තුලිය | තුලිත. |
| තුස්සති | තුසිත්වා | තුට්ඨ. |
| ථෙනෙති | ථෙනෙත්වා | ථෙනිත. |
| දදාති | දත්වා; දදිත්වා | දින්න. |
| දහති | දහිත්වා; | දඩ්ඪ. |
| දස්සෙති | දස්සිය; දස්සෙත්වා | දස්සිත. |
| දුබ්භති | දුබ්භිය; දුබ්භිත්වා | දුබ්භිත. |
| දූසෙති | දූසිය; දූසෙත්වා | දූසිත |
| දෙති | දත්වා | දින්න. |
| දෙසෙති | දෙසිය; දෙසෙත්වා | දෙසිත. |
| ධමති | ධමිත්වා; ධමිය | ධන්ත. |
| ධාවති | ධාවිත්වා, ධාවිය | ධාවිත. |
| ධුනාති | ධුනිය; ධුනිත්වා | ධුත. |
| ධොවති | ධොවිය; ධොවිත්වා | ධොත. |
| නච්චති | නච්චිය; නච්චිත්වා | ——— |
| නමස්සති | නමස්සිය; නමස්සිත්වා | නමස්සිත |
| නයති, නෙති | නෙත්වා; නයිත්වා | නීත. |
| නස්සති | නස්සිය; නස්සිත්වා | නට්ඨ. |
| නහාපෙති | නහාපෙත්වා; නහාපිය | නහාපිත. |
| නහායති | නහාත්වා; නහායිත්වා | නහාත. |
| නාසෙති | නාසෙත්වා | නාසිත. |
| නික්කුජ්ජති | නික්කුජ්ජිය;-ජ්ජිත්වා | නික්කුජ්ජිත. |
| නික්ඛමති | නික්ඛමම; නික්ඛමිත්වා | නික්ඛන්ත. |
| නිඛණති | නිඛණිත්වා; නිඛණිය | නිඛාත. |
| නිගච්ඡති | නිගන්ත්වා | ——— |
| නිග්ගච්ඡති | නිග්ගන්ත්වා; නිග්ගච්ඡිත්වා | නිග්ගත. |
| නිච්ඡෙති | නිච්ඡෙත්වා; නිච්ඡිය | නිච්ඡිත. |
| නිදහති | නිදහිත්වා; නිදහිය | නිදහිත; නිහිත. |
| නිධමති | නිධමිත්වා | නිධමිත. |
| නින්දති | නින්දිය; නින්දිත්වා | නින්දිත. |
| නිපජ්ජති | නිපජ්ජිත්වා; නිපජ්ජිය | නිපන්න |
| නිපජ්ජාපෙති | නිපජ්ජාපෙත්වා | නිපජ්ජාපිත. |
| නිබ්බත්තති | නිබ්බත්තිය; නිබ්බත්තිත්වා | නිබ්බත්ත |
| නිබ්බින්දති | නිබ්බින්දිත්වා | නිබ්බින්න. |
| නිමන්තෙති | නිමන්තිය; නිමන්තෙත්වා | නිමන්තිත |
| නිමුජ්ජති | නිමුජ්ජිය; නිමුජ්ජිත්වා | නිමුග්ග |

| වර්තමාන-ක්‍රියා. | පූර්ව ක්‍රියා. | අතීත කෘදන්ත ශබ්ද. |
|---|---|---|
| නිම්මිණාති | නිම්මිණිත්වා; නිම්මිණිය | නිම්මිත. |
| නිවත්තති | නිවත්තිය; නිවත්තිත්වා | නිවත්ත. |
| නිවත්තෙති | නිවත්තෙත්වා | නිවත්තිත. |
| නිවාසෙති | නිවාසෙත්වා; නිවාසිය | නිවුත්ථ; නිවාසිත. |
| නිවෙදෙති | නිවෙදිය; නිවෙදෙත්වා | නිවෙදිත |
| නිවෙසෙති | නිවෙසිය, නිවෙසෙත්වා | නිවෙසිත. |
| නිසීදති | නිසීදිය; නිසීදිත්වා | නිසින්න |
| නීහරති | නීහරිය; නීහරිත්වා | නීහට |
| නෙති | නෙත්වා | නීත. |
| පකාසෙති | පකාසිය; -සෙත්වා | පකාසිත. |
| පක්කොසති | පක්කොසිය; -සිත්වා | පක්කොසිත. |
| පක්ඛන්දති | පක්ඛන්දිය; -දිත්වා | පක්ඛන්ත. |
| පක්ඛලති | පක්ඛලිත්වා | පක්ඛලිත. |
| පක්ඛාලෙති | පක්ඛාලෙත්වා | පක්ඛාලිත. |
| පක්ඛිපති | පක්ඛිපිය; පක්ඛිපිත්වා | පක්ඛිත්ත. |
| පග්ගණ්හාති | පග්ගහිය; පග්ගහෙත්වා; පග්ගණ්හිත්වා, පග්ගය්හ. | පග්ගහිත. |
| පග්සරති | පග්සරිත්වා | පග්සරිත. |
| පචති | පචිත්වා; පචිය | පක්ක; පචිත. |
| පච්චක්ඛාති | පච්චක්ඛාය | පච්චක්ඛාත. |
| පච්චාගච්ඡති | පච්චාගන්ත්වා, පච්චාගම්ම. | පච්චාගත. |
| පච්චුට්ඨෙති | පච්චුට්ඨහිත්වා; පච්චුට්ඨිය | පච්චුට්ඨිත. |
| පටික්කමති | පටික්කම්ම; පටික්කමිත්වා | පටික්කන්ත. |
| පටික්ඛිපති | පටික්ඛිපිත්වා | පටික්ඛිත්ත. |
| පටිච්ඡාදෙති | පටිච්ඡාදිය, -දෙත්වා | පටිච්ඡන්න. |
| පටිපජ්ජති | පටිපජ්ජිය; -ජිත්වා | පටිපන්න. |
| පටිපුච්ඡති | පටිපුච්ඡිත්වා, -ඡිය. | පටිපුච්ඡිත. |
| පටිසාමෙති | පටිසාමෙත්වා-සාමිය | පටිසාමිත. |
| පටියාදෙති | පටියාදෙත්වා -යාදිය | පටියාදිත.<br>පටියත්ත. |
| පටිවෙදෙති | පටිවෙදෙත්වා; -දිය | පටිවෙදිත. |
| පටිසංඛරොති | පටිසංඛරිත්වා; -ඛරිය | පටිසංඛත. |
| පටිසංවෙදති | -වෙදෙත්වා; -වෙදිය | පටිසංවෙදිත. |
| පටිසෙධෙති | පටිසෙධෙත්වා; -සෙධිය | පටිසෙධිත. |
| පටිස්සුණාති | පටිස්සුණිය; -ණිත්වා | පටිස්සුත. |
| පටිහඤ්ඤති | පටිහඤ්ඤිත්වා | පටිහත. |
| පඨති | පඨිත්වා; පඨිය | පඨිත. |

| වර්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීත කෘදන්තපද. |
|---|---|---|
| පතති | පතිත්වා | පතිත. |
| පතිට්ඨාති | පතිට්ඨාය; පතිට්ඨහිත්වා | පතිට්ඨිත. |
| පතිට්ඨාපෙති | පතිට්ඨාපෙත්වා, -ට්ඨාපිය | පතිට්ඨාපිත. |
| පත්ථරති | පත්ථරිත්වා; පත්ථරිය | පත්ථට. |
| පත්ථෙති | පත්ථෙත්වා | පත්ථිත. |
| පපොති | —— | පත්ත. |
| පබුජ්ඣති | පබුජ්ඣිත්වා; -ජ්ඣිය | පබුද්ධ. |
| පබ්බජති | පබ්බජ්ජ; පබ්බජිය; පබ්බජිත්වා | පබ්බජිත. |
| පභාසෙති | පභාසිය; පභාසෙත්වා | පභාසිත. |
| පමුස්සති | පමුස්සිය, -සිත්වා | පමුට්ඨ. |
| පයිරුපාසති | පයිරුපාසිය; -සිත්වා | පයිරුපාසිත. |
| පයොජෙති | පයොජිය, පයොජෙත්වා | පයුත්ත. |
| පරක්කමති | පරක්කම්ම; -කමිත්වා | පරක්කන්ත. |
| පරාජෙති | පරාජිය; පරාජෙත්වා | පරාජිත. |
| පරික්ඛිපති | පරික්ඛිපිය; -ඛිපිත්වා | පරික්ඛිත්ත. |
| පරිචරති | පරිචරිය; -චරිත්වා | පරිචරිත. |
| පරිච්ඡින්දති | පරිච්ඡින්දිය; -දිත්වා | පරිච්ඡින්න. |
| පරිදහති | පරිදහිය; -දහිත්වා | පරිදහිත. |
| පරිදෙවති | පරිදෙවිය; -විත්වා | පරිදෙවිත. |
| පරිභාසති | පරිභාසිය; -සිත්වා | පරිභාසිත. |
| පරිමජ්ජති | පරිමජ්ජිය; -ජිත්වා | පරිමට්ඨ. |
| පරියෙසති | පරියෙසිය; -සිත්වා | පරිසෙසිත; පරියිට්ඨ. |
| පරිවජ්ජෙති | පරිවජ්ජිය; -ජ්ජෙත්වා | පරිවජ්ජිත. |
| පරිවත්තෙති | පරිවත්තිය; -තෙත්වා | පරිවත්තිත. |
| පරිවාරෙති | පරිවාරිය; -රෙත්වා | පරිවුත; පරිවාරිත. |
| පරිවිසති | පරිවිසිත්වා | —— |
| ~~පරිහායති~~ | ~~පරිහායිත්වා~~ | ~~පරිහීන.~~ |
| පලායති | පලායිත්වා | පලාත; පලායිත. |
| පවත්තති | පවත්තිය; පවත්තිත්වා | පවත්ත. |
| පවත්තෙති | පවත්තෙත්වා | පවත්තිත. |
| පවාහෙති | පවාහිය; පවාහෙත්වා | පවාහිත. |
| පවිසති | පිවිසිය; පවිසිත්වා | පවිට්ඨ. |
| පසහති | පසය්හ; පසහිත්වා | පසහිත. |
| පසාදෙති | පසාදිය; පසාදෙත්වා | පසාදිත. |
| පසාරෙති | පසාරෙත්වා; පසාරිය | පසාරිත. |
| පසීදති | පසීදිය; පසීදිත්වා | පසන්න. |

| වර්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීත කිතකපදං. |
|---|---|---|
| පස්සති | පස්සිය; පස්සිත්වා | දිට්ඨ. |
| පහරති | පහරිය; -රිත්වා | පහට. |
| පහිණාති | පහිණිය; පහිණිත්වා | පහිත. |
| පාතුභවති | පාතුභූත්වා; – භවිත්වා; පාතුභවිය | පාතුභූත. |
| පාවෙති | පාවිය; පාවෙත්වා | පාවිත. |
| පාපුණාති | පාපුණිත්වා; පත්වා | පත්ත |
| පාපෙති | පාපෙත්වා; පාපිය | පාපිත. |
| පාරුපති | පාරුපිය; – පිත්වා | පාරුත. |
| පාලෙති | පාලෙත්වා | පාලිත |
| පිදහති | පිදහිය; පිදහිත්වා | පිහිත. |
| පිලන්ධති | පිලන්ධිය; – න්ධිත්වා | පිලන්ධිත. |
| පිවති | පිවිත්වා | පීත. |
| පීළෙති | පීළිය; පීළෙත්වා | පීළිත. |
| පුච්ඡති | පුච්ඡිය; පුච්ඡිත්වා | පුට්ඨ; පුච්ඡිත. |
| පූජෙති | පූජිය; පූජෙත්වා | පූජිත |
| පූරති | පූරිත්වා | පුණ්ණ |
| පූරෙති | පූරිය; පූරෙත්වා | පූරිත. |
| පෙසෙති | පෙසිය; පෙසෙත්වා | පෙසිත. |
| පොසෙති | පොසිය; පොසෙත්වා | පොසිත; පුට්ඨ. |
| පලවති | පලවිත්වා | පලවිත. |
| ඵලති | ඵලිත්වා | ඵලිත. |
| ඵුසති | ඵුසිය; ඵුසිත්වා | ඵුට්ඨ; ඵුසිත. |
| බන්ධති | බන්ධිය; බන්ධිත්වා | බද්ධ; බන්ධිත. |
| බුජ්ඣති | බුජ්ඣිය; බුජ්ඣිත්වා | බුද්ධ. |
| බොධෙති | බොධෙත්වා | බොධිත. |
| බ්‍රෑති | බ්‍රෑවිත්වා | —— |
| භඤ්ජති | භඤ්ජිය; භඤ්ජිත්වා | භට්ඨ; භග්ග, භඤ්ජිත |
| භණති | භණිත්වා; භණිය | භණිත. |
| භවති | භවිත්වා; | භූත. |
| භාජෙති | භාජිය; භාජෙත්වා | භාජිත |
| භායති | භායිත්වා | භීත |
| භාසති | භාසිත්වා; භාසිය | භාසිත. |
| භිජ්ජති | භිජ්ජිය; භිජ්ජිත්වා | භින්න. |
| භින්දති | භින්දිය; භින්දිත්වා | භින්න. |
| භුඤ්ජති | භුඤ්ජිය; – ජිත්වා | භුත්ත |
| භූසෙති | භූසෙත්වා; භූසිය | භූසිත |

| වත්තමාන-ක්‍රියා. | පුබ්බක්‍රියා. | අතීත කිතකපද. |
|---|---|---|
| භොජෙති | භොජිය; භොජෙත්වා | භොජිත. |
| මද්දති | මද්දිය; මද්දිත්වා | මද්දිත. |
| මණ්ඩෙති | මණ්ඩිය: මණ්ඩෙත්වා | මණ්ඩිත. |
| මන්තෙති | මන්තිය; මන්තෙත්වා | මන්තිත. |
| මරති | මරිය; මරිත්වා | මත |
| මාපෙති | මාපිය; මාපෙත්වා | මාපිත. |
| මාරෙති | මාරිය; මාරෙත්වා | මාරිත. |
| මිණාති | මිණිත්වා | මිත; මිණිත. |
| මුච්චති | මුච්චිය; මුච්චිත්වා | මුච්චිත. |
| මුඤ්චති | මුඤ්චිය; මුඤ්චිත්වා | මුත්ත. |
| මුද්දඛෙකති | මුද්දඛෙකත්වා | මුද්දඛිත. |
| මුද්දාපෙති | මුද්දාපෙත්වා; මුද්දාපිය | මුද්දාපිත. |
| මොචෙති | මොචිය; මොචෙත්වා | මොචිත. |
| යාචති | යාචිය; යාචිත්වා | යාචිත. |
| යුජ්ඣති | යුජ්ඣිත්වා; යුජ්ඣිය | යුජ්ඣිත. |
| යුඤ්ජති | යුඤ්ජිය; යුඤ්ජිත්වා | යුත්ත. |
| යොජෙති | යොජිය; යොජෙත්වා | යොජිත. |
| රක්ඛති | රක්ඛිය; රක්ඛිත්වා | රක්ඛිත. |
| රචති | රචිය; රචිත්වා | රුත; රචිත |
| රුජති | රුජිත්වා | —— |
| රුහති | රුහිත්වා; රුහිය | රුළ්හ. |
| රොදති | රොදිය; රොදිත්වා | රුණ්ණ; රොදිත. |
| රොධෙති | රොධෙත්වා; රොධිය | රොධිත. |
| රොපෙති | රොපිය; රොපෙත්වා | රොපිත. |
| රොසෙති | රොසෙත්වා | රොසිත. |
| ලභති | ලභිය; ලභිත්වා; ලද්ධා; ලද්ධාන. | ලද්ධ. |
| ලිඛති | ලිඛිය; ලිඛිත්වා | ලිඛිත. |
| ලුණාති | ලුණිත්වා | ලූන. |
| වඩ්ඪති | වඩ්ඪිය; වඩ්ඪිත්වා | වඩ්ඪිත. |
| වදති | වදිත්වා; වත්වා | වුත්ත. |
| වන්දති | වන්දිය; වන්දිත්වා | වන්දිත |
| වපති | වපිත්වා; වත්වා | වුත්ත; වපිත. |
| වමති | වමිත්වා; වමිය | වමිත. |
| වසති | වසිත්වා; වසිය | වුත්ථ; වුසිත. |
| වස්සති | වස්සිත්වා; වස්සිය | වුට්ඨ; වට්ඨ. |
| වහති | වහිත්වා; වහිය | වූළ්හ; වහිත. |

| වර්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීත කෘදන්තපද. |
|---|---|---|
| වාදෙති | වාදෙත්වා | වාදිත. |
| වායති | වායිත්වා | වායිත. |
| වාරෙති | වාරිය; වාරෙත්වා | වාරිත. |
| විකිරති | විකිරිය; විකිරිත්වා | විකිණ්ණ. |
| විකූජති | විකූජිය;-ජිත්වා | විකූජිත. |
| වික්කිණාති | වික්කිණිය;-ණිත්වා | වික්කීත, වික්කිණිත. |
| විගච්ඡති | විගච්ඡිය;-ඡිත්වා | විගත. |
| විගාහති | විගාහිත්වා; විගාහිය | විගාළ්හ; විගාහිත. |
| විවරති | විවරිය; විවරිත්වා | විවට. |
| විජ්ඣති | විජ්ඣිය; විජ්ඣිත්වා | විද්ධ. |
| විතස්සති | විතස්සිය;-සිත්වා | විතට්ඨ |
| විනාති | විනිත්වා | වීත. |
| විනාසෙති | විනාසිය; විනාසෙත්වා | විනාසිත. |
| විනිවෙඡති | විනිවඡිය; විනිවෙඡත්වා | විනිවඡිත. |
| වින්දති | වින්දිය; වින්දිත්වා | වින්දිත. |
| විරෙචෙති | විරෙචෙත්වා; විරෙචිය | විරෙචිත;විරිත්ත. |
| විරොචති | විරොචිය; විරොචිත්වා | විරොචිත. |
| විවදති | විවදිත්වා; විවදිය | විවදිත. |
| විස්සජ්ජෙති | විස්සජ්ජිය;- ජෙත්වා | විස්සට්ඨ; විස්සජ්ජිත. |
| විස්සසති | විස්සසිත්වා | විස්සත්ථ. |
| විහරති | විහරිත්වා | වුත්ථ |
| විහෙසෙති | විහෙසිය; විහෙසිත්වා | විහෙසිත. |
| වීජෙති | වීජිය; වීජෙත්වා | වීජිත. |
| වීතිනාමෙති | වීතිනාමෙත්වා | වීතිනාමිත. |
| වෙඨෙති | වෙඨිය; වෙඨෙත්වා | වෙඨිත. |
| වෙදෙති | වෙදිය; වෙදෙත්වා | වෙදිත |
| වූහති | වූහිත්වා | වූළ්හ. |
| වොරොපෙති | වොරොපිය; -පෙත්වා | වොරොපිත. |
| ව්‍යන්තීකරොති | ව්‍යන්තීකත්වා | ව්‍යන්තීකත. |
| සක්කරොති | සක්කරිය; සක්කරිත්වා | සක්කත. |
| සක්කුණාති | සක්කුණිත්වා | —— |
| සඤ්ජායති | සඤ්ජායිත්වා | සංජාත. |
| සඤ්ඤාපෙති | සඤ්ඤාපිය; -පෙත්වා | සඤ්ඤාපිත. |
| සණ්ඨපෙති | සණ්ඨපෙත්වා | සණ්ඨපිත |
| සද්දහති | සද්දහිත්වා | සද්දහිත |

| වර්තමාන-ක්‍රියා. | පූර්වක්‍රියා. | අතීත කිතකපද. |
|---|---|---|
| සන්තපේජති | සන්තප්ජිය; -පේත්වා | සන්තප්ජිත. |
| සන්නිපතති | සන්නිපතිය; -පතිත්වා | සන්නිපතිත. |
| සමාගච්ඡති | සමාගම්ම; සමාගන්ත්වා | සමාගත. |
| සමාදපෙති | සමාදපෙත්වා; -දපිය | සමාදපිත. |
| සම්මිඤ්ජති | සම්මිඤ්ජිය; -ජිත්වා | සම්මිඤ්ජිත. |
| සමෙති | සමෙත්වා; සමිය | සමිත. |
| සම්මජ්ජති | සම්මජ්ජිත්වා; -ජිය | සම්මට්ඨ. |
| සම්මසති | සම්මසිය; -සිත්වා | සම්මසිත. |
| සම්මූහති | සම්මූය්හිත්වා | සම්මූළ්හ |
| සයති | සයිත්වා | සුත්ත; සයිත. |
| සල්ලක්ඛෙති | සල්ලක්ඛෙත්වා; -ඛිය. | සල්ලක්ඛිත. |
| සංබ්‍රූහති | සංබ්‍රූහිය; -හිත්වා | සංබ්‍රූහිත. |
| සංගණ්හාති | සංගය්හ; සංගණ්හිය; සංගණ්හිත්වා | සංගහිත. |
| සංසරති | සංසරිත්වා; -රිය | සංසරිත. |
| සංසීදති | සංසීදිය; -දිත්වා | සංසීන. |
| සංහරති | සංහරිය; -රිත්වා | සංහට |
| සායති | සායිත්වා | සායිත |
| සික්ඛති | සික්ඛිය; සික්ඛිත්වා | සික්ඛිත |
| සික්ඛාපෙති | සික්ඛාපිය;-පෙත්වා | සික්ඛාපිත. |
| සිඞ්ඝති | සිඞ්ඝිය; සිඞ්ඝිත්වා | සිඞ්ඝිත. |
| සිජ්ඣති | සිජ්ඣිත්වා | සිද්ධ. |
| සිබ්බති | සිබ්බෙත්වා, සිබ්බිය | සිබ්බිත. |
| සුක්ඛාපෙති | සුක්ඛාපෙත්වා;-පිය | සුක්ඛාපිත. |
| සුජ්ඣති | සුජ්ඣිය, සුජ්ඣිත්වා | සුද්ධ. |
| සුණාති | සුණිය, සුත්වා, සුණිත්වා | සුත. |
| සූයති | සූයිත්වා | සූයිත. |
| සෙවති | සෙවිය; සෙවිත්වා | සෙවිත. |
| සොචති | සොචිය; සොචිත්වා | සොචිත. |
| සොධෙති | සොධිය; සොධෙත්වා | සොධිත. |
| හඤ්ඤති | හඤ්ඤිත්වා | හත. |
| හනති | හනිය; හනිත්වා; හන්ත්වා | හත. |
| හරති | හරිය; හරිත්වා | හට. |
| හසති | හසිත්වා | හසිත |
| හායති | හායිත්වා | හීන. |
| හොති | හුත්වා | ——— |

# නිපාතමාලාව

අචිරං = වැඩිකලක් ගතවෙන්ට පෙර.
අචිරෙන = නොබෝ කලකින්.
අජ්ජ = අද.
අජ්ජුණ්හො = අද දවස.
අඤ්ඤත්‍ර = අන්තැනක.
අඤ්ඤථා = අන් ආකාරයකින්.
අඤ්ඤදා = අන්දිනක.
අඤ්ඤදත්ථු = එකාන්තයෙන්.
අතිප්පගෙව = ඉතා උදෑසනම.
අතිප්පගො = අති උදෑසන.
අතිවිය, අතීව = බොහෝසේ, ඉතාම.
අත්ථ, අත්‍ර = මෙහි
අථ = ඉක්බිති.
අථ ච = තවද
අථ වා = නොහොත්
අථො = ඉක්බිති.
අද්ධා = එකාන්තයෙන්.
අධුනා = දැන්.
අධො = යට.
අනෙකක්ඛත්තුං = නොයෙක්වර.
අනෙකධා = නොයෙක් ආකාරයෙන්.
අන්තරා = අතරෙහි.
අන්තරෙන = අතරෙහි.
අන්තො = ඇතුළෙහි.
අපි = ද; ත් (සමුච්චයෙහි.)
අපි ච = තවද; එසේ වුවත්.
අපිස්සු = තවද.
අප්පෙව = යෙහෙකි.
අබ්භුමෙම = අපොයි අම්මේ.
අභික්ඛණං = නිතර.
අම්භො = එම්බා.

අරෙ = බොල
අලං = පමණි, ඔතැතැත; සමර්ථයි.
අවස්සං = එකාන්තයෙන්.
අස්සු = පද පූර්ණයෙහි.
අහො = (ඛෙදයෙහි හා විස්මයෙහි.) අනේ.
අහො වත = (වන්නේ නම්) යෙහෙකි.
ආදු = නොහොත්.
ආම = එසේය; ඔව්.
ආයතිං = අනාගතයෙහි.
ආරකා = දුරින්.
ආරා = දුර; දුරින්.
ආවි = ප්‍රකටලෙස.
ආවුසො = ඇවැත්නි; මිත්‍රය.
ඉඞ්ඝ = මෙන්න.
ඉතරථා = අන් ආකාරයෙන්.
ඉති = මෙසේ.
ඉතො = මෙතැනින්.
ඉත්ථං = මෙසේ.
ඉධ = මෙහි.
ඉව = මෙන්.
උද උදාහු, = නොහොත්.
උද්ධං = උඩ.
උපරි = මත්තෙහි.
උභයථා = දෙයාකාරයෙන්.
එකජ්ඣං = එක්තැනක.
එකක්ඛත්තුං = එක්වරක්.
එකත්‍ර, එකත්ථ = එක්තැනක.
එකදා = එක්කලක.
එකධා = එක් ආකාරයකින්.
එකමන්තං = එක්පසෙක.
එතරහි = දැන්.
එත්තාවතා = මෙපමණකින්.

එතෙතා = මෙහෙන්.
එව = ම. (නියම කිරීමෙහි )
එවං = මෙසේ.
ඔරං = මේහා
කච්චි = කිමෙක්ද?
කතිධා = කීඅංකාරයකින්.
කතික්ඛත්තුං = කීවරක්
කත්ථ = කොහේ; කොතැන.
කදා = කවරකලක
කස්මා = කවරහෙයකින්.
කහං = කොහි.
කිඤ්ච = තවද; හුදෙක්.
කිඤ්චාපි = එසේ වුවත්; හුදෙක්;
කිත්තාවතා = කොපමණකින්.
කිමඞ්ග = කියනුම කිම?
කිර = ලු; වතාංහි. (අවිනිශ්චිතාර්ථ යෙහියි )
කිං, කිංසු = කිමෙක්ද?
කීව = කොපමණ?
කීවචිරං = කොපමණකල්
කුත්ථ, කුත්‍ර = කොහි; කොහේ.
කුහං, කුහිං=කොහේ; කොතැන
ක්ව = කොහි?
ඛලු = එකාන්තයෙන්.
ඛිප්පං = වහා
ඛො = වතාංහි
ච = ද (එක්කිරීමෙහි.)
චරහි = දැන්; එසේනම්
චිරපටිකා = බොහෝ කලක සිට.

---

චිරරත්තං = බොහෝ කලක්.
චිරස්සං = බොහෝ කලකින්
චිරං = බොහෝ කලක්
චිරෙන = බොහෝ කලකින්.
චෙ = ඉදින්.
ජාතු = එකාන්තයෙන.
ජෙ = එම්බා. (දාසියන්ට ආමන්ත්‍රණයෙහි )

තග්ඝ = හොඳ; එසේනම්.
තතො = එයින්; එහෙයින්.
තත්ථ, තත්‍ර = එහි.
තස්මා = එහෙයින්.
තහිං, තහං = එහි.
තාව, තාවතා = ඒතාක්; එපමණ.
තාවදෙ = එකෙණෙහි.
තික්ඛත්තුං = තුන්වරක්.
තිධා = තුන් ආකාරයකින්.
තිරියං, තිරො = සරස; හරස්ව.
තු = වතාංහි.
තුණ්හී = නිශ්ශබ්දව.
තුවටං = වහා.
දිවා = දවල්හි.
දුට්ඨු = නොමනාසේ.
ද්විධා = දෙයාකාරයෙන්.
ද්වික්ඛත්තුං = දෙවරක්.
ධි = නින්දාවකි.
(ධි + අත්ථු) ධිරත්ථු = නින්දාවේවා.
ධුවං = එකාන්තයෙන්.
න, නො = නැහැ; නොවේ.
නනු = නොවේද?
නහ = නොවේ.
නමො = නමස්කාරය.
නාම = නම්.
නිබද්ධං = නිතර.
නූන = එකාන්තයෙන්.
පගෙව = කල්ඇතිවම.

පගෙවතරං = වඩාකල් ඇතිව.
පච්ඡතො = පස්සෙන්.
පච්ඡා = පසුව.
පටිගච්ච = කල්ඇතිව.
පටිච්ච = නිසා.
පන = වතාංහි.
පභුති = පටන්.
පරම්මුඛා = ඉදිරියෙහි නැති විට.

පාතො = උදෑසන.
පුන = නැවැත.
පුනප්පුනං = නැවත නැවත.
පුරතො = ඉදිරියෙන්.
පුරා = පෙර.
පුරෙ = පූර්වයේදී.
බහි, බහිද්ධා = පිටත, පිටත්හි.
බහුක්ඛත්තුං = බොහෝවාරයක්
බහුධා, බහුසො = බොහෝසේ; බොහෝ ආකාරවලින්.
භණෙ = එම්බා.
භන්තෙ = ස්වාමීනි.
භීයො, භිය්‍යො = බොහෝසේ; වැඩියෙන්.
භීයොසොමත්තාය = බොහෝ සෙයින්.
භො = පින්වත්නි
මා = වැළැක්වීමෙහි.
(මා කරොහි = නොකරව.)
මිච්ඡා = අසත්‍යවූ; අසත්‍යය
මිථු = අන්‍යොන්‍යවශයෙන්.
මුධා = නිකමට; නොමිලයේ.
මුසා = බොරුව.
මුහුං = වහා
යග්ඝෙ = පදපූරණයෙහි
යතො = යම්හෙයකින්.
යත්‍ර; යත්ථ = යම්තැනක.
යදා = යම්කලක
යදි = ඉදින්.
යන්නූන = වුවොත්යෙහෙකි
යස්මා = යම්හෙයකින්.
යහිං, යහං = යම්තැනක
යාව, යාවතා = යම්පමණ, යම්තාක්.
යෙභුය්‍යෙන = බොහෝසේ.
රෙ = බොල

ලබ්භා = ලැබේ; ලැබියහැක.
වත = ඒකාන්තයෙන්.
වා = හෝ නොහොත්.
වාහසා = බලයෙන්.
විනා = නැතිව; වෙන්ව.
විය = මෙන්.
වෙ = ඒකාන්තයෙන්.
සකිං = වරක්.
සක්කා = හැකිය.
සක්ඛි = ප්‍රත්‍යක්ෂයෙන්.
සචෙ = ඉදින්.
සජ්ජු = එකෙණෙහි
සද්ධිං = සමග.
සනිකං = හෙමින්.
සපදි = එකෙණෙහි.
සබ්බත්ථ, සබ්බත්‍ර, සබ්බධි = සැමතැන.
සබ්බදා = හැමකල්හි.
සබ්බථා = සියලුආකාරයෙන්.
සම්පති = දැන්.
සමම = මිත්‍රය.
සම්මා = මනාසේ; සත්‍යවූ.
සම්මුඛා = ඉදිරියෙහි.
සමන්තා = හාත්පසින්.
සමං = සමග.
සයං = තෙමේ, තමාවිසින්.
සසක්කං = ඒකාන්තයෙන්.
සහ = සමග.
සහසා = වහා; හදිස්සියෙන්.
සාමං = තමාම, තමා විසින්ම.
සාධු = යෙහෙකි.
සායං = සවස්හි.
සීඝං = වහා. සීඝසීඝං = වහවහා.
සුට්ඨු = මනාසේ.
සුදං = පදපූරණයෙහි.
සුවෙ = හෙට

සෙය්‍යථාපි = යම්සේ.
සෙය්‍යථීදං = කෙසේදයත්.
හන්ද = හොඳ; එසේනම්.
හම්භො = එම්බා.
හලං = පමණයි; ඕනෑනෑත.
හවෙ = එකාන්තයෙන්.
හා = අහෝ; බෙදයකි.
හි = වනාහි.
හිය්‍යො, හීයො = ඊයේ.
හුරං = පරලොව; අන්තැනක.
හෙ = එම්බා.
හෙට්ඨා = යට.

---

## 30. නිතර එක්ව (යුගලවශයෙන්) යෙදෙන ශබ්ද.

අන්න-පාන = ආහාර පාන
අසිත-පීත = කෑම පීම.
අන්ධ-බධිර = අඳ බිහිරි.
අසි-චම්ම = කඩුව හා පලිහ.
අජෙළක = එළු තිරෙළු.
අභික්කම-පටික්කම = ඉදිරියට යාම හා පස්සට යාම හෝ ඉවත්වයාම.
ආරාමුය්‍යාන = වතු උයන්.
අපුබ්බං අචරිමං = ඉදිරි පසු නොවී.
අසිත ව්‍යාභඞ්ගි = දෑකැත්ත හා කද.
උච්ච-අවච = උස් මිටි
උච්චාර-පස්සාව = මලමූත්‍ර.
උච්චාසයන-මහාසයන = උසසුන් මහසුන්.
උල්ලිත්තාවලිත්ත = ඇතුළත පිටත ආලේප කළ (ගේ.)
ඔක්කස්ස පසය්හ = ඇද මැඩපවත්වා; බලාත්කාරකම්කොට
කණ්හ-සුක්ක = කළු සුදු; යහපත් අයහපත්.
කය-වික්කය = මිලදී ගැන්ම හා විකිණීම.
කථා-සල්ලාප = සාමාන්‍ය කථාව හා මිත්‍රලීලාවෙන් කථාව.
කාකොළූක = කපුටු බකමූහුණු.
කුක්කුට-සූකර = කුකුල් ඌරු.
කුද්දාල-පිටක = උදැල්ල හා කූඩය.
ඛජ්ජ-භොජ්ජ = (කඩා) කෑ යුතු (නොකඩා) අනුභව කළයුතු දේ.
ඛණ්ඩිච්ච-පාලිච්ච = දත් වැටීම හා හිසකෙස් පැසීම.
ඛත-උපහත = කණිනලද නසනලද.
ඛය-වය = විනාශය හා ගෙවීයාම.
ඛෙත්ත-වත්ථු = කුඹුරු හා වතු.
ඛඤ්ජ-කුණි = පාකොරා හා අත්කොරා.
කෙස-මස්සු = හිසකෙස් හා රැවුල.

**ගො-මහිස** = එළුහරක් මීහරක්.

**ගාම-නිගම** = ගම් නියම්ගම්.

**ජානං පස්සං** = දන්නේ දක්නේ.

**ජරා-මරණ** = දිරීම හා විනාශය.

**ඩංස-මකස** = මැසි මදුරු.

**තිබ්බ-කටුක** = තීව්‍රවූ කටුකවූ.

**දාසිදාස** = දැසි දස්.

**දෙව-මනුස්ස** = දෙවි මිනිස්.

**දම-සංයම** = දමනය හා හික්මීම.

**ධනු-කලාප** = දුන්න හා හීමිටිය.

**ථෙතො පච්චයිකො** = ස්ථිර වචන ඇත්තේ ද විශ්වාස කටයුතු වචන ඇත්තේ ද.

**නච්ච-ගීත** = නැටීම හා ගීකීම.

**පත්ත-චීවර** = පාත්‍ර සිවුරු.

**පුත්තදාර** = අඹු දරු

**පීති-සොමනස්ස** = ප්‍රීතිය හා සොම්නස.

**පසාද-සංවෙග** = සතුට හා සංවේගය.

**ඵලාඵල** = මහත් ගෙඩි හා කුඩා ගෙඩි. (තොණතොත් ගෙඩි හා කොළමුල් ආදිය.)

**බක-බලාක** = කොකා හා කණකොකී.

**භිස-මුලාල** = නෙළුම් ආදියේ අල හා (කෑමට ගත හැකි) මුල්.

**මණ්ඩන-විභූසන** = සාමාන්‍ය සැරසීම හා විශේෂ සැරසීම.

**මධු-ඵාණිත** = මීපැණි හා උක්පැණි ආදිය

**මක්ඛී පලාසී** = ගුණමකුවූයේ ද ගුණය වසන්නේ ද

**මාතාපෙත්තික** = මවුපියන් සතු.

**මාලා-ගන්ධ** = මල් හා සුවඳ.

**මඤ්ච**-පීඨ = ඇඳ පුටු.

**යුග-නඞ්ගල** = නගුල හා වියගස.

**රත්තිංදිවා** = රෑ දවල්.

**රක්ඛාවරණගුත්ති** = රැකවල, ආවරණය හා ගෝපනය.

**ලෙය්‍ය-පෙය්‍ය** = ලෙව කෑයුතුදේ හා පියයුතුදේ.

**වධ-බන්ධන** = හිංසාකිරීම හා සිරකිරීම (මරණයටද ඇතැම්විට වධයයි කියත්.)

**වත්ථාභරණ** = ඇඳුම් පැළඳුම්.

**වමන-විරෙචන** = වමනය හා විරේචනකිරීම.

**වාතාතප** = වාතය හා අව්ව.

**සමණ-බ්‍රාහ්මණ** = මහණ බමුණෝ
**සුරාමෙරය** = පෙරූ මත්පැන් හා පැසවූ මත්පැන්.
**දෙවාසුර** = දෙවියන් හා අසුරයෝ
**සතො සම්පජානො** = සිහිඇත්තේ නුවණඇත්තේ.
**සුසු කාළකෙසො** = තරුණවූයේ කළුහිසකෙස් ඇත්තේ.
**සමථ-විපස්සනා** = සිතඑකඟකිරීමේ පිළිවෙළ හා ධර්මයන්ගේ යථාතත්වය දැකීම
**සච්චවාදී සච්චසන්ධො** = ඇත්තකියන්නේ සත්‍යයෙන් සත්‍යය ගළපන්නේ
**භිසි-බිම්බොහන** = කොට්ට මෙට්ට.
**විජ්ජා-විමුත්ති** = ඥානය හා (කෙලෙසුන්ගෙන්) මිදීම
**හායන-වඩ්ඪන** = පිරිහීම හා වැඩීම.
**හිරි-ඔත්තප්ප** = පාපයට ලජ්ජාව හා ඊට භය.
**හත්ථ-පාද** = අත් පා
**හිරඤ්ඤ-සුවණ්ණ** = අමු රන් හා රන්. (කාසි වශයෙන් මුද්‍රණය කරන ලද්දේත් ආභරණ පිණිස යොදන ලද්දේත් සුවණ්ණ නම් එසේ නොකරන ලද්දේ හිරඤ්ඤ නමි.
**හත-පහත** = පහරදීම හා නැවත පහරදීම
**හඨ-පහඨ** = සතුටුවූ, විශෙෂයෙන් ප්‍රීතිමත්වූ.

## 31. අන්‍යොන්‍ය විරුද්ධාර්ථ ඇති විශෙෂණපද.

| | |
|---|---|
| අජ්ඣත්ත = තමාඅයත්, තම සිරුර හා සම්බන්ධවූ | බාහිර = පිටත්; බාහ්‍ය වූ. |
| අඤ්ඤාත = දැනගත් | අනඤ්ඤාත = නොදත් |
| අණු = කුඩාවූ; අල්පවූ | ථූල = මහත්වූ; දැඩිවූ. |
| අනුලොමික = විරුද්ධනොවූ | පටිලොමික=විරුද්ධපිළිවෙළ ඇති. |
| අප්ප, අප්පක =අල්පවූ | අනප්පක, බහුක = බොහෝවූ. |
| අප්පස්සුත = නූගත්; අඩුදැනුම ඇති | බහුස්සුත=උගත්;බොහෝදේ දත් |
| අප්පාබාධ = අල්පරෝග ඇති | බව්හාබාධ = රෝග බහුල වූ. |
| අප්පිච්ඡ = මද ආශා ඇති | මහිච්ඡ = මහත් ආශා ඇති. |
| ආමක = අමු; නොපැසුණු | පක්ක = පැසුණු; ඉදුණු; මේරූ. |
| ආවිල = කැලඹුණු | අනාවිල = නොකැලඹුණු. |
| ඉට්ඨ = ප්‍රියවූ; රුචිවූ. | අනිට්ඨ = අප්‍රියවූ |
| උක්කුජ්ජ = උඩුකුරුවූ | අවකුජ්ජ = යටිකුරු වූ. |

| | |
|---|---|
| උච්ච = උස්වූ; උසස්වූ. | නීච = මිටිවූ; පහත්වූ. |
| උජු = සෘජුවූ; ඇදනැති. | වඞ්ක = වක්වූ; ඇදවූ. |
| උත්තම = උතුම් | අධම = පහත්; නීච. |
| උත්තාන = නොගැඹුරු | ගම්භීර = ගැඹුරු. |
| උද්ධම්භාගිය=උඩකොටසට අයත්. | ඕරම්භාගිය = පහත කොටසට අයත්. |
| උන්නත = උස්; උසස්; උඩඟු. | ඕනත පහත්; නැමුණු, |
| ඌන = අඩු. | අධික = වැඩි |
| එකංසික=එකාන්තයෙන් සිදුවන | අනෙකංසික = අස්ථිර. |
| ඕරිම = මෙතෙරට අයත්. | පාරිම = පරතෙරට අයත්. |
| ඕලාරික = දළ; ලාමක; මහත්. | සුඛුම = සියුම් |
| කණ්හ = කළු. | සුක්ක = සුදු. |
| කරණීය = කටයුතු | අකරණීය = නොකටයුතු. |
| කාලික = තාවකාලිකවූ. | සදාතන = සදාකාලිකවූ. |
| කිස = කෙට්ටු. | ථූල = තරවූ. |
| කුසල = දක්ෂවූ. | අකුසල = අදක්ෂවූ. |
| ඛුද්දක = කුඩා. | මහන්ත = මහත්; විශාල. |
| ගත = ගිය. | ආගත = පැමිණි; ආවාවූ. |
| ගරුක = බරවූ. | ලහුක = සැහැල්ලුවූ. |
| ඝන = ඝනවූ. | තනු = තුනීවූ. |
| චල = සෙල්වෙන. | අචල = නොසෙල්වෙන. |
| ජීවන්ත = ජීවත්වෙන. | මත = මළ. |
| ඡේක = දක්ෂවූ. | ජළ = ජඩවූ; අදක්ෂවූ. |
| තිණ්හ = තියුණු; මුවහත්ඇති. | කුණ්ඨ = මොට්ටවූ |
| තුච්ඡ = හිස්වූ. | පුණ්ණ = පිරුණු. |
| ථද්ධ = තදවූ; දැඩි. | මුදු = මෘදුවූ; මොළොක්. |

---

| | |
|---|---|
| ථාවර = නොසෙල්ලී පවත්නා. | ජඞ්ගම = චඤ්චලවූ; එහාමෙහා යන්නාවූ හෝ ගෙනයාහැකි. |
| ථොක = අල්පවූ. | බහුක = බොහෝවූ. |
| දක්ඛිණ = දකුණට අයත්. | උත්තර = උතුරට අයත්. |
| දහර = බාලවූ. | මහල්ලක = වැඩි සිටි; මහලු |
| දළ්හ = දැඩි. | සිථිල = බුරුල්වූ. |
| දීඝ = දික්වූ. | රස්ස = කොටවූ. |
| දූර = දුරවූ. | සන්තික = ළංවූ; සමීපවූ. |
| ධම්මික = ධාර්මිකවූ. | අධම්මික = ධාර්මිකනොවූ. |
| නව = අලුත්. | පුරාණ = පරණවූ. |

| | |
|---|---|
| නිච්ච=නිත්‍යවූ; වෙනස් නොවන | අනිච්ච = වෙනස්වන. |
| පතිරූප = යෝග්‍යවූ. | අප්පතිරූප = අයෝග්‍යවූ. |
| පරාධීන = අනුන් අයත්. | අත්තාධීන = තමා අයත්. |
| පසත්ථ = පසස්නාලද. | නින්දිත = නින්දලැබූ. |
| ප්‍රිය = ප්‍රියවූ | අප්පිය, දෙස්ස = අප්‍රියවූ. |
| පුබ්බ = පූර්වයෙහිවූ; පෙරටුවෙහිවූ | අපර =පසුවූ. |
| පුරත්ථිම = නැගෙනහිරට අයත් | පච්ඡිම = බටහිරට අයත්. |
| පුරිම = පූර්වවූ. | චරිම = පසුවූ. |
| බාල = අඥානවූ. | පණ්ඩිත = නුවණැති. |
| භබ්බ = සමර්ථවූ. | අභබ්බ = අසමර්ථවූ. |
| මානිත = පුදනුලැබූ | අවමානිත = අවමන්ලැබූ. |
| ලොකිය = ලෝකයට අයත්. | ලොකුත්තර = ලෝකයෙන් පිටත් |
| වදඤ්ඤූ = ත්‍යාගශීලීවූ. | මච්ඡරී = මසුරුවූ. |
| වාම = වමට අයත්. | දක්ඛිණ = දකුණට අයත්. |
| විරුද්ධ=විරුද්ධවූ; නොගැළපෙන | අවිරුද්ධ = ගැළපෙන. |
| විවට = විවෘතවූ. | පටිච්ඡන්න = වැසූ; වැසුණු. |
| සක = ස්වකීයවූ; තමා අයත්. | පර = අන්‍යවූ; අනුන් අයත්. |
| සණ්හ = මෘදුවූ. | ඵරුස = කර්කශවූ. |
| සදිස = සමානවූ. | විසදිස = අසමානවූ. |
| සද්ධ = ශ්‍රද්ධාඇති. | අස්සද්ධ = ශ්‍රද්ධානැති. |
| සධන = ධනය ඇති. | නිද්ධන = ධනය නැති. |
| සන්ත = සත්පුරුෂවූ; සත්හුන්. | අසන්ත = නොසත්හුන්; අසත් පුරුෂ. |
| සන්තුට්ඨ = සතුටුවූ | අසන්තුට්ඨ = නොසතුටුවූ. |
| සන්දිට්ඨික = මෙලොවට අයත්. | සම්පරායික = පරලොවට අයත්. |
| සම = සම වූ. | විසම = සමනොවූ. |
| සමල = මලසහිතවූ. | නිම්මල = මලරහිතවූ. |
| සම්බාධ = අවකාශමදවූ. | උරුන්ද = බොහෝ අවකාශ ඇති. |

---

| | |
|---|---|
| සම්මා = මනාසේ; සත්‍යවූ. | මිච්ඡා = වැරදිසේ; අසත්‍යවූ. |
| සරාග = රාගසහිතවූ. | වීතරාග, විරාග=දුරුකළ රාගඇති |
| සවිඤ්ඤාණක = විඥාන සහිතවූ. | අවිඤ්ඤාණක = විඥානය නැති. |
| සංඛිත්ත = සංක්ෂේපකළ. | විත්ථාරිත = විස්තරකළ. |
| සාධු = යහපත්වූ. | අසාධු = අයහපත්වූ. |
| සාවජ්ජ = සදොස්වූ | නිරවජ්ජ; අනවජ්ජ = නිදොස්වූ. |
| සික්ඛිත = හික්මුණු. | අසික්ඛිත = නොහික්මුණු. |
| සීතල = සිහිල්වූ. | උණ්හ = උණුසුම්වූ. |

| | |
|---|---|
| සුකත = මනාසේ කළ. | දුක්කත = නොමනාසේ කළ. |
| සුකර = කිරීමට පහසුවූ | දුක්කර = කිරීමට අපහසුවූ. |
| සුඛිත = සුවපත්වූ | දුක්ඛිත = දුකට පත්වූ. |
| සුගන්ධ = සුවඳැති. | දුග්ගන්ධ = දුගඳැති. |
| සුගම = පහසුවෙන අවබෝධ කළ හැකි හෝ යාහැකි. | දුග්ගම = අපහසුවෙන් යායුතුවූ හෝ තේරුම්ගතයුතුවූ |
| සුචි = පිරිසිදුවූ | අසුචි = අපිරිසිදුවූ. |
| සුජාන = පහසුවෙන් දතහැකි. | දුජ්ජාන = පහසුවෙන් දත නොහැකි |
| සුද්ධ = පිරිසිදුවූ | අසුද්ධ = පිරිසිදුනොවූ. |
| සුබ්බච = කීකරු | දුබ්බච = නොකීකරු. |
| සුභ = යහපත්; මඞ්ගලවූ | අසුභ = අයහපත්, අවමඞ්ගලවූ. |
| සුභර = පහසුවෙන් පෝෂණය කළහැකි | දුබ්භර = අපහසුවෙන් පෝෂණය කළයුතු. |
| සුමන = සතුටු සිතැති | දුම්මන = නොසතුටු සිතැති |
| සුමෙධ = යහපත් නුවණැති. | දුම්මෙධ = කපටි නුවණැති. |
| සුලභ = පහසුවෙන් ලැබියහැකි. | දුල්ලභ = පහසුවෙන් ලැබිය නොහැකි. |
| සුවණ්ණ = මනාපැහැය හෝ රූපය ඇති. | දුබ්බණ්ණ = නොමනා රූපය හෝ වර්ණය ඇති. |
| සුවිනීත = මනාසේ හික්මුණු. | දුබ්බිනීත = නොහික්මුණු. |
| සුසීල = මනා සිල් ඇති | දුස්සීල = සිල් නැති |
| සෙත = සුදු. | කාළ = කළු. |
| සෙස = ඉතිරි. | අසෙස; නිස්සෙස = ඉතිරි නැති. |
| සවාක්ඛාත = මනාසේ කියනලද. | දුරක්ඛාත = මනාසේ නොකී |
| හීන = ලාමක; පහත් | පණීත = උසස්; උතුම්. |

# අන්‍යොන්‍ය විරුද්ධාර්ථ ඇති නාමපද.

| | |
|---|---|
| අත්ථ = ප්‍රයෝජනය; හිතවත් දෙය. පු. | අනත්ථ = අහිත, අනර්ථය. |
| පටිපාටි = පිළිවෙළ. ඉ. | උප්පටිපාටි = විරුද්ධ පිළිවෙළ. |
| අනුවාත = අවිරුද්ධවාතය. පු. | පටිවාත = විරුද්ධ වාතය. |
| අනුලොම = අවිරුද්ධදෙය. ඉ. | පටිලොම = විරුද්ධදෙය. |
| අභික්කම = ඉදිරියට යාම. පු. | පටික්කම = ඉවත්ව යාම; පස්සට යාම. |

| | |
|---|---|
| අවිජ්ජා = අවිද්‍යාව; මෝහය. ඉ. | විජ්ජා = විද්‍යාව; ඥානය. |
| අස්සාස = ඇතුළටගන්නා හුස්ම පු. | පස්සාස = පිටකරන හුස්ම. |
| ආදි = මුල, පටන්ගැන්ම, පු. | අන්ත = කෙළවර; අවසානය. |
| අස්සාද = රසවිඳීම. පු. | ආදීනව = දෝෂය, වරද. |
| ආය = අය; ලැබීම. පු. | වය = වියදම; විනාශය. |
| ආලෝක = එළිය. පු. | අන්ධකාර = අඳුර. |
| උදය = හටගැන්ම. පු. | වය = විනාශය; ගෙවීයාම. |
| උපකාර = උපකාරය පු. | අපකාර = අනුපකාරය. |
| උප්පථ = නොමග. පු. | සප්පථ = යහපත්මග. |
| එකග්ගතා = එකඟබව; නැන්පත්බව ඉ. | වික්ඛෙප = කලබලය; නොසන්සුන්බව. පු |
| එකංස = එකාන්තබව. පු. | අනෙකංස = අස්ථිරබව |
| කය = මිලදීගැන්ම. පු. | වික්කය = විකිණීම. |
| කාරණ = කාරණය; හේතුව. න. | අකාරණ = නොකාරණය. |
| කුසල = යහපත; පින. න. | අකුසල = අයහපත; පව. |
| කෙතු = මිලටගන්නා. පු. | වික්කෙතු = විකුණන්නා. |
| ගමන = යාම. න. | ආගමන = ඒම. |
| ගුණ = ගුණය. පු. | අගුණ = අගුණය. |
| චුති = චුතවීම; පහවයාම. ඉ. | උප්පත්ති = ඉපදීම. |
| චොදක = චෝදනාකරන්නා; පැමිණිලිකාරයා පු. | චුදිතක = චෝදනා ලැබූඅය, විත්තිකාරයා |
| ජය = දිනීම. පු | පරාජය = පැරදීම |
| නිග්ගහ = නිග්‍රහකිරීම. පු. | පග්ගහ = අනුබලදීම. |
| නින්දා = නින්දාකිරීම ඉ. | පසංසා = පැසසීම. |
| ථල = ගොඩබිම; උස්බිම. | නින්න = පහත්බිම, සමබිම. න. |
| දාස = දාසයා. පු. | භුජිස්ස = නිදහස් මිනිසා |
| පමාද = ප්‍රමාදය. පු. | අප්පමාද = ප්‍රමාදනොවීම. |
| පවෙස = ඇතුල්වීම පු. | නික්ඛම = නික්මීම. පු. |
| පුච්ඡා = ප්‍රශ්නය; විචාරීම. ඉ. | විස්සජ්ජන = විසඳීම. න. |
| පුබ්බණ්හ = පෙරවරුව. පු. | අපරණ්හ = පස්වරුව. |
| පුරෙභත්ත = උදයවරුව. න. | පච්ඡාභත්ත = හවස්වරුව. න. |
| මිත්ත = මිත්‍රයා. පු. | සපත්ත = සතුරා. |
| රජ්ජන = ඇලීම. න. | දුස්සන = නොඇලීම, කෝපවීම. |
| රති = ඇලීම. ඉ. | විරති; අරති = නොඇලීම. |
| ලාභ = ලැබීම. පු | අලාභ = නොලැබීම. |

| | |
|---|---|
| සච්ච = සත්‍යය. න | අලික = බොරුව |
| සදාර = ස්වකීයභාර්‍යාව. පු. | පරදාර = අනුන්ගේ භාර්‍යාවෝ. |
| සද්ධම්ම = යහපත්ධර්මය. පු. | අසද්ධම්ම = අසත්‍යධර්මය. |
| සප්පුරිස = යහපත්මිනිසා. | අසප්පුරිස = දුෂ්ටමිනිසා. |
| සමුදය = හටගැන්ම. පු. | නිරොධ = විනාශය. |
| සම්මිඤ්ජන = හැකිළීම. න | පසාරණ = දිගුකිරීම, දිගහැරීම. |
| සංඛෙප = සංක්ෂෙපය. පු. | විත්ථාර = විස්තරය. |
| සීත = ශීතල. න. | උණ්හ = උෂ්ණය. පු. |
| සුඛ = සැපය. න | දුක්ඛ = දුක. |
| සුගති = සැපැතිභවය. ඉ. | දුග්ගති = දුක්ඇතිභවය. |
| සුගහිත = මනාසේ ගත්දෙය. න | දුග්ගහිත = නොමනාසේ ගත්දෙය |
| සුචරිත = මනාහැසිරීම. න. | දුච්චරිත = නොමනා හැසිරීම. |
| සුබ්බුට්ඨි = මනාවැස්ස; සුලභවැස්ස | දුබ්බුට්ඨි = වැසි අඩුබව ඉ. |
| සුභාසිත = යහපත්කීම. න. | දුබ්භාසිත = නපුරුකීම. |
| සොමනස්ස = සතුට. න. | දෞමනස්ස = නොසතුට. |
| සොවචස්ස = කීකරුබව. න. | දෞවචස්ස = නොකීකරුබව. |
| සොසීල්‍ය = මනාසිල් ඇතිබව | දුස්සීල්‍ය = සිල්නැතිබව. න. |
| හානි = පිරිහීම. ඉ. | වඩ්ඪි = අභිවෘද්ධිය |
| හිංසා = හිංසාව. ඉ. | අවිහිංසා = හිංසා නොකිරීම. |

# පද්‍යරචනා.

පාලිභාෂාවතරණ පොත්වල ගද්‍යරචනා ගැන මිස පද්‍යරචනා ගැන කිසිවක් නොදක්වන ලදී. එබැවින් මෙහි පද්‍යරචනා ගැනත් කරුණු ස්වල්පයක් දක්වනු ලැබේ.

**1** පද්‍ය බන්ධනයක පිහිටුවිය යුතු වෘත්තය දක්වීම සඳහා අකුරු තුනෙන් තුනෙන් යුත් ගණ අටක් යොදා තිබේ. ඒ ගණ අට මෙසේයි:-

| | | | |
|---|---|---|---|
| 1. | මගණය | ⌒ ⌒ ⌒ | ගුරු තුනකින් යුක්තයි. |
| 2. | නගණය | — — — | ලඝු තුනකින් යුක්තයි. |
| 3. | භගණය | ⌒ — — | මුල ගුරක් වේ. |
| 4. | යගණය | — ⌒ ⌒ | මුල ලඝුවක් වේ. |
| 5. | ජගණය | — ⌒ — | මැද ගුරක් වේ. |
| 6. | සගණය | — — ⌒ | අග ගුරක් වේ. |
| 7. | රගණය | ⌒ — ⌒ | මැද ලඝුවක් වේ. |
| 8. | තගණය | ⌒ ⌒ — | අග ලඝුවක් වේ. |

මේ ගණ අටෙන් මගණ - නගන - යගණ - භගණ සතරදෙනා ඉෂ්ට ඵල ගෙන දෙතියි ද ඉතිරි ගණ සතර අනිෂ්ට ඵල ගෙන දෙතියි ද කියත්.

**2.** මේ ගණ අට පහසුවෙන් මතක තබාගැනීම සඳහා වුත්තෝදයෙහි දක්වා තිබෙන ගාථාව මෙසේයි:

"සබ්බග්ලා ම්නා'දි-ග්ලහූ භයා; මජ්ඣන්තගුරූ ජසා;
මජ්ඣන්තලා රතෙත'ට්ඨ ගණා, ගො ගුරු, ලො ලහු."

හැමතැන ගුරු ඇත්තේ මගණයයි, හැමතැන ලඝු ඇත්තේ නගණයයි; ආදියෙහි ගුරු අකුරක් ඇත්තේ භගණයයි; ආදියෙහි ලඝුවක් ඇත්තේ යගණයයි; මැද ගුරක් ඇත්තේ ජගණයයි; අග ගුරක් ඇත්තේ සගණයයි; මැද ලඝුවක් ඇත්තේ රගණයයි; අග ලඝුවක් ඇත්තේ තගණයයි මෙසේ ගණ අටක් වේ. ගො- යන්නෙන් හෝ ගකාරයෙන් ගුරු (දීර්ඝ) අකුර ද ලො-යන්නෙන් හෙවත් ලකාරයෙන් ලඝු (=හ්‍රස්ව) අකුර ද කියවේ.

**3.** ආර්‍ය්‍යා - උපජාති ආදි ඇතැම් වෘත්තයන්හි ගණයයි කියනුලබන්නේ මාත්‍රා සතරකටයි. දීර්ඝාක්ෂරයක මාත්‍රා දෙකක් ද හ්‍රස්වාක්ෂරයක මාත්‍රා එකක් ද ඇත්තේය. එවිට දීර්ඝාක්ෂරදෙකක මාත්‍රා සතරක් තිබේ. හ්‍රස්වාක්ෂර සතරක මාත්‍රා සතරක් තිබේ.

මාත්‍රාවශයෙන් බලනවිට මගණයෙහි මාත්‍රා සයකි. නගන- යෙහි මාත්‍රා තුනකි. භගණයෙහි මාත්‍රා සතරකි. යගණයෙහි මාත්‍රා පසකි. තගණයෙහිත් පසකි.

ආර්‍යාදිවෘත්තයන්හි ගණයක් මාත්‍රා සතරකින් යුක්තයයි කී බැවින් එහි භ – ජ – ස – සහ ගණතුන ද දීර්ඝාක්‍ෂර දෙකකින් යුත් ගණයක් හා හ්‍රස්වාක්‍ෂර සතරකින් යුත් ගණයක් ද යෙදිය හැක.

---

**4.** ගාථාවක පද හෝ පාද සතරක් තිබේ. ඒවා ප්‍රථම පාදය. ද්විතීය පාදය ආදි වශයෙන් බෙදිය හැක.

පාදසතරයෙහි ම එක් අකුරක් බැගින් හෝ අකුරුදෙක බැගින් හෝ තුන බැගින් හෝ පිහිටුවීමෙන් ද ගාථාවක් සෑදිය හැක. එක් පාදයකට අකුරු විසිහය බැගින් යොදාත් පද්‍ය බන්ධනයක් කළ හැක. එයත් අනතිමසීමාව නොවේ. අකුරු තිසකින් යුත් ශ්ලෝක ද වෘත්තමාලාඛ්‍යාවෙහි දක්නා ලැබේ.

පාදයකට එක් අකුරක් හෝ දෙකක් තුනක් හෝ යොදා කළ පද්‍ය ඇතොත් ඉතා දුලීභවශයෙනි.

දෙයකුරු පාදයක් ඇති ගාථාවක් වුත්තෝදයටීකාවේ තිබේ. එහි දෙයකුරම ගුරුය.
එය මෙසේයි:–

"ඛන්ති
යස්මිං
සා වෙ
භූසා."

---

"යමෙකුකෙරෙහි ඉවසීම ඇත්නම් එය ඔහුට ආභරණයක් වේ"යයි මෙයින් කියවේ.

මැද ලඝුවක් ඇති රගණය හැම පාදයෙහිම යෙදීමෙන් අකුරුතුනෙන් යුත් ගාථාවක් එහිම පෙන්වා තිබේ. එය මිගී නම් වෘත්තයකි:–

"පාතු වො
සබ්බතො
කෙසරී–
වික්කමො"

"ඔබගේ ශාස්තෘවරයාගේ සිංහවික්‍රමය ඔබ රකීවා"යි මෙයින් කියවේ.

පාතදුරේ ඩී ඇම්. සිල්වා කවිරාජ පඬිතුමා විසින් 1900 දී පළකරවූ **මාගධිකා** නමැති පාලිසඟරාවේ මුල පාදයක් අකුරුසතරකින් යුත් ගාථාවක් යොදා තිබේ. එහිම තිබෙන සන්නයත් සමග එය මෙසේයි:-

"මාගධිකා
මාගධිකා
මාගධිකා
මාගධිකා

(සුමුඛී වෘත්තමය චතුරක්ෂර - පාදභ්‍යාස මහායමකයයි.)

මාගධිකා = චන්ද්‍රසූර්යයන්ට ද වඩා ප්‍රකට වූ; මා = මාතෘ (භාෂාමය) වූ; ගධිකා = ගුර්වක්ෂර අධික වූ (හෙවත් මා-කා-යන දීර්ඝාක්ෂර ද්වයක් මුල අග පිහිටියා වූ); මාගධිකා = ස්තුති පාඨක ගාථා බන්ධනාදියෙන් උපලක්ෂිත වූ; මාගධිකා = **මාගධිකා** නම් මාසික පත්‍රිකාවයි."

මෙසේ අකුරු ස්වල්පයකින් ගාථාබන්ධනය කළවිට අර්ථාවබෝධය ඉතා අපහසු වෙයි. ඒ නිසාම බොහෝ දෙනෙක් ඒ සඳහා වෙහෙස නොගනිත්. වුත්තොදයටීකාවෙහි වනාහි හැම අකුරුසංඛ්‍යාවලටම අයත් වෘත්තනාම සමග උදාහරණ ගාථා දක්වෙති. ආධුනිකයන්ට එයින් ප්‍රයෝජනයක් නැතැයි සිතමි.

**5.** පද්‍යබන්ධනවලදී බොහෝ සේ දකින්ට ලැබෙන්නේ අටකුරු පාද ඇති **පථ්‍යාවත්තගාථා ය. වසන්තතිලකා - මාලිනී** - යන වෘත්තදෙකින් බැඳි ගාථා ද සුලභ වෙති.

---

ගුරු - ලඝු ගිණීමේදී බැඳි අකුරකට මුලින් තිබෙන හ්‍රස්ව අකුර සංයෝගයේ මුලකුරත් සමග ගුරු අකුරක් සේ ගත යුතුයි බින්දුවකට මුලින් තිබෙන අකුර ද බින්දුවත් සමග දීර්ඝාක්ෂරයකැයි ගතයුතු ආ-ඊ ආදිය ගුරු අකුරු සේ ගිණිය යුතුබව කියයුත්තක් නොවේ

ආර්‍යාවෘත්තාදි මාත්‍රාවෘත්තවලදී ඇතැම් තැනක බැඳි අකුරට මුලින් සිටින ස්වරය හ්‍රස්වයක් සේ ගණිනු ලැබේ. එයට උදාහරණයක් මෙසේයි:-

"දුස්සහරසානුභවනෙ, නිබද්ධගෙධා ජිතස්ස'යං ජනතා;
විම්භයජනනී සඤ්ඤත - ක්‍රියා නු සා නාතුරඤ්ජයති?"

මෙහි **සඤ්ඤතක්‍රියා** යන තැන ත - කාරය දීර්ඝයක් සේ ගිනිය යුතු නමුත් වෘත්තය බිඳෙන නිසා එය හ්‍රස්වයක් සේ ගණිනු ලැබේ. මෙය ක්‍රමසංඥ යයි කියනු ලැබේ.

වුත්තොදයෙහි දක්වෙන මේ ගාථාවේ අර්ථ මෙසේයි:- මේ ජනසමූහ තෙමේ බුදුරදුන් දැකීමේ රසය විඳීමෙහි නිරන්තරයෙන් ඇලුණේය. උන්වහන්සේ තුළ පවත්නා විස්මය උපදවන හික්මීම කවරකුගේ සිත නොඇලවා ද?

ගුරු - ලඝු ගිනීම පැහැදිලි සේ තේරුම් ගැනීම සඳහා

"බුද්ධම්බුජං නමස්සිත්වා සද්ධම්මමධුභාජනං
ගුණාමෝදපදං සංඝ - මධුබ්බතනිසෙවිතං"

යන අටකුරු ගාථාවට ගුරුලඝු ලකුණු යොදා පෙන්වනු ලැබේ:-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| බුද් | ධම් | බු | ජං | න | මස් | සිත් | වා |
| ⌒ | ⌒ | — | ⌒ | — | ⌒ | ⌒ | ⌒ |
| සද් | ධම් | ම | ම | ධු | භා | ජ | නං |
| ⌒ | ⌒ | — | — | — | ⌒ | — | ⌒ |
| ගු | ණා | මෝ | ද | ප | දං | සං | ඝ |
| — | ⌒ | ⌒ | — | — | ⌒ | ⌒ | — |
| ම | ධුබ් | බ | ත | නී | සෙ | වි | තං |
| — | ⌒ | — | — | — | ⌒ | — | ⌒ |

(මෙහි මතු කියනු ලබන පථ්‍යාවක්ත්‍ර ලක්ෂණය වූ හැම පදයේ ම පස්වෙනි අකුර ලඝුවක් ව සිටීමත් දෙවෙනි - සිවුවෙනි පාදයන්හි සත්වෙනි අකුර ලඝුවක් ව සිටීමත් පෙනේ.)

**6.** සැම ගාථාවකම පාදසතර සමාන නොවේ. යම් ගාථාවක සිවුපදය ම සමාන නම් එය **සමවෘත්තයයි** කියනු ලැබේ. යම් ගාථාවක ප්‍රථම පාදය තෙවෙනි පාදය හාත් දෙවෙනි පාදය සිවුවෙනි පාදය හාත් සමාන නම් එය **අර්ධසමවෘත්තයයි** කියනු ලැබේ. පාද සතර එකිනෙකට වෙනස් නම් එය **විෂමවෘත්තයයි** දතයුතු.

---

**7. පථ්‍යාවත්ත** නමැති අටකුරු ගාථාවල සාමාන්‍ය ලක්ෂණය නම් පාදසතරේම පස්වෙනි අකුර ලඝු අකුරක් වීමත් දෙවෙනි - සිවුවෙනි පාදවල සත්වෙනි අකුර ලඝුවක් වීමත්ය. උදාහරණ:-

"මහාකාරුණි[5]කං බුද්ධං ධම්මං ච විම[5]ලං ව[7]රං
වන්දෙ අරිය[5]සංඝං ච දක්ඛිණෙය්‍යං ති[5]රඞ්ග[7]ණං"

(සාරත්ථදීපනී ටීකා.)

"කරුණාපුණ්ණ[5]හදයං සුගතං හිත[5]දාය[7]කං
තථා ධම්මං ච[5] විමලං සංඝං ච ගුණ-[5]සම්ප[7]දං."

(විමතිවිනෝදනී ටීකා.)

8. "වුත්තෝදය" නැමැති පාලිඡන්දෝග්‍රන්ථයෙහි ලක්ෂ්‍ය-ලක්ෂණ දෙක එක් ගාථාපදයකින්ම දක්වනු ලැබේ. ලක්ෂණය නම් මේ වෘත්තයෙහි මේ මේ ගණ මෙසේ පිහිටිය යුතු යයි දැක්වීමයි. ලක්ෂ්‍යය නම් ඒ ගණවලින් යුත් ගාථාපදයක් දැක්වීම යි. එක් පදයකින්ම මේ කරුණු දෙක සිද්ධකොට තිබෙන සැටි මෙසේ යි:-

"වුත්තා වසන්තතිලකා ත-භ-ජා-ජ-ගා ගො."

(තගණ - භගණ දෙකින් හා ජගණදෙකකින් ද ගුරු-දෙකකින් ද යුක්තවූවා වසන්තතිලකා යයි කියලදී.)

| ත | භ | ජ | ජ | ගො | ගො |
|---|---|---|---|---|---|
| ⌒ ⌒ — | ⌒ — — | — ⌒ — | — ⌒ — | ⌒ | ⌒ |
| වුත් තා ව | සන් ත ති | ල කා ත | භ ජා ජ | ගා | ගො |

මේ ඒ වෘත්තයට නියමිත ගණ හා අකුරු යි. ඒ දැක්වූ ගාථාපදය ද ඒ ලක්ෂණවලින් යුක්තයි. ලක්ෂ්‍ය ලක්ෂණදෙකින් යුක්තවන්නේ මේලෙසිනි.

වසන්තතිලකාවට උදාහරණ:-

"යස්මිං සයිංසු ජිනධාතුවරා සමන්තා
ඡබ්බණ්ණරංසිවිසරෙහි සමුජ්ජලන්තා
නිම්මාය ලොකහිතහෙතු ජිනස්ස රූපං
තං ථූපමබ්භුතතමං සිරසා නමාමි,"

(ථූපවංසය.)

1. "තණ්හාවසන්නි යතයො මුනිරාජපුත්තා
යෙ සංඝරාජපමුඛා විනයෙ' තිදක්ඛා
නානාදිසාසු ගතවිස්සුත - කිත්තිඝොසා
සන්තින්ද්‍රියා සමිත - පාපගණා පසන්නා."

2. තෙසං විසිඨනයසාරවිසාරදානං
සබ්බඤ්ඤුසාසනතළාක - සරොරුහානං
සම්බුද්ධදෙහවරධාතු - ධුරාවහාය
ලංකාය නිරජනකායනිසෙවිතාය.

3. සන්දෙසපණ්ණමිද මාදරතො ලිඛිත්වා
කන්තං මයා මුනිසුතෙන සුමංගලෙන
පෙසියතෙ බුධමනොපරිතොසකන්තං
සඞ්ඝාය සාසනිකකිච්චවසෙන සම්මා."

(හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන් විසින් බුරුමරටට යැවූ සන්දේශයකින් ගන්නාලදී.)

## මාලිනී

**9.** මාලිනීවෘත්තයෙන් බැඳි ගාථා ද සුලභ යයි යට කියනලදී. ඒ වෘත්තයේ ලක්ෂණ නම්:—

"න-න-ම-ය-ය යුතායං මාලිනී භොගිසීහි"

— — — — — — ⌒ ⌒ ⌒ — ⌒ ⌒ — ⌒ ⌒

න න ම ය ය

යන්කසි

උදාහරණ:—

---

"සුමන කුසුම - තාරා - හාර - පීයූස - කුන්ද-
සදිස - විසද - කිත්තිං ධිවධුවාසතුල්‍යං
සකතවිදුත - ස්‍යාමින්දීදෙසෙ වසන්තං
වතරතනසභිධානං සංඝරාජං නමාමි."

(බෙන්තර අත්ථදස්සී මාහිමියන් සියමට යැවූ සන්දෙශයකිනි.)

"සතතවිතතකිත්තිං ධසතකන්දප්පදප්පං
තිභවහිතවිධානං සබ්බලොකෙකකෙතුං
අමිතමතිමනග්ඝං සන්තිදං මෙරුසාරං
සුගතමහමුදාරං රූපසාරං නමාමි."

(සමන්තකූටවණ්ණනා.)

"පිරබිතිරතනාද්‍යා පුණ්ණතාමං පුරං තං
අවිකලමතිරම්මං ධම්මරාජාධිරාජා
අධිවසති පසත්ථො නෙකභූපාලමොලි-
මණිගණමධුපාලී - සෙවිතඞ්ඝිසරොජො."

(සිප්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ගේ සන්දේශයකින්.)

මේ මාලිනීවෘත්තයෙහි අකුරු සතකින් හා අටකින් යතියක් වියයුතු යයි **භොගිසීහි** යන වචනයෙන් දැක් වේ. යතිය නම් අල්ප විරාමයකි, හෙවත් සවල්ප කාලයක් නවත්වා කීමයි. යට දැක් වූ "සතතවිතතකිත්තිං" ආදි ගාථාවෙහි සත්වෙනි අටවෙනි අකුරු තිබෙන්නේ 'කිත්තිං' යන තැනය. මෙහි මෙසේ කියනලද නමුත් වුත්තොදයටීකාවෙහි දැක්වෙන්නේ අටවෙනි අකුරේ දී යතිය යෙදිය යුතුබවයි. එය එසේ යයි පිළිගැනීම වටී. කිත්තිං, විධානං, මතඞ්ගං, මුදුරං යන පද අවසන් වෙන විට සවල්ප නැවැත්වීමක් කළයුතු.

අන්‍ය වෘත්තවල ද නියමිත විරාමයන් ඇති බව සැලකිය යුතු.

**10.** අකුරු විසිඑකක් ඇති **සග්ධරාවෘත්තයට** උදාහරණ මෙසේ යි:-

"සබ්බා දෙසප්පභූතාගත - බුධමධුපාසෙවනාධාරභූතෙ
සීලක්ඛන්ධසුගන්ධෙ සකුලසරසිජෙ සංසරාජාරවින්දෙ
පූරෙත්වා සුප්පතිට්ඨං ජිනවචනමධුං සංගහෙත්වා වසන්තො
පුඤ්ඤද්ධාරො ඡකාරා ස උපයති සදා හංසපොතො පතීතො."

(වුත්තමාලාවෙහි.)

මෙහි ලක්ෂණය මෙසේයි:-

⌒ ⌒ ⌒ ⌒ — ⌒ ⌒, - - - - - - ⌒, ⌒ — ⌒ ⌒—⌒ ⌒,

අකුරු සතෙන් සතෙන් යති ඇත්තාහ.

**මහානාමක්කාර පාඨයෙහි** බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂලක්ෂණ දක්වන සග්ධරාවෘත්තයෙන් යුත් ගාථා තුනක් වේ. එයින් එක් මෙසේයි:-

"බුද්ධො නිග්‍රොධබිම්බො මුදුකරචරණො බ්‍රහ්මසොසෙණිජංඝො
කොසච්ඡාදඞ්ගජාතො පුනරපි සුගතො සුප්පතිට්ඨිතපාදො
භූතොදාතුණ්ණලොමො අථම්පි සුගතො බ්‍රහ්මුජුග්ගත්තභාවො
නීලක්ඛී දීඝපණ්හි සුඛුම්මලඡවී ථොම්‍යරාසග්ගසග්ගී."

**11.** බෙන්තර අත්ථදස්සී මාහිමියන් සියමට යැවූ සන්දේශයක තිබෙන ගාථා අටෙන් එකක් මෙසේයි:-

"චතුරසංඛිය – කප්පලක්ඛමිත – කාලලද්ධවජිරාසනං
අජ්ඣසිත්ව දිනසත්තමෙව'මතදෙ තහිං සුභිසීදිය
ඵලසමාධිජනිතං සුඛනනුභවි සුද්ධසූරකුලවංසජො
ජයතු සච්චවචනෙන තෙන සුධි පරමධම්මිකනරාසභො."

මෙහි අකුරු 21 ක් ඇති නමුත් මෙය සද්ධරාවෘත්තයෙන් බැඳි ගාථාවක් නොවේ. මෙය ඒ ඡන්දසේම අන්‍යවෘත්තයකට අයත්ය. ඒකේ නාමය ඡන්දස්පොත්වලින් සෙවීම අපහසුය.

**12.** අකුරු 19 ක් ඇති සද්දූලවික්කීළිතයට උදාහරණයක්:-

"ලඞ්කිපිවදනෙ විභූතිසදනෙ සාතච්චසම්මානනෙ
යස්මිං සජ්ජිතතොරණෙ සතරුණෙ සාධූනසාධාරණෙ
ධම්මාරාමකුලෙ විලොපවිකලෙ පච්චත්ථිදුග්ගාචලෙ
ආරාමො අහු රාමණෙය්‍යවිභවො දට්ඨබ්බසාරො වරො"

(මහානාගකුලසන්දේසයෙනි.)

මෙහි ලක්ෂණය:-

⏑ ⏑ ⏑ — — ⏑, — ⏑ — — — ⏑, ⏑ ⏑ — ⏑ ⏑ —, ⏑

සයකින් සයකින් යති ඇති බව පෙනේ.

**13.** අකුරු 11 ක් ඇති **රථොද්ධතාවෘත්තය**

⏑ — ⏑ — — — ⏑ — ⏑ — ⏑

මේ ලක්ෂණයෙන් යුක්ත වේ, උදාහරණයක්:-

"සුද්ධදුද්ධපටලං ව වාලුකා–
පට්ටමට්ටඝසිතං ව භූමියා
භාති යත්ථ මුනිවීර – නීරජ–
පත්ථොරුගුණරේණු – සන්නිභං."

(මානාවුලුසන්දේශයෙනි.)

අටකින් පසුව යතිය ඇතිබව පෙනේ.

# යමකබන්ධන.

**14.** මෙකී නොකී ගාථාවන්හි එක් එක් පාදයෙහි මුල දෙපදයක් හෝ අග දෙපදයක් හෝ මැද දෙපදයක් හෝ සමානව යෙදේ නම් එය **යමකබන්ධනයයි** කියනු ලැබේ. ඇතැම් විට සම්පූර්ණ ගාථාපාද දෙකක් හෝ තුනක් හෝ සතරම හෝ සමාන වෙනසේ ද යොදත්. ඒවා ද යමක වෙති, ඒවාට නොයෙක් නම් ද ඇත්තාහ.

මෙහි පදසමානත්වය ශ්‍රැතියෙන් මිස අර්ථයෙන් නොවේ.

"තථාගතො යො කරුණාකරො කරො –
පයාතමොස්සජ්ජ සුඛප්පදං පදං
අකා පරත්ථං කලිසම්භවෙ භවෙ
නමාමි තං කෙවලදුක්කරං කරං"

යන්න අභිධානප්පදීපිකාවේ මුල තිබෙන ගාථාවයි. මෙහි මුල් පාදයෙහි "කරො කරො" යන අකුරු ද දෙවෙනි පාදයේ "පදං පදං" යන දෙක ද තෙවෙනි පාදයෙහි "භවෙ භවෙ" දෙක ද සිවුවැන්නෙහි "කරං කරං" දෙක ද සමානව පෙනෙත්. යමකය නම් යුග්මයකි, ජෝඩුවකි. මේ යමකය පාදාන්තයන්හි යෙදී ඇති බැවින් "පාදාන්තයමක" යයි කියනු ලැබේ. මේ යුග්මයන්හි යෙදී ඇති පදවල අර්ථසාම්‍යයක් නැත. ශ්‍රැතිසාම්‍යය පමණක් තිබේ

"කරො කරො" යන දෙකැන්හි මුල් 'කරො' යන්න "කරුණාකරො" යන සමාසයෙහි යෙදී තිබෙන ආකර-ශබ්දයෙන් ලැබේ. දෙවෙනි "කරො" යන්න "කරොපයාත" යන සමාසපදයේ මුල් කොටසෙන් ලැබේ. එහි කර-ශබ්දයෙන් අත කියවේ. ඉතිරි පද ගැනත් පිළිවෙළින් මෙසේ සලකා බැලියයුතුයි.

අභිධානප්පදීපිකාවෙහි රත්නත්‍රය නමස්කාරය සඳහා යෙදී තිබෙන ගාථාතුනම මෙවැනි පාදාන්තයමකවලින් යුක්තයි.

**15.** බුද්ධඝෝෂාචාර්යයන් විසින් නිබන්ධිතයයි බුරුමරටේ සලකනු ලබන **ජිනාලංකාර*** නමැති ගාථාපෙළක් තිබේ. එහි ප්‍රථමගාථා දෙක මෙසේයි:-

*නානාවෘත්තවලින් බැඳි ගාථා සොළසකින් යුත් මෙය අදින ලියූ ටීකාවක් සමග බුරුමරටේ මණ්ඩලේ නුවර සුඛවතී යන්ත්‍රාලයෙහි මුද්‍රිතව තිබේ. මේ ටීකාව කළ ආචාර්යවරයා නම් සවෙනි සංගායනාවේ මූලසුන දරූ අග්ගමහාපණ්ඩිත රේවතානිධජරාජගුරු මහතෙර නමය. මෙතුමා සංගායනා කාලයේදී ම අපවත් විය.

"සුගතං සුගතං සෙට්ඨං, කුසලං කුසලං ජහං
අමතං අමතං සන්තං, අසමං අසමං දදං
සරණං සරණං ලොකං, අරණං අරණං කරං
අභයං අභයං ඨානං, නායකං නායකං නමෙ."

මේ හැම පදවලම මුල යමකයක් ඇතිබව පෙනේ. මෙවැනි ගාථාවලට සබ්බපාදාදියමකයයි නමක් වේ. මෙවා යට දක්වූ පාදයක අකුරු අටක් ඇති පථ්‍යාවත්තගාථායි.

**16.** යමකබන්ධන බහුලව යෙදූ පාලිකාව්‍යය නම් ජිනාලංකාර නමැති බුද්ධචරිතයයි. එහි 66 වෙනි ගාථාව මෙසේයි:-

"දිස්වා නිමිත්තානි මදච්ඡිදනි,
පිතං විරූපානි රතිච්ඡිදනි,
පාපානි කම්මානි සුඛච්ඡිදනි
ලද්ධාන ඤාණානි භවච්ඡිදනි."

මෙහි පාද සතරේම අග "ඡිදනි" යන වචනය යෙදී තිබේ. මෙය පාදන්තබ්‍යපෙත යමක නමැත්තේය. මෙය අකුරු එකොළොසකින් යුත් ඉන්ද්‍රවජ්‍රා නම් වෘත්තයට අයත්ය. එහි වින්‍යාසය මෙසේයි:-

⌒ ⌒ —   ⌒ ⌒ —   — ⌒ —   ⌒ —

**17.** එක් ගාථාපාදයක අගද ඊළඟ පාදයේ මුලද සමාන වචන යොදා බැඳි ගාථාව පාදසන්ධානසමක නම්. ජිනාලංකාරයෙන් උදාහරණයක්:-

"පදිත්තාගෙහා විය භෙරවං රවං
රවං සමුට්ඨාය ගතො මහෙසි,
මහෙසි මාලොකිය පුත්තමත්තනො
කතොසි නො පෙම්මහොසමත්තතො."

මෙය අකුරු 12 ක් ඇති වංසට්ඨ ගාථාවකි. ඒකෝ වින්‍යාසය මෙසේයි:-

— ⌒ — ⌒ ⌒ — — ⌒ — ⌒ — ⌒

**18.** පාදසතරේම මුල සමාන පද යෙදී තිබෙත් නම් එය **පාදාදිඅව්‍යපෙතසමකයයි.** ජිනාලංකාරයෙන් උදාහරණයක්:-

"එකන්තමෙව සපරත්ථපරො මහෙසි
එකන්තමෙව දසපාරමිතාබලෙන
එකන්තමෙව හතමාරබලෙන තෙන
එකන්තමෙව සුවිසුද්ධමලත්ථ බොධිං."

මෙය අකුරු 14 කින් යුත් **වසන්තතිලකා**වෘත්තයට අයත්ය. ඒ වෘත්තයේ ලක්ෂණ මින් පෙර දක්වනලදී.

## 34. අර්ථවිවරණය.

උදාහරණ වශයෙන් දක්වූ ඇතැම් පාලිපාඨයන්ගේ අර්ථාදිය මෙහි දක්වනු ලැබේ.

**10 වෙනි පිට, 10 අංකය හා සම්බන්ධයි:—**

1. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ස්ත්‍රීතොමෝ දුර්වර්ණ වේද, විරූප වේ ද, දක්මට අප්‍රිය තැනැත්තියක් වේ ද, දිළිඳු වේ ද, අල්පධන-අල්පභෝග ඇත්තියක් වේ ද, ඒ හේතුව ප්‍රත්‍යය කවරේද?"

2. "කඩුගත් අත් ඇතියකු හා කථාකරන්නේය, පිශාචයකු හාත් කථා කරන්නේය, නමුත් තනිවූයේ හුදකලාවූ ස්ත්‍රියක් සමග කථා නොකරන්නේය."

3. "මහණෙනි, ස්ත්‍රීතොමෝ කරුණු දෙකක් සම්බන්ධයෙන් තෘප්තනොවූවා පසුනොබසින්නී කළුරිය කරයි."

4. ආනන්දය, ස්ත්‍රිය ක්‍රෝධකරන සුලුය, ඊර්ෂ්‍යාකරන සුලුය, මසුරුය, දුෂ්ප්‍රාඥය; ආනන්දය, මාගම සභාවක නොහිඳිනීය, කර්මාන්ත නොම යොදවන්නීය යන්නට හේතුව මේය.

**12 වෙනි පිට, 11 වෙනි අඩකය හා සම්බන්ධයි·**

3. "වෛරී මනුෂ්‍යයන් අතුරෙහි වෛර නැත්තෝව ඒකාන්තයෙන් ඉතා සැපසේ ජීවත්වෙමු."

4. "දැඩිකොට නොහඩව, වහා පොදිය බඳුව."

7. "ඔහු සකසා වළඳවා ඔහුගේ පාත්‍රය මනාකොට සෝදා නොයෙක් අග්‍රරසභොජනයෙන් පුරවා 'මේ පිණ්ඩපාතය උන් වහන්සේට දුනමැනවැ'යි කීය"

**12 වෙනි පිට, තෘතීයාඋදාහරණ.**

1. "මසුරු සිටුහු මොහොතකින් දමනය කොට සම්බුදුන් වහන්සේට හමුකොට සෝවාන්ඵලයෙහි පිහිටුවිය."

2. "බිම හෙවැ පෙරළෙමින් දුකසේ දරුවකු වදා"

3. "දැන් මගේ සිත නිවියාක් වන්නේය. සැපසේ ද නිදන්ට ලබන්නෙමි.

**13 වෙනි පිට, 12 වෙනි අංකය හා සම්බන්ධයි.**

9. එක් ධනවතෙක් තමාගේ පුතුන් සිවුදෙන අතුරෙන් එක එකාට රුපියල් දහස බැගින් ද ගවයන් සියය බැගින් ද දුන්නේය.

10. ලඞ්කාද්වීපය පාලනය කරන්නෝ නොයෙක් බදුවලින් වර්ෂයකදී රුපියල් දොළොස් කෝටියක් ද අසූලක්ෂයක් ද ලබත්.

**16 වෙනි පිට 16 වෙනි අඞ්කය හා සම්බන්ධයි:**

7. තිස්සය, වැඩිමහලු භික්ෂූන්ට මේ සියලු වත් කරන්ට වරි ඒ භික්ෂූන් ක්ෂමාකරව.

8. හෙතෙම කිම්ද අන් තැනකින් පලාගියේය.

9. ඒ ගෙහි සියලු දාසයෝ ද කම්කරුවෝද විශාඛාවන් සතුවූවෝය.

මෙ ගින්න හා සමාන ගින්නක් කම් නැතැයි මෙසේ මේ කාරණයෙහි ම නිදොස්ම විය.

10. තෙපි කෙසේ කියහු ද? අත්දෙකින් දණදෙකේ එල්ලී නතනමින් (සෙදිරි ගාමින්) "ගෙහි කිසිවක් ඇද්ද"යි ඇසීය.

**17 වෙනි පිට සමාසවිශෙෂණ හා සම්බන්ධයි:**

1. "හෙතෙම නගර ඉල්පුණු සිරුරු ඇත්තෝ අලසබැවින් මැඩුණේ කසන කොරිවිලින් ගැවසුණෝ විය."

2. "ගැල් අසූවක (පුරවන) තරම් කිකිරිදර ගෙන්වා පූරවා."

3. "සියල් සුදු ඇත්පැටියා දුන්, තනිව හැසිරෙන ඇතා සැරියුත් තෙරුන්වහන්සේ වූහ."

4. "කළු බත්තිස ඇති (=දත් වලදු අවසන්වූ) තෙරුන් හා මිහිරි පිළිසඳරකොට (=තොරතුරු කථාකොට) මෙසේ කීය."

5. මධුර නාද ඇති කරවීකපක්ෂිතෙමේ මිහිරි රසැති මිඅඹ ගෙඩිය මුවතුඩින් (=හොටයෙන්) ඇත වැගිරෙන රසය ආස්වාදනය කොට (=බී) සියලු වනය ආශ්‍රිත වූ වසන සත්වසමූහය මත්කරමින් නාදකෙරේ.

6. "පහළවූ සත්රුවන් ඇති කාලිඞ්ග චක්‍රවර්ති රජතෙමේ එක්දිනක් සියලු අලඞ්කාරයෙන් සැරසුනේ මල්විලවුන් දූරුයේ සම්බන්ධවලවූ කෛලාශකූටය (=හිමවත මිදිදියෙන් වැසුණු කන්දකි) ට සමානවූ හස්තිරත්නයට නැග මවුපියන්ගේ ආශ්‍රම පදයට ගියේය."

7. සැවැත්නුවර අනේපිඬු - විශාඛාදී පස්කෙළක් පමණ ආර්යශ්‍රාවකයෝ ද දෙකෙළක් පමණ යහපත් පෘථග්ජනයෝ (=මාර්ගඵල නොලැබූ සම්‍යක්දෘෂ්ටිකයෝ) ද සුවඳ මල් ආදිය ගෙන රැස්වූහ.

8. "සත්රුවන්මුවා ගරාදිවැටක් කරවා රන් (සුණු) මිශ්‍ර වැලි අතුරුවා පවුරකින් වටකරවා සප්තරත්නමය දොරකොටු වක් කරවිය."

9. "තිස්යොදුන් මග ගෙයක් උස්රළ බිඳීමෙන් රම්‍යවූ ගඞ්ගානදිය එතරකොට (=නදියෙන් එතරව) උතුම් රජගෙවල් ඇති රාජගෘහ නම්වූ අතිමනොඥ නගරයට පිවිස එහි ඓශ්වර්ය මදයෙන් මත්වූ ජනයාට පරිහාස (=සමච්චල්) කරන්නාසේ සත්හුන් ඉඳුරන් ඇත්තේ සක්හුන් සිත්ඇත්තේ සිඟු පිණිස හැසිර........බබලමින් වැඩහුන්නේය."

10. "ශක්‍රතෙමේ විජයුත්තර නම්වූ එක්සියවිසිගොදුන් දිගැති ලෝකකුහරය පතුරුවන නාදඇති සක පිඹිමින් සිටියේය.

15. වෙනි සිට 18 වෙනි අංකය හා සම්බන්ධයි.

8. මහාපුරුෂතෙමේ වැටකෙය්යා - හෝපලු - සපුආදි ~~නොයෙක් ගස්සමූහයන්ගෙන් සැරසුණු, මුව-අස්-ඇත්-වග ආදි~~ සිවුපාසමූහයන් විසින් හැසිරෙනලද, සුරාසුරාදි නොයෙක් සියගණන් අමනුෂ්‍යයන් විසින් සෙවුනාලද, නානාවිධ රත්නයන්ට ආකරවූ හෝ නානාවිධ රත්නාකර ඇති, දෙව්-කිඳුරු - නයින්ට රඟමඬලක් වැනිවූ හිමවතට බැසගත්තේය.

9. මොහඳුරු නසන, දහම් පහන් දල්වන, ලොවට යහපත සලසන, දීපඞ්කර නම්වූ නිරුත්තරවූ සම්‍යක් සම්බුද්ධයන්වහන් සේ උත්තම - මනොඥදර්ශන ඇති, ජනයන්ගේ ඇස් හා සිත් ඇදගන්නා, සුදර්ශනමහාවිහාරයෙහි වැඩවසත්.

10. හෙතෙම මනාව හැඩි, මනාව පෙරවී, සන්හුන් ඉඳුරන් ඇති, සන්හුන් සිත් ඇති, මහාපුරුෂලක්ෂණ–අනුව්‍යඤ්ජන (–කුඩා ලක්ෂණ)–ව්‍යාමප්‍රභාවන්ගෙන් යුක්තවූ, සවණ බුදුරැස් විහිදුවමින් ඇංසීසමූහයා විසින් පිරිවරනලදුව සැරසූ මගට බැස්සාවූ, දෙව්මිනිසුන්විසින් පුදනු ලබන, දීපඞ්කරසම්බුදුයන් වහන්සේ දක යටිකුරුවැ මඩමත්තෙහි හොත්තේය.

11. මහත් මහත් පර්වතකූටයෝ දුමමින් දැල්වෙමින් අහසින් අවුත් බෝසතුන් කරා පැමිණ දිව්‍යමල්ගුළිබවට පත්වූහ.

## 30 වෙනි පිට

4. වම්පසින් ඌරෙක් වේ. දකුණුපසින් එළුවෙක් වේ, සඬින් වස්සෙක් වේ: අගින් මහලුගවයෙක් වේ. (මේ කියවෙන්නේ ප්‍රේතයකුගේ ලක්ෂණයි)

# සිංහල-පාලි වචනමාලාව

**සංකේතයෝ:**

පු. පුල්ලිඞ්ග. ක්‍රි. වි. ක්‍රියාවිශේෂණ.
ඉ. ඉත්ථිලිඞ්ග. පූ. ක්‍රි. පූර්වක්‍රියා.
න. නපුංසකලිඞ්ග. 3. ත්‍රිලිංගික.
නි. නිපාත.

**(පාලිභාෂාවතරණ i වෙනි පොතේ ඇති වචන මෙහි නොයොදනලදී.)**

අකුර = අක්ඛර, න.
අකුළයි = සංහරති.
අගතැන්පත් = අග්ගප්පත්ත. 3.
අගමෙහෙසිය = අග්ගමහෙසී. ඉ.
අගසිට = අග්ගතො. නි.
අඟ = විසාණ. න.
අඥාන = දුප්පඤ්ඤ; බාල. 3.
අටවෙනි = අට්ඨම. 3.
අටසිල් = අට්ඨඞ්ගසීල. න.
අටල්ල = අට්ටාලක. පු.
අඩුමිල = ඌනමූල. න.
අණකරවයි = ආණාපෙති.
අත්තිකාරම = සච්චකාර. පු.
අත් පා හකුළයි = සම්මිඤ්ජති.
අත්පොළගසයි = අප්පොඨෙති.
අත්හරියි = වජ්ජති, ජහාති, පරිච්චජති
අතරනැති = අවීචි, නිරන්තර.
අතරමග = අන්තරාමග්ග. පු.
අතහරියි = විස්සජ්ජෙති.
අතිකර්කශ = අච්චන්තකක්ඛළ.
අතිමනොඥ = අතිමනුඤ්ඤ, අතිමනොහර. 3.
අතිවිශිෂ්ට = අතිවිසිට්ඨ. 3.
අතිශයෙන් = අච්චන්තං; අතිසයෙන; අතිවිය. ක්‍රි. වි.
අතිඅඥානබව = අච්චන්තබාලතා. ඉ.
අතිසාර රෝගය = අතිසාර. පු.
අතුරනලද = අත්ථත; සන්ථත. 3.
අද්දක්වා = යාවජ්ජතනා. නි.
අදහයි = සද්දහති.
අදහස = මනොරථ; අධිප්පාය; අජ්ඣාසය. පු.
අදහා = සද්දහිත්වා. පූ. ක්‍රි.
අදියි = ආකඩ්ඪති.
අඳුන්ගායි = අඤ්ජති.
අඳුන්ගෑම = අඤ්ජනාලෙපන. න.
අධික ජලය = අධිකවාරි. න
අධිකරණ නායකයා = ධම්මට්ඨ. පු.
අධිකලෙස = අතිරෙකතරං. ක්‍රි. වි.
අධිගෘහීත = පරිග්ගහිත; අධිග්ගහිත.
අධිෂ්ඨානය = අධිට්ඨාන. න.
අධිෂ්ඨානකෙරේ = අධිට්ඨාති.
අත්දවයි = අච්ඡාදෙති.
අනාථමරණය = අජඩුමාරිකා. ඉ.
අනික් = අඤ්ඤ, ඉතර. 3.
අනික් පැත්ත = ඉතරපස්ස. පු.

අනුකම්පා ඇති = අනුකම්පක, කාරුණික. ති.
අනුග්‍රහය = අනුග්ගහ. පු.
අනුන්සතු = පරසන්තක. ති.
අනුභව කරයි = භුඤ්ජති, අනුභවති, අසති, අස්නාති, අදති, භක්ඛති.
අනුව දුවයි = අනුධාවති
අනූඅට = අට්ඨනවුති ඉ.
අඳියි = පරිදහති, නිවාසෙති.
අපරාධකාරයා = අපරාධී. පු.
අපිරිසිදුතැන = අපරිසුද්ධට්ඨාන. න.
අභිවෘද්ධිය, = වුද්ධි, අභිවුද්ධි, සමිද්ධි. ඉ. — කැමති = වුද්ධිකාම. ති.
අමතා = ආමන්තෙත්වා. පූ. ක්‍රි.
අමිහිරි = අමධුර. ති.
අමු = ආමක. ති.
අමුනයි = ආවුනාති.
අඹුදරුවෝ = පුත්තදාරා. පු
අයත් = ආයත්ත. ති.
අයිතිකැති බැවින් = ආයත්තතාය.
අල = කන්ද, ආලුව. පු
අලසකමින් මැඩුණු = ආලසියාභිභූත. ති.
අලු = භස්ම. න.
අලුත් = අභිනව; නව. ති.
අලුතෙන් = අධුනා.
අවකාශය = ඔකාස. පු.
අවවාද කරයි = ඔවදති.
අවසාන පරීක්ෂණය = නිට්ඨානොපපරික්ඛා. ඉ.
අවුරුදු කීපයක් = කතිපය වස්සානි.
අවුරුදු පතා = අනුසංවච්ඡරං. ක්‍රි. වි.
අශ්වයා = අස්ස, හය, තුරඞ්ග. පු.

අස්වයි = සාවෙති.
අසත්පුරුෂයා = අසප්පුරිස. පු.
අසන්ට ලැබේ = සූයති.
අසනලද = සුත. ති.
අසරණ = අනාථ. ති.
අසවල් = අමුක. ති.
අසුරයා = අසුර, දානව. පු.
අසුන් දිවීම = අස්සධාවන. න.
අසූවක් පමණ = අසීතිමත්ත. ති.
අස්ථිර = අධුව, අථිර. ති.
අස්ලොමක් පමණ = වාලග්ගමත්ත. ති.
අහස = ආකාස, නභ. පු.
අහිමිවූ = අස්සාමික. ති.
ආ ආ = ආගතාගත. ති.
ආක්‍රෝශලැබූ = අක්කුට්ඨ. ති.
ආගමික ගුරුවරයා = සමණ. පු.
ආඥාසම්පන්න = ආණාසම්පන්න. ති.
ආමග = ආගතමග්ග. පු.
ආමන්ත්‍රණය = ආලපන. න.
—කොට = ආලපිත්වා. පු. ක්‍රි.
ආර්යශ්‍රාවකයා = අරියසාවක. පු.
ආර්යසමූහයා = අරියගණ. පු.
ආරම්භක්ලේශ = ආරබ්භ.
ආරාධනාව = අජ්ඣෙසනා. ඉ.
ආරාධනාකරයි = නිමන්තෙති, ආරාධෙති, අජ්ඣෙසති.
—කොට නිමන්තෙත්වා. පූ. ක්‍රි.
ආරෝග්‍යශාලාව = සොත්ථිසාලා. ඉ.
ආලේපකරයි = උපලිම්පෙති.
ආවාවූ = ආගත. ති.
ආවුධය = ආවුධ. න.
ආශ්චර්යවත් = අබ්භුත. ති.
ආශ්චර්යනැති = අපාටිහීරක. ති.
ආශ්‍රමපෙදෙස = අස්සමපද. න.
ආශ්‍රය කරයි = සෙවති, භජති, පයිරුපාසති.

ආශ්‍රය නොකළ = අසන්ථුත. 3.
ආශ්‍රයකොටගෙන=උපනිස්සාය. පූ. ක්‍රි.
ආසනය = ආසන. න
ආස්වාදකොට = සායිත්වා. පූ. ක්‍රි.
ආහාරකෘත්‍යය=භත්තකිච්ච. න.
ආහාර නොගෙන සිටීම = අනසන. න.
ඇත්නාන = සනාති.
ඇත්තේය = අත්ථි.
ඇත්පැටවා = හත්ථිපොතක. පු
ඇතා = හත්ථි; කුඤ්ජර. පු.
ඇතිකල්හි = සන්තෙ; සති.
ඇතුළත් = අන්තොගධ. 3.
ඇතුළත් කිරීම පිණිස = අන්තොගධකරණාය.
ඇතුල්වූ කාලය = පවිට්ඨකාල. පු.
ඇතුළත්කොට = අන්තොකත්වා. පූ. ක්‍රි.
ඇතුල්කරයි = පවෙසෙති.
ඇතුළු නුවර = අන්තොනගර; අන්තොපුර. න.
ඇතැම් = එකච්ච. 3.
ඇන = ආකොටෙත්වා, ආහනිත්වා. පූ. ක්‍රි.
ඇපසටි බැඳීම = අනුබන්ධ. පු.
ඇපැල් ගෙඩි = මහාබදර. න.
ඇමතියා = අමච්ච. පු
ඇස්පෙනීම = අක්ඛිදිසි. 3.
ඇස්නැති = අන්ධ, අනක්ඛික. 3.
ඇස්හමුව = චක්ඛුපථ. පු.
ඇහුම්කන්දෙන=සුස්සූසන්ත. 3.
ඉක්මවයි = අතික්කමති.
ඉක්මවා ගියේය = අච්චගමා.
ඉගනීම = උග්ගණ්හන; සික්ඛන. න.
ඉගනීම පිණිස = සික්ඛනත්ථාය.

ඉගනීම සොයන = සුතගවෙසක. 3.
ඉගෙනගනී = උග්ගණ්හාති.
ඉගැන්වීම = සික්ඛාපන. න.
ඉතා උණුසුම් = අච්චුණ්හ. 3.
ඉතා උසස්බව=අච්චුන්නතභාව. පු.
ඉතකෝපවූ = අතිරුට්ඨ. 3.
ඉතාදුෂ්කරවූ = අතිදුක්කර. 3.
ඉතාපුරාණයේදී = අතිපුරා. නි.
ඉතාසැපසේ = සුසුඛං. ක්‍රි. වි.
ඉතිරිවූ = අවසෙස, අවසිට්ඨ, අතිරිත්ත. 3.
ඉදිකටුව = සූචි. ඉ.
ඉදින් = සචෙ. නි.
ඉදිරියට යේ = අභික්කමති.
ඉදුණු = පක්ක. 3. —තල්ගෙඩිය = තාලපක්ක. න.
ඉදුරා = උබ්ධ. 3
ඉබ්බා = කුම්ම. පු.
ඉරයි = දාලෙති; විදාරෙති.
ඉරබසිනතෙක් = යාව සුරියත්ථංගමනා.
ඉරා = විදාරෙත්වා; ඵාලෙත්වා.
ඉල්වන්නා = ආයාචක. 3.
ඉවත්කරයි = අපනෙති.
ඉවත්වයේ = අපගච්ඡති, අපෙති, අපක්කමති.
ඉවත්ව = අපක්කම්ම. පූ. ක්‍රි.
ඉවතදමයි = ඡඩ්ඩෙති.
ඉවසයි = අධිවාසෙති, ඛමති.
ඉවුරඅසළ හැසිරෙන = අනුතීරචාරී. 3.
ඉසියි = සිඤ්චති.
ඊට ආසන්නවූ = තදනන්තර. 3.
ඊෂ්‍යාඇති = ඉස්සුකී. 3.
උකුස්සා = සෙන, කුලල. පු.
උගතයුතු = උග්ගණ්හිතබ්බ. 3.
උගත් = සුතවන්තු. 3

උගනී = උග්ගණ්හාති, සික්ඛති.
උගන්වයි = සික්ඛාපෙති.
උඩකොටස = උපරිමභාග. පු.
උඩගු = උද්ධත. 3.
උඩත්පිරිසයෙන් = උපරිම කොටිතො. නි.
උඩනගී = උග්ගච්ඡති.
උඩබලයි = උල්ලොකෙති.
උඩුකුරුකරයි = උක්කුජ්ජෙති.
උණපඳුර = වෙළුගුම්බ. පු
උණපලුව = වංසපෙසිකා. ඉ,
උණුකිරීමට=පචිතුං,තාපෙතුං.නි.
උත්තරය = පටිවචන. න.
උත්තරලියුම = පටිසාසන. න.
උත්සාහකරයි=උස්සහති, වායමති, පරක්කමති.
උත්සාහවත්කරයි = උය්‍යොජෙති, උස්සාහෙති.
උතුම්ගුණැති = උත්තමගුණයුත්ත. 3.
උතුම් රජගෙවල් ඇති = වරරාජගහ. 3.
උතුරෙන් = උත්තරතො. නි.
උදාරවූ = උළාර. 3.
උදුන = උද්ධන. න.
උදෑසන්බත = පාතරාස. පු.
උපක්‍රමය=උපාය, උපක්කම. පු.
උපදී = උප්පජ්ජති, නිබ්බත්තති, ජායති.
උපන්පෙදෙස = ජාතභූමි. ඉ.
උපස්ථානකරයි = උපට්ඨාති.
උපස්ථානකොට = උපට්ඨහිත්වා; උපට්ඨිය.
උපාධ්‍යාය = උපජ්ඣාය පු.
උපුල්වැව = උප්පලවාපි. ඉ.
උපුටාගත් = උද්ධට. 3.
උයන = උය්‍යාන. න.

උවැසිය = උපාසිකා. ඉ.
උෂ්ණරට = උණ්හදෙස. පු.
උස් = උච්ච, උන්නත, උත්තුංග. 3.
උසස් = උළාර, උත්තම. 3.
උසුලයි = වහති, ධාරෙති.
උසුලන්ට = වහිතුං. නි.
උළු = ඡදනිට්ඨකා. ඉ.
එක් එක් අයවිසින් = එකමෙකෙන.
එක්දවසක්=එකදා, නි.එකදිවස පු
එක්රැස්ව = සංගම්ම; සමාගන්ත්වා. පු. ක්‍රි.
එක්වරකදී = එකවාරෙ.
එක්සියවිසිරියන් දිගැති = වීසංරතනසතායාම. 3.
එකෙණෙහි = තංඛණෙ.
එතරවන්ට = තරිතුං. නි.
එතරවී = උත්තරිත්වා.
එතරවේ = තරති, උත්තරති.
එතැන් සටන් = තතො පට්ඨාය.
එත්සාල් = එලා. ඉ.
එන = ආගච්ඡන්ත. 3.
එරඬු = එරණ්ඩ. පු.
එල්වයි = ඔලම්බෙති, ලග්ගෙති,
එල්ලී = ඔලම්බිත්වා. පු. ක්‍රි.
එල්වේ = ඔලම්බති.
එවැනි = තාදිස; තථාවිධ. 3.
එසේ නම් = යජ්ජෙවං. නි.
එසේය කියයි = පටිස්සුණාති.
එළඹේ = උපසංකමති.
එළා = අත්ථරිත්වා. පු. ක්‍රි.
එළිපත්ත = උම්මාර. පු.
එළියකළ බැවින් = ඔභාසිතත්තා. නි.
එළුමස් = එළකමංස. න.
ඒ = ත. 3.
ඒ ඒ තැන = තත්ථ තත්ථ.

ඒම = ආගමන. න.
ඒ සඳහා = තදත්‍ථාය.
ඓශ්වර්යමදය = ඉස්සරියමද. පු.
ඔට්ටුව = අබ්භුත. න.
ඔබ ඉදිරියෙහි = තවාභිමුඛෙ.
ඔරලෝසිය = හොරාලොචන. න.
ඔවුනොවුන් = අඤ්ඤමඤ්ඤං
ඔසවයි = උක්ඛිපති.
ඔසවාගනියි = පග්ගණ්හාති.
ඕනෑකම ඇති = අත්‍ථික. 3.
ඕනෑවූ = ඉච්ඡිත. 3.
ඖෂධ ගුණය = ඔසධගුණ. පු.
කට්පාඩම් කරයි = වාචුග්ගතං කරොති.
කටරොළු = ගිරිකණ්ණි. ඉ.
කටියි = කන්තති.
කටුව (කබල) = කටාහ. පු.
කඩකඩ = ඛණ්ඩාඛණ්ඩික. 3.
කඩු අතේ ඇති = අසිහත්‍ථ. 3.
කණුව = ථම්භ. පු.
කතුර=කත්තරිකා. ඉ. පිප්ඵල න.
කථාකරන්ට = සල්ලපිතුං. නි.
කථාකරයි = සල්ලපති.
කඳවුර = ඛන්ධාවාර. පු.
කප්රුක = කප්පරුක්ඛ. පු.
කපටිකම = සාඨෙය්‍ය. න.
කපටියා = සඨ. පු.
කපයි = ඡින්දති; ලායති
කපන්ට = ලායිතුං. නි.
කපන්නා = ලායක. පු.
කපන = ඡින්දන්ත. 3
කම්පාකරයි = ධුනාති, කම්පෙති, චාලෙති.
කම්පාවේ = කම්පති.
කම්බිලිය = කම්බල. න.
කමත = ඛල. න.
කරත්තය = සකට. පු.

කරන්නා = කත්තු. පු.
කරනලද = කත. 3.
කරනුලැබේ = කරීයති.
කරනුකැමති = කාතුකාම, 3.
කරවූ = කාරාපිත. 3.
කර්කශ = කක්ඛළ. 3.
කර්මාන්තය = කම්මන්ත. පු. න.
කල්ඇතිවම = කාලස්සෙව. නි.
කල්ගතකොට = චිරායිත්වා. පූ ක්‍රි
කල්යවයි = වීතිනාමෙති.
කලකිරේ = නිබ්බින්දති.
කලහය = කොලාහල. පු.
කලින් කල = කලෙන කාලං.
කවටකම = පරිහාස. පු.
කවයි = ඛාදාපෙති.
කවර = කතම. 3
කවර ලෙසින් = කෙනාකාරෙන.
කවර ස්ත්‍රියක් = කතමා ඉ.
කවරහෙයකින් = කස්මා. නි
කවිත්වය = කවිත්ත. න.
කවුඩු දෙන = කාකී. ඉ
කෂාය = කසාය න.
කස්තුරි = කත්‍ථූරිකා. ඉ.
කසල = කචවර. පු.
කළය = ඝට. පු
කහවණුව = කහාපණ. න.
කළබත්කිස ඇති = කතභත්තකිච්ච. 3.
කළු = කාළ. 3.
කාමරය = ගබ්භ. පු.
කාලය = සමය, කාල. පු,
කිඳබසී = නිමුජ්ජති.
කිඳුරා = කින්නර පු
කිපී = කුජ්ඣිත්වා. පූ ක්‍රි.
කිපුණු = කුද්ධ. 3
කියන්ට = වත්තුං නි.
කියනුකැමති = වත්තුකාම. 3

**කියමින්** = වදන්ත; කථෙන්ත. 3.
**කියයි** = වදති, භාසති, භණති, කථෙති, බ්‍රෑති, ආචික්ඛති.
**කියවන්ට** = වාචෙතුං. නි.
**කිරයි** = තුලෙති.
**කිරි** = ඛීර, න. පය. පු. න.
**කිලිටි** = කිලිඨ.
**කිසිවක්** = කිඤ්චි. නි.
**කිහිරිදර** = ඛදිරදාරු. න.
**කී** = වුත්ත. 3.
**කී ආකාර ඇති** = යථාවුත්ත. 3.
**කීකරු** = සුවච; වචනකර. 3.
**කී දිනක්** = කතිදිවස. පු.
**කීපදිනකින්** = කතිපාහෙන.
**කීම** = භාසිත, න. කථා. ඉ.
**කීවේය** = ආහ; අභාසි; කථෙසි; අවදි.
**කුඩා ළමයා** = බාලදාරක. පු.
**කුඩාකල්හි** = දහරකාලෙ.
**කුඩා මහත් අතු ඇති** = සාඛාවිටපසම්පන්න 3.
**කුඩා සතා** = ඛුද්දජන්තු. පු.
**කුඩිම්බිය** = චූලා; සිඛා. ඉ.
**කුමක් පිණිස** = කිමත්ථාය.
**කුඹුර** = ඛෙත්ත; කෙදාර. න.
**කුල්ල** = සුප්ප. පු.
**කුල දූ** = කුලධීතු. ඉ.
**කුස්සිය** = රසවතී. ඉ.
**කුළු ගොණා** = කූටගොණ. පු
**කුහුඹියා** = කිපිල්ලිකා. ඉ.
**කුළුරසැති** = කටුකරස. 3.
**කූඩුව (කුරුලු)** = කුලාවක.
**කෘත්‍යයෙහි යෙදුණු** = කිච්චපපසුත. 3.
**කෙත** = ඛෙත්ත. න.
**කෙඳිරිගාමින්** = නිත්ථනන්ත. 3
**කෙබඳු** = කීදිස. 3.
**කෙලෙස** = කථං. නි.
**කෙසෙල්** = කදලි. ඉ.
**කෙළවර කරන්ට** = අන්තංකාතුං.
**කේශධාතු** = කෙසධාතු ඉ.
**කෛලාශකූටය වැනි** = කෙලාසකූටපටිභාග. 3.
**කොට්ටය** = බිම්බොහන. න.
**කොටමින්** = කොට්ටෙන්ත. 3.
**කොටයි** = කොට්ටෙති.
**කොටළුවා** = ගද්‍රභ. පු.
**කොටළු හඬ** = ගද්‍රභරව. පු.
**කොටා** = කොට්ටෙත්වා. පූ ක්‍රි.
**කොණ** = කොණ පු. කොටි. ඉ.
**කොතැන** = කත්ථ. නි.
**කොපමණ** = කිත්තක. 3.
**කොමල** = කෝමල. 3.
**කොපි පොත** = ලිපිපරිචය පොත්ථක. න.
**කොහේ** = කත්ථ; කුහිං, කහං. නි.
**කෝප කරවයි** = කොපෙති, රොසෙති.
**කෝපාවිෂ්ටවූ** = කොපාවිඨ. 3.
**කෞතුක භාණ්ඩ** = කුතුහල භණ්ඩ. න.
**කෞතුකාගාරය** = කොතුහල සාලා. 3.
**කැඩුනබැවින්** = භින්නත්තා. නි.
**කැඳවයි** = පකොසති.
**කැඳවවයි** = පකොසාපෙති.
**කැපකරුවා** = කප්පියකාරක. පු.
**කැමැත්තක් කළහැකි** = යථාකාමකරණීය. 3.
**කැමතිවේ** = ඉච්ඡති.
**කැලඹේ** = සංඛුභති.
**කැහැසීය** = උක්කාසෙසි; උන්නාදි
**කෑ බව** = ඛාදිතභාව. පු.
**කෑම හා ඇඳීම** = ඝාසච්ඡාදන. න.

කැල්ල = ඛණ්ඩ. පු
කැවේය = ඛාදි, භුඤ්ජි.
ක්‍රිස්තෝතපත්තිය=කිච්ඡුප්පත්ති. ඉ
ක්ෂත්‍රියවංශික = ඛත්තිය. 3.
ඛාද්‍ය - භොජ්‍ය = ඛජ්ජ
භොජ්ජ. න.
ඛේදයට පත් = ඛේදප්පත්ත,
විසාදප්පත්ත. 3.
ගඩොල් = ගිඤ්ජකා. ඉ.
ගත් = ගහිත; ආදින්න. 3.
ගත් මිල = කීතමූල. න.
ගතකරයි = වීතිනාමේති.
ගඳ බලයි = සායති.
ගනී = ගණ්හාති; ආදති.
ගම්දොර = ගාමද්වාර. න.
ගමක්තිබුණතැන= ගාමඨාන න.
ගර්ජනා කෙරේ = ගජ්ජති.
ගල්ලෑල්ල = සිලාපත්ථර. න.
ගව දෙන = ගාවී. ඉ.
ගස්වැල් වගී = භූතගාමජාති. ඉ.
ගසා = පහරිත්වා. පු. ක්‍රි.
ගළපමින් = සටෙන්ත. 3.
ගිනි දැල්වීම = අග්ගිජාලන. න.
ගිය මස = ගතමාස. පු.
ගියේය = පායාසි, අගමි, අගච්ඡි.
ගිරවා = සුක, කීර. පු.
ගිලන් උපස්ථානය = ගිලානො
පට්ඨාන. න.
ගිලන්කම = ගෙලඤ්ඤ. න.
ගිලාබසී = ඔසීදති, සංසීදති,
නිමුජ්ජති.
ගිලියි = ගිලති
ගිලී = නිමුජ්ජිත්වා. පු. ක්‍රි.
ගිහිවීම = ගිහිභාව. පු,
උපසම්පජ්ජන. න.
ගී කියන්නා = ගායක. පු.
ගීකියන්නී = ගායිකා. ඉ.

ගුරු පූජාව = ගුරුපූජා. ඉ.
ගුරුවරයා = ආචරිය. පු.
ගුරුවරිය = ආචරියානී. ඉ.
ගෘහිණිය = ගහපතානී. ඉ.
ගෙඩිය = ඵල. න.
ගෙන්වයි = ආහරාපෙති.
ගෙන්වා = ආහරාපෙත්වා. පු. ක්‍රි.
ගෙන ඒ = ආහරති.
ගෙනගිය = හට; නීත. 3.
ගෙය = ඝර; ගෙහ; නිවෙසන. න
ගෙයි හිමියා = ඝරසාමික. පු.
ගොඩ = ථල. න.
ගොඩ ගසයි = රාසීකරොති.
ගොඩ ගසා = රාසීකත්වා. පු. ක්‍රි.
ගොඩට ඒ = උත්තරති.
ගොඩනංවා = කාරාපෙත්වා.
මාපෙත්වා පු. ක්‍රි.
ගොනයි = ගණේති.
ගොයම් කැපීම = සස්සලායන. න.
ගොයිතැන = සස්සකම්ම. න.
ගොලුවා = මූග. පු.
ගොවියා = කස්සක. පු.
ගෝත්‍රය = ගොත්ත. න.
ගෝනුස්සා = විච්ඡික. පු.
ගෞරවය=ගාරව; නිපච්චාකාර.පු.
ගෞරව පෙරදැරිව = ගාරව
පුබ්බඞ්ගමං. ක්‍රි. වි.
ගැනීම පිණිස = ගහණත්ථාය.
ගැඹුරු = ගම්භීර. 3.
ගැඹුරේහැසිරෙන = ගම්භීරචාරී. 3.
ගැල් අසුවක් පමණ = අසීතිස
කටමත්ත. 3.
ගැලෙන්ට (=ගිලෙන්ට) = නිමුජ්ජි
තුං.
ගැවසීගත් = චුට; පරිකිණ්ණ,
ආකිණ්ණ. 3.
ගැසුවේය = පහරි,

ග්‍රීසිය = යොනකලොක. පු
චාරිකාව = චාරිකා. ඉ.
චිකිත්සාකර්මය=තිකිච්ඡකකම්ම. න.
චෛත්‍ය වන්දනාව = චෙතිය වන්දනා ඉ.
ජනපද වැසියා = ජානපදික. පු.
ජනේලය = කවාට, වාතපාන. න.
ජලය නැති = නිරුදක. 3.
ජලසන්නිය = විසූචිකා ඉ.
ජලාශය = ජලාලය. පු.
ජාතිය = ජාති. ඉ.
ජීවත්වේ = ජීවති; ධරති.
ජීවමාන = ධරමානක. 3.
ජීවිකාවකරයි = ජීවිකං කප්පෙති
ටිකක් = ථොකං.
ඩැහැ = ඩසිත්වා. පූ ක්‍රි.
තක්සලාව = තක්කසිලා. ඉ.
තට්ටු කරයි = ආකොටෙති.
තට්ටුව = භූමිකා. ඉ.
තද = ථද්ධ. 3.
තනිව හැසිරෙන = එකචාරික 3.
තමා සෑදූ = සයංකත. 3.
තරඟය = යුගග්ගාහ. පු.
තරුණයා = මාණවක. පු.
තර්ජනය කරයි = තජ්ජෙති, සන්තජ්ජෙති.
තල් කොළය = තාලපණ්ණ. න.
තල් ගස = තාලරුක්ඛ. පු.
තල් ගෙඩිය = තාලඵල. න.
තල්වල්ල = තාලපිණ්ඩි. ඉ.
තල = තිල. න.
තවලම = සත්ථ පු.
තළා = පොථෙත්වා. පූ. ක්‍රි.
තාපසිය = තපස්සිනී, තාපසී. ඉ.
තියුණු = තිඛිණ. 3.
තිරිසනා = තිරච්ඡාන; පසු. පු.

තිස්යොදුන් ඇති = තිංසයොජනික 3.
තීරණය කරයි = තීරෙති
තුට්ටුව = කාකණිකා. ඉ.
තුටුපඬුර = තුට්ඨිපාභත. න.
තුන්වරක් = තික්ඛත්තුං. නි.
තුන්සිවුර = තිචීවර. න.
තුඹස = වම්මික. පු.
තුවාල ලැබූ = ලද්ධප්පහාර; ඛතසරීර. 3.
තෘප්තියට නොපත් = අතිත්ත 3.
තෙමහල් = තිභූමක. 3.
තෙල් = තෙල. න.
තොට = තිත්ථ. න.
තොර කරයි = වොරොපෙති.
කොරකරන්නා = වොරොපෙතු. පු.
තොරතුරු = පවත්ති. ඉ.
තෝරා = උච්චිනිත්වා. පූ. ක්‍රි.
තැන්පත් කරයි = පටිසාමෙති.
තැපැල්කාර්‍යාලය = සාසනපණ්ණාගාර; න.
තැබිය යුතු = ඨපෙතබ්බ. 3,
තැබෑරුම = පානමන්දිර. න.
දක්වයි = දස්සෙති.
දකුණු දොරටුව = දක්ඛිණද්වාර න.
දකුණු පලාත = දක්ඛිණදෙස. පු.
දකුණු පැත්ත = දක්ඛිණපස්ස. පු.
දකුණෙන් = දක්ඛිණතො. නි.
දක්ෂ = දක්ඛ; පටු; කුසල. 3.
දනව්ව = ජනපද පු.
දන්වයි = නිවෙදෙති, ආරොචෙති
දනහිස = ජණ්ණුක. න.
දන්නාලද = විදිත, ඤාත. 3.
දනින් වැටී = ජණ්ණුහි නිපතිත්වා.
දනියි = ජානාති.
දමනය කරයි = දමෙති.
දමනුලැබේ = පක්ඛිපීයති.

දඹකොළ පටුන = ජම්බුකොළ පට්ටන. න.
දඹදිව = ජම්බුදීප. පු.
දරයි = ධාරෙති.
දරන = ධාරක. 3.
දරුවා = දාරක. පු.
දල්වයි = ජාලෙති.
දවයි = ඣාපෙති, දහති.
දවල්කෑම = දිවාභත්ත. න.
දවස්පතා = දෙවසිකං, පතිදිනං, ක්‍රි. වි.
දෂ්ට කරයි = ඩසති.
දහනවය = එකූනවීසති. ඉ.
දහම්පහන = ධම්මදීප. පු.
දහම්පොත = ධම්මපොත්ථක. පු.
දහසක් ඇස්ඇති = දසසත නයන 3.
දළමුල = දාඨාමූල. න.
දික් = දීඝ; ආයත 3.
දිනක්පාසා = පච්චාහං, පතිදිනං, ක්‍රි වි.
දියබල්ලා = උද්ද. පු.
දියයුතුබව = දාතබ්බතා. ඉ.
දිරවයි = ජීරෙති
දිරායයි = ජීයති; ජීරති
දිවිදෙන = දීපිනී, ඉ
දිවුල් = කපිත්ථ, පු
දිව්‍යමල්ගුලිය=දිබ්බමාලා ගුළ න.
දීමෙහි ඇලුණු = දානරත, 3
දීර්ඝජීවනය = දීඝජීවන, න.
දුක්ඇති ජීවිතය=දුක්ඛජීවිත. න.
දුකසේ = කිච්ඡෙන; දුක්ඛං, ක්‍රි. වි.
දුන් තීන්දුව = දින්න විනිච්ඡය, පු.
දුන් නම = දින්නනාම, න
දුම්දමන = ධූපායන්ත, 3.
දුම්රිය = ධූමරථ, පු.
දුරනැන = දූරට්ඨාන, න.
දුරුකරයි = පරිවජ්ජෙති; ජහාති; පජහති, නිද්ධමති.
දුර්ලභ = දුල්ලභ 3.
දුවන = ධාවමාන, 3.
දුෂ්කරවූ = දුක්කර, 3.
දුෂ්ට ක්‍රියාව = දුට්ඨකම්ම, න.
දූෂණය කරයි = දූසෙති.
දෙඅතින් = උභොහි හත්ථෙහි.
දෙගුණවූ = දිගුණ, 3.
දෙතුන්දිනක් = ද්වීහතීහ, න.
දෙදෙන = උභො.
දෙදෙනගේ = උභින්නං, ද්වින්නං.
දෙනලද = දින්න, 3.
දෙකෝටියක් පමණ = ද්විකොටිමත්ත. 3.
දෙන්නා = දායක; දාතු. පු.
දෙමින් = දදමාන, 3
දෙයොදුන්තැන = ද්වියොජනට්ඨාන, න.
දෙල් = ලබුජ, පු.
දෙව්රම්වෙහෙර = ජේතවන විහාර, පු.
දෙවගන = දෙවච්ඡරා, ඉ.
දෙවීය = දාපෙසි.
දෙවෙනිදා = දුතිය දිවස, පු.
දේවස්ථානය = දෙවායතන, න.
දොඩම් = ජම්බීර, න.
දොරකොටුව = ද්වාරකොට්ඨක, පු. ගොපුර, න.
දොරටුපාලයා = ද්වාරපාල, පු.
දොවින්ට = දොහිතුං.
දොස්නැති = අනඞ්ගණ, 3.
දොළොස්කෝටිය = ද්වාදස කොටි, ඉ.
දොළොස්හැවිරිදි=ද්වාදසවස්සික 3.
ද්‍රෝහකරයි = දුබ්භති.

දැකීම = දස්සන, න.
දැඩි = දළ්හ, 3
දැඩිසේ = දළ්හං; බාළ්හං, ක්‍රි. වි.
දැත්විය = ආරොවෙසි.
දැත්වියයුතු = ආරොචෙතබ්බ, 3.
දැනගනී = විජානාති
දැනගෙන = ජානිත්වා; අඤ්ඤාය; සංවිච්ච, පූ. ක්‍රි.
දැනුම්දෙයි = නිවෙදෙති; පටිවෙදෙති; ආරොචෙති
දැමූ = පක්ඛිත්ත, 3
දැරිය = දාරිකා, ඉ.
දැල්වේ = ජලති.
දැල්වෙන = පජ්ජලන්ත. 3.
දැල = ජාල, න.
දෑකැත්ත = දාත්ත, අසිත. න.
ධනයනැති = අස්සක; නිද්ධන; අධන; දළිද්ද. 3.
ධනවියදම = ධනබ්බය. පු.
ධර්මයෙහි අනන්තගීන = ධම්මනෙත්තාගධ 3.
ධර්මාශනය = ධම්මාසන, න.
ධාන්‍ය = ධඤ්ඤ, න.
ධාන්‍ය කන = ධඤ්ඤඛාදක, 3.
නගරශාලාව = සන්ථාගාර, පු. න.
නගර ශෝධකයා = නගර සොධක. පු.
නගරසභාව = නෙගම. පු.
නගරාධිපතියා = නගරගුත්තික. පු.
නගුට = නංගුඨ. න.
නගුල = නඞ්ගල. න.
නටයි = නච්චති.
නඩුව = අට්ට. න.
නපුරු = චණ්ඩ. 3.
නම්ලැයිස්තුව = නාමාවලී. ඉ.
නවත්වනලද = නිවත්තාපිත. 3.
නවමහල් = නවභූමක. 3.
නවතියි = නිවත්තති.
නසන = විධංසක, විනාසක. 3
නසයි = ඝාතෙති, හනති, පරිපාතෙති, නාසෙති.
නසියි = නස්සති
නහර ඉල්පුණු = ධමනිසන්ථත 3.
නළුමාගීය = නළමග්ග පු.
නංවයි = උඨාපෙති, ආරොපෙති.
නංවා = ආරොපෙත්වා. පූ ක්‍රි.
නාගස = නාගරුක්ඛ. පු.
නාදකරයි = රවති, නදති, ඝොසෙති.
නායකයා = නෙතු; නායක. පු.
නාවයි = නහාපෙති
නාස්ලණුව = නාසාරජ්ජු. ඉ.
නික්මුණු = නික්ඛන්ත; නිග්ගත, 3.
නික්මෙන = නික්ඛමන්ත. 3.
නිතර = නිච්චං; සතතං; අභිණ්හං; නිබද්ධං, නිරන්තරං ක්‍රි. වි.
නිදන්කරයි = නිදහති.
නිදන්ට = සයිතුං. නි.
නිදහස්වේ = මුච්චති.
නිදුක් = නිද්දුක්ඛ. 3.
නිදෙස් = නිද්දොස 3.
නින්දාකරයි = නින්දති; පරිභවති.
නිමවයි = නිඨාපෙති.
නිම්කල්හි = නිඨිතෙ.
නියග = නිදාඝ, පු.
නියම්කළ = නියමිත, 3.
නියමකොට = නියමෙත්වා, පූ. ක්‍රි.
නිරාහාරවූ = නිරාහාර. 3.
නිරුත්තරවූ = අනුත්තර. 3.
නිරෝගීබව = ආරෝග්‍ය; න.
නිර්ධනයා = නිද්ධන. පු.

නිවුණු = නිබ්බුත. 3.
නිශ්චයකරයි = නිවෙජති.
නිසා = නිස්සාය. නි.
නිසැකසේ = නිස්සංසයං. ක්‍රි. වි
නුගුණ =අගුණ. පු
නුදුරුතැන = අවිදූරඨාන. න.
නුවණැත්තා = මෙධාවී. පු.
නුවණැත්තී = පඤ්ඤවතී; මෙධාවිනී. ඉ
නුවර වැසියා = නගරවාසී පු.
නූගත් = අස්සුතවන්තු 3.
නෘත්‍යබැලීම = නච්චදස්සන. න.
නෘත්‍යශාලාව = නච්චසාලා. ඉ
නෙරපයි = නිකකඩ්ඪති
නෙරපූ = නිකකඩ්ඪිත; නීහට; 3.
නෙලුම් = පදුම. න.
නොඅඩු = අනූන, අවිකල 3.
නොඒම = අනාගමන. න.
නොකරව් = මා කරිත්ථ.
නොකල්හි =අකාලෙ.
නොකෑම = අනසන. න.
නොකෑබව = අඛාදිතභාව. පු.
නොගන්නා = අගණ්හන්ත. 3.
නොදත් = අඤ්ඤත; අවිදිත. 3
නොදෙවා = අදපෙත්වා. පු. ක්‍රි.
නොබෝකලකින් = න චිරස්සං, නි

නොවිචාරා =අනාපුච්ඡා. පු ක්‍රි.
නොසතුටු සිතැති = අත්තත මන. 3.
නොසිට = අඨත්වා. පු. ක්‍රි.
නොසැලකීමෙන් = අවඤ්ඤය.
නොහොබනා = අසොභන. 3.
නොහැකිවූ = අසක්කොන්ත. 3.
නොහැකිවිය = නාසක්ඛි.
නොහැකිබැවින් = අසක්කු ණෙය්‍යන්තා. නි.
නැකත = නක්ඛත්ත. න.
නැග = ආරුහිත්වා පු. ක්‍රි.
නැගිටියි = උඨහති; උඨාති.
නැගිටුවයි = උඨාපෙති.
නැගුණු = ආරුළ්හ. හ.
නැගෙනහිරින් = පුරත්ථිමතො; පාචීනතො. නි.
නැගේ = ආරුහති.
නැතිකල්හි = අසන්තෙ, අසති.
නැතිකමින් = අභාවෙන.
නැන්දම්මා = සස්සු. ඉ
නැන්දා = මාතුලානී. ඉ
නැමේ = ඔනමති.
නැව්තොට = නාවාතිත්ථ. න.
නැවත විචාරයි= පටිපුච්ඡති.
නැවතුණේය = නිවත්ති.
~~නැසූ = හත; සමූහත; නාසිත 3.~~

නොමිලයේ = නිම්මූලෙන.
නොයන කල = අගච්ඡන්තෙ.
නොයෙක් = විවිධ; නානාවිධ. 3.
නොයෙක්ආකාර = නානප්පකාර; විවිධාකාර. 3.
නොයෙක් උතුම් රසැති - නානග්ගරස. 3.
නොයෙක්ලක්ෂගණන් = අනෙකසතසහස්සසංඛ. 3.
නොලැබූ බැවින් = අලබ්භනාය.

නැසේ = නස්සති; විනස්සති.
නෑනා = නනන්දු. ඉ.
නෑම්පිණිස = නහායිතුං. නි.
පක්ෂඝාතරෝගය=පක්ඛඝාත. පු
පටන්ගනී = ආරභති.
පටරෙද්ද = කොසෙය්‍යවත්ථ. න.
පණවනලද = පඤ්ඤත්ත. 3.
පණවයි = පඤ්ඤපෙති.
පඬු = රජත. න.
පඬුඔරුව= රජතදොණී. ඉ.

පඹුපොවයි = රජති; රඤ්ජෙති.
පතයි = පත්ථෙති.
පතමින් = පත්ථෙන්ත. 3.
පතුරුවයි = පත්ථරති; ව්‍යාපෙති.
පතුරු වන = පත්ථරන්ත. 3.
පඳුර = ගුම්බ. පු.
පමුණුවනලද = පාපිත. 3.
පර්තකූටය = පබ්බතකූට. න.
පර්සියාව = පාරසිකදෙස. පු.
පරදවයි = පරාජෙති.
පරදේශය = පරදෙස. පු.
පරමල් = මිලාතපුප්ඵ. න.
පරාදය = පරාජය. පු
පරිබ්‍රාජකයා = පරිබ්බාජක. පු.
පරිහාසකරමින් = පරිහසන්ත. 3.
පරෝපකාරය = පරත්ථ. පු.
පලගැටියා = සලභ; පටඞ්ග. පු.
පලස = කොජව. පු.
පලාකොළ = සාකපණ්ණ. න.
පලාගියේය = පලායි
පලායන්ට = පලායිතුං නි.
පව්කාර = පාපකාරී; පාපිඨ. 3.
පවත්නාකල්හි = පවත්තමානෙ.
පවත්වනු ලබන = පවත්තාපියමාන. 3.
පවත්සලයි = වීජෙති
පව්ටු = පාපිඨ; දුඨ 3.
පව්ටු සවභාව ඇති = පාපධම්ම 3.

---

පවුල = කුල; කුටුම්බ. න.
පස්කෝටියක්පමණ = පඤ්චකොටිමත්ත. 3.
පසුදා = පුනදිවස. පු.
පසේබුදුනම = පච්චෙකබුඩ. පු.
පහත් = නීච; ලාමක; ඔමක. 3.
පහවූ මලඇති = වීතමල. 3.
පහසු = සුකර. 3.

පහළවූ = පාතුභූත. 3.
පහුර = උළුම්ප; කුල්ල. පු.
පළමුඑම = පඨමාගමන. න.
පළවිය = පක්ඛුදයිත්ථ.
පාගයි = අක්කමති
පාගවා = මද්දපෙත්වා. පු. ක්‍රි.
පාතාලය = අධොභුවන. න.
පාපමිත්‍රයා = පාපමිත්ත. පු.
පාරඅසළ = මග්ගපස්ස
පාලිභාෂාව = පාළිභාසා. ඉ
පාවේ = වුය්හති.
පිඟාන = කංස. පු.
පිටත්කරයි = පෙසෙති, උය්යොජෙති.
පිටත = බහිඩා; බහි. නි.
පිටතට ගෙන = නීහරිත්වා; නික්ඛාමෙත්වා පූ. ක්‍රි
පිටවේ = නිග්ගච්ඡති; නික්ඛමති.
පිටිසරවැසි = පච්චන්තවාසී. 3.
පිත = පිත්ත. න
පිදුරු = පලාල. න. පු.
පිත්වත් = භවන්ත 3.
පිපේ = පුප්ඵති; විකසති.
පිබිදේ = පබුජ්ඣති.
පිඹියි = ධමති.
පිඹිමින් = ධමන්ත. 3.
පියරජ = පිතුරාජ. පු.
පිරිවරයි = පරිවාරෙති.
පිරිසමැද = පරිසමජ්ඣෙ.

---

පිරිමදී = පරිමජ්ජති.
පිරිහුණු = පරිහීන; ජීන 3.
පිරිහේ = හායති; පරිහායති.
පිසනුලැබේ = පච්චති.
පිසවන = පාචෙන්ත. 3.
පිහාටුපැන = පත්තනාළ [ලෙඛනී. ඉ.
පිහිටයි = පතිඨාති.

පිහිටි = පතිට්ඨිත. 3.
පිහිටුවයි - පතිට්ඨාපෙති.
පිහියානලය = වාසිඵල. න.
පිහියාමිට = වාසිජට;
වාසිදණ්ඩක. න.
පිළිගැනීම = පටිග්ගහණ. න.
පිළිදූගුම්කරයි = පටිජග්ගති.
පිළිපදී = පටිපජ්ජති.
පිළිමගෙය = පටිමාඝර. න.
පිළිබිඹුවූ = පටිබිම්බිත. 3.
පිළියම්කරයි = තිකිච්ඡති.
පිළියම්කළනොහැකි = අතෙකිච්ඡ. 3.
පිළියෙළකරයි = පටියාදෙති
පිළියෙළකිරීම = පටියාදන. න
පිළිවෙළින් = අනුපුබ්බෙන.
ක්‍රි. වි.
පිළිසඳර = පටිසන්ථාර. පු.
පුදනුලබන = පූජියමාන. 3.
පුරවයි = පූරෙති; පරිපූරෙති.
පුරුද්ද = පරිචය. පු.
පුවක් = පූග. න. පු.
පුසුල් = කුම්භණ්ඩ. පු.
පුස්තකාලය = පොත්ථකාගාර. න.
පෘථග්ජනයා = පුථුජ්ජන. පු.
පෙනෙන = දිස්සමාන. 3.
පෙනේ = පඤ්ඤායති; දිස්සති.
පෙබරවාරිමාසය = මාඝමාස. පු.
පෙර = පුරා; පුරෙ; අතීතෙ.
පෙරළයි = පරිවත්තෙති.
පෙරළෙමින් = සම්පරිවත්තමාන. 3.
පෙරෙව් = පාරුත. 3.
පෙළයි = පීළෙති; හිංසති.
පොත්ත = තච. පු.
පොදිය = භණ්ඩිකා. ඉ.

පොරොන්දුව = පටිඤ්ඤා. ඉ.
පොරොන්දුකැඩීම=පටිඤ්ඤාභංග පු.
පොරොවා = පාරුපිත්වා.
පොල්ගස = නාළිකෙරතරු. පු.
පොල්මදය = නාළිකෙර
මිඤ්ජ. න.
පොල්ල = දණ්ඩක; මුග්ගර. පු
පොලා = පප්ඵොටෙත්වා. පූ. ක්‍රි.
පෝෂණය කරයි = පොසෙති.
පොසොන් පසළොස්වක = ජෙට්ඨ
පුණ්ණමී ඉ.
පොහෝනා = පහොන්තක. 3.
පැකිලෙයි = පක්ඛලති.
පැණි = ඵාණිත න.
පැතිරේ = පත්ථරති.
පැන = පක්ඛන්දිත්වා; උල්ලංඝිත්වා
පූ. ක්‍රි.
පැනදුවයි = පක්ඛන්දති.
පැනනගී = උබ්බිජ්ජති.
පැමිණ=පත්වා; පාපුණිත්වා. පූ. ක්‍රි.
පැමිණි = පත්ත. 3.
පැමිණිබව = සම්පත්තභාව. පු
පැමිණියේය = ආපජ්ජි; පාපුණි.
පැමිණේ = පප්පොති; පාපුණාති.
පැලගොයම = තරුණසස්ස. න.
පැලැන්දූ = පිළන්ධිත 3.
පැලැටිය = ගච්ඡ. පු.
පැවිද්ද බලාපොරොත්තුවන්නා
= පබ්බජ්ජාපෙක්ඛක. පු.
පැවිද්ද = පබ්බජිත; සමණ. පු.
පැවිදිකොට = පබ්බාජෙත්වා.
පැවිදිවීමට = පබ්බජිතුං; පබ්බජ්ජාය.
පැවැත්තේය = පවත්තිත්ථ.
පැහැරගනී = අච්ඡින්දති.
පෑන = ලෙඛනී.

පැත්තලය = ලෙඛනීමුඛ. න.
ප්‍රකටබව = පාකටත්ත න.
ප්‍රකාශකරයි = පකාසෙති.
ප්‍රකෘතිමත්කරයි = පටිසංඛරොති; පාකතිකං කරොති.
ප්‍රතිපත්තිය = පටිපත්ති. ඉ.
ප්‍රතික්ෂෙපකරයි = පච්චක්ඛාති; පටික්ඛිපති.
ප්‍රත්‍යන්තය = පච්චන්ත. පු.
ප්‍රදක්ෂිණාකරයි = පදක්ඛිණං කරොති.
ප්‍රතිරූපය = පටිබිම්බ. පු.
ප්‍රථමකල්පික = පඨමකප්පික. 3.
ප්‍රථමයාමය = පඨමයාම. පු.
ප්‍රමාණය = පමාණ. පු. මත්තා. ඉ.
ප්‍රමාණවත් = පමාණයුත්තක. 3.
ප්‍රමාදවේ = චිරායති.
ප්‍රමාදීවූ = පමත්ත; පමාදී. 3.
ප්‍රමුඛ = පාමොක්ඛ; පමුඛ. 3.
ප්‍රයෝජනය = අත්ථ. පු. පයොජන. න.
ප්‍රවෘත්තිය = පවත්ති; කිංවදන්තී ඉ.
ප්‍රවෘත්තිපත්‍රය = පවත්තිපණ්ණ න.
ප්‍රවේණිය = පවෙණී. ඉ
ප්‍රසාදලැබීම = පසාදලාභ. පු.
ප්‍රාකාරය = පාකාර. පු
~~ප්‍රාසාදපෙළ = පාසාදපන්ති. ඉ.~~
ප්‍රියකරයි = පියායති.
ප්‍රියකථාඇති = පියංවද. 3.
ප්‍රියවූ = පිය. 3.
ප්‍රීතියෙන් පිරුණු = පීති සම්පුණ්ණ. 3.
බක්මස = චිත්තමාස. පු.
බකමූණා = උලූක. පු.
බටවනය = නළවන. න.

බටහිරවැසි = පච්ඡිමදෙසවාසී. 3.
බටහිරින් = පච්ඡිමතො. නි.
බඩසගින් පෙළුණු = ජිඝච්ඡාපීළිත. 3.
බඩු = භණ්ඩ. න.
බඩුමිටිය = භණ්ඩිකා. ඉ.
බණඇසීම = ධම්මසවණ. න.
බණපොත = ධම්මගන්ථ. පු.
බදුගෙවන = බලිකාර. 3.
බබළයි = විරොචති; ඔභාසති; දිප්පති; ජොතති.
බත්ඩක්කා = භණ්ඩාකී ඉ.
බදිමින් (බිත්තිආදිය) = චිනන්ත. 3.
බබළමින් = විරොචමාන. 3.
බබළවයි = පභාසෙති; ජොතෙති; ඔභාසෙති.
බමුණුළමයා = බ්‍රාහ්මණ දාරක. පු.
බඹසර හැසිරෙන = බ්‍රහ්මචාරී. 3.
බරඋසුලන = භාරවාහී. 3
——සතා = වාහකපසු. පු.
බරණැස = බාරාණසී. ඉ.
බලහලද = ඔලොකිත. 3
බළලා = මජ්ජාර; බිළාල. පු.
බලාත්කාරයෙන් = බලක්කාරෙන.
බලාපොරොත්තුවේ = ආගමෙති; ආසිංසති.
~~බස්වයි = ඔතාරෙති.~~
බසී = ඔරුහති; ඔතරති.
බහා = පක්ඛිපිත්වා. පු. ක්‍රි.
බාරදෙනුලැබේ = අප්පියති.
බිත්තිය = භිත්ති. ඉ.
බිඳගෙන = භින්දිත්වා; භඤ්ජිය. පූ. ක්‍රි.
බිඳියි = භින්දති; භඤ්ජති.
බිඳුනබැවින් = භින්නත්තා.

බිඳේ = භිජ්ජති.
බිලිබාන්නා = බාලිසික පු.
බීචේය = පිවි
බුදුන්වැඳීම = බුද්ධවන්දනා. ඉ.
බුද්ධධර්මය = සොගතධම්ම. පු.
බුලත් = තම්බූල. න.
බූගා = වොරොපෙත්වා. පු. ක්‍රි.
බෙදයි = භාජේති.
බෙල්ල = ගීවා. ඉ.
බෙලි = බෙලුව. පු.
බොරු = මුසා නි
බොරුකාරයා = මුසාවාදී. පු
බොල් = භුස. න.
බොල්මිට = භුසමුට්ඨි. පු
බොහෝඋපකාර එළවන = බහූපකාරාවහ. 3.
බොහෝ කලක් ආශ්‍රයකළ = චිරසන්ථුත. 3.
බොහෝකලකපටන් = චිරකාලතො පඨාය.
බොහෝකලකින් = චිරෙන. නි
බෝවෙන = සංකන්තික. 3.
බෞද්ධමහාවිද්‍යාලය = සොගතමහාවිජ්ජායතන. න.
බැට දී = පොථෙත්වා. පු. ක්‍රි.
බැත්දේය = බන්ධි; උපනිබන්ධි
බැස = ඔරුය්හ. පු. ක්‍රි
බැසගනී = අජ්ඣොගාහති; විගාහති.
බැල්ලී = සුනඛී. ඉ
බැළලී = මජ්ජාරී. ඉ.
බෑනා = ජාමාතු. පු.
භ්‍රමණවෘත්තාන්තය = පරියටනවුත්තන්ත. පු.
මකුළුවා = මක්කටක; උණ්ණනාභි. පු
මගට බට = මග්ගපටිපන්න. 3.
මගියා = පථික. පු.
මගුල = මඞ්ගල. න
මඩමත්තෙහි = කලලපිට්ඨෙ.
මඩවතුර = සපඞ්කජල. න.
මඩවයි = මද්දපෙති
මත්තෙහි = උත්තරි; උපරි. නි.
මත්පැන්වගී = මජ්ජජාති. ඉ
මත්ස්‍යයා = මච්ඡ. ඉ.
මදය = මිඤ්ජා. ඉ.
මදුරුවා = මකස. පු,
මධ්‍යදේශය = මජ්ඣදෙස. පු.
මධ්‍යස්ථවේ = උපෙක්ඛති.
මනදෙළ පුරන = මනොරථපූරක 3.
මනවඩන = මනාප 3.
මනාසේ = සක්කච්චං. ක්‍රි වි
මනාසේ නොඉදුණු = නාතිපක්ක. 3
මනාසේ පොරවාගත් = සුපාරුත. 3.
මනාසේ හැදගත් = සුනිවත්ථ. 3.
මන්ත්‍රණ කරයි = මන්තෙති.
මමත්වයකරයි = මමායති.
මරණුලබයි = මාරීයති.
මරා = වධිත්වා; ඝාතෙත්වා පු. ක්‍රි.
මල්අසුන = පුප්ඵාසන න.
මල්රේණු = පුප්ඵරේණු. පු
මල්විලවුන්දරණ = මාලාවිලෙපනධර. 3.
මවයි = මාපෙති; නිම්මිණාති.
මවුපියන්ගේ = මාතාපිතුන්නං.
මස්සිනා = සාළ. පු
මසුරු = මච්ඡරී. 3.
මහම්මදිකයා = මොහමමදික. පු.
මහත්සෘද්ධිඇති = මහිද්ධික. 3.
මහත්ඝෝෂා කරයි = උග්ඝොසෙති

මහත්ලාභය = මහාලාභ. පු.
මහනුවණැති = මහාපඤ්ඤ. 3.
මහර්ෂි = මහෙසි. පු.
මහලුගවයා = ජරග්ගව පු.
මහලුසාවා = වුඩසස. පු.
මහසත්තුමා = මහාපුරිස පු.
මහසෑය = මහාචෙතිය. න.
මහාත්මයා = මහාසය. පු.
මහාමාරිය = අහිවාතකරොග. පු.
මහාවෛද්‍යයා = මහාවෙජ්ජ. පු.
මලඑකකු වැනි = මතසදිස. 3
මලකල = මතෙ.
මලගෙය = මතකඩාන. න.
මාතොට පටුන = මහාතිත්ථ
පට්ටන. න.
මාරුකිරීම = නිමිනන. න.
මාරුකරයි = නිමිනාති.
මිටි = ලකුණ්ටක; රස්ස. 3,
මිණි කොඬොල් = මණි
කුණ්ඩල. න
මිත්‍රබව = මිත්තභාව. පු.
සහායතා. ඉ.
මිත්‍රයා = මිත්ත, සහාය. පු.
මිදුල = ගෙහඞ්ගණ; අජිර. න.
මිදේ = මුඤ්චති
මිලට ගත් = කීත. 3.
මිලට ගතයුතු = කිණිතබ්බ. 3.
මිහිරි රසැති = මධුරරස. 3.
මීඅඹ ගෙඩිය = සහකාරඵල. න
මීගෙඩි = මධුකඵල. න.
මීගොනා = මහිස. පු.
මීමැස්සා = මධුකර. පු.
මුගටියා = නකුල. පු.
මුණුපුරා = නත්තු. පු.
මුද්දිරප්පලම් = මුද්දිකා. ඉ
මුදසි = මොචෙති
මුදල් = මූල න.

මුදල්නැතිබැවින් = මූලාභාව
තො. නි.
මුදා ඉවත්කරයි = ඔමුඤ්චති.
මුදුනෙහි = මුඩනි.
මුද්‍රණය කරයි = මුද්දංකෙති,
මුද්දාපෙති.
මුද්‍රණාලය = මුද්දංකනාලය. පු.
මුද්‍රිත = මුද්දිත. 3.
මුල්වූ = ආදිම. 3.
මුල දක්වා = යාව පාද.
මුලිනුදුරා = උම්මූලෙත්වා. පු. ක්‍රි.
මුවවර්ගය = මිගජාති. ඉ.
මුලාවූ = මූළ්හ; පමොහිත. 3.
මුණ = ආනන; මුඛ. න.
මුදෙත් එතර = සමුද්දපාර. න.
මූර්ජාවේ = මුච්ඡති.
මෙබඳු = එවරූප; ඊදිස. 3.
මෙහෙකරුවා = සෙවක. පු.
මේසය (කෑම) = භොජනඵලක.
පු. න.
මේසෙත් (වැඩකරන්නා) = ඉඨක
වඩ්ඪකී පු.
මෛථුනය = මෙථුන. න.
මොහඳුර = මොහන්ධකාර. පු.
මොහොතක් = මුහුත්තං. ක්‍රි. වි.
මොහොතකින් = මුහුත්තෙන.
මෝටර්රථය = සයංවට්ටකරථ.
පු.
මෝඩයා = ජළ; අන්ධබාල;
අපඤ්ඤ. පු.
මෝල්ගස = මුසල පු.
මැටි = මත්තිකා. ඉ.
මැදකොටස = මජ්ඣභාග. පු.
මැදපටන් = මජ්ඣතො. නි.
මැරුබැවින් = හතත්තා; ව්‍යාපා
දිතත්තා.
යකා = යක්ඛ. පු.

යටත් පිරිසයෙන් = හෙඪිම කොටියා
යටිකුරු = අවකුජ්ජ. 3.
යටිකුරුකරයි = නිකුජ්ජෙති.
යතුර = කුඤ්චිකා. ඉ.
යනුකැමති = ගනතුකාම. 3.
යම්සේ = යථා; සෙය්‍යථාපි. නි.
යවකෙත = යවකෙඛත්ත. න.
යවයි = පෙසෙති
යවනුලැබේ = පෙසීයති.
යහපත් = සුන්දර; සුභ. 3.
යහපත් ඒම = සවාගත. න.
යුතුබව = යුත්තභාව. පු.
යුඛකෙරේ = යුජ්ඣති
යුවරජකම = ඔපරජ්ජ. න
යෙදේ = යුඤ්ජති; අනුයුඤ්ජති
යෝග්‍යවූ = යොග්ග; අනුරූප; අනුච්ඡවික. 3.
යොදවයි = පයොජෙති.
රකුසා = රක්ඛස. පු.
රකුසිය = රක්ඛසී: ඉ.
රඟමඬල = රංගමණ්ඩල. න.
රචනාකළ = රචිත. 3.
රටඉඳි = මහාඛජ්ජුරී. ඉ.
රටවැසියා = රට්ඨවාසී. පු.
රජ = වසුධාධිප; භූපාල, රාජ; නරාධිප. පු.
රජගහනුවර = රාජගහ. න.
රජවාසල = රාජවාර. න.
රජතනතුර = රාජඨාන, රාජ ත්ථාන. න.
රජදූ = රාජධීතු. ඉ.
රත් කබල = තත්තකපාල න.
රත්නත්‍රය = රතනත්තය. න.
රතුනෙළුම් = අරවින්ද; රත්ත පදුම. න.
රත් ආලේපකළ = සුවණ්ණා ලිත්ත. 3.
රත් තහඩුව = සුවණ්ණපට්ට. න.
රත්මිශ්‍ර = කඤ්චනමිස්ස. 3.
රහත්නම = ඛීණාසව පු.
රළු = කක්ඛළ; කක්කස 3.
රාජපුරුෂයා = රාජපුරිස. පු.
රාජවෛද්‍යයා=රාජකීයවෙජ්ජ. පු.
රාජ්‍යශ්‍රිය = රජ්ජසිරි. ඉ.
රාත්‍රිකාලයේ = රත්තියං.
රිදේ = රුජති.
රියන් 250 ක් උසැති = අඩ්ඪ තෙය්‍යරතනසතුබ්බෙධ. 3.
රුක්දෙවියා = රුක්ඛදෙවතා. ඉ.
රුචිවේ = රුච්චති;
රුපියල = රූපිය. න.
රුවන් කිරුළ = රතනකිරීට. න.
රෙද්ද = වත්ථ. න.
රේස්පිටිය = අස්සමණ්ඩල. න.
රෝගය = ව්‍යාධි; රොග, පු. ගෙලඤ්ඤ. න.
රෝගදුරුකරන = ආතංකාප හාරක. 3.
රෝගියා = රොගී; ව්‍යාධිත; ගිලාන. පු.
රැස්කරයි = උපචිනාති.
රැස්වියයුතු = සන්නිපතිතබ්බ. 3.
රැස්වීම් ශාලාව = සන්නිපාත සාලා. ඉ.
රැස්වේ = සන්නිපතති; සමා ගච්ඡති; සමොසරති·
රැළය = තරංග; පු. වීචි. ඉ
රැඳුවල්හි = රත්තින්දිවං. ක්‍රි වි.
ලක්දිව = ලංකා. ඉ. සීහළදීප. පු.
ලබනුකැමති = ලද්ධුකාම. 3.
ලබාගෙන = ලද්ධා; ලද්ධාන; ලභිත්වා පු. ක්‍රි.
ලිපිද්‍රව්‍ය = ලෙඛනොපකරණ. න.
ලියමින් = ලිඛන්ත. 3.
ලියවාගෙන = ලිඛාපෙත්වා

ලියුම = සාසනපණ්ණ. න.
ලී = දාරු; කට්ඨ. න.
ලීබඩු = දාරුභණ්ඩ. න.
ලීවැඩ = දාරුකම්ම. න.
ලුණුවරණ = වරණ; කරේරි. පු.
ලුහුබඳියි = අනුබන්ධති.
ලෝකයාට යහපත කරන = ලොකසිවංකර. 3.
ලෝකකුහරය = භුවනවිවර. න.
ලෝකය දන්නා = ලොකවිදූ. 3.
ලෝසැළිය = ලොහකුම්භී. ඉ.
ලැබියයුතු = ලද්ධබ්බ. 3.
ලැබුණුවිට = ලද්ධෙ.
ලැබූ = ලද්ධ. 3.
ලැබුවේය = ලභි; පටිලභි
ලැබේ = සම්භවති; ලබ්භති.
ලෑල්ල = ඵලක; පදර න.
වටකරයි = පරික්ඛිපති
වටකළ = පරික්ඛිත්ත. 3.
වඩා අධික = අධිකතර. 3.
වඩා ශ්‍රේෂ්ඨබව = සෙට්ඨතරභාව. පු.
වණය (තුවාලය) = වණ. පු. න.
වත්කොට = ආසිඤ්චිත්වා. පු. ක්‍රි
වත්ත = වත්ථු; උය්‍යාන. න.
වත්පිළිවෙත් = වත්තපටිවත්ත. න.
වතාවත් කිරීම = වෙය්‍යාවච්චකරණ න.
වදකසා = ගොලොමී ඉ.
වදා = විජායිත්වා පු. ක්‍රි.
වඳියි = වන්දති; අභිවාදෙති; නමස්සති.
වඳුරා = සාඛාමිග; කපි; වානර. පු.
වන්දනීයස්ථානය = පූජට්ඨාන. න.
වන්නේ නම් = භවෙය්‍ය.
වනගහනය = වනගහන. න.
වනයේ හැසිරෙන = වනචරක 3.
වනසෙනසුන = අරඤ්ඤවිහාර. පු.
වම්පැත්ත = වාමපස්ස. පු.
වමනය කෙරේ = වමති.
වයස් ප්‍රමාණය = ආයුප්පමාණ. න.
වරද = ආදීනව; අච්චය; දොස. පු.
වර්ණය = වණ්ණ. පු.
වර්ණයෝජකයා = වණ්ණයොජක. පු.
වර්ණිත = පසත්ථ; වණ්ණිත 3.
වලඳවයි = භොජෙති පරිවිසති.
වලඳා අවසන්හි = භොජනාවසානෙ.
වලාකුළක් පමණ = අබ්භාමත්ත. 3.
වවයි = රොපෙති
වස්එළඹි = වස්සූපගත. 3.
වස්සා = වච්ඡ. පු.
වසනගෙය = වාසාගාර. න.
වසනබව = වසනභාව. පු.
වසයි = ඡාදෙති; පිදහති.
වසා = පිදහිත්වා; ඡාදෙත්වා. පු. ක්‍රි.
වසාගත් = පරියොනද්ධ. 3.
වසාවාසි = ජාතිකොස. පු
වසූරිය = මසූරිකා. ඉ.
වස්ත්‍රයුග්මය = දුස්සයුග. න.
වළක්වයි = වාරෙති, නිවාරෙති; පටිසෙධෙති; බාධෙති.
වළලයි = නිඛණති.
වංගෙඩිය = උදුක්ඛල. පු.
වාක්‍යරචනාව = වාක්‍යරචනා. ඉ.
වාදනය කරමින් = වාදෙන්ත. 3.
වාසයකරවයි = වාසෙති, නිවෙසෙති.

වාසස්ථානය = වසනට්ඨාන. න.
විකනුලබන = වබ්බියමාන. 3.
විකුණනමිල = වික්කායිකමූල. න.
විකුණුබැවින් = වික්කිණිතත්තා.
විචාරයි = පුච්ඡති.
විචාරනලද = පුට්ඨ 3.
විචාරා = පුච්ඡිත්වා; පුච්ඡිය. පු. ක්‍රි.
විජිනිපත = විජනී. ඉ.
විද = විජ්ඣිත්වා. පු. ක්‍රි
විදුලි එළිය = විජ්ජුප්පභා. 3.
විඳියි = වින්දති; වෙදෙති; පටිසංවෙදෙති.
විද්‍යායතනය = විජ්ජාලය. පු.
විද්‍යාව දීම = විජ්ජාදාන න.
විනාශකරයි = විනාසෙති; විධංසෙති.
විනාශකළ = විධංසිත; විනාසිත. 3.
විනාශයට පැමිණි = විනාසප්පත්ත. 3.
විනාශවිය = විනස්සි.
විනිශ්චය කරයි = නිච්ඡෙති, තීරෙති.
විපත්තිකාලය = කාලවිපත්ති. ඉ
විමසාබලයි = වීමංසති; උපපරික්ඛති
විමසීම = වීමංසා; උපපරික්ඛා, ඉ
වියදම්කොට = විස්සජ්ජෙත්වා පු. ක්‍රි.
වියදම = පරිබ්බය; වය. පු
වියදම්කරයි = විස්සජ්ජෙති; වයං කරොති.
වියයි = විනාති.
වියයුතු = භවිතබ්බ. 3.
වියලි = සුක්ඛ. 3.
වියා = වායෙත්වා පු. ක්‍රි.
විරේචනයකරයි = විරෙචෙති.

විල = සර. පු න.
විවාදකරයි = විවදති.
විවාදනැති = විවාදරහිත. 3.
විවාදයට පත් = විවාදාපන්න. 3.
විවාහයෝජනාකොට = වාරෙත්වා පු. ක්‍රි.
විවෘතකළ කෙණෙහි = විවටමත්තෙ.
විවේකකාමී = පටිසල්ලානරත. 3.
විවේකයට පැමිණි = විවෙකගත. 3.
විශිෂ්ටරූප ඇති = අභිරූප. 3.
විශ්වවිද්‍යාලය = නිඛිලවිජ්ජාලය. පු.
විශ්වාසඇති = විස්සාසික. 3.
විසිදහස වීසතිසහස්ස. න
විසිවයසැති = වීසතිවස්සික. 3.
විසිරේ = විකිරති.
විසීමපිණිස = වසනත්ථාය.
විසුරුවයි = ඔකිරති.
විසූ = වුත්ථ. 3.
විසූබව = වුසිතභාව. පු
විස්තරකරයි = විත්ථාරෙති
විස්මිතසිතැති = විම්හිතමානස. 3.
විහාර වැනසීම = විහාරවිධංසන න.
විහිඳුවන = විස්සජ්ජෙන්ත, 3
වීරිය = රජ්ජු. ඉ
වී (ය) = අභොසි.
වෘඩවූ = වුඩ්ඪ. 3.
වෙදකම = වෙජ්ජකම්ම; න.
වෙන්කොට = වියොජෙත්වා; විසුං කත්වා. පු. ක්‍රි.
වෙන්ව යේ = විගච්ඡති.
වෙන්වීම = විගමන. න.
වෙනස = නානාකරණ. න.

වෙශ්‍යාව = ගණිකා. ඉ.
වෙහෙසෙමින් = කිලමන්ත. 3.
වෙළඳනැව = වාණිජනාවා. ඉ.
වෙළඳ පුත්‍රයා = වාණිජපුත්ත පු.
වෙළඳාම = වණිජ්ජා ඉ.
වෙළඳාම් කරමින් = වණිජ්ජං කරොන්ත. 3.
වෙළඹ = වළවා. ඉ.
වෙළයි = වේඨෙති.
වෙහෙසයි = විහෙසෙති.
වේදිකාව = වෙදිකා. ඉ.
වේයා = උපචිකා ඉ.
වේලා = සුක්ඛාපෙත්වා පූ. ක්‍රි
වේලිගියේය = සුස්සි.
වෛද්‍යශාස්ත්‍රය = වෙජ්ජසත්ථ. න.
වෛරබැන්දේය = උපනන්ධි.
වෛරඇත්තා = වෙරී. පු.
වෛරනැත්තා = අවෙරී. පු.
වැගිරේ = පග්ඝරති.
වැගුරුණු = පග්ඝරිත. 3,
වැට = වති. ඉ.
වැටකේ = කෙතකී. පු.
වැවූ = රොපිත. 3.
වැටහේ = ඛායති; පටිභාති.
වැටුණු = පතිත. 3.
වැඩිමහලු = වුඩ්ඪතර. 3.
වැඩිවියපැමිණි = වයප්පත්ත. 3.
වැද්දා = ව්‍යාධ; ලුද්දක. පු.
වැදගනී = පක්ඛන්දති.
වැඳිරිය = වානරී. ඉ.
වැසිත් = මුද්දිකාසව. පු
වැස්ස = දෙව. පු. වුඩ්ඪි. ඉ.
වැසුණු = ආවට; ඡන්න. 3.
වැල්මී = මධුලට්ඨිකා. ඉ.
වැළඳගනී = ආලිඞ්ගති.
වැලපේ = පරිදෙවති.
වැලමිටිපහර = කප්පරප්පහාර. පු.
ව්‍යඤ්ජනරසය = සූපරස. පු.
ව්‍යවහාරකිරීම පිණිස = වොහරණත්ථාය.
ව්‍යාඝ්‍රදෙන = ව්‍යග්ඝී. ඉ.
ශතය = සතභාග පු
ශබ්දනගා කියයි = පඨති.
ශාලාව = සාලා. ඉ.
ශාස්තෘවරයා = සත්ථු පු.
ශිල්පඉගනීම = සිප්පුග්ගහණ. න.
ශුඩකටයුතු = සොධෙතබ්බ. ඉ.
ශුඩකළබැවින් = සොධිතත්තා.
ශුභඋදයක් වේවා = සවාගතං.
ශ්‍රද්ධානැති = අස්සද්ධ. 3.
ශ්‍රමණයා = සමණ. පු.
ශ්‍රමණයන්ට අයත් = සාමණක 3.
ශ්‍රාවකයා = සාවක. පු.
සක්විතිරජ = චක්කවත්තිරාජ. පු.
සකසා = සක්කච්ච. පූ. ක්‍රි.
සත්කාරකර = සක්කරිත්වා. පූ. ක්‍රි
සත්දිනක් පමණ=සත්තාහමත්ත.
සත්රුවන්මුවා = සත්තරතනමය. 3.
සත්වසමූහය = සත්තකාය. පු.
සතුටුකථාව = සල්ලාප. පු.
සතුටුවූ = තුට්ඨ; සන්තුට්ඨ; අත්තමන; හට්ඨ. 3.
සතුටුවෙන = සමෙමාදමාන. 3.
සතුටුවේ = තුස්සති; මොදති; නන්දති.
සතුරා = පච්චාමිත්ත. පු.
සත්‍යවාදීබව = සච්චවාදිතා. ඉ.
සඳුදා = චන්දවාර. පු.
සත්හුන් ඉඳුරන් ඇති = සන්තින්ද්‍රිය. 3.
සත්හුන්සිතැති = සන්තමානස. 3.
සපයනුලැබේ = සම්පාදීයති.

සපු = චම්පක. පු.
සමග ආ = සහාගත 3.
සමඑවූ = සමත්ථ 3.
සමවේ = සමෙති.
සමශීතොෂ්ණ ඇති = සමසී
තුණ්හ. 3
සමාකරවයි = ඛමාපෙති.
සමාදන්කරවයි = සමාදපෙති.
සමාන පෙනුම ඇති = සමාන
රූප 3.
සමානවූ = සදිස 3.
සමීපය = උපන්තික, සමීප;
සකාස; සන්තික න.
සම්බවූ = සම්බ 3.
සම්පත = සාපතෙය්‍ය න.
සම්පත්ති කාලය = කාල
සම්පත්ති. ඉ.
සම්පාදිතවූ = සම්පාදිත 3
සම්බන්ධනැති බැවින් = අසම්බන්ධ
තාය.
සයහැවිරිදි = ඡබ්බස්සික. 3.
සරසවයි = භූසෙති; මණ්ඩෙති;
භූසාපෙති.
සර්වඥ = ජින; ලොකනාථ;
සබ්බඤ්ඤු පු.
සල්වනය = සාලවන න.
~~සලකනලද = සල්ලක්ඛිත. 3.~~
සලකතුලැබේ = සල්ලක්ඛීයති.
සලකයි = සල්ලක්ඛෙති.
සල්ලවෛද්‍යයා = සල්ලකත්ත. පු
සවණක් බුදුරැස් = ඡබ්බණ්ණ
බුඬරංසි. ඉ.
සහභාගී වෙයි = සභාගීහොති.
සංක්ෂිප්තවූ = සංඛිත්ත 3.
සංසස්ථවිරප්‍රමුඛ = සංඝත්ථෙරපප
මුඛ 3.
සංසිඳවීම සඳහා=වූපසමනත්ථාය.

සංසිඳුණු = වූපසන්ත. 3.
සංස්කෘත භාෂාව = සක්කට
භාසා ඉ.
සංඥව = සඤ්ඤ ඉ.
සාත්තුකාරිය = උපට්ඨායිකා;
සප්පායකාරිකා ඉ.
සාදික්කා ජාතිඵල න.
සාවා = සසක. පු
සිටි = ඨිත. 3.
සිත්ගනියි = ආරාධෙති.
සිත්නැති = අචෙතන. 3.
සිදුර = ඡිද්ද න ඔතාර. පු.
සිදුවේ = සිජ්ඣති.
සිඳදමයි = ලුණාති.
සිඳේ (කැපේ = ඡිජ්ජති.
සිනාසෙන = හසන්ත 3.
සිඹබලයි = සිංඝති.
සියගෙදරින් = සකගෙහතො.
සියබස = නිජභාසා ඉ.
සියපිරිවර = සකපරිවාර. පු.
සියයබැගින් = පටිසතං ක්‍රි. වි.
සියයක්පමණ = සතමත්ත. 3.
සියරට = සකරට්ඨ, න සදෙස පු.
සියල්ල සුදු = සබ්බසෙත. 3.
සියුම් = සුඛුම 3.
සිරකරුවා = කාරාගත; බන්ධනා
~~ගාරික. පු.~~
සිරගෙය = කාරා ඉ. බන්ධනා
ගාර. න.
සිරගේ පාලකයා = කාරා
පාලක. පු.
සිල්නැති = දුස්සීල 3.
සිවුපාවා = චතුප්පද. පු.
සිහිකරන = අනුස්සරන්ත. 3.
සිහිනැතිවේ = පමුස්සති.
සිහිනැතිවී (මතකනැතිවී)=විස්ස
රිත්වා පමුස්සිත්වා. පූ. ක්‍රි.

සිංහසම = සීහවම්ම. න.
සීනුව = ඝණ්ටා. ඉ.
සීසෑම = කසන; න කසි. ඉ.
සුදුපැහැති = සෙතවණ්ණ. 3.
සුරාසොඬා = සුරාසොණ්ඩ. පු.
සුරැකි = සුරක්ඛිත. 3.
සුලභවූ = සුලභ. 3.
සුලභබැවින් = සුලභතාය.
සුවකිරීම අපහසු = දුතතිකිච්ඡ. 3.
සුවඳමල් ආදිය = ගන්ධමාලාදි. පු.
සුවපත් = සුඛිත. 3.
සූදුකාරයා = අක්ඛධුත්ත. පු.
සෙල්ලම්කොට = කීළිත්වා පු. ක්‍රි.
සෙලවේ = චලති; කම්පති.
සෙවිලිකරයි = ඡාදෙති.
සෙවෙල් = සෙවාල. පු.
සේවනය කරයි = සෙවෙති; භජති. පයිරුපාසති.
සේවය කරයි = පරිචරති.
සොඳුර = භොති. ඉ.
සොයයි = ගවෙසති; පරියෙසති.
සොයන්නට = ගවෙසිතුං. නි.
සොයාබලයි = උපධාරෙති.
සොරකම් කරයි = ථෙනෙති; චොරෙති.
සොරකම්කළ = ථෙනිත.
සොරුන්අතට පත් = චොරහත්ථගත. 3.
සෝදයි = ධොවති; පක්ඛාලෙති.
සෝවාන්ඵලය = සොතාපත්තිඵල. න.
සෞභාග්‍යය = සොභග්ග. න.
සෑහවුණි = නිලීයි.
සැපදුක් = සුඛදුක්ඛ. න.
සැපසේ = සුඛෙන. ක්‍රි. වි.
සැරසුණු = පතිමණ්ඩිත. 3.
සැලෙනරළ = චලමාන-තරඞ්ග. පු.
සැවැත්නුවර = සාවත්ථි. ඉ.
සැළිය = චාටි. ඉ.
සෑගිරිය = චෙතියගිරි. පු.
සෑමලුව = චෙතියඞ්ගණ. න.
ස්තුතිකෙරේ = ථවති; පසංසති; අභිත්ථුනාති.
ස්ත්‍රිය = මාතුගාම. පු. වනිතා; නාරී; ඉත්ථී. ඉ.
ස්ථානය = ඨාන. න.
ස්ථානොචිතප්‍රඥ ඇති = ඨානොචිතපඤ්ඤ 3.
ස්ථිර = ධුව; ථිර. 3.
ස්ථිරබව = ථිරභාව. පු.
ස්ථිරවාසස්ථාන = ථිරනිවාසට්ඨාන. න.
ස්වකීයාචාර්‍යයා = නිජාචරිය. පු.
ස්වල්ප = අප්පක 3.
ස්වාමිපුරුෂයා = භත්තු, පති. පු.
හක්ගෙඩිය = සංඛ. පු.
හකුරු = ගුළ. පු. සක්ඛරා. ඉ.
හඟවයි = විඤ්ඤාපෙති.
හඟියි = මඤ්ඤති.
හටගනී = සංජායති.
හඬ = සර; නාද. පු.
හඬයි = රවති; විරවති; කන්දති; රොදති.
හදරයි = සජ්ඣායති.
හඳියි = නිවාසෙති; පරිදහති.
හමයි = වායති.
හමුකොට = සම්මුඛීකත්වා. පු. ක්‍රි.
හමුවීම = සම්මුඛීභාව. පු.
හමුවෙන්ට = සමාගන්තුං නි.
හසුරුවයි = චාරෙති; සංචරාපෙති; සාරෙති.
හසුරුවනුලබයි = සාරීයති.
හස්තිරත්නය = ගජරතන. න.
හාත්පසින් = සමන්තතො. නි.

හික්මේ = සික්ඛති.
හිඳුවා = නිසීදාපෙත්වා. පූ. ක්‍රි.
හිමාලය = හිමවන්තු. පු.
හිරකරයි = රෝධෙති.
හිරමණය = සණ්හකරණී. ඉ
හිවල්දෙන = සිගාලි. ඉ.
හිස්බිම = අබ්භොකාස. න
හිංසාව = හිංසා. ඉ
හුත්තේය = නිසීදි.
හෙරණ = සාමණේර. පු.
හෙමින් = සනිකං. ක්‍රි. වි.
හෙවැ = නිපජ්ජිත්වා පූ ක්‍රි.
හෙළයි = පාතෙති.
හෙළන්ට = පාතෙතුං. නි
හොට = මුඛතුණ්ඩ පු
හොත්තේය = නිපජ්ජි.
හොබනා = සොභන. 3.
හොබී = සොභති.
හොරි = කච්ඡු. ඉ.
හොවයි = නිපජ්ජාපෙති.
හෝපලු = අසොක. පු.
හැක, හැකිය = සක්කා. නි.
හැකිවිය = අසක්ඛි.
හැකිවේ = සක්කොති, සක්කු ණාති; විසහති.
හැජේ = පටිහඤ්ඤති.
හැමකල්හි = සබ්බදා. නි.
හැමතැන = සබ්බත්‍ථ. නි.
හැම්ද = සම්මජ්ජිත්වා. පූ. ක්‍රි.
හැර = වජ්ජෙත්වා; වජ්ජිත්වා; පහාය. පූ. ක්‍රි.
හැරදමූ විහාරය = ඡඩ්ඩිත විහාර. පු
හැරීඑයි = පච්චාගච්ඡති.
හැරීඒම = පච්චාගමන. න.
හැරීයයි = පටිගච්ඡති.
හැල්කෙත = සාලික්ඛෙත්ත. න.
හැසිරීම = සංචරණ. න. චාරිකා; චරියා. ඉ.
ළදරු = දහර. 3.
ළිඳ = කූප. පු.
ළිඳේ ජලය = කූපම්බු. න.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු